321 වන කාණ්ඩය - 14 වන කලාපය
தொகுதி 321 - இல. 14
Volume 321 - No. 14

2025 ඔක්තෝබර් 22 වන බදාදා
2025 ஒக்ரோபர் 22, புதன்கிழமை
Wednesday, 22nd October, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
පාර්ලිමේන්තුවේ කලා සහ සංස්කෘතික කටයුතු සංසදය සංවිධානය කරන වේදිකා නාට්‍ය දැක්ම [තීරුව 2309]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 2309]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 2311]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2312-2342]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
මන්නාරමේ ක්‍රියාත්මක වූ වියළි කලාප නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය [තීරුව 2342]

**2025.08.06 දින ගරු නන්දන පත්මකුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය:**
ගරු අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර [තීරුව 2346]

**සීනි කර්මාන්තයේ තිරසරභාවය:**
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2350]

**වර්තමාන රජයේ බලශක්ති උත්පාදන ප්‍රතිපත්තිය:**
බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2364]

**විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත:**
නියමය [තීරු 2379-2463]

**සුරාබදු ආඥාපනත:**
රීති [තීරුව 2463]

**කල්තැබීමේ යෝජනාව:**
පියයුරු පිළිකා කල්තියා හඳුනා ගැනීම ප්‍රවර්ධනය [තීරු 2464-2482]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
கலைகள் மற்றும் கலாசார அலுவல்கள் பற்றிய பாராளுமன்ற ஒன்றியத்தால் ஏற்பாடு செய்யப்பட்டுள்ள மேடை நாடகம் [ப: 2309]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 2309]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 2311]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2312-2342]

**தனி அறிவித்தல் மூல வினா:**
மன்னாரில் நடைமுறைப்படுத்தப்பட்ட உலர் வலய நகர நீர் மற்றும் கழிவகற்றல் திட்டம் [ப: 2342]

**2025.08.06ஆம் திகதி மாண்புமிகு நந்தன பத்மகுமாரவால் கேட்கப்பட்ட வினா:**
மாண்புமிகு பிரதம அமைச்சரினது விடை [ப: 2346]

**சீனிக் கைத்தொழிலின் நிலைத்தன்மை:**
கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 2350]

**தற்போதைய அரசாங்கத்தின் வலுசக்தி உற்பத்திக் கொள்கை:**
வலுசக்தி அமைச்சரினது கூற்று [ப: 2364]

**விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம்:**
கட்டளை [ப: 2379-2463]

**மதுவரிக் கட்டளைச் சட்டம்:**
விதிகள் [ப: 2463]

**ஒத்திவைப்புப் பிரேரணை:**
மார்பகப் புற்றுநோயை முன்கூட்டியே கண்டறிவதற்கான விழிப்புணர்வை ஊக்குவித்தல் [ப: 2464-2482]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Stage Play Organized by Parliamentary Caucus on Arts and Cultural Affairs [Col. 2309]

AUDITOR-GENERAL'S REPORT [Col. 2309]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2311]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2312-2342]

QUESTION BY PRIVATE NOTICE:
Dry Zone Urban Water and Sanitation Project Implemented in Mannar [Col. 2342]

QUESTION POSED BY HON. NANDANA PATHMAKUMARA ON 06.08.2025:
Reply by Hon. Prime Minister [Col. 2346]

SUSTAINABILITY OF SUGAR INDUSTRY:
Statement by Minister of Industry and Entrepreneurship Development [Col. 2350]

POWER GENERATION POLICY OF PRESENT GOVERNMENT:
Statement by Minister of Energy [Col. 2364]

SPECIAL COMMODITY LEVY ACT:
Order [Cols. 2379-2463]

EXCISE ORDINANCE:
Rules [Col. 2463]

ADJOURNMENT MOTION:
Promote Early Detection of Breast Cancer [Cols. 2464-2482]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 ඔක්තෝබර් 22වන බදාදා***
*2025 ஒக்ரோபர் 22, புதன்கிழமை*
*Wednesday, 22nd October, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තුවේ කලා සහ සංස්කෘතික කටයුතු සංසදය සංවිධානය කරන වේදිකා නාට්‍ය දැක්ම
### கலைகள் மற்றும் கலாசார அலுவல்கள் பற்றிய பாராளுமன்ற ஒன்றியத்தால் ஏற்பாடு செய்யப்பட்டுள்ள மேடை நாடகம்
### STAGE PLAY ORGANIZED BY PARLIAMENTARY CUACUS ON ARTS AND CULTURAL AFFAIRS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දසවැනි පාර්ලිමේන්තුවේ කලා සහ සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු සංසදය විසින් 2025 සාහිත්‍ය මාසයට සමගාමීව සංවිධානය කරන කරනු ලබන "පළිඟු රැන" - Wingfield Family - වේදිකා නාට්‍යය 2025 ඔක්තෝබර් 23වන බ්‍රහස්පතින්දා පස්වරු 6.30 ට පාර්ලිමේන්තුවේ තඹ දොර අබියස ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ රසාස්වාදය උදෙසා වේදිකාගත කිරීමට නියමිතය. මෙම නාට්‍ය ප්‍රසංගය රස විඳීමට එක්වන මෙන් සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට ආරාධනා කරමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLVI කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XIX කොටස සහ නවවැනි කාණ්ඩයේ IX කොටස

මම ඉදිරිපත් කරමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Regulations made by the Minister of Finance, Planning and Economic Development regarding the Guidelines on the Grant of Exemptions or Incentives to Businesses of Strategic Importance under Section 71 read with Section 52 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021 and published in Gazette Extraordinary, No. 2454/62 of 20th September, 2025.

I move that these Regulations be referred to the Committee on Public Finance.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the -

(i) Rules under Section 32 of the Excise Ordinance (Chapter 52) regarding the time period for payment of duty on the production of liquor and levying of fee; and

(ii) Order under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007 relating to Special Commodity Levy,

which were referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) හිඟුරක්ගොඩ, සතොස හන්දිය, මධ්‍යම පාන්තික නිවාස, අංක 19 යන ලිපිනයෙහි පදිංචි එල්.ජී. නිහාල් ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) නුවරගල, පහළ යක්කුරේ, අංක 30 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්. විජේසූරිය මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

Hon. Speaker, I present a petition from Mr. C.S.T. Jalathge of No. 593, New Town, Thalgaswala.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

Hon. Speaker, I present a petition from Mr. M. Karunarathna of Puwakgahakadawala, Weerapokuna.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ලංකා විදුලිබල මණ්ඩලය: ප්‍රතිව්‍යුහගතකරණය
### இலங்கை மின்சார சபை: மறுசீரமைத்தல்
### CEYLON ELECTRICITY BOARD: RESTRUCTURE

678/2025

**1. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට බදු ගෙවන ජනතාවට, මහා භාණ්ඩාගාරයට සහ රාජ්‍ය බැංකු වෙත විශාල වැය බරක් බවට පත්වී ඇති ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කළ යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது வரி செலுத்தும் மக்களுக்கும், பொதுத் திறைசேரிக்கும், அரச வங்கிகளுக்கும் பாரிய செலவினச் சுமையாக மாறியுள்ள இலங்கை மின்சார சபை மறுசீரமைக்கப்பட வேண்டும் என்பதை ஏற்றுக்கொள்வாரா;

(ii) ஆமெனில், மேற்படி சபை மறுசீரமைக்கப்படும் முறையியல் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether he accepts that the Ceylon Electricity Board, which has become a huge burden of expenditure to the taxpayers, the Treasury and the State banks, should be restructured; and

(ii) if so, the methodology to be adopted for such restructuring?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 2025 අංක 14 දරන සංශෝධිත විදුලිබල පනත ප්‍රකාරව, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතෙහි පළමු (1) උපලේඛනයේ සඳහන් ආකෘතිය අනුව, 17 වන වගන්තියට අනුකූලව ප්‍රතිව්‍යුහගතකරණය කරනු ලබයි. එහිදී ස්ථාපිත කරනු ලබන සමාගම් 06 පහත පරිදි වේ.

1. National System Operator (Pvt.) Limited
2. National Transmission Network Service Provider (Pvt.) Limited
3. Electricity Generation Lanka (Pvt.) Limited
4. Electricity Distribution Lanka (Pvt.) Limited
5. Energy Ventures Lanka (Pvt.) Limited
6. CEB Employees Fund (Pvt.) Limited

(ආ) අදාළ නොවේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ ඒ සියල්ලම සමාගම් හැටියට තමයි ප්‍රතිව්‍යුහගත කරන්නේ. සමාගම් හැටියට වැඩ කරගෙන යනකොට කොයි ආකාරයෙන්ද රජය සහ පෞද්ගලික අංශය මේ සඳහා දායක වන්නේ කියන එක විශේෂයෙන්ම මම දැනගන්න කැමැතියි. ප්‍රශ්නයක් හැටියට නොවෙයි, ඒ ගැන දැනුවත් වීමටයි මා එය අහන්නේ.

මීට දින කිහිපයකට ප්‍රථම විදුලි බිල සම්බන්ධයෙන් තීන්දුවක් ගත්තා. විදුලි බිල වැඩි කරන්න රජය විසින් මහජන උපයෝගිතා කොමිසමට ඉදිරිපත් කළ යෝජනාව සාකච්ඡාවට අරගෙන තමයි ඒ අය විදුලි බිල වැඩි කරන්නේ නැහැ කියන තීන්දුව ගත්තේ. ඒ වෙලාවේදී රජය මහජන උපයෝගිතා කොමිසමට විදුලි බිල වැඩි කරන්න යෝජනා කරපු ආකාරය සහ මිල ගණන් මේ සභාවට දැනුම් දෙනවාද කියන එක පළමුවෙනි අතුරු ප්‍රශ්නය හැටියට මම අහන්න කැමැතියි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මුලින් සඳහන් කළ කාරණය සම්බන්ධයෙනුත් මම පිළිතුරක් ලබා දෙන්නම්. නැත්නම් ඒක අඩුවක් විධියට දකින්න පුළුවන්. අපි මේ සමාගම් 6ම සියයට සියයක් මහා භාණ්ඩාගාරය - රජය - සතු සමාගම් විධියට තමයි ලියාපදිංචි කර තිබෙන්නේ. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ඒවා private limited companies විධියට තමයි register වෙන්නේ. ඒක ලංකාවට අනන්‍ය වෙච්ච එකක්. ඒවා පෞද්ගලික නොවෙයි, සියයට සියයක් රජය සතු සමාගම්.

ඊළඟට ඔබතුමාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය ගත්තොත්, ලංකා විදුලිබල මණ්ඩලයේ සංඛ්‍යාලේඛන අනුව විදුලි බිල සියයට 6.8කින් වැඩි වෙන්න ඕනෑය කියලා ඔවුන් යෝජනා කර තිබුණා. මොකද කොමිසමත් රජයේ, CEB එකත් රජයේ. ඒ නිසා මේක රජයයි, විපක්ෂයයි කියලා දෙකක් නොවෙයි, එකක්.

ඇත්තටම PUCSL එක පත් කර තිබෙන්නේ කොමිසමක් විධියට එම කාර්යය නියාමනය - regulate - කරන්න. එහෙම නැත්නම් CEB එකට එය කරන්න සිදු වනවා. ලොකු මුදලක් වැය කරලා, ලයිසන් අරගෙන PUCSL එක දාලා තිබෙන්නේ ඒකට තමයි. එහි mandate එක තේරුම් ගන්න, ගරු මන්ත්‍රීතුමා. එහෙම නොකළොත් ඒකෙන් වැඩක් නැහැ. මොකද, CEB එක හරහා රුපියල් කෝටි ගණනක් සල්ලි ගෙවනවා, ඒ ලයිසන් එක ගන්න. එහෙම තත්ත්වයක් තිබියදී මහජන උපයෝගිතා කොමිසම විධියට ඔවුන්ගේ කාර්යභාරය තමයි, ඒ යෝජනාව හරියට විශ්ලේෂණය කරලා ජනතාවට හරි ප්‍රතිඵලය ලබා දෙන එක. ඒ අනුව තමයි මිල වැඩි කිරීමක් සිදු නොවුණේ. ඔබතුමා අවශ්‍ය තොරතුරු ලබා ගන්න වෙනම ප්‍රශ්නයක් යොමු කළොත්, මට ඒ විස්තර ඉදිරිපත් කිරීමේ කිසි ගැටලුවක් නැහැ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමනි, ඒ කියන්නේ විදුලි බිල සියයට 6.8කින් වැඩි කරන්න යෝජනා කළා. Regulate වනකොට රජයේත් එකඟත්වයෙන් තමයි ඒ ප්‍රමාණය වැඩි කරන්න යෝජනා වෙන්නේ. රජයේ අකැමැත්තෙන් regulate කළා කියලා විතරක් ඒක වෙන්නේ නැහැ. විදුලි බිල අඩු කරන්න කියලා රජය විසින් මහජන උපයෝගිතා කොමිසමට බල කළ කථාවක් නොවෙයි නේ මෙතැන තිබෙන්නේ. Regulate කළ විධියට මහජන උපයෝගිතා කොමිසම තීන්දු කරනවා, මේ වෙලාවේ විදුලි බිල වැඩි කරන්න බැහැ, ඒක වැරදියි කියලා. එම නිසා තමයි ඔවුන් එය නිවැරදි කළේ. රජයේ කැමැත්තෙන් තමයි විදුලි බිල වැඩි කරන්න යෝජනා කළේ. අපේ පැත්තෙන් කියන්න තිබෙන්නේ

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

මෙයයි. ලංකා විදුලිබල මණ්ඩලය මීට පෙර යම්කිසි විධියක ආදායමක් උපදවා ගත්තා; වැඩි ආදායමක්. ඒ අදායම අනුව මේ වනකොට හරි නම් ඔබතුමන්ලාගේ පොරොන්දුව අනුව විදුලි ඒකකයක මිල අඩු කරලා මහජනතාවට සහනයක් දෙන්න ඕනෑ. මොකද, මේ වන විට එක පැත්තකින් කර්මාන්ත කඩා වැටෙනවා. අනෙක් පැත්තෙන්, නිෂ්පාදකයාට විශාල ප්‍රශ්නයක් එනවා. සාමාන්‍ය ජනතාවට දුන් පොරොන්දුව ඉෂ්ට කරන වැඩසටහනත් එතැනදී ඔබතුමන්ලාගෙන් සිද්ධ වුණේ නැහැ. ඒක තමයි මම පළමු අතුරු ප්‍රශ්නය හැටියට ඇහුවේ.

දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් මම අහන්න බලාපොරොත්තු වෙන්නේ මගේ දිස්ත්‍රික්කයට අදාළ ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, නොරොච්චෝලේ විදුලි බලාගාරය හැදුවේ කල්පිටියේ ජනතාවට පොරොන්දු රාශියක් දීලා.

ඒ ප්‍රදේශයේ ගොවි ජනතාවට මුදල් අය නොකර විදුලිය ලබා දෙනවා කියලා වැඩසටහනකුත් සකස් කළා. ඊළඟට, තවත් ප්‍රදේශවලට සහන දෙනවා කියලා වැඩසටහන් හැදුවා. මේ සියල්ල කරලා ඒ බලාගාරය ක්‍රියාත්මක වෙද්දී එක පැත්තකින් පරිසරයට විශාල හානියක් වනවා. අදටත් ඒ පරිසර දූෂණය සම්බන්ධයෙන් නිවැරදිව තීන්දුවක් අරගෙන නැහැ, වාර්තාවක් නිවැරදිව අරගෙන නැහැ. කෙසේ වෙතත්, මේ තුළින් පරිසරයට විශාල හානියක් වනවා.

අපි අද පරිසරය ගැන කථා කරනවා. පරිසර අමාත්‍යතුමාත් සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, හැබැයි ඊට වඩා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. කල්පිටිය බල ප්‍රදේශයට හැම දාම විදුලිය විසන්ධි වනවා. ආපහු විදුලිය අරගන්න ඒ ජනතාව අඬන්න ඕනෑ. මේක බරපතළ ප්‍රශ්නයක්. මේක ගැන හොයා බලා නැති නිසා ඔබතුමාට මේ ගැන දැන් සෘජු පිළිතුරක් දෙන්න බැහැ කියලා මම දන්නවා. මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න ඔබතුමා සූදානමින් ඉන්න කියලා. මොකද, නොරොච්චෝලේ විදුලි බලාගාරය ඕනෑ නැති තැනක හැදුවා කියන එක තමයි අපේ මතය. ඒ බලාගාරය හදපු තැන නිසා සිදු වුණු බරපතළ පරිසර හානිය සහ ජනතාවට වුණු හානිය නිවැරදි කරන්න ඉදිරි කාලය තුළ යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලා සූදානම්ද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, එතුමාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයේ පසුවදනින් කියපු විධියට රජය සහ කොමිසම කියලා දෙකක් නැහැ. ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයක් විධියට ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කරනවා, ඒකත් රජයේ. ඒ වාගේම කොමිසමත් රජයේ. කොමිසම පත් කරලා තිබෙන්නේත් රජය විසින්ම තමයි. ඒ අනුව ඒ දෙකක් නොවෙයි. හැබැයි, කොමිසමට කාර්යභාරයක් තිබෙනවා, මණ්ඩලයට වඩා ගැඹුරින් මේක සලකා බලා මහජනතාවගේ යහපත සඳහා තීරණ ගන්න. ඒකට අපි රජය විධියට විරුද්ධ වෙලාත් නැහැ. සියයට 6.8 කියන එකට යම් යම් corrections කරලා ඔවුන් වෙනස් කරලා තිබෙනවා.

අපි ඒවාට එකඟයි. අපි පත් වනකොටත් සියයට 38ක විදුලි බිල වැඩිවීමක් ඉල්ලුවා. ඔක්කෝම එකතු කළත් අපි සියයට 5ක් අඩුවෙන් ඉන්නේ. සියයට 38ක වැඩිවීමක් තවම නැහැ. අපි ආණ්ඩුව ගන්න ඉස්සෙල්ලා ඒක යෝජනා කරලා තිබුණේ. අපේ අරමුණ විදුලි බිල අඩු කරන එක තමයි. අවුරුදු ගණනක් තිස්සේ ලංකා විදුලිබල මණ්ඩලය කාබාසිනියා කරලා තිබුණේ. ඒක ණය අරගෙන, වෙන වෙන දේවල් කරලා, අනවශ්‍ය විධියට connections දීලා, රජයේ ආයතනවලින්, ඇමතිවරුන්ගෙන් රුපියල් කෝටි ගණන් බිල් අය කරගන්නේ නැතුව දූෂිතව කටයුතු කරපු ආයතනයක්. ඒක මාස 12කින්, 13කින් ගොඩදාන්න බැහැ කියලා දේශපාලකයෙකු විධියට ඔබතුමාට යම් හෝ කල්පනාවක් තිබෙනවා නම් මේක තේරුම් ගන්න පුළුවන් ඇති. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කොතැනකවත් කිසිම පොරොන්දුවක් දීලා නැහැ, අරවා දෙනවා, මේවා දෙනවා කියලා. මම හිතන විධියට, ඒක ඔය පැත්තේ ඉන්න ඔබතුමන්ලාගේ විපක්ෂයේ නායකයන් එක්ක බේරා ගත්තොත් හොඳයි. මොකද, රජයක් විධියට අපි දෙන පොරොන්දු ඉටු කරනවා. *[බාධා කිරීමක්]* මගේ කාලය දෙන්න. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි නේ. පරිසර හානිය ගැන අපට අලුතෙන් වාර්තා වුණොත් අපි ඒ ගැන සොයා බලනවා. *[බාධා කිරීමක්]* මොකද, මේක ආරම්භ කරලා තිබෙන්නේ අපි නොවෙයි. පරිසර හානි ගැන මොනවා හෝ ප්‍රශ්නයක් තිබුණොත් අපට වාර්තා කරන්න. අපි ඒ ගැන සොයා බලා අවශ්‍ය කටයුතු කරනවා. *[බාධා කිරීමක්]* ඔබතුමා කියන විදුලිය විසන්ධි වීම ගැන මම හොයා බලන්නම්. එච්චරයි මට කියන්න තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -738/2025- (1), ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2010 සිට මාධ්‍යවේදීන් ඝාතනය කිරීම්, පැහැර ගැනීම් හෝ පහර දීම් පිළිබඳ විමර්ශන: ප්‍රගතිය
2010இலிருந்து படுகொலை செய்யப்பட்ட, கடத்தப்பட்ட அல்லது தாக்குதல்களுக்குள்ளான ஊடகவியலாளர்கள் தொடர்பான விசாரணைகள்: முன்னேற்றம்
INVESTIGATIONS INTO ASSASSINATIONS, ABDUCTIONS OR ASSAULTS OF JOURNALISTS SINCE 2010: PROGRESS

808/2025

3. **ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝාතනයට, පැහැර ගැනීමට සහ පහර දීමට ලක්වූ ජනමාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම ජනමාධ්‍යවේදීන්ට සාධාරණය ඉටු කිරීම සඳහා පැවැත්වෙන විමර්ශනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு தொடக்கம் இதுவரை படுகொலை, கடத்தல் மற்றும் தாக்குதலுக்கு இலக்கான ஊடகவியலாளர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஊடகவியலாளர்களுக்கு நீதியை நிலைநாட்டும் பொருட்டு நடத்தப்படுகின்ற விசாரணைகளின் முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of journalists who have been assassinated, abducted or assaulted so far since 2010;

(ii) names of those journalists; and

(iii) progress of the investigations that are being conducted to exercise justice in respect of the said journalists?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඝාතන - වාර්තා වී නැත.

පැහැර ගැනීම් - 01

පහරකෑම් - 08

(ii) පැහැර ගැනීම් - ප්‍රගීත් බණ්ඩාර එක්නැලිගොඩ

පහරදීම් - මහින්ද ආරියවංශ

- කුඹුරේ මුදුන්කොන් ගෙදර ධනුෂ්ක සම්පත් සෙනවිරත්න

- රෆයිඩීන් ෆාරුක් මොහොමඩ් සුහයිල්

- සුබ්‍රමනියම් බාස්කරන්

- දිවුල්දෙනිය විදාන රාලලාගේ චමිල ජනිත් කුමාර ඒකනායක

- මුදියන්සේලාගේ අසංක ක්‍රිශාන්ත බාලසූරිය

- සේරසිංහ මුදියන්සේලාගේ සිනේෂ් උපේන්ද්‍ර

- අලුල් ගෙදර ඉඳුනිල් සිසිර විජේනායක

(iii) පැහැර ගැනීම්

| | නම | සාධාරණය ඉටු කිරීම සඳහා පැවැත්වෙන විමර්ශනවල ප්‍රගතිය |
|---|---|---|
| 1 | ප්‍රගීත් බණ්ඩාර එක්නැලිගොඩ | ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩුව විභාග වෙමින් පවතී |

පහරදීම්

| | නම | සාධාරණය ඉටු කිරීම සඳහා පැවැත්වෙන විමර්ශනවල ප්‍රගතිය |
|---|---|---|
| 1 | මහින්ද ආරියවංශ | නඩුව විභාග වෙමින් පවතී. |
| 2 | කුඹුරේ මුදුන්කොන් ගෙදර ධනුෂ්ක සම්පත් සෙනවිරත්න | වෛද්‍ය වාර්තාවේ සුළු තුවාල බවට ලැබී ඇති බැවින් දෙපාර්ශ්වයම ගරු අධිකරණය මඟින් සමථ මූල මණ්ඩලය වෙත යොමු කර ඇත. |
| 3 | රෆයිඩීන් ෆාරුක් මොහොමඩ් සුහයිල් | සිද්ධියට අදාළ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන නුවරඑළිය ම/උ. නඩු අංක 17165/25 යටතේ ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. සැකකරුවන් රුපියල් ලක්ෂයක ශරීර ඇප දෙකක් යටතේ මුදා හැර ඇත. සෑම මසකම අවසන් ඉරුදින පෙර වරු 9.00ත් - 12.00ත් අතර පොලිස් ස්ථානයේ පෙනී සිටීමට නියෝග කර, 2025.11.20 දින දක්වා කල් තබා ඇත. |
| 4 | සුබ්‍රමනියම් බාස්කරන් | චෝදනා පත්‍ර ගොනු කිරීමට 2026.03.30 දක්වා කල් තබා ඇත. |
| 5 | දිවුල්දෙනිය විදාන රාලලාගේ චමිල ජනිත් කුමාර ඒකනායක | 2025.07.12වන දින ගරු අධිකරණය කරුණු වාර්තා කර ඇත. සාක්ෂි කැඳවා හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් පවත්වා ඇත. සමථ මණ්ඩලයට යොමු කර ඇති අතර, 2026.01.07වන දිනට නැවත කැඳවා ඇත. |
| 6 | මුදියන්සේලාගේ අසංක ක්‍රිශාන්ත බාලසූරිය | 2025.06.16 දින පැමිණිල්ලේ එකඟතාව මත වන්දි ගෙවීමකින් තොරව සමථ වී ඇත. |
| 7 | සේරසිංහ මුදියන්සේලාගේ සිනේෂ් උපේන්ද්‍ර | දිසා අධිකරණයේ විභාග වී තරයේ අවවාද කර නඩුව අවසන් කර ඇත. |
| 8 | අලුල් ගෙදර ඉඳුනිල් සිසිර විජේනායක | 2024.10.01 සැකකරුට රුපියල් 1,000ක දඩ නොගෙවන්නේ නම්, මාස 06ක් සිර දඬුවම් හා ඊට අමතරව මාස 06ක් බරපතළ වැඩ සහිත සිර දඬුවම් වසර 05කට අත්හිටුවා ඇත. |

(ආ) අදාළ නොවේ.

මම ඒ කිව්වේ, පහර කෑමට නැත්නම් පැහැර ගැනීමට ලක් වූ මාධ්‍යවේදීන්ගේ නම් සහ ඔවුන්ට අදාළව සිදු කරන ලද අධිකරණ ක්‍රියාවල ප්‍රගතිය පිළිබඳවයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ අය බොහෝ විට 2010 වාගේ කාලය තුළ ප්‍රවෘත්ති පත්‍ර ආයතනවල වැඩ කරපු ජනමාධ්‍යවේදීන් කියලා අපි දන්නවා. දැන් වසරක කාලයක් තිස්සේ YouTube channelsවල, සමාජ මාධ්‍යවල වැඩ කරන ජනමාධ්‍යවේදීන්ට නිතරම ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් කැඳවීම් ලැබෙනවා. ඒක තමයි, අලුත්ම ප්‍රවණතාව. ඔවුන් තමන්ගේ YouTube channelsවල, එහෙම නැත්නම් සමාජ මාධ්‍යවල යම් යම් කාරණා සම්බන්ධයෙන් -විශේෂයෙන්ම පලස්තීනය සම්බන්ධයෙන්-

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ප්‍රවෘත්ති පළ කළාම ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් ඔවුන්ව කැඳවලා පැය ගණන් තියාගෙන ඉඳලා ප්‍රශ්න කරනවා. මේ විධියට ප්‍රවෘත්ති පළ කරන්නේ ඇයි, පලස්තීනය සම්බන්ධයෙන් ප්‍රවෘත්ති පළ කරන්න මොකක්ද තිබෙන වුවමනාව කියලා දිගින් දිගටම ඔවුන්ට යම්කිසි ආකාරයේ පීඩනයක් එල්ල කරනවා.

මම දන්නේ නැහැ, ඔබතුමා මේ පිළිබඳව දැනුවත් ද කියලා. ඔබතුමා මේ පිළිබඳව දැනුවත් නම් ඒ පිළිබඳව ගන්නා වූ ක්‍රියාමාර්ග ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, බොහෝ ජනමාධ්‍යවේදීන් ත්‍රස්ත විමර්ශන ඒකකයට නිතර නිතර කැඳවනවා කියලා ඔබතුමා කිව්වාට ඒකට පිළිතුරු ලබා දෙන්න බැහැ. මෙන්න මේ මාධ්‍යවේදීන් මෙන්න මේ දිනවල කැඳවා තිබෙනවා කියලා ඔබතුමා මට කිව්වොත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයත් එක්ක කථා කරලා එක්කෝ මගේ පැත්තෙන්, එහෙම නැත්නම් පොලීසිය පැත්තෙන් උත්තර ලබා දෙන්න පුළුවන්. අනෙක, අපේ රජය කිසිම අවස්ථාවක පලස්තීනය හෝ වෙන විශේෂ කරුණක් කියලා TID එකට කැඳවා නැහැ. ඒක අතරේ සිදුවීම් කීපයක් ඇති. ඔබතුමා අහන ප්‍රශ්නයට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නිශ්චිත සිදුවීම කිව්වොත් පමණයි. එතකොට අපට පුළුවන්, ඇයි, එන්න කියලා කිව්වේ, විමර්ශනවල ප්‍රගතිය මොකක්ද, හොයා ගත්ත කරුණු මොනවාද, අත්අඩංගුවට අරගෙන තිබෙනවාද, වෙනත් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවාද කියලා මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න. එහෙම නැත්නම් මතයක් හැදෙනවා, බොහෝ මාධ්‍යවේදීන් නිතර නිතර කැඳවනවා කියලා. මම හිතන විධියට, එහෙම එකක් නැහැ. රටේ සාමාන්‍ය ජනතාව ඒ ගැන දන්නවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කලින් මේ කාරණය කියන්න අවශ්‍යයි. මොකද, ගරු ඇමතිතුමා කිව්වා, නිශ්චිත කරුණක් කියන්න කියලා. පලස්තීන තානාපති කාර්යාලයේ මාධ්‍ය අංශයේ වැඩ කරන ඒ තරුණයා ගෙදර ගියාම ඔහුගේ ප්‍රදේශයේ තිබෙන පොලීසියට කීප වතාවක්ම කැඳවලා ඔහුගෙන් සෘජුවම ප්‍රශ්න කරලා තිබෙනවා, ඇයි, සමාජ මාධ්‍යවල පලස්තීනය සම්බන්ධව ප්‍රචාරක කටයුතු සිදු කරන්නේ කියලා. ඔහු තානාපති කාර්යාලයේ මාධ්‍ය අංශයේ වැඩ කරන ප්‍රධානියා. ගරු ඇමතිතුමනි, ඔබතුමා නිශ්චිත වශයෙන් කරුණක් කියන්න කියලා කියපු හින්දා තමයි මම ඒ කාරණාව කිව්වේ. ඒ ප්‍රදේශයේ තිබෙන පොලිස් ස්ථානයට ඔහුව කීප වතාවක්ම කැඳවා ප්‍රශ්න කර තිබෙනවා. මම මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී මේ කාරණය මතු කළා, ගරු ඇමතිතුමනි. මේක ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. එක්කෝ, මේ ආයතනවල නිලධාරින්ගේ ආකල්ප පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

එක්කෝ, මේගොල්ලන් ඊශ්‍රායලයෙන් සල්ලි ගන්නවා. එක්කෝ, මොසාඩ් එක සල්ලි වියදම් කරනවා, මේ ආරක්ෂක අංශවල ඉන්න සමහර නිලධාරින්ට. ඔබතුමන්ලා දන්නේත් නැතුව ඇති. ඒකයි මම මේ කියන්නේ. මේ ගැන බලන්න, ඇයි, ඒ අය පලස්තීනය සම්බන්ධව වැඩ කරනකොට මේ ආරක්ෂක අංශයේ අය ඔවුන්ව එළවාගෙන ගිහිල්ලා ඒක නවත්වන්න මානසික පීඩනයක් එල්ල කරන්නේ කියන එක. මොකද, හැම එක්කෙනාවම කැඳවනවා. ඒකයි මම මේ කියන්නේ. ඔබතුමා අහපු නිශ්චිත කාරණාව ගැනයි මම මේ කිව්වේ.

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, පසුගිය කාලයේ ඔබතුමා වාරණයක් දැම්මා, ඔබතුමාගේ කැබිනට් මාධ්‍ය සාකච්ඡාවට එනවිට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ Identity Card එක නැතුව ඇතුළට එන එක නවත්වන්න කියලා. මම හිතන විධියට, ඊට කලින් එහෙම එකක් තිබුණේ නැහැ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පත නැති වුණත් මාධ්‍යවේදීන් ඇවිල්ලා, ඔබතුමා එක්ක කැබිනට් මාධ්‍ය සාකච්ඡාවට සහභාගි වුණා. මැතකදී එවැනි වාරණයක් දාලා තිබෙනවා, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ Identity Card එක නැතුව එන්න බැහැයි කියලා. ඒ සම්බන්ධව ඔබතුමා දරන මතය මොකක්ද? ඒ වාගේම ඒ සම්බන්ධව ලිහිල් ක්‍රියාමාර්ගයක් ගන්න බැරිද, සියලු මාධ්‍යවේදීන්ට එතැනට ඇවිල්ලා සහභාගි වෙලා ඔබතුමා එක්ක ඒ සාකච්ඡාව කරගෙන යන්න පුළුවන් වන විධියට?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නයේ දෙවන කාරණයට පිළිතුර තමයි, පලස්තීන තානාපති කාර්යාලයේ මාධ්‍ය අංශයේ වැඩ කරන කෙනෙක් එහෙම TID එකට කැඳෙව්වා කියලා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට හෝ ජනමාධ්‍ය අමාත්‍යාංශයට වාර්තා කරලා නැහැ කියන එක. සාමාන්‍යයෙන් ජනමාධ්‍යවේදියෙක් සම්බන්ධයෙන් එහෙම තොරතුරක් අපට වාර්තා වුණොත්, අපි ඒ ගැන සොයා බලනවා, මොකක්ද සිදුවීම කියලා. එවැනි දෙයක් ගැන මාගේ දැනුවත්භාවයක් නැහැ. පොලීසිය එක්ක සාකච්ඡා කරන්න ඕනෑ, මොකක්ද ප්‍රශ්නය කියන එක.

දෙවන අතුරු ප්‍රශ්නයෙන් ඔබතුමා ඇහුවේ, අපේ කැබිනට් මාධ්‍ය හමුවට එන මාධ්‍යවේදීන්ට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් මාධ්‍යවේදියෙකු ලෙස හඳුනා ගන්න නිකුත් කළ හැඳුනුම්පත තිබෙන්න ඕනෑ, ඒක තිබුණොත් තමයි ඒකට සහභාගි වෙන්න පුළුවන් වන්නේ කියන තීන්දුවට ආවා කියන එක ගැන.

ගරු කථානායකතුමනි, ඒක සාධාරණයි. එක් පැත්තකින් අපේ රටේ මාධ්‍යවේදීන් හැටියට කටයුතු කරන අය ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෙන්න කැමැත්තක් තිබෙනවා. ඒ සඳහා බොහෝ ඉල්ලුම්පත් ලැබී තිබෙනවා. අපි කඩිනමින් එම ලියාපදිංචිය කළා. මාධ්‍යවේදීන් හැටියට හැඳුනුම්පතක් තිබෙන අය එතැනට එන එකේ වටිනාකමක් තිබෙනවා, වැදගත්කමක් තිබෙනවා.

අනික් පැත්තෙන්, මාධ්‍යවේදී හැඳුනුම්පතක් නැති ඕනෑම කෙනෙකුට අනෙක් press conferences ඕනෑ එකකට යන්න පුළුවන්. කැබිනට් මාධ්‍ය හමුවට පමණයි Identity Card එක අරගෙන පෙන්වා එන්න කියලා අපි කිව්වේ. දැන් වෙනකොට කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ හැම දෙනාම Identity Card එක අරගෙන, ඒක පෙන්වා තමයි ඇතුළු වෙන්නේ. ඒ තීන්දුව ගන්න හේතු වුණු කාරණාවකුත් තිබුණා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට මතක ඇති, මාධ්‍යවේදීන් හැටියට පෙනී ඉඳිමින් පසුගිය කාලයේ සමහර අවස්ථාවල සමහර ඝාතනවලට උදවු කළ ආකාරය. කෙනෙක් අත්අඩංගුවටත් පත් වුණා. ඔහු එක්තරා මාධ්‍ය ආයතනයක් නියෝජනය කරමින් මාධ්‍ය සාකච්ඡා ගණනාවකට පැමිණ තිබුණා. ඔහුගේ history එක බැලුවාම ඔහු අපරාධ ගණනාවකට සම්බන්ධයි. ඒකත් මෙහිදී සැලකිල්ලට ගත්තා.

තුන්වැනි කාරණය, ඇත්තටම ජනමාධ්‍යවේදීන් හැටියට මාධ්‍යවේදී හැඳුනුම්පතක් ලබාගන්නා එක හොඳයි. මොකද, අපි

මුදල් අමාත්‍යාංශය එක්ක සාකච්ඡා කරමින් මාධ්‍යවේදීන් වෙනුවෙන් සලකා බලමින් ඉන්නවා, ඔවුන්ගේ මාධ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා සහනයක් ලබා දෙන්න. ඒ වාගේම, අපට දේශීය, විදේශීය පුහුණුවීම් ලැබෙමින් පවතිනවා. ඒ වාගේම, ශිෂ්‍යත්ව ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. නිශ්චිත මාධ්‍යවේදීන් ප්‍රමාණයක් හඳුනා ගත්තොත් තමයි ඒ අවස්ථා ලබා දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. එසේ හඳුනා ගැනීම සඳහාත් මේ මාධ්‍යවේදී හැඳුනුම්පත වැදගත්. මේ සියලු කාරණා නිසා හැම පැත්තෙන්ම මෙය වැදගත් කියා මම හිතනවා. ඔබතුමාටත් දැන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට හැඳුනුම්පතක් තිබෙනවා. වෛද්‍යවරුන්ටත් හැඳුනුම්පතක් තිබෙනවා, නීතිඥවරුන්ටත් හැඳුනුම්පතක් තිබෙනවා. මාධ්‍යවේදීන්ටත් එහෙම හැඳුනුම්පතක් තිබුණොත් හොඳයි. එහෙම නැතිව වැඩ කරන්න කැමැති අයට නිදහසේ එළියේ වැඩ කරන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් කරගන්න ඕනෑ නැහැ. දැන් බොහොම සාමකාමීව ඒ ජනමාධ්‍ය හමුව පැවැත්වෙනවා. ජනමාධ්‍යවේදීන් ඒ නීතියට ගරු කරමින් ජනමාධ්‍ය හැඳුනුම්පත අරගෙන තමයි එතැනට එන්නේ.

## පවුල් සෞඛ්‍ය සේවිකා තනතුර: පුරප්පාඩු
## குடும்ப சுகாதார உத்தியோகத்தர் பதவி: வெற்றிடங்கள்
## POST OF PUBLIC HEALTH MIDWIFE: VACANCIES

850/2025

**4. ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් පවුල් සෞඛ්‍ය සේවිකාවන් විශාල සේවයක් සිදු කරන බව පිළිගන්නේද;

(ii) මේ වනවිට පවුල් සෞඛ්‍ය සේවිකා තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට පියවර ගන්නේද;

(iv) පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் சுகாதாரத்துறைக்கு குடும்ப சுகாதார உத்தியோகத்தர்கள் பாரியளவில் சேவையாற்றுகின்றமையை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) இன்றளவில் குடும்ப சுகாதார உத்தியோகத்தர் பதவியில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iv) குடும்ப சுகாதார உத்தியோகத்தர்களுக்குத் தேவையான வசதிகளை மேம்படுத்துவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he acknowledges that Public Health Midwives provide a great service to the health sector in Sri Lanka;

(ii) the number of vacancies that exist in the post of Public Health Midwife at present;

(iii) whether steps will be taken to fill the said vacancies; and

(iv) the steps that will be taken to improve the facilities provided to the Public Health Midwives?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න කලින් ඒ ප්‍රශ්නයේ දෝෂයක් නිවැරදි කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අහලා තිබෙන්නේ, "ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් පවුල් සෞඛ්‍ය සේවිකාවන් විශාල සේවයක් සිදු කරන බව පිළිගන්නවාද, පවුල් සෞඛ්‍ය සේවිකා තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව, පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?" යනාදියයි. ගරු මන්ත්‍රීතුමියනි, මේ කියන PHMs - Public Health Midwivesලා - හඳුන්වන්නේ පවුල් සෞඛ්‍ය සේවිකාවන් හැටියට නොවෙයි, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් හැටියටයි. "පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී" කියන එක තමයි ඒගොල්ලන්ගේ තනතුරු නාමය. ඒ නිසා මම හිතනවා, අපේ රටේ සෞඛ්‍ය සේවාවට බිම් මට්ටමින් ක්ෂේත්‍රයේදී සහ රෝහල්වලදී විශාල සේවාවක් කරන ඒ අයට ගරුත්වයක් ලබා දීම සඳහාම "පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී" කියන නාමය අප හැම තැනකදීම භාවිත කරන එක හොඳයි කියලා. සමහර විට කාලයක් තිස්සේ ඒ නාමය පාවිච්චි කරලා තිබෙන නිසා එහෙම කියනවා වෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, එතුමිය අහපු එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්, පැහැදිලිවම.

අපේ රටේ විශේෂයෙන්ම පූර්ව ප්‍රසව - antenatal - සංරක්ෂණය, අන්තර් ප්‍රසව සංරක්ෂණය සහ පසු ප්‍රසව - postpartum - සංරක්ෂණය යන තේමාවන් තුළ ගුණාත්මක සේවාවක් සපයමින් මාතෘ හා ළමා සෞඛ්‍ය සංවර්ධනය මූලික කොට සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම වැනි විශාල සේවයක් සියලු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හරහා මේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සිදු කරනවා.

අපේ රටේ අද තිබෙන මාතෘ හා ළදරු සෞඛ්‍යයට අදාළව ගත් විට, රටක් හැටියට අපව අගය කිරීමට ලක් කරන විධියට, රටක් හැටියට අපට බොහොම අභිමානයෙන් ලෝකය ඉස්සරහට යන්න පුළුවන් වන විධියට මාතෘ හා ළදරු සෞඛ්‍ය පවත්වාගෙන යෑමේදී ඉතා විශාල කාර්යභාරයක් ඉටු කරන්නේ මේ කියන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්. Universal Health Coverage එකේ අපට තිබෙන score එක 67. එසේ score එක 67ක් ගන්න ලොකුම හේතුවක් වෙලා තිබෙනවා, අපේ රටේ

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් ක්ෂේත්‍රයේ සහ රෝහල්වල කරන කාර්යභාරය. ඒ නිසා අපි එය විශේෂ ඇගැයීමකට ලක් කරනවා.

(ii)

| | | |
|---|---|---|
| රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වල | - | 430 |
| පළාත් සභා යටතේ පවතින රෝහල් හා ආයතනවල | - | 2,183 |
| මුළු පුරප්පාඩු සංඛ්‍යාව | - | 2,613 |

(iii) ඔව්.

- මේ වන විට පවුල් සෞඛ්‍ය සේවා පුහුණු පාසල්වල පවුල් සෞඛ්‍ය සේවා අභ්‍යාසලාභීන් 1,110ක් පුහුණුව ලබන අතර, එම කණ්ඩායම 2026 මාර්තු වන විට පුහුණුව අවසන් කිරීමට නියමිතය. පුහුණුව අවසන් කිරීමෙන් පසු නව පත්වීම් ලබා දීම තුළින් පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

  පුහුණුව අවසන් කළාට පසුව ඒ අය සේවයට බඳවා ගන්න පුළුවන් වේවි කියලා අපි විශ්වාස කරනවා.

- එසේම තවත් 1,000ක කණ්ඩායමක් ඉදිරියේදී පුහුණුවට බඳවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

  ගරු මන්ත්‍රීතුමියනි, ඒ අනුව සාමාන්‍යයෙන් 2,100ක වාගේ ප්‍රමාණයක් බඳවා ගන්න අපට හැකි වේවි, ඊළඟ වසරේ 1,100කුත් තවත් වසර දෙකක්, දෙකහමාරක් ගියාට පසුව තවත් 1,000කුත් වශයෙන්. ඒ වාගේම පසුගිය මාර්තු මාසයේදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් 976දෙනෙකුට පත්වීම් ලබා දුන්නා. ඒක විශාල ප්‍රමාණයක්. ඒ අනුව තමයි මේ පුරප්පාඩු පුරවා ගෙන යන්නේ.

(iv)

1. වර්ෂ 2026 වන විට ක්ෂේත්‍ර නිලධාරිනියන් සඳහා යතුරුපැදි ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

   ඒ අයගෙන් බහුතරයක් ක්ෂේත්‍රයේ වැඩ කරන අයයි. පසුගිය කාලය පුරාම තිබුණු ලොකුම ගැටලුවක් තමයි එම නිලධාරිනියන් සඳහා යතුරු පැදි ලබා දීමේදී වෙච්ච අඩුපාඩුව. මීට වසර ගණනාවකට කලින් යතුරුපැදි ලබා දීමේදීත් රටේ දිස්ත්‍රික්ක දෙකකට ඒවා හරියාකාරව ලැබිලා තිබුණේ නැහැ.

   අපි මේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සඳහා යතුරු පැදි 2,250ක් ලබා දෙනවා. ලබන වසරේ අප්‍රේල් මාසය වන විට ඒවා ලබා දෙන්න අපට පුළුවන්කම ලැබෙයි. මේ තිබෙන අඩුපාඩුව සම්පූර්ණ කරලා ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු කරන සහ අපේ සෞඛ්‍ය සේවාවට විශාල කාර්යභාරයක් කරන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ ප්‍රවාහන ප්‍රශ්නයට සැලකිය යුතු විසඳුමක් ලබා දෙන්න එමඟින් පුළුවන්කමක් ලැබෙනවා.

2. විශේෂ රාජකාරි සඳහා රු.6,000ක දීමනාවක් ලබා දීමට කටයුතු සිදු කරනු ලබනවා.

3. නිල ඇඳුම් දීමනාව රු.5,000කින් වැඩි කරලා දැන් රුපියල් 28,000ක් ලබා දෙනවා. එය කලින් රුපියල් 23,000ක් ලෙසයි තිබුණේ. පසුගිය මැයි මාසයේ ඉඳලා රුපියල් 28,000ක් ලබා දෙනවා. සමස්තයක් හැටියට, රජයේ සේවකයන්ට ලබා දෙන පහසුකම්වලට අමතරව මේ අය වෙනුවෙන් මේ පහසුකම් ද ලබා දීලා තිබෙනවා. ඊටත් අමතරව ගත්තොත්, රාජ්‍ය සේවයේ පොදු වැටුප් වැඩිවීම ඒගොල්ලන්ටත් බලපානවා.

(ආ) පැන නොනඟී.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම ගෝලීය පියයුරු පිළිකා ගැන දැනුවත් කිරීම ඔක්තෝබර් මාසයේ සිද්ධ වෙනවා. මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් අද මේ පාර්ලිමේන්තුවේදී පවත්වනවා. අපේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් බිම් මට්ටමේ සිට විශාල සේවාවක් කරනවා, විශාල මෙහෙයුමක් කරනවා, විශේෂයෙන් පියයුරු පිළිකා හඳුනා ගැනීමට. අද උදේ ගරු කථානායකතුමාත් මේ සම්බන්ධයෙන් අපිත් එක්ක කථා කළා. විශේෂයෙන්ම midwivesලා මේ කාරණය සම්බන්ධයෙන් ලොකු සේවයක් කරනවා. මෙවැනි දිනයක ඒ අය සම්බන්ධයෙන් කථා කිරීම පිණිස ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇසීම සඳහා මට අවස්ථාවක් ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා.

මේ ප්‍රශ්නය ඇසීමට මූලික හේතුවක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. පසුගිය කාලයේ - මට මතක විධියට අගෝස්තු මාසයේ - අපේ ගරු විපක්ෂ නායකතුමා මෙන්ම ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහපු අවස්ථාවේ ඔබතුමා සඳහන් කළා, අපේ රටේ උපත් අනුපාතය පහත වැටීම නිසා සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකටම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් අවශ්‍ය නොවන බවට.

ඉතින්, ඔබතුමාගේ මේ ප්‍රකාශයෙන් පසුව විශේෂයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ මෙන්ම දිස්ත්‍රික්ක ගණනාවක පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් මට කථා කරලා කිව්වා, මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කරන්න කියලා. ඔබතුමා අද සඳහන් කළ ආකාරයට ලොකු සේවයක් මේ midwivesලාගෙන් සිදු වෙනවා. පූර්ව ප්‍රසව ප්‍රතිකාර සහ ප්‍රසව කටයුතුවලට අමතරව විශාල සේවාවක් ඒ අයගෙන් සිදු වෙනවා. ඉතින් මම සන්තෝෂ වෙනවා, අද ඔබතුමාගේ පිළිතුරෙන් ඒ සම්බන්ධයෙන් කථා කිරීම ගැන. ඇත්තටම මගේ ප්‍රශ්නය වූයේ මේකයි. අපේ ගරු විපක්ෂ නායකතුමාත් ඒ අයගේ කාර්යාල ප්‍රශ්නය ඔබතුමාගෙන් ඇසුවා. Midwivesලාට කාර්යාලයක් පවත්වා ගෙන යන්න අවශ්‍යයි. ඒ සඳහා ලැබෙන දීමනාව ඉතාම අඩු මට්ටමක තිබෙන්නේ. රුපියල් 500ක් වැනි දීමනාවක් තමයි මේ අයට කාර්යාල පවත්වා ගෙන යන්නට ලැබෙන්නේ.

ඒ වාගේම midwivesලාට ලිපිද්‍රව්‍ය ලබා දෙන්නට අවශ්‍යයි, තොරතුරු දත්ත ගබඩා කිරීමට. අද වෙනකම් ඔවුන්ට මේ කිසිම දෙයක් ලැබිලා නැති බව තමයි අප දැනුවත් කරලා තිබෙන්නේ. මේ කාරණයට ඉදිරි අය වැයේදී ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා. ඒ යතුරුපැදි ලබා දීම වෙනුවෙන් ඇත්ත වශයෙන් ගොඩක් සන්තෝෂ වෙනවා.

ස්තුතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

බොහොම ස්තුතියි කිරිඇල්ල මන්ත්‍රීතුමිය, ඒ ප්‍රශ්නය ඒ විධියටම යොමු කළාට. මොකද දන්නවාද? ප්‍රශ්නයක් ඇහුවාම, ඒ ප්‍රශ්නයට තමයි උත්තරය ලබා දෙන්නේ. කවුරු හරි ඇහුවොත් ග්‍රාම නිලධාරි වසමකටම එක්කෙනෙක් ඕනෑද කියලා, මට කියන්න තිබෙන්නේ මේකයි.

දැනුත් ග්‍රාම නිලධාරි වසමකටම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් නැහැ. ග්‍රාම නිලධාරි වසම් තුනකට, හතරකට එක්කෙනෙක් තමයි ඉන්නේ. ඉතින් දැන් මේ වෙලාවේ ග්‍රාම නිලධාරි වසමකට එක්කෙනෙක් පත්කරන්න පුළුවන්ද කියලා ඇහුවොත්, මේ වෙලාවේ එහෙම කරන්න බැහැ. ඒ පුරප්පාඩු පුරවමින්, ඒ අය රෝහල්වලටත් යොමු කරමින් තමයි ක්ෂේත්‍රයට යොමු කරන්නත් තිබෙන්නේ. ග්‍රාම නිලධාරි වසම් හතරක් ආවරණ කරන කෙනෙකුට, තුනක් ආවරණ කරන කෙනෙකුට ඒවා දෙකක් දක්වා අඩු කරලා, ඒ ක්‍රමයට කටයුතු කරනවා මිස ඔය කියන විධියට කටයුතු කරන්න බැහැ. ඒ නිසා කවුරු හරි මගෙන් ඇහුවොත්, ග්‍රාම නිලධාරි වසමකට එක්කෙනෙක් ගණනේ මේ වෙලාවේ දෙන්න පුළුවන්ද කියලා, ඒක මේ වෙලාවේ කරන්න බැහැ. ඒ අය සාමාන්‍යයෙන් මේ වෙනකොට ගර්භිණී මාතාවන් 35ක්, 50ක් අතර ප්‍රමාණයක් රැක බලා ගනිමින් සෞඛ්‍ය සේවා සපයමින් ඉන්නවා. අපට ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් තිබෙනවා, ඒ අය දැන් රැක බලා ගන්නා ප්‍රමාණය යම් ප්‍රමාණයකට නිශ්චිත කරලා, ඒකට අවශ්‍ය පහසුකම් ලබා දීලා උපරිම සෞඛ්‍ය සේවාවක් ලබා දෙන්න.

ඇත්තටම ඒ වෙලාවේ ප්‍රශ්නය අහපු විධියට තමයි උත්තර ලබා දුන්නේ. අනෙක් පැත්තෙන් මම තව කරුණක් හැටියට කිව්වේ මොකක්ද? අපේ රටේ පසුගිය වසර 10ක් විතර තිස්සේ සංඛ්‍යාලේඛන අරගෙන බැලුවාම උපත් ප්‍රමාණය අඩු වෙලා තිබෙන බව පේනවා.

ඒක නිශ්චිත කරුණක්, සත්‍ය කරුණක්. ඒ කාරණාව එක පැත්තකින් තිබෙනවා. නමුත් ඒකෙන් අදහස් කරන්නේ නැහැ, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් බඳවා ගැනීම අඩු කරනවා කියලා. මම දැක්කා, ඒ කථාව කිව්වාට පස්සේ ඒ වාක්‍යයේ කොටස් අරගෙන මාධ්‍යවල දමලා තිබුණා. නමුත් අප කා තුළත් ඒ අගය කිරීම තිබෙනවා. මොකද, මේ ලංකාවේ කොහේ ගිහිල්ලා බැලුවත් කන්දේද, ලන්දේද කියලා නැහැ, ඕනෑ වෙලාවක ගමේ ඈත කෙළවරට වුණත් පයින් ගිහිල්ලා වැඩ කරන රාජ්‍ය නිලධාරින් පිරිසක් තමයි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් කියන්නේ. ඒ නිසා ඒ අයට ඒ නිසි ගරුත්වය දෙන අතරේ, අපි ක්‍රමානුකූලව ඒ පාසල් දියුණු කරමින්, ඔවුන් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා වැඩි කරමින්, පුහුණුව වැඩි කරමින්, බඳවා ගැනීමට කටයුතු කරගෙන යනවා. ඔබතුමිය ඒ ප්‍රශ්නය ඇහුවාට බොහොම ස්තුතියි. අපි බලමු, ආර්ථිකය වර්ධනය වන ප්‍රමාණය අනුව ඒ අයට ලබා දෙන්න පුළුවන් උපරිම පහසුකම් ප්‍රමාණය ලබා දෙන්න.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු විපක්ෂ නායකතුමා අහනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු අමාත්‍යතුමනි, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් - Public Health Midwivesලා - කරන සේවාව මාතෘ සෞඛ්‍යයට වාගේම, ළමා සෞඛ්‍යයටත් ඉතා වැදගත් වෙනවා. ළමා සෞඛ්‍යය ගැන කථා කරනකොට, මම කැමැතියි වැදගත් කාරණාවක් පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න. කොළඹ මහානාම විද්‍යාලයේ ඉගෙන ගන්නා ළමයි තුන්දෙනෙක්, එම විද්‍යාලයේ ස්ථාන භාර ප්‍රධාන ආරක්ෂක නිලධාරියා විසින් පසුගිය ඔක්තෝබර් 4 වැනි සෙනසුරාදා බරපතළ ලෙස ලිංගික අපයෝජනයට ලක් කර තිබෙනවා. දැන ගන්නට තිබෙන ආකාරයට, විදුහල්පතිවරයාවත්, අදාළ ආචාර්යවරුන්වත් අපයෝජනයට ලක් වුණු ඒ දරුවන් තිදෙනා පිළිබඳ පැහැදිලි පියවරක් අරගෙන නැහැ. දන්නා විධියට වෛද්‍යවරුන් වෙත යොමු කරලාත් නැහැ. ඒ වාගේම ඒ ආරක්ෂක ආයතනය සම්බන්ධව හෝ ඒ අපයෝජනය සිදු කළ පාපතරයා සම්බන්ධව පියවරක් ගන්නට කටයුතු කරලාත් නැහැ. ගුරුවරුන් දෙපළක් පමණ විදුහල්පතිවරයාගේ අවධානයට එය යොමු කරන්න හදපු වෙලාවේ විදුහල්පතිවරයා තර්ජනය කර තිබෙනවා කියලා වාර්තා වෙනවා. ඒ වාගේම මේවා පැමිණිලි කරන්න ගියාම, දරුවන් උසාවි ගානේ ගෙනයන්න වෙයි, අවුරුදු ගණනාවක් ගතවෙයි කියලා දෙමව්පියන් බිය වැද්දීමකුත් සිද්ධ වෙලා තිබෙනවා. ඒ කාරණාව කොච්චර උත්සන්න වෙලා තිබෙනවාද කිව්වොත්, පාසල ඉදිරිපිට උද්ඝෝෂණයක් පවත්වන්නට කැඳවීමක් තිබෙනවා.

මම මේ කාරණාව ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ, විශේෂයෙන්ම මේ කාරණාව පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා එම අපයෝජනයට ලක් වුණාය කියන දරුවන් තුන්දෙනාට නිසි ආරක්ෂාව, රැකවරණය, ශක්තිය, උපදේශනය ලබා දීම සඳහායි. ගරු ඇමතිතුමනි, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඔබතුමා යටතේ නොවෙයි තිබෙන්නේ කියලා මම දන්නවා. නමුත්, මේ සංවේදී කාරණාව පිළිබඳ වගකීම තිබෙන්නේ කාටද කියන එක ගැන සොයා බලන්නේ නැතුව, අමාත්‍යාංශ ඒකාබද්ධ වෙලා හෝ යම් කිසි පියවරක් අරගෙන, මේ අපයෝජනයට ලක් වුණු දරුවන්ට ලබා දිය යුතු ආරක්ෂාව, රැකවරණය, උපදේශනය වාගේම, වෛද්‍ය ප්‍රතිකාර සිදු වෙනවාද නැද්ද, ඒ වාගේම මේ ක්‍රියාවට මුල් වූ පාපතරයාට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නවාද, එසේ නොකරන්නට යම් යම් අය බලපෑම් කරනවාද යන කාරණා පිළිබඳව සොයා බලන්න. ගරු ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය ක්ෂණිකවම අහන ප්‍රශ්නයක් නිසා, ඔබතුමාට මේ මොහොතේම උත්තර දෙන්න බැරි වුණත්, මම අසාධාරණව හිතන්නේ නැහැ. කරුණු සොයා බලා මේ පාර්ලිමේන්තුවට ඒ ගැන ප්‍රකාශයක් කරන්න. මොකද, මේක ඉතාම සංවේදී කාරණාවක්. ඒ වාගේම බරපතළ කාරණාවක්. විශේෂයෙන්ම අපි ළදරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව කථා කරන මොහොතක, මේ ළදරුවන්ට එම පාපතරයා කරපු විනාශය; මේ ඛේදනීය සිද්ධිය පිළිබඳව ගත හැකි උපරිම පියවර ගන්න කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේ ඔබතුමාට යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, දරුවන්ට එරෙහිව සිදු වන ශාරීරික, මානසික කවර හෝ හිංසනයකට එරෙහිව මේ රජය දැඩිව කටයුතු කරනවා. ඒවාට නීති මඟින් කටයුතු කරනවා පමණක් නොවෙයි, ඒ දරුවන් ආරක්ෂා කර ගන්නට අවශ්‍ය කරන අන්තර් අමාත්‍යාංශයීය කටයුතු සිදු කරනවා. මේ සඳහා අමාත්‍යාංශ කිහිපයක් සම්බන්ධ වෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය වාගේ අමාත්‍යාංශ නිරන්තරයෙන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. නීති ශක්තිමත් කරමින්, විශේෂයෙන්ම සමහර ගතානුගතික සහ ආචීර්ණ කල්පික මතවාද නිසා දරුවන්ට සිදු වන හිංසනයන්ගෙන්

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

ඒ දරුවන් බේරා ගන්නටත් නව රජය හැටියට අපි කටයුතු කරමින් සිටිනවා. ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඒ සඳහා අවශ්‍ය කරන සහාය ලබා දෙයි කියලා මම හිතනවා.

ගරු විපක්ෂ නායකතුමනි, මේ නිශ්චිත කරුණ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත් වෙලා තිබෙනවා. ඒ විමර්ශන කටයුතු ආරම්භ වෙලා තිබෙනවා. පොලීසිය පැත්තෙන් මේකට මැදිහත්වීමක් කරමින් ඉන්නවා. මම මේ ගැන තවත් කරුණු අද කැබිනට් මාධ්‍ය හමුවේදීත් කථා කරන්නම්. මෙවැනි කවර හෝ සිදුවීමක් අපි සුළු කොට තකන්නේ නැහැ.

ඒ වෙනුවෙන් ගත හැකි ක්‍රියාමාර්ග සියල්ලම අපි ගන්නවා. මොකද, මේ සිදුවීම්වලට අපි දක්වන ප්‍රතිචාරයන් - reactions - තුළින් තමයි තවත් මෙවැනි සිදුවීම් සිදු වන එක වළක්වාගන්න පුළුවන්කම ලැබෙන්නේ. විශේෂයෙන්ම මෙවැනි සිදුවීම් වාර්තාකරණයේදී දරුවන් යළි යළිත් පීඩාවට පත් කරන්නේ නැතිව, අගතියට පත් කරන්නේ නැතිව වාර්තා කිරීම පිළිබඳව මාධ්‍යයටත් වගකීමක් තිබෙනවා කියලා ජනමාධ්‍ය ඇමතිවරයා හැටියට මම මේ වෙලාවේ කියනවා. මොකද, එවැනි එක සිදුවීමක් ඔබතුමාට මතක ඇති. ඒ තමයි, අනුරාධපුර ශික්ෂණ රෝහලේ වෛද්‍යවරියකට අදාළව වුණු සිද්ධිය. එම සිද්ධියේදී, කාලයකට පස්සේ අපේ රටේ මාධ්‍ය විසින් වින්දිතයා තවත් පීඩාවට පත් නොවන ආකාරයට එය වාර්තා කළා. මේ දරුවන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදීත් ඒ ආකාරයටම සැලකිලිමත් වෙන්න කියා ජනමාධ්‍ය ඇමතිවරයා හැටියට මම මේ වෙලාවේ ඉල්ලා සිටින්න කැමැතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම කාරණාව සම්බන්ධයෙන් සොයා බලයි, ගරු විපක්ෂ නායකතුමනි. ඔබතුමා අසුන් ගන්න.

ප්‍රශ්න අංක 5 -1009/2025- (1), ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் இந்த வினாவைக் கேட்கின்றேன்.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -1160/2025- (1), ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -1174/2025- (1), ගරු සුනිල් රත්නසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## අම්පාර දිස්ත්‍රික්කයේ වී අලෙවි මණ්ඩලයේ ගබඩා: විස්තර
### அம்பாறை மாவட்டத்திலுள்ள நெல் சந்தைப்படுத்தல் சபையின் களஞ்சியசாலைகள்: விபரம்
### WAREHOUSES OF PADDY MARKETING BOARD IN AMPARA DISTRICT: DETAILS

1211/2025

**8. ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) 2024 සහ 2025 වර්ෂවල යල කන්නයේ අම්පාර දිස්ත්‍රික්කයේ මුළු වී අස්වැන්න සහ එම අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති වී අලෙවි මණ්ඩලයේ ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් ගබඩාවේ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (iii)හි සඳහන් වී ගබඩා අතරින් වී වියළන යන්ත්‍ර සවිකර ඇති ගබඩා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்திலுள்ள வயற்காணிகளின் மொத்த அளவு யாது என்பதையும்;

(ii) 2024 மற்றும் 2025ஆம் ஆண்டுகளில் சிறுபோகத் தின்போது அம்பாறை மாவட்டத்தின் மொத்த நெல் அறுவடையின் அளவு மற்றும் அவ்வறு வடையில் நெல் சந்தைப்படுத்தல் சபையால் கொள்வனவு செய்யப்பட்ட நெல்லின் அளவு வெவ்வேறாக யாது என்பதையும்;

(iii) அம்பாறை மாவட்டத்திலுள்ள நெல் சந்தைப் படுத்தல் சபைக்குச் சொந்தமான களஞ்சிய சாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அந்த ஒவ்வொரு களஞ்சியசாலையினதும் முகவரி வெவ்வேறாக யாது என்பதையும்;

(v) மேலே (iii)இல் குறிப்பிடப்பட்டுள்ள நெல் களஞ்சியசாலைகளுள், நெல் உலர்த்தும் இயந்திரம் பொறுத்தப்பட்டுள்ள களஞ்சிய சாலைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the total area of the paddy lands located in the Ampara District;

(ii) the total amount of the paddy harvest in the Ampara District in the Yala Season of the years 2024 and 2025 and the amount purchased by the Paddy Marketing Board, out of the said harvest separately;

(iii) the number of warehouses belonging to the Paddy Marketing Board in the Ampara District;

(iv) the address of each of the said warehouses, separately; and

(v) the number of warehouses that are equipped with paddy dryer machines, out of those referred to in (iii) above?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) හෙක්ටෙයාර 98,531.3769

(ii)

| කන්නය | අම්පාර දිස්ත්‍රික්කයේ මුළු වී අස්වැන්න (මෙ.ටො) | වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වී ප්‍රමාණයන් (මෙ.ටො.) |
|---|---|---|
| 2024 යල | 232,709 | 119.6 |
| 2025 යල | 265,774 | 23,660 |

අම්පාර දිස්ත්‍රික්කයේ 2024 යල කන්නයේ වී මෙට්‍රික් ටොන් 232,709ක අස්වැන්නක් තිබුණා. 2025 යල කන්නයේ මෙට්‍රික් ටොන් 265,774ක අස්වැන්නක් තිබුණා. ඒ අනුව, 2024 යල කන්නයට සාපේක්ෂව 2025 යල කන්නයේ මෙට්‍රික් ටොන් 33,000ක වැඩිවීමක් තිබෙනවා.

මිලදී ගෙන ඇති වී ප්‍රමාණය ගත්තොත්, 2024 යල කන්නයේ වී කිලෝග්‍රෑම් 119,600ක් තමයි රජයේ ගබඩාවලට අම්පාර ගොවි ජනතාව විසින් ලබා දී තිබෙන්නේ. 2025 යල කන්නයේ වී කිලෝග්‍රෑම් 23,660,000ක ප්‍රමාණයක් අම්පාරේ ගබඩාවලට ගොවි ජනතාව විසින් ලබා දීලා තිබෙනවා.

(iii) ගබඩා 28යි.

(iv)

| ගබඩා ගණන | ගබඩා | පිහිටීම | |
|---|---|---|---|
| | | ග්‍රාම නිලධාරි වසම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 1 | අඩ්ඩාලච්චේන | මීනෝඩුකට්ටු | අඩ්ඩාලච්චේන |
| 2 | නෙල්ලිකැලේ | වීරපිටිය | දමන |
| 3 | තම්බට්ටේ | තම්බට්ටේ 01 | තිරුක්කෝවිල් |
| 4 | පොතුවිල් 1 | ඒත්තම | පොතුවිල් |
| 5 | පොතුවිල් 2 | | |
| 6 | මහඔය 1 | සමගිපුර 69 | මහඔය |
| 7 | මහඔය 2 | | |
| 8 | අම්පාර 1 | තිස්සපුර | අම්පාර |
| 9 | අම්පාර 2 | | |
| 10 | කෝමාරිය 1 | තිස්සපුර බටහිර | උහන |
| 11 | කෝමාරිය 2 | | |
| 12 | සමන්තුරේ 01 | මලයාඩිගම 02 | සමන්තුරේ |
| 13 | සමන්තුරේ 02 | | |
| 14 | ගොනාගොල්ල | මියාදුන්න | උහන |
| 15 | නින්දවූර් 1 | නින්දවූර් 22 | නින්දවූර් |
| 16 | නින්දවූර් 2 | | |
| 17 | අක්කරපත්තුව 1 | සින්නමුගතුවාරම් | අලයාඩිවේම්බු |
| 18 | පාලමකඳවූර 1 | පාලම්කඳවූර | උහන |
| 19 | පාලම්කඳවූර 2 | | |
| 20 | කොහොඹාන 1 | වැරන්කැටගොඩ | |
| 21 | කොහොඹාන 2 | | |
| 22 | වීරගොඩ 01 | වීරගොඩ | |
| 23 | වීරගොඩ 02 | | |
| 24 | කුමාරිගම | තිස්සපුර බටහිර | |
| 25 | ඉඟිණියාගල | ඉඟිණියාගල | මඩුල්ල |
| 26 | දමන 1 | පැරනිගම | අම්පාර |
| 27 | දමන 2 | | |
| 28 | අක්කරපත්තුව 2 (අබලන්) | පල්ලිකුඩියුරුප්පු | අක්කරපත්තුව |

(v) ගබඩාවල වී වියළන යන්ත්‍ර සවි කර නැත.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

(ආ) ගරු මන්ත්‍රීතුමනි, අපි වී ගබඩා භාර ගන්නකොට එම ගබඩා වහලා තිබුණේ. වී මිලදී ගැනීම් නතර කරලා තිබුණේ. එම ගබඩා අලි කඩලා, වවුලන් සහ පරවියෝ ලැගලා තිබුණේ. ගොයම් කැපුවාට පසුව තමයි ගොවියාට අස්වැන්න එන්නේ. ඒ අස්වැන්න තමයි රජයේ ගබඩාවලට හෝ අනෙකුත් තැන්වලට වී විධියට ගොවි ජනතාව ගෙනැවිත් දෙන්නේ. ගොයම් කැපුවාට පසුව ඒ කුඹුරු අපි හඳුන්වන්නේ ඉපනැල්ල කියලා; වෙල් ඉපනැල්ල. ඒ වෙල් ඉපනැල්ලට අම්බරුවෝ එනවා. අම්බරුවෝ ඇවිල්ලා ඉපනැල්ල උළා කනවා; පොළොව පැදෙන කල්ම උළා කනවා. අන්න ඒ අම්බරුවෝ වෙල් ඉපනැල්ල උළා කනවා වාගේ, ඒ වී ගබඩා උළා කාලා තිබුණේ. වී මෝල්වල තිබුණු යන්ත්‍ර ටික යකඩවලට කපාගෙන ගිහින් තිබුණේ. බිම් තරාදි යකඩවලට ගලවාගෙන ගිහින් තිබුණේ. අපි ඒවා ප්‍රතිසංස්කරණය කරමින් මේ වනකොට සියලු කටයුතු යථා තත්ත්වයට පත් කරමින් සිටිනවා. ඉදිරියේදී අපි වී වියළන යන්ත්‍රත් හැකිතාක් ප්‍රමාණයක් සවි කිරීම සඳහා මේ වනකොට සැලසුම් කරගෙන යනවා.

ගරු මන්ත්‍රීතුමනි, එය තමයි පිළිතුර.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நன்றி! எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன். அம்பாறை மாவட்டத்திலுள்ள நெல் சந்தைப்படுத்தல் சபையின் நெற் களஞ்சியசாலைகள் 30 வருட கால யுத்த சூழ்நிலையால் அழிக்கப்பட்டு இருக்கின்றன. அதுமாத்திரமல்ல, அவை அமைந்துள்ள காணிகள்கூட பராமரிக்கப்படாத நிலை காணப்படுகின்றது. அதனை நீங்கள் சிறந்த முறையில் பயன்படுத்த வேண்டும் என்பதற்காகத்தான் நான் இந்த வினாவை முன்வைக்கின்றேன்.

அம்பாறை மாவட்டத்தில் 28 நெற்களஞ்சியசாலைகள் இருப்பதாக நீங்கள் கூறினீர்கள். அந்த 28 நெற்களஞ்சிய சாலைகளில் ஆசியா கண்டத்தில் 4ஆவது இடத்தில் இருந்த பெரிய அரிசி ஆலை ஒன்றும் இருக்கிறது. அந்த நேரம் அது சம்மாந்துறை பிரதேச செயலாளர் பிரிவில் இருந்தது. இப்போது அது நாவிதன்வெளி பிரதேச செயலாளர் பிரிவுக்கு உட்பட்டு இருக்கின்றது. நாவிதன்வெளி பிரதேச செயலாளர் பிரிவில் 56 ஏக்கர் அரச காணியில் பெரியளவிலான அரிசி ஆலையாக அது உருவாக்கப்பட்டு இருக்கிறது. அது எமது மாவட்டத்துக்கு மாத்திரமல்ல, தேசிய மட்டத்திலும் பொருளாதார வளர்ச்சிக்குப் பங்களிப்புச் செய்திருக்கிறது. யுத்த சூழ்நிலை காரணமாக அது சிதைவடைந்து இருக்கிறது. பொதுத் தேவைகளுக்கும் மக்களுக்கும் அந்தக் காணியின் சில பகுதிகள் பகிர்ந்தளிக்கப்பட்டு இருக்கின்றன. மிகுதியாக இருக்கின்ற காணியிலாவது அதனை மீளவும் அமைப்பதற்கு நடவடிக்கை எடுப்பீர்களா? மேற்குறித்த 28 நெற்களஞ்சிய சாலைகளின் பட்டியலில் சவளக்கடை அரிசியாலையும் இருக்கின்றதா? எனக் கேட்க விரும்புகின்றேன்.

මම අහන්නේ, චවලකඩෙ ප්‍රදේශයේ තිබුණු ලොකු වී ගබඩාවක් ගැන.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, අම්පාර දිස්ත්‍රික්කයේ වී ගබඩා 28ක් තිබෙනවා. ඒ වී ගබඩා 28න් 27කට මේ යල කන්නයේදී ගොවි ජනතාව වී ගෙනැවිත් දුන්නා. ඒ අනුව ඔබතුමා ඔය කියන වී ගබඩාව පිළිබඳවත් තොරතුරු තිබෙනවා. මේ වෙනකොට බොහෝ ගබඩා ප්‍රමාණයක් තාවකාලිකව ප්‍රතිසංස්කරණය කරලා තිබෙනවා. සමහර ගබඩා තිබෙනවා, තාවකාලික ප්‍රතිසංස්කරණවලින් එහාට ගිහින් ස්ථිර ප්‍රතිසංස්කරණ කටයුතුවලට භාජන කරන්න ඕනෑ කර තිබෙන. ඒ අනුව ඔබතුමා ඔය කියපු කාරණය පිළිබඳව අපි විශේෂ අවධානය යොමු කරනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கிறேன்.

அம்பாறை மாவட்டத்திலுள்ள நெற்களஞ்சியசாலைகளுக்கு நெல் உலர்த்தும் இயந்திரங்களை வழங்க வேண்டுமென்ற கோரிக்கையை நான் முன்வைக்கின்றேன். ஏனென்றால், எமது மாவட்டத்தில் அடிக்கடி வெள்ள நிலைமை ஏற்படுகின்றது. நீங்களும் எமது மாவட்டத்துக்கு வருகை தந்து, அங்கு ஏற்பட்ட வெள்ள நிலைமையை நேரடியாகப் பார்வையிட்டு இருக் கிறீர்கள். எங்களுடைய விவசாயிகளின் நெல்லை உலர்த்திக் கொடுப்பதற்கென எதிர்வரும் 2026ஆம் ஆண்டுக்குரிய Budgetஇலாவது விசேட நிதி ஒதுக்கீட்டை மேற்கொண்டு, அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற நெற்களஞ் சியசாலைகளுக்கு நெல் உலர்த்தும் இயந்திரங்களை வழங் குவதற்கு நடவடிக்கை எடுப்பீர்களா? எனக் கேட்கின்றேன்.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, දැනටත් අපි ඇත්තටම මුහුණ දෙන ගැටලුවක් තමයි, අපට කමතට ගිහින්, ගොවියා ළඟට ගිහින් වී මිලදී ගැනීමේ හැකියාවක් නොමැතිවීම. ඊට හේතු විධියට අදාළ වාහන නොමැතිවීම තිබෙනවා. ඊටත් වඩා තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, තෙත වී ලබා ගැනීමට අදාළ ප්‍රතිපාදන රජය සතුව නොමැතිවීම. අපි සියයට 14 දක්වා තෙත බර ඉවත් කළ වී ගන්න ඕනෑ. ඒ තත්ත්වයට වී පත් කිරීමට නම් ඊට අවශ්‍ය තාක්ෂණික මෙවලම් සම්පූර්ණ කරලා අදාළ යටිතල පහසුකම් සම්පූර්ණ කරන්න ඕනෑ. අපි ඒකට ප්‍රවේශයක් විධියට මේ වෙනකොටත් පුවත් පත් දැන්වීමක් පළ කර තිබෙනවා. විශේෂයෙන්ම ලබන කන්නය වෙනකොට ස්ථාන කිහිපයක වී වියළන යන්ත්‍ර සවි කරලා ඒ ක්‍රියාවලිය ඉස්සරයට අරගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කය කියන්නේ, ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයෙන් සියයට 20කට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන දැවැන්තම දිස්ත්‍රික්කය. ඒ කියන්නේ, රටට බත සරිකරන ප්‍රධානම දිස්ත්‍රික්කය තමයි අම්පාර දිස්ත්‍රික්කය. ඒ පිළිබඳව අපට ගෞරවයක් තිබෙනවා. ඒ සියලු තත්ත්වයන් සැලකිල්ලට ගෙන, ඔබතුමා යෝජනා කරන විධියට අම්පාර දිස්ත්‍රික්කය තුළත් පවතින තත්ත්වය මත මෙම ක්‍රියාවලිය ඉදිරියේදී ක්‍රියාවට නඟමු කියන කාරණාව මේ වෙලාවේ මම මතක් කරනවා.

## විකල්ප මාර්ග කිලෝමීටර 100,000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන: කළුතර දිස්ත්‍රික්කය
100,000 கிலோமீற்றர் மாற்று வீதிகளை அபிவிருத்தி செய்யும் வேலைத்திட்டம்: களுத்துறை மாவட்டம்
PROGRAMME TO DEVELOP 100,000 KILOMETRES OF ALTERNATIVE ROADS: KALUTARA DISTRICT

1283/2025

**9.** ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විකල්ප මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට ඇතුළත් කර ඇති කළුතර දිස්ත්‍රික්කයේ මාර්ග කවරේද;

(ii) ඒ අතරින් මේ වන විට සංවර්ධන කටයුතු අවසන් කර ඇති මාර්ග සහ අවසන් කර නොමැති මාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් මාර්ගය වෙනුවෙන් වැය කර ඇති මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් මාර්ගයේ සංවර්ධන කටයුතුවල ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) සංවර්ධන කටයුතු අවසන් කර නොමැති මාර්ගවල වැඩ කටයුතු අවසන් නොකිරීමට හේතු කවරේද;

(ii) එම මාර්ග සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම මාර්ගවල නඩත්තු කටයුතු නිසි පරිදි සිදු කරන්නේද;

(v) ඉහත වැඩසටහන වෙනුවෙන් වෙනත් ආයතනවලට පවරා ගන්නා ලද මාර්ග, නැවත අදාළ ආයතන වෙත පවරා දී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஓரிலட்சம் கிலோமீற்றர் மாற்று வீதிகளை அபிவிருத்தி செய்யும் வேலைத்திட்டத்தில் உள்வாங்கப்பட்டிருக்கும் களுத்துறை மாவட்டத்திலுள்ள வீதிகள் யாவை என்பதையும்;

(ii) அவற்றுள் இன்றளவில் அபிவிருத்திப் பணிகள் நிறைவு செய்யப்பட்டுள்ள மற்றும் நிறைவு செய்யப்படாத வீதிகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) அத்தகைய வீதி ஒவ்வொன்றுக்குமெனச் செலவிடப்பட்டுள்ள மொத்தச் செலவுத் தொகை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அத்தகைய வீதி ஒவ்வொன்றினதும் அபிவிருத்திப் பணிகளின் முன்னேற்றம் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அபிவிருத்திப் பணிகள் நிறைவு செய்யப்படாத வீதிகளின் நிர்மாணப் பணிகள் நிறைவு செய்யப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) அத்தகைய வீதிகள் தொடர்பாக எடுக்கவிருக்கும் அடுத்தகட்ட நடவடிக்கைகள் தீர்மானிக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், அந்த நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) அத்தகைய வீதிகளின் பராமரிப்பு நடவடிக்கைகள் முறையாக மேற்கொள்ளப்படுகின்றனவா என்பதையும்;

(v) மேற்படி வேலைத்திட்டத்துக்காக வேறு நிறுவனங்களுக்குக் கையகப்படுத்தப்பட்ட வீதிகள் மீண்டும் சம்பந்தப்பட்ட நிறுவனங்களுக்கு ஒப்படைக்கப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the roads in the Kalutara District which are included in the programme to develop 100,000 kilometres of alternative roads;

(ii) the roads where development works have been completed and those that remain incomplete at present, out of those, separately;

(iii) the total cost incurred for each road, separately; and

(iv) the progress of development works of each road, separately?

(b) Will he also inform this House -

(i) the reasons for the incompletion of development works of the said roads;

(ii) whether a decision has been made on the future measures that will be taken regarding such roads;

(iii) if so, such measures;

(iv) whether maintenance of those roads are duly carried out; and

(v) whether the roads taken over by other institutions for the above-mentioned programme have been handed back to the relevant institutions?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (වැඩබලන ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - பதில் போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Acting Minister of Transport, Highways and Urban Development)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට මාර්ග 405ක් යෝජනා වී ඇති අතර ඉන් මාර්ග 06ක් අවලංගු වී මාර්ග 399ක් ඇතුළත් කර තිබී ඇත. එම මාර්ග ලැයිස්තුව ඇමුණුම 01හි දක්වා ඇත.

[ගරු ප්‍රසන්න ගුණසේන මහතා]

(ii) කළුතර දිස්ත්‍රික්කයේ කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට ඇතුළත් කර ඇති මාර්ග අතරින්,

(1). සංවර්ධනය කර අවසන් මාර්ග සංඛ්‍යාව 201කි. මාර්ග ලැයිස්තුව ඇමුණුම 02හි දක්වා ඇත.

(2). එම වැඩසටහනට ඇතුළත් කර තිබූ නමුත් සංවර්ධනය කර අවසන් නොකළ මාර්ග සංඛ්‍යාව 198කි. මාර්ග ලැයිස්තුව ඇමුණුම 03හි දක්වා ඇත.

(iii) එම මාර්ග සංවර්ධනය සඳහා වැය කර ඇති පිරිවැය වෙන් වෙන් වශයෙන් ඇමුණුම් 02හි හා 03හි දක්වා ඇත.

(iv) එම මාර්ග සංවර්ධන කටයුතුවල ප්‍රගතිය ඇමුණුම 02හි හා 03හි වෙන් වෙන් වශයෙන් දක්වා ඇත.

(ආ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සංවර්ධන කටයුතු ආරම්භ කළ ද පහත හේතු මත මාර්ග 198ක වැඩ අවසන් කිරීමට නොහැකි විය.

(1). 2021-2022 වර්ෂ තුළ පැවති කොවිඩ් අර්බුදය හේතුවෙන් මෙම සංවර්ධන කටයුතු නතර වීම.

(2). අමුද්‍රව්‍ය සහ ඉන්ධන හිඟය.

(3). රට තුළ 2021-2022 වර්ෂ තුළ පැවති ආර්ථික අර්බුද තත්ත්වය මත මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කළ "රාජ්‍ය වියදම් පාලනය කිරීම" මැයෙන් වූ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022හි 03 ඡේදය අනුව ව්‍යාපෘති කටයුතු තාවකාලිකව නතර කිරීමට ලබා දී තිබූ උපදෙස් පරිදි මෙම සංවර්ධන වැඩසටහන් නතර කිරීම.

චක්‍රලේඛයෙහි පිටපතක් ඇමුණුම 04 වශයෙන් දක්වා ඇත.

ඇමුණුම් 01, 02, 03 සහ 04 **සභාගත*** කරමි.

(ii) තීරණය කර තිබේ.

(iii) කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ වැඩ ආරම්භ කර ඇතත්, සංවර්ධන කටයුතු නිම කර නොමැති මාර්ග නැවත සංවර්ධනය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය කොපමණදැයි තක්සේරු කරමින් පවතී.

ඉන් පසු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත එම යෝජනාව යොමු කර අවශ්‍ය ප්‍රතිපාදන 2026 වර්ෂයේ සිට අමතර ප්‍රතිපාදන ලෙස වාර්ෂිකව කොටස් වශයෙන් ලබාගෙන ඉදිරියේදී මෙම මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

(iv) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මෙම ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කරන ලද මාර්ගවල නඩත්තු කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරනු ලැබේ. අනෙකුත් මාර්ග නඩත්තු කිරීම එම මාර්ග අයත් පළාත් පාලන ආයතනය හෝ පළාත් සභාවට අයත් කාර්යයකි.

(v) මෙම වැඩසටහන සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත තාවකාලිකව පවරා ගන්නා ලද මාර්ග ආපසු භාර ගන්නා ලෙස අදාළ පළාත් සභා හා පළාත් පාලන ආයතන වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර, මේ වන විට ඉන් බොහොමයක් මාර්ග අදාළ ආයතන විසින් ලිඛිතව භාර ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු විධියට මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කළුතර දිස්ත්‍රික්කයේ මේ වන විට සාදා නිම කර නැති මාර්ග සංඛ්‍යාව 198ක් වෙනවා. නමුත් මාර්ග සංවර්ධන අධිකාරිය මට දැනුම් දී තිබෙනවා, ඒ ප්‍රමාණය 203ක් කියලා. ගරු ඇමතිතුමනි, කොහොම වුණත් ඒ යටතේ පානදුර 04ක්, කළුතර 25ක්, බණ්ඩාරගම 04ක්, හොරණ 40ක්, බේරුවල 14ක්, මතුගම 10ක්, බුලත්සිංහල 12ක් වශයෙන් තිබෙනවා. මෙහි විශේෂත්වය වන්නේ අගලවත්ත ප්‍රදේශයේ සාදා නිම කර නැති මාර්ග සංඛ්‍යාව 94ක් වීමයි.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල පවතින මාර්ගවල සංවර්ධන කටයුතු තමයි මෙසේ අතරමඟ නතර කර තිබෙන්නේ. ඒ අතරින් භාගෙට හදා තිබෙන මාර්ගත් තිබෙනවා. ඒවායේ දැනටත් ගමන් කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා, එම සංවර්ධන ව්‍යාපෘතියේම ඛේදවාචකයක් විධියට. ගරු ඇමතිතුමනි, අපේ ආණ්ඩුවෙන් දැන් ක්‍රියාත්මක කරනවා, "පුනරුදයට මඟ" කියා ඉතා හොඳ ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක්. මම අහන්න කැමැතියි, දැනට අතරමඟ වැඩ නතර වී තිබෙන මාර්ගවල කටයුතු එම ව්‍යාපෘතිය යටතේ අපට ප්‍රමුඛ කරගන්න හැකියාවක් පවතිනවාද කියලා.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු කථානායකතුමනි, මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන අවුරුදු ගණනකට කලින් පටන් ගත්තේ. මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන කිව්වාට, ලංකාවේම තිබෙන්නේ මාර්ග 119,382ක් වාගේ ප්‍රමාණයක්. ඒ අනුව හැමෝටම තේරුම් යනවා, මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන කියන්නේ තනිකරම දේශපාලන ඉලක්කමක් අල්ලාගෙන පටන් ගත් වැඩක්, සම්පූර්ණයෙන්ම කඳ හරහා ඇනපු programme එකක් බව. ඒක සාර්ථක වුණේ නැහැ. හැබැයි, අතරමඟ වැඩ නවත්වා තිබෙන ව්‍යාපෘති නැවත පටන් ගන්න අවශ්‍ය නිසාත්, අවුරුදු ගණනාවක් තිස්සේ ග්‍රාමීය ප්‍රදේශවල තිබෙන මාර්ග සංවර්ධනය නොවුණු නිසාත්, මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ නොපවතින ග්‍රාමීය මාර්ග සංවර්ධනය කරන්න අවශ්‍ය නිසාත් අපේ රජය බලයට පත් වුණාට පසුව "පුනරුදයට මඟ" කියන වැඩසටහන පටන් ගත්තා. එම වැඩසටහන යටතේ අපි මේ වෙනකොට රුපියල් මිලියන 50ට වඩා අඩුවෙන් වැය වන පාරවල් 159ක වැඩ පටන් ගෙන තිබෙනවා. ඉදිරියේදී තවත් මාර්ග 262කට කොන්ත්‍රාත් award කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ කියන්නේ ඉදිරි මාස 2 ඇතුළත මේ මාර්ග 159ට අමතරව තව 262කට කොන්ත්‍රාත් පිරිනමන්න තිබෙනවා. ඒ අනුව ඒ වැඩ ටිකත් ඉදිරි කාලය ඇතුළත පටන් ගන්නවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඊට අමතරව මෙමඟින් අපි බලාපොරොත්තු වෙනවා, අතරමඟ නැවතිලා තිබෙන පාරවල සංවර්ධන කටයුතු වැඩි ප්‍රමාණයක් ඉවර කරන්න. නමුත් ඒක එක අවුරුද්දකින් අවසන් කළ හැකි දෙයක් නොවෙයි. මොකද, හදන්න පටන් ගත්ත පාරවල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපි ඉදිරි කාලය තුළ මේ "පුනරුදයට මඟ" කියන වැඩසටහන හරහා ග්‍රාමීය පාරවල් ටික ක්‍රමක්‍රමයෙන් සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ ව්‍යාපෘති සියල්ල ආරම්භ කළේ ණය ලබාගෙනයි. ඒ ණය වර්තමානයේදී ගෙවාගෙන යනවාද කියන එකත් ඔබතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමා, ණයක් ගත්තාට පස්සේ ඒක නොගෙවා ඉන්න බැහැ. එම නිසා ඒ ණය ගෙවන්න ඕනෑ. ඒ වාගේම අපි මේ කටයුතුත් අනිවාර්යයෙන්ම කරගෙන යනවා. ඊට අමතරව කිව යුතු කාරණයක් තිබෙනවා. මේ ණය ප්‍රතිපාදන සියල්ලක්ම අරගෙන තිබෙන්නේ පාරවල් ඉදිකරන්න. අපේ රජයේ අය වැයෙන් ප්‍රධාන මාතෘකා 4ක් යටතේ පාරවල් සංවර්ධනය කිරීම සඳහා මුදල් වෙන් වෙනවා. ඒ අතුරින් එක programme එකක් තමයි, "Widening and Improvement" කියන එක. ඒ යටතේ projects 83ක් මේ අවුරුද්දේ පටන් ගන්න තිබුණා. මේ වෙනකොට අපි projects 20කට කොන්ත්‍රාත් පිරිනමලා ඒ වැඩකටයුතු පටන් ගෙන තිබෙනවා. ඊට අමතරව 42ක් ප්‍රසම්පාදන - procurement - කටයුතුවල තිබෙනවා. ඒ වාගේම NPD approvals සඳහා තව කිහිපයක් ඉතුරුවෙලා තිබෙනවා. ඉදිරි මාසය ඇතුළත අපට පුළුවන් වෙනවා, ව්‍යාපෘති 23ක් සඳහා කොන්ත්‍රාත් පිරිනමන්න. ඒ ව්‍යාපෘති 23 වැඩ කටයුතුත් ඉදිරි කාලය තුළ පටන් ගන්නවා. ඒ වාගේම මම කලින් කිව්වා වාගේ, "පුනරුදයට මඟ" කියන වැඩසටහන යටතේ පාරවල් 262ක වැඩ කටයුතු පටන් ගන්නවා.

ඊළඟට, "Weak Bridges" කියලා programme එකක් තිබෙනවා. ඒ යටතේ පාලම් 27ක් මේ අවුරුද්දේ ඉදිකරන්න ලැහැස්ති කරලා තිබුණා. මේ වනකොට එයින් 19කට කොන්ත්‍රාත් පිරිනමලා තිබෙනවා. තව 7ක් ප්‍රසම්පාදන කටයුතුවල තිබෙනවා. එකක්, estimate කළ යුතුව තිබෙනවා. ඉදිරි මාස දෙක තුළ ඒ කටයුතුත් අවසන් වුණාම එම පාලම් 27 සඳහාත් කොන්ත්‍රාත් පිරිනමන්න අපට හැකියාව ලැබෙනවා. ඒ වාගේම "'Rapid Overlay" කියලා රුපියල් බිලියන අටහමාරක් වියදම් කරපු surfacing කරන වැඩක් තිබෙනවා. ඒක කිලෝමීටර 225ක්. ඒ කටයුතුත් ඉදිරි මාස දෙක ඇතුළත ඉවර කරනවා. අවුරුදු ගණනක් තිස්සේ අපේ රටේ මාර්ග සංවර්ධනයක් සිදු වුණේ නැහැ. පාරට කොන්ක්‍රීට් තාච්චියක්, තාර තාච්චියක් දා ගන්න බැරි තත්ත්වයක් තමයි තිබුණේ. මේ පිරිනමන කොන්ත්‍රාත් ප්‍රමාණයත් එක්ක ඉදිරි මාස දෙකතුන ඇතුළත මේ රට අනිවාර්යයෙන්ම සම්පූර්ණ වැඩ බිමක් බවට පත් වෙනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කිව යුතුයි. අපි සාමාන්‍යයෙන් ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් කරනවා, කොච්චර ප්‍රමාණයක් වියදම් වෙනවාද කියලා බලන්න. ගරු කථානායකතුමනි, මේ දවස්වල කොන්ත්‍රාත් පිරිනැමෙන්නේ ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 24ක්, සියයට 30ක් අඩුවෙන්. එතකොට අපි පාරවල් ඉදිකිරීම සඳහා වෙන් කරන ලද මුදලෙන් බලාපොරොත්තු වෙච්ච ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් මේ අවුරුද්දේ ඉතුරු වෙනවා. ඒ නිසා අපි ලබන අවුරුද්දේත් continue වන විධියට දිස්ත්‍රික්ක වශයෙන් පාරවල් හදන්න පටන් ගන්නවා. මේ විධියට මූල්‍ය කළමනාකරණය සහිතව, කොමිස් නැති නිසා ඉතුරු වන මුදලුත් ග්‍රාමීය පාරවල් සංවර්ධනය කිරීමට දෙන්න පුළුවන් වන ආකාරයට වැඩකටයුතු ටික කරගෙන යනවා. ඒක තමයි ඔබතුමා අහපු අතුරු ප්‍රශ්නයට උත්තරය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## බේරේ වැව: ජල දූෂණය
## பேர வாவி: நீர் மாசடைதல்
## BEIRA LAKE: WATER POLLUTION

738/2025

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය දිනවල කොළඹ, බේරේ වැවේ මත්ස්‍යයන් මිය යාමේ සිද්ධියක් වාර්තා වූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද විශේෂඥ කමිටු වාර්තාවේ සඳහන් කරුණු කවරේද;

(iii) බේරේ වැවේ පමණක් නොව ශ්‍රී ලංකාවේ බොහෝ ජලාශවල ජලය අතිශය දූෂිත වී ඇති බැවින්, එම තත්ත්වය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த நாட்களில் கொழும்பு, பேர வாவியில் மீன்கள் இறந்த சம்பவம் தொடர்பாக அறிவாரா என்பதையும்;

(ii) அது தொடர்பாக ஆராய்வதற்காக நியமிக்கப்பட்ட நிபுணர் குழுவின் அறிக்கையில் குறிப்பிடப்பட்டுள்ள விடயங்கள் யாவை என்பதையும்;

(iii) பேர வாவி மாத்திரமன்றி, இலங்கையிலுள்ள பல நீர்த்தேக்கங்களிலுள்ள நீர் பாரியளவில் மாசடைந்துள்ளமையால் அந்நிலைமையைக் கட்டுப்படுத்த மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he is aware that an incident of fish death was reported recently in the Beira Lake in Colombo;

(ii) the findings in the report of the expert committee appointed to investigate the said incident; and

(iii) since the water not only in the Beira Lake but also in many other reservoirs in Sri Lanka has become extremely polluted, the steps that will be taken to control this situation?

(b) If not, why?

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කොළඹ බේරේ වැවේ මත්ස්‍යයන් මිය යෑමේ සිද්ධියක් වාර්තා වී නොමැත. එහෙත් බේරේ වැවෙහි ගංගාරාම සීමා මාලකය අසල පිහිටි දූපතෙහි සිටි තාරාවුන් මිය යෑමේ සිද්ධියක් 2025 ජනවාරි මාසයේදී වාර්තා වී ඇත.

(ii) ඉහත (අ) (i) පිළිතුර අනුව තාරාවුන් මිය යෑම පිළිබඳව පරීක්ෂණ කටයුතු කොළඹ මහ නගර සභාව විසින් සිදු කරන ලද අතර එම පරීක්ෂණ වාර්තාව මෙම අමාත්‍යාංශය සතුව නොමැත.

(iii) ශ්‍රී ලංකාවේ ජලාශවල භාරකාරත්වය විවිධ ආයතන සතු වන අතර, එම ආයතනවලට අදාළව පවතින නීති රාමු තුළ අදාළ ආයතන ක්‍රියා කරනු ඇත.

බේරේ වැව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ කාර්යභාරය ඇමුණුමෙහි** සවිස්තරව දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

**** * පුස්තකාලයේ තබා ඇත.***
** * நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

## කටුපොල් වගාව : විස්තර
## செம்பனை பயிர்ச்செய்கை: விபரம்
## CULTIVATION OF OIL PALM : DETAILS

1160/2025

**6. ගරු ගයාන් ජනක මහතා (ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා වෙනුවට)**
(மாண்புமிகு கயான் ஜனக - மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம சார்பாக)
(The Hon. Gayan Janaka on behalf of the Hon. (Prof.) L.M. Abeywickrama)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කටුපොල් වගාව හා කටුපොල් බීජ ආනයනය කිරීම මේ වනවිට නීතියෙන් තහනම් කර තිබේද;

(ii) ශ්‍රී ලංකාවට කටුපොල් තෙල් ආනයනය කිරීම සඳහා වර්ෂයකට වැය කරනු ලබන මුදල කොපමණද;

(iii) කටුපොල් වගාව නැවත ආරම්භ කිරීම සඳහා පවතින බාධා කවරේද;

(iv) කටුපොල් වගාව සහ පාම් තෙල් නිෂ්පාදනය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) செம்பனை (முள்ளுத் தேங்காய்) பயிர்ச்செய்கை மற்றும் செம்பனை விதை இறக்குமதி ஆகியன தற்பொழுது சட்டத்தால் தடை செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இலங்கைக்குச் செம்பனை எண்ணெய் இறக்குமதி செய்வதற்காக வருடமொன்றுக்குச் செலவு செய்யப்படும் தொகை எவ்வளவு என்பதையும்;

(iii) செம்பனைப் பயிர்ச்செய்கையை மீள ஆரம்பிப்பதில் நிலவும் தடைகள் யாவை என்பதையும்;

(iv) செம்பனைப் பயிர்ச்செய்கை மற்றும் பாம் எண்ணெய் உற்பத்தி தொடர்பிலான அரசாங்கத்தின் கொள்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether the cultivation of oil palm and the import of oil palm seeds are currently prohibited by law;

(ii) the amount of money spent annually on importing palm oil into Sri Lanka;

(iii) the obstacles of resuming oil palm cultivation in Sri Lanka; and

(iv) the policy of the Government on oil palm cultivation and palm oil production?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකාවේ කටුපොල් වගාව අංක 2222/13 සහ 2021.04.05 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් තහනම් කර ඇත. ඒ අනුව බීජ ආනයනය සඳහා ද කිසිදු වගාකරුවෙකු විසින් ඉල්ලීම් යොමු කර නොමැත.

(ii) අංක 2312/77 සහ 2023.01.01 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ශුද්ධ නොකළ පාම් තෙල් සහ ලීටර් 210 හෝ ඊට අඩු ප්‍රමාණයන්ගෙන් අසුරා ආනයනය කරනු ලබන පාම් තෙල් ආනයනය තහනම් කර ඇත. කෙසේ වුවද කාමර උෂ්ණත්වයේ ඇති පාම් තෙල් අනුක්‍රමික කොටස් (පාම් ස්ටියරින්), ශුද්ධ නොකළ පාම් ඔලේන් සඳහා ආනයන බලපත්‍ර යටතේ ආනයනය කිරීමට අවසර ලබා දී ඇත.

ඒ අනුව, පොල් සංවර්ධන අධිකාරියේ Monthly Bulletin - (December 2024) හි ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාව පාම් ඔලේන් - palm olein, ශුද්ධ නොකළ පාම් ඔලේන් - crude palm olein, පාම් කර්නල් - palm kernel, පාම් ස්ටියරින් - palm stearin - වැනි විවිධාකාර පාම් තෙල් ආනයනය සඳහා 2023 වසරේදී රුපියල් මිලියන 8,067.31ක් ද, 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 11,079.66ක් ද වැය කර ඇත.

(iii) කටුපොල් වගාව තහනම් කර ප්‍රසිද්ධ කරන ලද අංක 2222/13 සහ 2021.04.05 දිනැති අතිවිශේෂ ගැසට් නියෝගය අහෝසි කිරීමට මෙතෙක් පියවර නොගැනීම මෙහි ප්‍රධාන බාධාව වේ.

(iv) ප්‍රාදේශීය වැවිලි සමාගම් කළමනාකරණය කරන ඉඩම්වල සීමාසහිතව කටුපොල් වගාව සඳහා අවසර ලබා දීමට පූර්වගාමී අමාත්‍ය මණ්ඩලය විසින් අංක අමප/24/1947/601/084-1 සහ 2024.09.13 දිනැතිව ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය නැවත සලකා බලන ලෙස 2024.09.30 දිනැති අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, කමිටුවක් පත් කිරීමට ලබා දී තිබූ උපදෙස් පරිදි පත් කළ කමිටුව විසින් සකස් කළ නව වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට නියමිතව ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -1174/2025- (1), ගරු සුනිල් රත්නසිරි මහතා.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### මන්නාරමේ ක්‍රියාත්මක වූ වියළි කලාප නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය
### மன்னாரில் நடைமுறைப்படுத்தப்பட்ட உலர் வலய நகர நீர் மற்றும் கழிவகற்றல் திட்டம்
### DRY ZONE URBAN WATER AND SANITATION PROJECT IMPLEMENTED IN MANNAR

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2) இன் கீழ் சுற்றாடல் அமைச்சர் மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

இலங்கையின் வடக்கு மாகாணத்தின் பெரு நிலப்பரப்பாகவுள்ள மன்னார் மாவட்டத்தின் மன்னார் நகரமானது, அதன் பௌதிக வரலாறு, கல்வி, சுற்றுலா மற்றும் பொருளாதார வளம் என்பவற்றால் முக்கியத்துவம் வாய்ந்ததாகும். இது 163,096 மக்கள் தொகையையும், பல கல்வி நிறுவனங்கள், மாவட்டச் செயலகம், நீதிமன்றம், மாவட்ட வைத்தியசாலை, நகர சபை, பிரதேச சபைகள் எனப் பல நிறுவனக் கட்டமைப்புகளையும் கொண்டதாகும். மேலும், கடல்வள அதிகரிப்பு, வர்த்தக நடவடிக்கைகள், நெற்செய்கை மற்றும் கால்நடை வளர்ப்பு எனத் தொழிற்றுறை ரீதியாக வளர்ச்சி கண்டுவரும் நகரமாக மன்னார் பெருநகரம் விளங்குகின்றது.

இந்நகரப்பகுதி மற்றும் இந்த மாவட்டத்தில் வாழும் மக்களின் நலன்கருதி, அரசினால் மக்களுக்காக மேற்கொள்ளப்படும் குடிநீர் வழங்கல் மற்றும் சுகாதாரப் பிரச்சினைகளைத் தீர்ப்பதற்குப் புதிய நீர் சுத்திகரிப்பு நிலையங்கள், கழிவுநீர் தரமேற்றல் போன்றவற்றில் அக்கறைகொண்டு ஆசிய அபிவிருத்தி வங்கி 69 மில்லியன் ரூபாய் வழங்க, நகர சபையும் 8 மில்லியன் ரூபாய் செலவிட்டு, மொத்தமாக 77 மில்லியன் ரூபாய் செலவில் மன்னார் பகுதியில் 'உலர் வலய நகர நீர் மற்றும் கழிவுநீர்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

முகாமைத்துவத்தை மேம்படுத்தும் திட்டம்' - Dry Zone Urban Water and Sanitation Project தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையால் செயற்படுத்தப்பட்டது.

மக்களின் தேவை மற்றும் விலங்கினங்களுக்கு ஏற்படக்கூடிய பாதிப்புகள், சூழலை மேம்படுத்துவதற்கான நிலைபேறான வழிகள் என்பன ஆய்வு செய்யப்பட்டு, 2012ஆம் ஆண்டு தொடங்கப்பட்ட இத்திட்டம் 2015ஆம் ஆண்டு மார்ச் 30ஆம் திகதி மன்னார் நகர சபைக்குக் கையளிக்கப்பட்டு, 2016ஆம் ஆண்டுவரை சீராக இயங்கி வந்தது. மன்னார் மலக்கழிவகற்றல் சுத்திகரிப்பு நிலையத் திட்டத்தைத் தொடங்குவதற்கு முன்பு விரிவான ஆரம்ப சுற்றுச்சூழல் ஆய்வு - Initial Environmental Examination - மேற்கொள்ளப்பட்டது. இத்திட்டத்திற்காகப் பல இடங்கள் பரிசீலனைக்கு உட்படுத்தப்பட்டு, பின்னர் மாந்தை மேற்குப் பிரதேச சபைக்குட்பட்ட மளிகைத்திடல் கிராம அதிகாரி பிரிவில் குறித்த திட்டத்திற்கான இடம் தெரிவு செய்யப்பட்டது. மாவட்டச் செயலாளரின் அனுமதியுடன் இத்திட்டத்திற்காகத் தெரிவுசெய்யப்பட்ட நிலப்பகுதியை பிரதேச செயலாளர் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைக்கு ஒப்படைத்தார்.

இதன் ஆரம்பச் சுற்றுச்சூழல் அறிக்கை 2012ஆம் ஆண்டிலிருந்து பொதுமக்கள் பார்வைக்குக் கிடைக்கக்கூடியதாக ஏற்பாடு செய்யப்பட்டுள்ளது. இவ்வாய்வானது இத்திட்டத்தால் ஏற்படும் சுற்றுச்சூழல் பாதிப்புக்களை மதிப்பீடுசெய்து, அவற்றைக் குறைப்பதற்கான பரிந்துரைகளையும் வழங்கியது. மேலும், பாதிப்புத் தடுப்பு நடவடிக்கைகளை நடைமுறைப்படுத்துதல் மற்றும் கண்காணிப்பதற்கான சுற்றுச்சூழல் முகாமைத்துவத் திட்டம் - Environmental Management Plan - என்பன இதில் அடங்கியுள்ளது. இத்திட்டத்துக்கான மாற்றுவழிகள் பின்வரும் 3 பிரிவுகளின்கீழ் ஆய்வு செய்யப்பட்டன:

01. கழிவுநீர் அகற்றும் மாற்று முறைகள்

02. தேர்ந்தெடுக்கப்பட்ட முறையின் கீழுள்ள மாற்று தொழில்நுட்பங்கள்

03. மாற்று இடங்கள்

கௌரவ சபாநாயகர் அவர்களே, முழுமையான மதிப்பீட்டின் பின்னர் நீர்த்தாங்கி அடிப்படையிலான உயிரியல் சுத்திகரிப்பு முறை - pond-based biological treatment of septage - மிகப் பொருத்தமான தொழில்நுட்ப வாய்ப்பாகத் தேர்வு செய்யப்பட்டது.

இந்த அடிப்படையில் இத்திட்டத்தின் முன்னேற்றங்கள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றபொழுது, 2016 பெப்ருவரி 25ஆம் திகதி ஏற்படுத்தப்பட்ட கட்டளை ஒன்றின்மூலம், 1937ஆம் ஆண்டின் 02ஆம் இலக்க, தாவர, விலங்கினப் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் பிரிவு 2(1)இன்கீழ், மன்னார் மாவட்டத்தில் அமைந்துள்ள 29,180 ஹெக்டயர் பரப்பளவுகொண்ட நிலப்பகுதி, 'விடத்தல்தீவு பாதுகாக்கப்பட்ட பிரதேசம்' - Wedithalathivu Nature Reserve - என 2016 மார்ச் 01ஆம் திகதிய 1956/13ஆம் இலக்க அதிவிசேட வர்த்தமானியில் அறிவித்தல் வெளியிடப்பட்டது. குறித்த சுத்திகரிப்பு நிலையம் நிறைவுற்றுச் செயற்பாட்டுக்கு வந்த பின்னரே இந்த வர்த்தமானி அறிவித்தல் வெளியிடப்பட்டது. 2023 ஒக்ரோபர் 03ஆம் திகதி Environmental Foundation Limited என்ற அமைப்பானது, இலங்கை மேன்முறையீட்டு நீதிமன்றத்தில் ஒரு மனுவைத் தாக்கல் செய்தது. அதில்,

1. குறித்த இடத்தில் குப்பை மற்றும் கழிவுநீரைச் சேகரிப்பதைத் தடுக்க, தடையீட்டெழுத்தாணை பிறப்பித்தல்;

2. குறித்த கழிவுநீர் சுத்திகரிப்பு நிலையம் செயற்படுவதைத் தடுக்க, தடையீட்டெழுத்தாணை பிறப்பித்தல்;

3. அந்த இடத்தில் குப்பை மற்றும் கழிவுநீர் சேகரிப்பதை உடனடியாகத் தடுக்க, ஓர் இடைக்காலத் தடைக் கட்டளை பிறப்பித்தல்;

4. குறித்த கழிவுநீர் சுத்திகரிப்பு நிலையம் செயற்படுவதை உடனடியாகத் தடுக்க ஓர் இடைக்காலத் தடைக் கட்டளை பிறப்பித்தல்

ஆகிய கோரிக்கைகள் உட்படப் பல நிவாரணங்கள் கோரப்பட்டன.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ලබා දී ඇති ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය පමණක් කියවන්න.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த அடிப்படையில் பின்வரும் வினாக்களை நான் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கிறேன்.

01. சிறப்பான நீர் சுத்திகரிப்பு, சுகாதார மேம்பாட்டுத் திட்டம் என்ன அடிப்படையில், எந்த உள்நோக்கம் கொண்டு இடைநிறுத்தப்பட்டுள்ளது?

02. இத்திட்டத்தின் நன்மைகளை மன்னார் நகர மக்கள் அனுபவிக்க முடியாமல் தடுத்தவர்களின் நோக்கம் என்ன?

03. இச்சுகாதாரத் திட்டம் மீண்டும் வேகமாக சிறப்பாகச் செயற்பட கௌரவ அமைச்சர் அவர்கள் எடுக்கும் நடவடிக்கை பற்றி தெளிவுபடுத்த முடியுமா?

04. இத்திட்டத்தைத் தடுத்து நிறுத்தியவர்களின் நோக்கத்தை மீறி, அமைச்சு மேற்கொண்டுள்ள நடவடிக்கைகள் என்ன என்பதைத் தெளிவுபடுத்த முடியுமா?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයේ අපහැදිලිතාවක් තිබෙනවා; පටලැවිල්ලක් තිබෙනවා. මේකට උත්තරයක් නොදීත් බැහැ. නමුත් සම්පූර්ණ උත්තරයක් දෙන්නත් බැහැ. ගරු මන්ත්‍රීතුමාට මම උත්තරයක් දෙන්නම්. අපි බලමු, සම්පූර්ණ උත්තරයක් කොහොමද ගන්නේ කියලා.

ගරු කථානායකතුමනි, Dry Zone Urban Water and Sanitation Project එක ආසියානු සංවර්ධන බැංකුව විසින්

ක්‍රියාත්මක කරපු ව්‍යාපෘතියක්. එය ණය ආධාර යටතේ 2012 වසරේ ආරම්භ කරලා 2016 වසරේදී අවසන් කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ මන්නාරම ප්‍රදේශයේ ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇත. ඒ යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ගෘහස්ථ පූතික ටැංකිවලින් - septic tanksවලින් - ඉවත් කරන ඝන අපද්‍රව්‍ය පිරිපහදු කිරීම සඳහා ඝන මීටර් 28ක පවිත්‍රාගාරයක් ඉදිකර එයට අදාළ ගලි රථ සමඟ 2015 වසරේදී නගර සභාව වෙත භාර දී ඇත.

මීට අමතරව, පොදු වැසිකිළි පද්ධතිය ඉදිකර ඒවාද නඩත්තුව සඳහා නගර සභාව වෙත භාරදී ඇත. 2025.10.21 අපි විමසීමක් කළා, නගර සභාවෙන්. මේ පද්ධතියන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳ මන්නාරම නගර සභාවෙන් විමසන ලදුව, මේ වන විට ඉහත අපජල පවිත්‍රාගාරය හා පොදු වැසිකිළි පද්ධතීන් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත දැනුම් දීලා තිබෙනවා.

ඊළඟට, මෙම ව්‍යාපෘතියට, ඒ කියන්නේ Dry Zone Urban Water and Sanitation Project එකට අදාළ කාර්යයන් ඉටු කර එයට අදාළ ණය සීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කරලා තිබෙනවා. ඒ අනුව ඉහත ව්‍යාපෘතිය කිසිවෙකුගේ බාධා කිරීමකට ලක් වෙලා නැහැ. මේ කියන ව්‍යාපෘතිය. නමුත් මෙතැන පටලැවිලා තිබෙන්නේ ඔබතුමා නවත්වපු ව්‍යාපෘතියක් ගැන අහනවා නේ. ඇත්තටම මන්නාරම නගර සභාවේ අපජල පද්ධතියට යාබදව, මේ කියන project එකට යාබදව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක්, Solid Waste Management Project එකක් පටන් අරගෙන තිබෙනවා. ඒක තමයි නවත්වලා තිබෙන්නේ. ඒක ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ආරම්භ කරපු එකක් නොවෙයි. ඔබතුමා කියන මේ නමින් තිබෙන ව්‍යාපෘතිය නොවෙයි. ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි. ඒකට යාබදව වෙන ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබෙනවා. ඒක තමයි නැවතීමට ලක් කරලා තිබෙන්නේ. ඒක ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් නැති එකක්. නීතිමය ප්‍රශ්නයක් මත එය ක්‍රියාත්මක වීම අත්හිටුවා ඇති බව දැනුම්දීලා තිබෙනවා.

ඉහත මන්නාරම ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පිළිබඳව ඇත්තටම නගර සභාව පැත්තෙන් තමයි අහන්න ඕනෑ.

ඔබතුමා මේ ප්‍රශ්නය නිශ්චය කර නැති නිසා, ඒ කියන්නේ National Water Supply and Drainage Board එකෙන් ක්‍රියාත්මක කරපු ව්‍යාපෘතියක් ගැන අහලා, ඇයි මේක නැවැත්වූයේ කියලා ඇහුවා. ඒක ක්‍රියාත්මකයි. නමුත්, ක්‍රියාත්මක නොවන වෙනත් ව්‍යාපෘතියක් තිබෙනවා. ඒක මේ අමාත්‍යාංශයට අදාළ නැහැ. එහෙම පටලැවිල්ලක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, நான் கேட்பது என்னவென்றால், இந்தத் திட்டத்திற்காக நான்கு தடை உத்தரவு எழுத்தாணைகள் நீதிமன்றத்தில் பெறப்பட்டிருப்பதனால் இதனைத் தொடர்வதற்கு ஏதாவது தடை இருக்கிறதா? இவ்வளவு பெருந்தொகையான காசைச் செலவழித்து மன்னார் நகர மக்களுடைய வளர்ச்சிக்காக முன்னெடுக்கப்பட்ட இந்தத் திட்டத்தை, கொழும்பைச் சேர்ந்த ஒரு நபர் வழக்குத் தாக்கல் செய்ததன்மூலம் தடுக்க முற்படுகின்றாரென்றால், இயற்கையை விரும்புவதாகச் சொல்லிக்கொள்ளும் அவர் அந்த நகரத்தை அசுத்தமாக வைத்திருக்க விரும்புகின்றாரா? அப்படியானால், அதற்கான தங்களுடைய விடை என்ன?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, අපේ National Water Supply and Drainage Board එකෙන් ක්‍රියාත්මක කරපු මේ Dry Zone Urban Water and Sanitation Project කියන එක නවත්වා නැහැ. ඒක අවසන් කර නගර සභාවට භාර දී තිබෙනවා. ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි. ඒක නවත්වා නැහැ. ඒකයි මම කිව්වේ, ප්‍රශ්නය අහන විධියේ වැරැද්දක් තිබෙනවා කියලා. නමුත්, එතැන නගර සභාවෙන් ආරම්භ කළ මොකක් හෝ ව්‍යාපෘතියක් නවත්වා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, ඔබතුමා ඒ නවත්වා තිබෙන project එකේ නම හරියට සොයාගෙන ඒ සම්බන්ධව ප්‍රශ්නය ඇහුවා නම් හරියට උත්තරයක් දෙන්න පුළුවන් වෙයි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, ගරු අග්‍රාමාත්‍යතුමිය.

## 2025.08.06 දින ගරු නන්දන පත්මකුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය: ගරු අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර
## 2025.08.06ஆம் திகதி மாண்புமிகு நந்தன பத்மகுமாரவால் கேட்கப்பட்ட வினா: மாண்புமிகு பிரதம அமைச்சரினது விடை
## QUESTION POSED BY HON. NANDANA PATHMAKUMARA ON 06.08.2025: REPLY BY HON. PRIME MINISTER

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් 2025.08.06 දින අසනු ලැබූ ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. (i) දිළිඳු බව පිටු දැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර්කරණීය සංවිධාන ව්‍යුහයක් ස්ථාපනය.

   (ii) ජනතාවගේ සක්‍රිය සහභාගිත්වයෙන් ඔවුන්ගේ අවශ්‍යතා නියෝජනය වන ලෙස සංවර්ධන යෝජනා සකස් කිරීම.

   (iii) උචිත සංවර්ධන යෝජනා හඳුනා ගැනීම සඳහා මහජනතාව බලගැන්වීම.

   (iv) ඒකාබද්ධ වැඩ පිළිවෙළක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම.

   (v) මූලික පහසුකම්, යටිතල පහසුකම් සහ සේවා සඳහා වන ප්‍රවේශය ඉහළ නැංවීම.

[ගරු හරිනි අමරසූරිය]

(vi) සියලු සංවර්ධන කාර්යයන්හිදී තිරසරභාවය සහතික කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම.

(vii) මැදිහත්කරණය තුළින් සමාජ ගැටලු අවම කිරීම.

(viii) ආන්තික සහ අවදානම් ප්‍රජාව සඳහා රැකවරණය සලසා දීම.

(ix) ඵලදායී නිෂ්පාදන පදනම් කරගත් ජීවන මාර්ගවලට යොමු කිරීම.

(x) දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

**2. ප්‍රජා ශක්ති ජාතික ප්‍රතිපත්ති සභාව**

මේක නව ව්‍යුහයක්. ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙනුයි රැස් වෙන්නේ. වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා විධාන නිකුත් කිරීම සිදු කරයි.

**ජාතික මෙහෙයුම් කමිටුව**

මේකත් නව ව්‍යුහයක්. ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙනුයි රැස් වෙන්නේ. ජාතික ප්‍රතිපත්තිය අනුව වැඩසටහනේ මෙහෙයුම් කටයුතු ප්‍රජා ශක්ති ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක කරයි.

**අමාත්‍යාංශ/පළාත් සභා**

පෙර පැවති ව්‍යුහයකි. ග්‍රාමීය සංවර්ධන සැලසුම් අනුව සවිබලගැන්වීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් දරිද්‍රතාව තුරන් කිරීම සඳහා කටයුතු කළ යුතුය.

**දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව**

මේකත් පෙර පැවති ව්‍යුහයක්. ප්‍රජාශක්ති ඇතුළු රජයේ ප්‍රමුඛ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවනු පිණිස මෙය ප්‍රතිසංවිධානය කරනු ලබයි. සවිබලගැන්වීමේ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කළ යුතුය.

**ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව**

මෙයත් පෙර පැවති ව්‍යුහයක්. ප්‍රජාශක්ති ඇතුළු රජයේ ප්‍රමුඛ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවනු පිණිස මෙය ප්‍රතිසංවිධානය කරනු ලබයි. සවිබලගැන්වීමේ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කළ යුතුය.

**ප්‍රජා සංවර්ධන සභාව**

මේකත් නව ව්‍යුහයක්. ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් ස්ථාපනය කරනු ලබයි. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හෝ නියෝජිතයෙක් මෙහි සභාපති ලෙස පත් වේ. ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අනුයුක්ත කරනු ලබන ප්‍රජා සවිබලගැන්වීමේ නිලධාරි මෙහි ලේකම් වශයෙන් පත් වේ. කොට්ඨාසයට ග්‍රාම සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ප්‍රධානතම කාර්ය භාරය වෙනවා. ප්‍රජා සහභාගිත්වයෙන් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සංවර්ධන අවශ්‍යතා හා ගැටලු හඳුනා ගැනීම, ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම, ව්‍යාපෘති අධීක්ෂණය, සමාජ විගණනයට ලක් කිරීම සිදු කළ යුතුය. වැඩසටහන් ව්‍යුහයේ රූප සටහන ඇමුණුම ලෙස **සභාගත*** කරමි.

---

* ***පිළිතුර අවසානයේ පළ කර ඇත.***

* *விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*

* *Produced at end of Answer.*

3\. (i) මහජන අවශ්‍යතා නිසි පරිදි නියෝජනය නොවීම.

(ii) මහජන සහභාගිත්වය අවම වීම.

(iii) අමාත්‍යාංශ වශයෙන් වෙන් වෙන්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(iv) ප්‍රාදේශීය වශයෙන් වෙන් වෙන්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(v) දිළිඳු බවෙන් අත්මිදීම වෙනුවට යැපුම් මානසිකත්වය තුළ පැවැතීමට උත්සාහ කිරීම හා නැවත නැවතත් එම තත්ත්වයේම පැවැතීමට ඇලුම් කරන ප්‍රජාවක් බිහිවීම.

(vi) සැබෑ අවශ්‍යතාව සහිත පිරිස් ඉලක්කගත කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම.

(vii) දරිද්‍රතාව තුරන් කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් හඳුනා ගැනීම සිදු කරන්නේ එකම නිලධාරි කණ්ඩායමක් විසින් වන බැවින් එම පිරිස තෝරා ගන්නා ප්‍රතිලාභීන් ද එකම කණ්ඩායමක් වීම.

(viii) අවිධිමත් සහ යථාර්ථවාදී නොවන නිර්ණායක සහ ක්‍රමවේදය ඔස්සේ තෝරා ගත් බොහෝ පිරිසක් ප්‍රතිලාභීන් ලෙස ඇතුළත්ව සිටීම.

(ix) සමාජ ආරක්ෂණ වැඩසටහන්වල සුදුසුකම් සහිත සියලු පුද්ගලයන් ආවරණය නොවීම.

(x) ජාතික ප්‍රතිපත්තියක් මත සැලසුම් කිරීම වෙනුවට දේශපාලන අවශ්‍යතා මත ක්‍රියාත්මක කිරීම.

(xi) වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා දැනුම හා කුසලතාවෙන් පරිපූර්ණ ඉහළ ධාරිතාවෙන් යුත් මානව සම්පතෙහි හිඟය.

(xii) ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය දත්ත සහ තොරතුරුවල අසංවිධානාත්මක බව හා හිඟය.

4\. (i) මෙම වැඩසටහන ඒකාබද්ධ ප්‍රවේශයකින් සහ සක්‍රිය ප්‍රජා සහභාගිත්වයකින් යුතුව ක්‍රියාත්මක කිරීම.

(ii) ප්‍රජාව, මහජන නියෝජිතයන් හා නිලධාරින් යන සියලු පාර්ශ්වකරුවන් සමඟ ඒකාබද්ධ වූ නව ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක කිරීම.

(iii) මහජන සහභාගිත්වය වැඩි කිරීම.

(iv) සහනාධාර වෙනුවට ජීවන චක්‍ර ප්‍රවේශය මත රැකවරණය සැලසීම.

(v) සවිබලගැන්වීම මඟින් දරිද්‍රතාව තුරන් කිරීම.

(vi) අමාත්‍යාංශ මඟින් වෙන වෙනම වැඩසටහන් ක්‍රියාත්මක නොකර සියලු අමාත්‍යාංශවල වැඩසටහන් දරිද්‍රතාව පිටුදැකීම සහ ප්‍රජා සවිබල ගැන්වීම සඳහා දිශාගත කිරීම.


5\. (i) "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්තියට අනුව පොහොසත් වීම යනු, ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වීම පමණක් නොවන අතර, අධ්‍යාපනය, සෞඛ්‍ය, යහපත් ජීවන තත්ත්වය සහ ආකල්පමය වශයෙන් ද ශක්තිමත් වීම තුළින් පුද්ගල පෞරුෂයේ වර්ධනය, රටේ ආර්ථික සංවර්ධනය හා බද්ධ වෙමින් ජීවන මට්ටම උසස් තත්ත්වයට පත්වීමයි.

(ii) ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතාව මැනීම සඳහා පවතින දර්ශකය 2019 වර්ෂයේ ගෘහ ඒකක

ආදායම් වියදම් සමීක්ෂණය අනුව පදනම් වූවකි. ඒ අනුව සියයට 16ක් බහුමානික දරිද්‍රතාවෙන් පෙළෙයි. 2025 වසරේදී සිදු කරනු ලබන ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය අනුව ලබන වසරේදී මෙරට බහුමානික දරිද්‍රතා දර්ශකය යාවත්කාලීන වනු ඇත. ඒ අනුව 2030 වර්ෂයේදී මෙරට දරිද්‍රතාව සියයට 5කින් අඩු කිරීම ඉලක්කය වේ.

(iii) තිරසර සංවර්ධන ඉලක්ක යටතේ 2030 වර්ෂය වන විට සෑම ආකාරයකම දුප්පත්කම ලෝකයෙන් තුරන් කිරීම සඳහා වන පොදු එකඟතාව අනුව කටයුතු කිරීම හා ඉන් ඉදිරියට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සකස් කරනු ලබන තිරසර සංවර්ධන ඉලක්ක අනුව වැඩසටහන සැලසුම් කිරීම හා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

** සභාමේසය මත තබන ලද ඇමුණුම:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*




**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා. 2025.09.26 දින ගරු රවි කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ එකී ප්‍රශ්නයට පිළිතුර දෙන්න කලින් මම මොහොතක් ඉල්ලා සිටිනවා, අපේ පාර්ලිමේන්තුවේ ආයුර්වේද ප්‍රතිකාර අංශයේ අවුරුදු 15කට ආසන්න කාලයක් සේවය කරපු මහේෂ් නිශාන්ත එදිරිසිංහ මහත්මයා ගැන වචන කිහිපයක් කථා කරන්න. එතුමා පසුගිය දවසක හදිසියේ අභාවප්‍රාප්ත වුණා. එතුමා මේ පාර්ලිමේන්තුවේ ඉන්න බොහෝ මන්ත්‍රීවරුන් සහ බොහෝදෙනෙකු දන්නා නිලධාරි මහත්මයෙක්; අප කා අතරත් හරිම ප්‍රියමනාප කෙනෙක්. අප කවුරුත් බලාපොරොත්තු නොවෙච්ච මොහොතක සිදු වූ එතුමාගේ හදිසි අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙනුවෙනුත්, පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනා වෙනුවෙනුත් එතුමාගේ පවුලේ අය වෙත අපගේ ශෝකය පළ කරනවා.

## සීනි කර්මාන්තයේ තිරසරභාවය: කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## சீனிக் கைத்தொழிலின் நிலைத்தன்மை: கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரினது கூற்று
## SUSTAINABILITY OF SUGAR INDUSTRY: STATEMENT BY MINISTER OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් 2025.09.26වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. එය පෞද්ගලික අදහසක් නොව ජාතික ජන බලවේගයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අන්තර්ගත කරුණු මත, මූලධර්ම මත, ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මත පදනම්ව කරන ලද ප්‍රකාශයකි.

   අපගේ ආර්ථික ප්‍රතිපත්තිය වන්නේ ජන සහභාගිත්වය සහිත, ජනතාවට සාධාරණ ලෙස ප්‍රතිලාභ බෙදී යන නිෂ්පාදන ආර්ථික ප්‍රතිපත්තියකි. එය තුළ කිසිසේත් රජයේ කාර්යභාරය අවතක්සේරු නොවන අතර රජය සමස්ත ලෙස ආර්ථික කටයුතු මෙහෙයවීමක් ද අපේක්ෂා නොකරයි. ආර්ථිකයට අත්‍යවශ්‍ය පහසුකම් සැලසීම සඳහා රජය මැදිහත් වන අතර, එයින් ජනතාවට ආර්ථික ක්‍රියාවලියට වැඩි වැඩියෙන් සහභාගි වීම සඳහා උත්ප්‍රේරක සලසයි.

   රජය සමස්ත ලෙසම ආර්ථිකයේ සියලු කටයුතු මුළුමනින්ම මෙහෙයවන ක්‍රියාවලියක් වෙනුවට ආර්ථිකය නියාමනය කරන ක්‍රියාවලියකට අවතීර්ණ වනු ඇත. එය සමාජ සාධාරණත්වයේ මූලධර්මය මත පදනම්ව සිදු කරන මැදිහත්වීමකි.

   "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මූලික මූලධර්මයක් ලෙස ආර්ථික

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ප්‍රජාතන්ත්‍රවාදය පිළිගනු ලැබේ; මනුෂ්‍යත්වයට ප්‍රමුඛතාව දෙනු ඇත; මහජන සහභාගිත්වය හා අන්තර්ගෘහිත ආර්ථික සමාජයක් නිර්මාණය කිරීම සඳහා සාධාරණව ආර්ථික ප්‍රතිලාභ බෙදී යැම තහවුරු කරනු ඇත.

එම ප්‍රජාතාන්ත්‍රික ආර්ථික මූලධර්ම මත මූල්‍ය ප්‍රතිපත්ති, බාහිර අංශය ස්ථාවර කිරීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග වැඩසටහන, ආයෝජන ප්‍රවර්ධනය, රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යවසායන් පිළිබඳ අපගේ ස්ථාවරය, දේශීය වෙළෙඳාම සහ විදේශීය වෙළෙඳාම යන කරුණු පිළිබඳව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පරිච්ඡේද අංක 3හි, "ප්‍රජාතාන්ත්‍රික ආර්ථිකයක්" යන මාතෘකාව යටතේ පිටු අංක 102 සිට 109 දක්වා විග්‍රහ කර ඇත.

එසේම ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයත්, ජීවධර්මී ප්‍රවේශයත් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 149හි සවිස්තරාත්මකව පැහැදිලි කර ඇත.

මේ වන විට මුහුණ දී ඇති ආර්ථික අර්බුදයෙන් රට ගොඩ ඒමට දේශීය නිෂ්පාදන ශක්තිමත් කර ගනිමින් අපනයන ප්‍රමුඛ නිෂ්පාදන ආර්ථිකයක් වෙත යොමු විය යුතුව ඇත. එහිදී ලංකාවේ පිහිටීම, මානව සම්පත සහ ස්වාභාවික සම්පත් උපයෝගී කර ගනිමින් දිගුකාලීන කර්මාන්ත සංවර්ධන සැලැස්මක් හා එය ක්‍රියාත්මක කිරීමට කැපවුණු දේශපාලනික නායකත්වයක් අත්‍යවශ්‍යය. බිඳ වැටී ඇති දේශීය නිෂ්පාදන කර්මාන්ත නැවත පණ ගැන්වීම, අපනයන කර්මාන්ත තරගකාරී කිරීම, සේවා කර්මාන්ත ප්‍රවර්ධනය, නව විභවයන් හරහා ලෝක වෙළෙඳ පොළ අත්පත් කර ගැනීම, ජාතික සැලැස්මකට අනුව සෘජු විදේශ ආයෝජන කැඳවීම, නව ආයෝජන සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය, අඩු පිරිවැය යටිතල පහසුකම් සහ යෙදවුම් සැපයීම මෙම ප්‍රතිපත්ති රාමුවේ මූලික අරමුණ වේ.

අපගේ ආර්ථික ප්‍රතිපත්තිය හා රජයේ මැදිහත්වීමේ ක්‍රියාමාර්ග:

- ජාතික සැලසුම්කරණය හා රාජ්‍ය මැදිහත්වීම
- බදු නීතිය හා ඵලදායිතා වර්ධනය
- ජාත්‍යන්තර හා දේශීය වෙළෙඳ පොළ පුළුල් කිරීම හා කාර්යක්ෂමතාව
- කර්මාන්තපුර සහ යටිතල පහසුකම්
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත
- සාම්ප්‍රදායික ශිල්ප සහ හස්ත කර්මාන්ත
- තිරසාර සංවර්ධනයට අවශ්‍ය වන මැදිහත්වීම
- ඩිජිටල්කරණය සහ තාක්ෂණික භාවිතය
- ව්‍යාපාර කිරීමේ පහසුව ප්‍රවර්ධනය හා ව්‍යවසායකත්වය

යන මාතෘකා යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 149 සිට 155 දක්වා ව්‍යවසායකත්වය පිළිබඳව සහ රජයේ මැදිහත්වීම පිළිබඳව පැහැදිලි කර ඇත.

ගරු කථානායකතුමනි, මම මේ කාරණා කෙටියෙන් ප්‍රධාන මාතෘකා හැටියට විතරයි කිව්වේ. මේ කාරණා සියල්ල අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කාරණායි. එම නිසා අප ඉදිරිපත් කරන මේ ස්ථාවරය පෞද්ගලික ස්ථාවරයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. මේවා අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉතා පැහැදිලිව සඳහන් ස්ථාවරයන්. ඒ කියපු පිටු අංකවල මේ ටික තිබෙනවා.

2. මාස නවයකට පෙර එවැනි ප්‍රකාශයක් මා සිදු කර නොමැත. ඒ නිසා එය අදාළ වන්නේ නැත.

3. ජනතාවගේ විශ්වාසය සහ දේශීය හා විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි වී ඇති බව මෑත කාලීනව ආයෝජන වර්ධනය වී ඇති තත්ත්ව යටතේ තහවුරු වේ.

ගරු මන්ත්‍රීතුමනි, අප මේ පිළිතුර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ ටිකක් කලින්. නමුත්, අද න්‍යාය පත්‍රයටයි ඇවිත් තිබෙන්නේ. මෙය ඉදිරිපත් කළ දිනවල තිබුණු දත්ත කිහිපයක් ආයෝජන වැඩි වීමට අදාළව ඉදිරිපත් කර තිබෙනවා. ආයෝජන මණ්ඩලයේ වර්තමාන දත්ත මම දැක්කා. ඊටත් වඩා ආයෝජන වැඩි වෙලා කියලා පසුගිය දා සඳහන් කර තිබුණා.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නිකුත් කර ඇති තොරතුරු අනුව, 2025 ජනවාරි සිට සැප්තැම්බර් 15 දක්වා අනුමැතිය ලද ප්‍රදාන ඩොලර් මිලියන 1,304ක්ද, 2025 ජනවාරි සිට අගෝස්තු දක්වා සෘජු විදේශ ආයෝජන ගලා ඒම් ඩොලර් මිලියන 1,048ක් -ඩොලර් බිලියනයක්- ද, දේශීය ආයෝජන ඩොලර් මිලියන 496ක් ද, රැකියා අවස්ථා පුද්ගලයින් 1,319ක් වෙත ද, අපනයන ආදායම ඩොලර් මිලියන 6,969ක් ද ලැබී ඇති බව ප්‍රකාශ කරමි.

එය ඩොලර් මිලියන 6,000ක් වුණේ සැප්තැම්බර් මාසයේදීයි, ගරු කථානායකතුමනි. මේ වන කොට ඩොලර් මිලියන 10,000ක් -ඩොලර් බිලියන 10ක්- ඉක්මවා තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමා, ඔබතුමා අන්තිමට කිව්වේ,- *[බාධා කිරීමක්]*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අන්තිමට කිව්වේ අපනයන ආදායම.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බිලියන 10ක් කියලා කිව්වේ මොකක්ද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපනයන ආදායම වශයෙන් ඩොලර් මිලියන 6,969ක් ලැබී ඇති බව වාර්තා වෙනවා. මේ කාලයට අදාළව - දැනට - බිලියන 10ක් අපනයන ආදායම විධියට ලැබී තිබෙනවා.

4. මෙහිදී අහන්නේ සීනි සම්බන්ධයෙන්. කලින් ඇහුවේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන්. සීනි සම්බන්ධයෙන් අහන ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

දැනට දේශීයව නිපදවන්නේ දුඹුරු සීනි පමණයි. 2024 වර්ෂයේ දුඹුරු සීනි මෙට්‍රික් ටොන් 81,000ක් මෙරට නිපදවා ඇත. පවත්නා දත්ත අනුව, ශ්‍රී ලංකාවේ දුඹුරු සීනි අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 120,000ක් පමණ වේ.

දැනට දුඹුරු සීනි නිපදවන මෙරට කර්මාන්තශාලා හතරෙහි ධාරිතාව දිනකට උක් මෙට්‍රික් ටොන් 7,750කි. සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය, ඒ කියන්නේ rendement එක - සීනි සාන්ද්‍රණ ප්‍රතිශතය - සියයට 7ක් වේ. ඒ අනුව වසරකට දින 200ක් නිෂ්පාදනයෙහි නිරත වුවහොත් නිපදවිය හැකි දුඹුරු සීනි ප්‍රමාණය ටොන් ලක්ෂයක් පමණ වේ. නමුත් මෙම කර්මාන්තශාලාවල සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය ඉදිරි වර්ෂවලදී සියයට 8ක් ඉක්මවන පරිදි කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට නම්, උක්

පර්යේෂණායතනයේ නිපදවූ උසස් තත්ත්වයේ උක් ප්‍රභේද, නියමිත උක් වගා පිළිවෙත් හා කර්මාන්තශාලා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් අවශ්‍ය වේ.

ගරු මන්ත්‍රීතුමනි, අපි දැනටමත් උක් පර්යේෂණ ආයතනයට අවස්ථාව දීලා තිබෙනවා, අලුත් variety එකක් හඳුනා ගන්න. දැනට හඳුන්වා දීලා තිබෙන variety එකේ බර වැඩියි. නමුත් සීනි ලබා ගැනීමේ හැකියාව - සීනි සාන්ද්‍රණය - අඩුයි; ඒ කියන්නේ, rendement එක අඩුයි. Rendement එක තිබෙන්නේ, සියයට 5, 4 මට්ටමේ. දැන් මේ වතාවේ තමයි සියයට 8ට ගෙනාවේ. අපි ඇත්තටම බලාපොරොත්තු වෙනවා, rendement එක වැඩි උක් variety එකක් ඉක්මනින් හඳුන්වා දෙන්න.

එසේ කළ විට එම සියයට 8 සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය ඉක්මවා, එම කර්මාන්තශාලා 4 මඟින් දුඹුරු සීනි නිපදවිය හැකිය. එනම්, වසරකට මෙට්‍රික්ටොන් 124,000ක් පමණ නිපදවිය හැක. එලෙස මෙට්‍රික්ටොන් 120,000 ඉක්මවා නිපදවන සියලු දුඹුරු සීනි අපනයනය කළ හැක.

එසේම, එයට කුරුඳු, ඉඟුරු වැනි විවිධ රස වර්ග එකතු කිරීම, කාබනික සීනි, සීනි කියුබ් වැනි අගය එකතු කිරීම ගැනද මේ වන විට උක් පර්යේෂණ ආයතනය හා කර්මාන්තශාලා සමඟ සාකච්ඡා කරමින් සිටී. ඒ අනුව, සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය 8 ඉක්මවා යෑමත් සමඟ දුඹුරු සීනි අපනයනයට අවස්ථාව සැලසෙන අතර, එම අවස්ථාවේදී කාර්යක්ෂමතාව වැඩි නිසා නිෂ්පාදන වියදම අඩුවීමත් සමඟ ලෝක වෙළෙඳ පොළේ දුඹුරු සීනි සමඟ තරග කිරීමටද අපට අපේක්ෂාවක් ඇත. නමුත් එමඟින් සුදු සීනි අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු නොවේ.

මොකද සුදු සීනි අවශ්‍යතාව තිබෙනවා, සියයට 90ක්ම. ඒක සම්පූර්ණ කරන්න අපට මේ වෙලාවේ හැකියාවක් නැහැ. අනෙක් එක, හුඟක් කර්මාන්තවලට යොදා ගන්නේ සුදු සීනි. අපි දැනට පෞද්ගලික අංශයේ කර්මාන්ත එක්ක සාකච්ඡා කරමින් ඉන්නවා, සුදු සීනි වෙනුවට දුඹුරු සීනි ආදේශ කරන්න පුළුවන්ද කියලා. පසුගිය දා කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා, රජයේ ආයතනවලට, විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව වාගේ රජයේ ආයතනවලට වැඩිපුර දුඹුරු සීනි හඳුන්වා දෙන්න, promotion එකක් කරන්න.

5. ලංකා සීනි (පුද්ගලික) සමාගම සම්පූර්ණයෙන්ම රජය සතු සීනි සමාගමකි. එය සෙවනගල සහ පැල්වත්ත ලෙස කර්මාන්තශාලා දෙකකින් සමන්විතය. ඔබතුමන්ලා දන්නවා ඒක. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ සියයට 51ක කොටස් රජයට හිමිය. එම සමාගම් දෙක විසින් නිෂ්පාදනය කරන දුඹුරු සීනි දේශීය පරිභෝජනය සඳහා යොදා ගනී.

ආනයන මත යැපීම අඩු කිරීම සහ විදේශ විනිමය ඉතිරි කිරීම සඳහා දේශීය සීනි නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වැඩි කිරීම එම සමාගම්හි දිගු කාලීන අරමුණයි. වත්මන් දේශීය දුඹුරු සීනි නිෂ්පාදනය ජාතික ඉල්ලුමෙන් සියයට 10-12ක් පමණ සපුරාලයි. කෙසේ වෙතත්, රජය සතු සීනි කර්මාන්තශාලා වඩාත් තිරසාර හා ලාභදායී කිරීම සඳහා සැලකිය යුතු වෙනස්කම් සිදු කිරීම රජයේ අරමුණයි.

විශේෂයෙන්ම මම අවධාරණය කරලා කියන්න ඕනෑ, රජය සතු පැල්වත්ත හෝ සෙවනගල සීනි සමාගම් වසා දැමීමට හෝ පෞද්ගලීකරණය කිරීමට හෝ හවුල් ව්‍යාපාර බවට පත් කිරීමට අදහසක් නැහැ කියලා. ඒවා දැනට තිබෙන ආකාරයටම රජය සතුව තිබෙනවා. අවශ්‍ය තැන්වලදී පෞද්ගලික අංශයේ සහභාගිත්වය ලබා ගන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අපි දැනට පැල්වත්ත හා සෙවනගල ඒකාබද්ධ සංචාරක promotion එකක්, සංචාරක ප්‍රවර්ධන ක්‍රියාවලියක් ආරම්භ කරන්න යනවා. ඒකට අපට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණා. Public-private partnership එකකට EoIs කැඳවලා තිබෙනවා, හෙක්ටෙයාර 500කට පමණ. ඒ කියන්නේ එතැන high-end tourism area එකක් බවට පත් කරන්න. ඒක සීනිවලට අදාළ එකක් නොවෙයි. ඒ සඳහා ඉඩම් වෙන් කරන්න අපට පුළුවන්කම තිබෙනවා.

6. සියල්ලන්ටම සාධාරණ මිලක් ලබා දීම සඳහා දැනට උක් ගොවීන්ට සපයනු ලබන උක් සැපයුමේ ගුණාත්මකභාවය නොසලකා, මෙට්‍රික්ටොන් එකකට රුපියල් 10,000ක් ගෙවනු ලැබේ.

හැම කෙනාටම ගෙවනවා, ටොන් එකකට රුපියල් 10,000ක්.

2025.07.21 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් ලංකා සීනි (පුද්ගලික) සමාගමේ - සෙවනගල, පැල්වත්ත - මූල්‍ය ගැටලු මඟ හරවා ගැනීම සඳහා මූල්‍ය ආධාර ලෙස රුපියල් බිලියනයක ප්‍රාග්ධනයක් ලබා දීමට අනුමැතිය ලබා දුන් අතර, එම මුදල කොටස් වශයෙන් නිදහස් කිරීමට මහා භාණ්ඩාගාර ලේකම්වරයාට බලය පවරන ලදී. ගොවීන්ට කළ යුතු ගෙවීම් සඳහා එම මුදලින් රුපියල් මිලියන 200ක් දැනටමත් නිදහස් කර ඇත.

ඊට අමතරව, ගින්නෙන් හානි වූ උක් වගාවේ පිරිවැය දැරීමට සහ ගොවීන්ට වන්දි ගෙවීමට රජය පියවර ගෙන ඇත. ගින්නෙන් විනාශ වූ උක් මෙට්‍රික්ටොන් එකකට රුපියල් 7,000 බැගින් උක් ගොවීන්ට වගා හානි ලෙස වන්දි ලබා දීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2025.09.15 දින අනුමැතිය ලබා දී ඇත.

ඒ කියන්නේ ඒවා ගොවියෝ ගිනි තබා ගත්තාද, ස්වාභාවිකව ගිනි ගත්තාද කියන එක නොසලකා, ඒවා අපේ ආයතනයට ගන්නේ නැතුවම, ඒ හැමෝටම අපි මෙට්‍රික්ටොන් එකකට රුපියල් 7,000 ගණනේ දෙන්න තීරණය කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මට මතක හැටියට ඒ වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 133ක් වෙන් කරලා තිබෙනවා.

එයට අදාළව වාර්තාවක් ලබා දීම සඳහා නිලධාරි කමිටුවක් මේ වන විට පත් කර ඇත.

මේ වෙනකොට අපට ගෙවන්න තිබෙන්නේ අවසාන ගෙවීම් පමණයි. මොකද, අපි ගොවීන්ට අත්තිකාරම් ගෙවීම් සියයට සියයක්ම කරලා තිබෙන්නේ. අවසාන ගෙවීම් කරන්න ගොවි සංවිධාන එක්ක මම සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ සාකච්ඡාවට අනුව අපි ගොවි සංවිධාන එක්ක එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා, ඒ වෙලාව වෙනකොට අරගෙන තිබෙන සියලු උක්වලට අවසාන ගෙවීම් නොවැම්බර් 30වන දා වෙනකොට සිදු කරන්න.

7. මේ ප්‍රශ්නය අපේ අමාත්‍යාංශයට සෘජුව අදාළ වෙන එකක් නොවෙයි, මුදල් අමාත්‍යාංශයට අදාළ කාරණාවක්. ඒ බදු සම්බන්ධයෙන් වන කාරණාව. "නැත" කියන එක තමයි ඒකට උත්තරය.

එසේ නම් ඒ සංශෝධන මොනවාද යන්නට පිළිතුර අදාළ නොවේ කියන එකයි.

8. සියල්ලන්ටම සාධාරණ මිලක් ලබා දීම සඳහා දැනට උක් ගොවීන්ට සපයනු ලබන උක් සැපයුමේ ගුණාත්මකභාවය නොසලකා, මෙට්‍රික්ටොන් එකකට රුපියල් 10,000ක් ගෙවනු ලැබේ. ගින්නෙන් හානි වූ උක් සඳහා වන්දි ගෙවීමට රජය මේ වන විට පියවර ගෙන තිබේ. දේශීය සීනි නිෂ්පාදන පිරිවැය ඉහළ මට්ටමක පැවතුණද, සීනි සමාගම විසින් අහිමි වූ දේ දරා ගනිමින් අඩු මිලකට සීනි අළෙවි කරමින් තිබේ.

ඒ කියන්නේ ගොවීන්ටත් අපි රුපියල් 10,000 බැගින් දෙනවා. ඒ වාගේම සීනිත් මේ වෙනකොට අපි අඩු මිලකට දෙමින් තිබෙනවා. ඒ නිසා break-even level එකේ යන්න

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

හරි අමාරුයි. නමුත්, අපි ඒක කොහොම හරි කළමනාකරණය කර ගනිමින් තිබෙනවා.

දේශීයව නිපදවන දුඹුරු සීනි සතොස අලෙවි සැල් හරහා සැපයීමට කටයුතු යොදා ඇති අතර, එමඟින් බහුතර ජනතාව වෙත ප්‍රවේශවීමට හැකි වේ. තවද, දේශීයව නිපදවන දුඹුරු සීනි "කාබනික සීනි" ලෙස නැවත සන්නාමගත කර චීනය, ඉරානය හා අප්‍රිකානු රටවල් කිහිපයක් ඇතුළු ජාත්‍යන්තර ගැනුම්කරුවන්ට අලෙවි කිරීමට මේ වන විට සැලසුම් සකස් කරමින් සිටී.

ශ්‍රී ලංකාවේ දුඹුරු සීනි අවම ආසනික් අන්තර්ගතයක් සහිත පොහොර භාවිතයෙන් නිෂ්පාදනය කරන බැවින් ජාත්‍යන්තර ප්‍රමිති යටතේ කාබනික ලේබල් කිරීම සඳහා සුදුසුකම් ලබයි. මේ සඳහා රජය සාකච්ඡා පවත්වමින් තිබේ.

9. ආනයනය කරන සීනි කිලෝග්‍රෑම් එකකට රුපියල් 50යි. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් තමයි අය කරන්නේ. දේශීයව නිෂ්පාදනය කරන ලද සීනිවලට සියයට 18ක VAT එක සහ සියයට 2.5ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - SSCL එක - අය කරනවා.

10. සීනිවලට කියලා වෙනම සහතිකවීමක් නැහැ. රාජ්‍ය ව්‍යවසාය නඟා සිටුවීමට අදාළව නුදුරේදී ප්‍රතිපත්තිමය තීරණ ගනු ලැබීමට නියමිතයි. ඒ පිළිබඳව ඉදිරියේදී පාර්ලිමේන්තුව දැනුවත් කරන්න බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

හැබැයි, මේ කාරණාවේ මුලට ගියොත්, ඔබතුමා ඒ ස්ථාවරයේම හිටියා නම් මම කැමැතියි. සැප්තැම්බර් මාසයේ 13වැනි දා පැවැති ගොවි සංගම් රැස්වීමේදී කියපු වැඩ පිළිවෙළ ඒ ආකාරයෙන්ම ඉදිරියට ගෙන ගියා නම් මම අගය කරනවා. මොකද, ඒක තමයි කළ යුත්තේ. එදා ඔබතුමා කිව්ව දේ වාර්තා කර තිබුණේ මෙහෙමයි: "The Hon. Sunil Handunnetti, the Hon. Minister of Industry and Entrepreneurship Development mentioned, 'We must basically be setting up facilitation and not run businesses' ". ඒක තමයි හරි දේ. අද නැවත ඔබතුමා ඒක වෙනත් ආකාරයකට කිව්වා. ඒ මතයේ සිටිනවා නම්, මම හිතන විධියට සීනි කර්මාන්තය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. ඇයි මම එහෙම කියන්නේ? අවුරුදු 76ක ශාපය කියලා කිව්වාට, මේ කර්මාන්තය ඒ ශාපය කියපු කාලයේ ඉඳන් රැඳිලා තිබුණු එකක් නේ.

හැබැයි, මේ අවුරුද්ද තුළ ඒ ශාපය වෙනත් පැත්තකට ගිහිල්ලා නැහැ නේ. මේක economies of scale advantage එකක්. ඒක ඔබතුමා කියනවා. මම දන්නේ නැහැ, ඇයි මීට පෙර කියපු එකම ක්‍රියාත්මක කරන්නේ නැත්තේ කියලා. ඔබතුමාට ඒ කියපු දෙයින් ඉදිරියට යන්න පුළුවන් නම්, අපට අපනයනය කරන්න අවශ්‍ය නැහැ. ඉන්දියාව, බ්‍රසීලය මේ වාගේ ඒවා දැවැන්ත ගණනක් ගෙනාවාම අපි වාගේ පොඩි රටකට අපේම ඉල්ලීම සපුරන්න බැරි වුණාම තරගකාරී ස්වරූපයක් ඇති වෙන්නේ නැහැ. දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කර තිබෙන්නේ, මෙහේ තිබෙන බද්ද ආනයනය කරන බද්දට වඩා අඩුවෙන් තැබීමෙන්. ඒකේ රැකවරණයක් තිබෙනවා. මෙතැන තිබෙන්නේ අපේ ඵලදායිතාව නැති එක. ඒ ඵලදායිතාව සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම තමයි ඔබතුමන්ලා කරන්න ඕනෑ. ඒ නිසා අර facilitation එක හොඳයි. පැලවත්ත, හිඟුරාන ඕනෑ කෙනෙකුට ක්‍රියාත්මක කරගෙන යන්න කිව්වා නම් ඒක වැඩිය අගය කරන ස්වරූපයක්.

අද සීනි මිල අඩු වෙලා තිබෙනවා. මෙහේ තිබෙන ඵලදායිතාව අඩුයි, අකාර්යක්ෂමතාව නිසා. ඊට වඩා හොඳයි, ගොවියාට මිලක් ගෙවලා මේක පෞද්ගලික අංශයේ ස්වරූපයෙන් ගෙනයන එක. "පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" ළඟා කර ගන්න පුළුවන් වෙන්නේ, මේ ඔක්කොම හොඳ වෙන්නේ, මිල අඩු වෙලා විකුණන්න පුළුවන් තරගකාරී තත්ත්වයක් ඇති වුණොත් නේ. නැත්නම් අර ශාපයේ කොටසම වෙනවා නේ. ගරු ඇමතිතුමනි, කරුණාකරලා මේ කියපු විධියට කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒ තරගකාරී තත්ත්වය ඇති කරන්න. ඒ විතරක් නොවෙයි. අද මිලියන 388ක් ආනයනය - import - කරන්න පුළුවන්. මේක බැලුවා නම්, බිලියන 120ක් විතර වෙනවා. මේකට පොඩි බදු ප්‍රමාණයක් එකතු කළා නම්, ගොවියාට මීට වඩා ඵලදායි තත්ත්වයක් ඇති වන දෙයක් කරන්න ඒක පාවිච්චි කරන්න පුළුවන්. නිෂ්පාදනය කරනවා කියලා කිව්වාට වැඩක් නැහැ. ඔබතුමා කරන්න අවශ්‍ය වෙන්නේ පැලවත්ත, හිඟුරාන, සෙවනගල සීනි සමාගම් පෞද්ගලික අංශයට ලබා දීලා හෝ මේ රටට සීනි ආනයනය කිරීම නවත්වලා, මෙහේම නිෂ්පාදනය කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන එකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් පිළිතුර පැහැදිලි කර ගන්න. ඔබතුමා දැන් විනාඩි 3ක් ගත්තා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම ඇහුවේ ලොකු ප්‍රශ්නයක්. ඒකට දීර්ඝ පිළිතුරක් ලැබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ලබා දුන් පිළිතුර සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීමක් සඳහා පමණයි අවස්ථාව තිබෙන්නේ. නැවත විවාදයක ආකාරයෙන් කථා කරන්න එපා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

76 ශාපය තුළින් එළියට ඇවිල්ලා "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ළඟා කරගන්න එක නේ කරන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දැන් විනාඩි 3ක් අරගෙන තිබෙනවා, පිළිතුර පැහැදිලි කර ගැනීමට. ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බලන්න, අද වෙලාවත් ඉතුරු වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වෙලාව ඉතුරු වුණේ පිළිවෙළට කාලය කළමනාකරණය කරන නිසායි, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම තව කාරණයක් කියන්නම්. උක් වගාවේ ගින්න ඇති වුණාද, නැද්ද කියන එක තර්ක කරලා වැඩක් නැහැ නේ. මොකද, ඒක වෙලා ඉවරයි. ඔබතුමා උක් ගොවීන්ට වගා හානි සඳහා වන්දි ගෙවන්නේ නැහැ කිව්වාට දැන් ගෙවන්න තීරණය කර තිබෙනවා. ඒ ගොවියා ආරක්ෂා කරන්න ඕනෑ. ගරු ඇමතිතුමාත් දන්නවා, මම මුදල් ඇමති වශයෙන් සිටියදී ස්වාභාවික ව්‍යසන - natural disasters - සඳහා insurance එකක් ඇති කළ බව. ඒ තුළින් මේ වාගේ ඒවාට රක්ෂණ ලබා ගන්න පුළුවන්. ඒ නිසා නැවත ඒක ගෙනෙන්න. වගාවට ගිනි තිබ්බාද, ගිනි ගත්තාද, ලාභය අඩු වුණාම මේක විකුණුවාද යන ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. ඒ වාගේ දේවල් තමයි කරන්න අවශ්‍ය වෙන්නේ. ගරු ඇමතිතුමා, මෙතැන කරන්න අවශ්‍ය නම් crystals මෙහෙටත් ගෙනැල්ලා, - ඔබතුමා කියූ පරිදි ත්‍රිකුණාමලයේ හදනවා වාගේ, දැන් යථාර්ථය තේරිලා තිබෙනවා - crystals ගෙනාවාට පස්සේ, සීනි නිෂ්පාදනය කළාම අපට තරගකාරි තත්ත්වයක් ඇති වෙනවා. මම කැමැතියි ඔබතුමා අපි හිතන ආකාරයට හිතන්න පටන් ගත්ත එකට. ඒ නිසායි මම හැම වෙලාවේම කියන්නේ, ලාල් කාන්ත, බිමල්, නලින්ද, සුනිල් කියන ඇමතිවරුන්ට. මම මේ කියන්නේ කුහකකමින් නොවෙයි. අපි බෝඩ් ලෑලි අල්ලාගෙන ඉන්නේ නැහැ, මේ විපක්ෂයේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටි කරන්න. ඔබතුමා දැන් විනාඩි 4ක් ගත්තා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

හරි, මම ප්‍රශ්නයට එනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

තවම ඔබතුමා ප්‍රශ්නයට ඇවිල්ලාත් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක තමයි මට තේරෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කෙටියෙන් කියන්න, ගරු මන්ත්‍රීතුමා. තව තත්පර 30ක් දෙන්නම්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම මේ ඇමතිතුමාට උදවු කරන්නයි හදන්නේ. විපක්ෂයෙන් මෙහෙම උදවු ලැබෙන්නේ නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේක සංවාදයක් වෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම මේ කියන්නේ කුහකකමින් නොවෙයි. ගරු ඇමතිතුමා, කරුණාකරලා ඒ තරගකාරි තත්ත්වය ඇති කරලා, මිල අඩු කරන්න පුළුවන් ස්වරූපයක් ඇති කරන්න. මේ රටේ නිෂ්පාදනය ආරක්ෂා කරන්න ගිහිල්ලා ගොවියාව නැති කරන්න එපා. මම හිතන විධියට, පාරිභෝගිකයා ආරක්ෂා කරන්න පුළුවන් නම්, ගොවියා ආරක්ෂා කරන්න පුළුවන් නම්, ඔබ එතැනට යන එක තමයි හරි. මේක රජයේ ආයතන යටතට ගත්තා කියලා වැඩක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක, තිබෙන ඵලදායිතාව නැති කරන්න කරන ක්‍රියාවක්. මේ සම්බන්ධයෙන් තරගකාරිත්වයක් ඇති කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විනාඩි 5ක් ගත්තා.

ගරු අමාත්‍යතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීමට ස්තුතියි.

ඇත්තටම මීට අවුරුද්දකට කලින් අපේ රටේ ව්‍යවසායකයන්ට, ව්‍යාපාරිකයන්ට අපේ ආර්ථික ප්‍රතිපත්ති ගැන යම් හෝ සැකයක් තිබුණා නම්, අපි රජය සහ පෞද්ගලික අංශය සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳව යම් හෝ සැකයක් තිබුණා නම්, දැන් ඒකත් නැහැ. අපේ රටේ පෞද්ගලික අංශයට, ව්‍යවසායකයන් සහ විශේෂයෙන් රටට ආයෝජන ගෙනෙන ආයෝජකයන්ට දැන් එහෙම සැකයක් නැහැ. එහෙම සැකයක් නැහැ කියලා දැන් ඉතා පැහැදිලියි. අපි ඔබතුමන්ලාගේ අදහසුත් එකතු කරගෙන, අපේ රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රතිසංස්කරණවලට යනවා. ඔබතුමාම දන්නවා, එම ආයතනය දයා ගමගේ හිටපු ඇමතිතුමා විසින් පාලනය කළ කාලයක් තිබුණු බව. ඊට කලින් තවත් අය එය පාලනය කළා. ආයතනය ඇතුළේ තිබුණු දේශපාලන අධිකාරය පිළිබඳව ඔබතුමා දන්නවා. මට වඩා හොඳින් ඔබතුමා එය දන්නවා කියලා මම විශ්වාස කරනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක නම් මම දන්නේ නැහැ. මම කියපු ටික තමයි මම දන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

දැන් තිබෙන තත්ත්වය මේකයි. අපි රාජ්‍ය ව්‍යවසායන් ඇතුළේ තිබෙන දේශපාලනීකරණය සම්පූර්ණයෙන් නවත්වා තිබෙනවා. මට ඒ ගැන කර්මාන්ත සහ ව්‍යවසායකත්ව ඇමතිවරයා හැටියට

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

සම්පූර්ණ සහතිකය දෙන්න පුළුවන්. ඔබතුමන්ලාට පුළුවන් නම් කියන්න, අපේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ ලැයිස්තුවකින් මෙන්න මේ අය දාලා තිබෙනවා, මෙන්න සේවකයෝ අරගෙන තිබෙනවා, මේ නිසා නාස්ති වනවා, පාඩු වනවා කියලා? එහෙම තත්ත්වයක් නැහැ. හැබැයි, ඔබතුමා කියන දේ පිළිගන්නවා. රාජ්‍ය ව්‍යවසායන් ඇතුළේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, තීරණ ගැනීමේදී. ඒ කියන්නේ, කල් යන එක. මේ ක්‍රියාවලිය, තීරණ ගැනීමේ ධුරාවලිය ගත්තාම පෞද්ගලික අංශයට වඩා දීර්ඝ කාලයක් යනවා. එම නිසා ආයෝජකයන්ටත් බරපතළ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. අපි ඒවා අඩු කරන්න ඕනෑ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකට උත්තරය ප්‍රශ්න නැහැ කියන එක නොවෙයි. හැබැයි, ඒගොල්ලෝ කියන්නේ මේ වෙලාවේ,-

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීමට බොහොම ස්තුතියි. මගේ පැහැදිලි කිරීම සිද්ධ වුණේ, ඔබතුමා පොදුවේ අහලා තිබුණු රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව අපේ ස්ථාවරය ගැන. ඒකට තමයි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන කරුණු ඉදිරිපත් කළේ. සීනි කර්මාන්තශාලා ගැන ඔබතුමා අහලා තිබුණ කාරණාවට නිශ්චිත උත්තරය දීලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය ඉදිරිපත් කිරීමට, බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, බරපතළ තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා. මීට මොහොතකට පෙර වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ලසන්ත වික්‍රමසේකර මහත්මයාට, මහජන දිනය පවත්වන අවස්ථාවේ සභාව තුළදී වෙඩි තියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, - *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට පොඩ්ඩක් කථා කරන්න ඉඩ දෙන්න, ගරු කථානායකතුමනි. මෙය බරපතළ තත්ත්වයක්. වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා මහජන දිනයේ එතුමාගේ රාජකාරිය ඉෂ්ට කරනකොට ඇවිල්ලා වෙඩි තියලා. ඔබතුමාත් දන්නවා, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු අතුරුදහන් කෙරෙව්වාය කියලා එක වෙලාවක කිව්වා. නීතිඥවරයෙකුට වෙඩි තිබ්බා කියලා තව වෙලාවක කිව්වා. ඒ ඔක්කෝම කරලා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, එය point of Order එකක් නොවෙයි. ඔබතුමා කියපු සිදුවීම සම්බන්ධයෙන් පොලීසිය සහ අදාළ ආරක්ෂක අංශ අනිවාර්යයෙන් ක්‍රියාත්මක විය යුතුයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, එහෙම mike එක off කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඒක point of Order එකක් නෙවෙයි නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේක point of Order එකක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, Point of Order එකක් නොවෙයි, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ, point of Order එකක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එය point of Order එකක් නොවෙයි. Points of Order තිබෙන්නේ සභාව පවත්වාගෙන යෑම සම්බන්ධව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ප්‍රාදේශීය සභාවේ සභාපති ලසන්ත වික්‍රමසේකර මහත්මයා තමන්ගේ සභා කාර්යාලයේ මහජන

දිනය පවත්වාගෙන යනකොට වෙඩි ප්‍රහාරයකට ලක් වෙලා තිබෙනවා. අපට දැන ගන්න ලැබී තිබෙන ආකාරයට එතුමාට බරපතළ ලෙස තුවාල වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, එය point of Order එකක් නොවෙයි. එයට නීතිය ක්‍රියාත්මක වෙයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට වෙඩි තැබීම සම්බන්ධ සිදුවීම වාර්තා වුණා. පොලීසිය දැන් ඒ ගැන විමර්ශන කරමින් පවතිනවා. ලැබෙන විමර්ශනවල ප්‍රතිඵල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන් ප්‍රමාණය මහජන ආරක්ෂක ඇමතිවරයා තව පැය කිහිපයකින් ඉදිරිපත් කරයි. දැන් තමයි පොලිස් විමර්ශන ආරම්භ කළේ. එම විමර්ශනවල ප්‍රගතිය, එම සිදුවීමට සම්බන්ධ අය අත්අඩංගුවට ගැනීම පිළිබඳ කරුණු ඉක්මනට පාර්ලිමේන්තුවට වාර්තා කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු විපක්ෂ නායකතුමාට ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති කියන්නේ, උඩින් පාත් වුණු කෙනෙක් නොවෙයි, මහජන නියෝජිතයෙක්. මහජන නියෝජිතයකු හැටියට තමන්ගේ මහජන දිනය ප්‍රාදේශීය සභාව තුළ පවත්වාගෙන යන්න බැරි නම්, රටේ ජාතික ආරක්ෂාවට මොකක්ද වෙලා තිබෙන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, එය රීති ප්‍රශ්නයක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ඊයේ වරප්‍රසාද ප්‍රශ්නයක් භාර දුන්නා. ඒක ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරන්නේ නැතිව ඔබතුමාම ප්‍රතික්ෂේප කළා. කමිටුවෙන් ප්‍රතික්ෂේප කළා නම් - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න, කථානායකතුමා. වරප්‍රසාද ප්‍රශ්නය -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක අදාළ නැත්නම්, මම ඒක ඔබතුමාට දැනුම්දීලා තිබෙනවා.

අමාත්‍යාංශ නිවේදනය, බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතා. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමාගේ point of Order එක මොකක්ද? *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, කථා කරන්න අවස්ථාව දෙන්න. මේ දැන් අපට ආරංචි වෙනවා, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ජීවිතක්ෂයට පත් වෙලා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නෙවෙයි. ඔබතුමාට තේරෙන්නේ නැහැ.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
ගරු කථානායකතුමනි, හදිසි අවස්ථාවක් නිසායි මම මේ අවස්ථාව ඉල්ලන්නේ. මොකද, මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන එකම මන්ත්‍රීවරයා මම. අපේ පක්ෂයෙන් පත් වුණු සභාපතිවරයා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක මේ සභාව පවත්වාගෙන යාමේ - *[බාධා කිරීම්]*

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
කරුණාකරලා මේකට action ගන්න. මොකද, මේ මරලා තිබෙන්නේ මහජන නියෝජිතයෙක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒවාට අනිවාර්යයෙන්ම නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. *[බාධා කිරීම්]*

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
අද මහජන දිනයක් පවත්වාගෙන යන්න බැරි තැනකට පත්ව තිබෙනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා පැහැදිලිවම කියනවා, මහජන ආරක්ෂක අමාත්‍යතුමා මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරනවා කියලා. *[බාධා කිරීමක්]* ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නය ඇහුවේ ව්‍යවස්ථාදායක සභාවට පත් කරලා ඉන්න කෙනාට විරුද්ධව. Bribery Commission එකට දැන් දීලා තිබෙනවා, පැමිණිල්ලක්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එහෙම නම් මට වරප්‍රසාද ප්‍රශ්නය අහන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, ඔබතුමා දිගින් දිගටම මන්ත්‍රීවරුන්ට වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කරන්න දෙන්නේ නැහැ. වරප්‍රසාද පිළිබඳ කමිටුවක් තිබෙන්නේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම ඒ වරප්‍රසාදය කඩ වෙලාද, නැද්ද කියලා විභාග කරන්න. ඔබතුමා ඔය තීරණය ගන්නවා නම් වරප්‍රසාද පිළිබඳව තිබෙන කමිටුව Standing Ordersවලින් ඉවත් කරන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

Bribery Commission එකේ පැමිණිලි සම්බන්ධව එන වරප්‍රසාද ප්‍රශ්න අහන්න දෙන්නේ නැත්තේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි.

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතා.

## වර්තමාන රජයේ බලශක්ති උත්පාදන ප්‍රතිපත්තිය: බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## தற்போதைய அரசாங்கத்தின் வலுசக்தி உற்பத்திக் கொள்கை: வலுசக்தி அமைச்சரினது கூற்று
## POWER GENERATION POLICY OF PRESENT GOVERNMENT: STATEMENT BY MINISTER OF ENERGY

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, 2025.03.21වන දින ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. • ගල්අඟුරු හා ඩීසල් බලාගාර ගණන 13යි. ඒවා පහත දැක්වේ.

| අ | බලාගාරය | ඉන්ධන වර්ගය |
|---|---|---|
| 1 | නොරොච්චෝලේ ලක්විජය ගල්අඟුරු බලාගාරය | ගල්අඟුරු |
| 2 | කැලණිතිස්ස විදුලි බලාගාරය (Small GT) | ඩීසල් |
| 3 | කැලණිතිස්ස විදුලි බලාගාරය (GT- 7) | |
| 4 | මතුගම බලාගාරය | |
| 5 | දකුණු ජනනි | |
| 6 | කැලණිතිස්ස විදුලි බලාගාරය 2 | |
| 7 | සපුගස්කන්ද විදුලි බලාගාරය A | දැවි තෙල් (ඩීසල් මඟින් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇත.) |
| 8 | සපුගස්කන්ද විදුලි බලාගාරය B | |
| 9 | Barge-mounted විදුලි බලාගාරය | |
| 10 | උතුරු ජනනි | |
| 11 | කැලණිතිස්ස ද්විත්ව චක්‍රීය විදුලි බලාගාරය | නැප්තා (ඩීසල් මඟින් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇත.) |
| 12 | යුගදනවි (West Coast) විදුලි බලාගාරය | Heavy fuel |
| 13 | සොබාදනවි විදුලි බලාගාරය | ඩීසල් |

• රජයට අයත් නොවන ඩීසල්/දැවි තෙල් බලාගාර එකක් ඇත. එය කෙරවලපිටියේ සොබාදනවි බලාගාරයයි.

• බලාගාරයන්හි හිමිකාරිත්වය පහත පරිදි වේ.

| සොබාදනවි බලාගාරය | ලක්දනවි සමාගම |
|---|---|
| යුගදනවි බලාගාරය | West Coast Power (Pvt) Limited. මෙම සමාගමේ අයිතියෙන් සියයට 59.63ක් රජයට අයත් ආයතනවලට අයත් වේ. |
| ඉහත වගුවේ 1 සිට 11 දක්වා ඇති බලාගාර | ලංකා විදුලිබල මණ්ඩලය සතු වේ. |

• විදුලි ඒකකයක් නිපදවීමට රජය වැය කරන මුදල (ලංකා විදුලිබල මණ්ඩලයට අයිති බලාගාරවලින්)

| **ඉන්ධන වර්ගය** | **2024 වර්ෂය සඳහා ජනන ස්ථානයේ ජනන ඒකක පිරිවැය (රුපියල්)** |
|---|---|
| ඩීසල් | 142.43 |
| දැවි තෙල් | 46.94 |
| නැප්තා | 54.45 |
| ගල්අඟුරු | 20.82 |
| ජල විදුලිය | 2.30 |
| සුළං | 12.12 |

• **පෞද්ගලික බලාගාරවලින් විදුලි ඒකකයක් මිලදී ගැනීම සඳහා රජය වැය කරන මුදල**

| **ඉන්ධන වර්ගය** | **2024 වර්ෂය සඳහා පුද්ගලික සංවර්ධකයින්ට ගෙවන ලද ඒකක පිරිවැය (රුපියල්)** |
|---|---|
| ඩීසල් (සොබාදනවි බලාගාරය) (ඉදිරියේදී ද්‍රවීකෘත ස්වාභාවික වායුවෙන් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.) | රු.80.20 (2024 දෙසැම්බර්) |
| දැවිතෙල් | රු.50.37 (2024 දෙසැම්බර්) |
| ජල විදුලි (කුඩා ජල විදුලි බලාගාර සඳහා) | සාමාන්‍ය රු.14.13 |
| සුළං | සාමාන්‍ය රු.15.73 |
| සූර්යාලෝකය (වහල මත) | කි.වො. 500 දක්වා - රු.27.06 |
| | කි.වො. 500ට වැඩි - රු.23.18 |
| | එකතු කිරීමේ යෝජනා ක්‍රමය - රු.23.18 |
| සූර්යාලෝකය (පොළොව මත) | සාමාන්‍ය රු.19.49 |
| Dendro | සාමාන්‍ය රු. 36.59 |
| ජෛව ස්කන්ධ (Biomass) | |
| නාගරික ඝන අපද්‍රව්‍ය | ලං.වි.ම ගෙවීම රු.36.20 (භාණ්ඩාගාරයෙන් රු.13.10ක් ගෙවනු ලැබේ.) |

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වරප්‍රසාද කඩවීම සම්බන්ධව ඔබතුමා එවපු ලේඛනයේ නිශ්චිතව සඳහන් කරලා නැහැ. එය පැහැදිලිව සඳහන් කරලා ලබා දීමට කටයුතු කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, දැන් අප දැනුවත් වුණු ආකාරයට වෙඩි වැදුණු ඒ සභාපතිතුමා අමාරු තත්ත්වයක ඉන්නේ. මේ වෙලාවේ සෞඛ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්නවා. කරුණාකරලා හෙලිකොප්ටරයක් යවලා හෝ ඔහු කොළඹට ගෙන්වා ගන්න. ජාතික අවශ්‍යතාවක් තිබෙන වෙලාවක තමන්ගේ දේශපාලන කාර්යාලයේ -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් මැදිහත් වීමක් කරයි, සෞඛ්‍ය අංශ විසින්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, ඒ වරප්‍රසාද ප්‍රශ්නය, නිශ්චිත කාරණයක් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන පැහැදිලි ප්‍රකාශයක් ලබා දුන්නා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමා ඉස්සෙල්ලා මම කියන්නේ මොකක්ද කියලා අහන්න. *[බාධා කිරීම්]*

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
ගරු කථානායකතුමනි, මම මේ සභාවේ කිසිම දෙයකට බාධාවක් නොකරන මන්ත්‍රීවරයෙක්. නමුත් මට අද මේ අවස්ථාව ලබා දෙන්න. මම මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන විපක්ෂයේ එකම මන්ත්‍රීවරයා. මහජන දිනයේදීම ඇවිල්ලා, අපි බලය ලබා ගත් ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ හිසට සහ පපුවට වෙඩි තියලා ගිහිල්ලා තිබෙනවා. දැන් ආරංචි වනවා, ඔහු මරණයට පත් වුණා කියලා. ගරු කථානායකතුමනි, මේ වාගේ තත්ත්වයක් තුළදී කොහොමද මහජන ආරක්ෂාව සහ රටේ ආරක්ෂාව තහවුරු කරන්නේ? මේ සභාවේ ඇමතිවරුන් ඉන්නවා. කරුණාකරලා මේ ගැන පියවර ගන්න. මේ වෙඩි තියලා යන්නේ මහජන නියෝජිතයෙකුට. අපට ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් තිබෙනවා. කරුණාකරලා ඒ සම්බන්ධව පියවර ගන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, පසුගිය කාලයේම විවිධාකාරයේ වෙඩි තැබීම් පිළිබඳව වාර්තා වුණා. ඒකට අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගනිමින් තිබෙනවා. ඒ විමර්ශනවල තත්ත්වය තවම මට වාර්තා කරන්න බැහැ. නමුත් අපි ඒ සම්බන්ධව අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා කියන එක ඔබතුමන්ලාට කියන්න පුළුවන්කමක් තිබෙනවා. අපි බලමු, මේවා පිටුපස ඉන්නේ කවුද කියලා. ඒ සියල්ල හෙළිදරව් වෙනවා. ඒ ගැන කලබල වෙන්න එපා. මට ඔබතුමන්ලා කියන කාරණාව තේරෙනවා. අපි ඔක්කෝම ඒ ගැන සංවේදියි. ඒ නිසා ඒකට යම් වෙලාවක් දෙන්න. *[බාධා කිරීම්]* මේ අපරාධ නතර කිරීම සඳහායි අපි කටයුතු කරමින් යන්නේ. *[බාධා කිරීම්]* නිකම් කෑ ගහන්න එපා. මන්ත්‍රීවරයෙක්, සභාපතිවරයෙක් නොවෙයි, ඕනෑම පුරවැසියෙකුගේ ජීවිතය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් රජය මැදිහත් වනවා. රජයට ඒ ගැන වගකීමක් තිබෙනවා. අපරාධ රැල්ලක් නිර්මාණය වෙච්ච රටක ඒ අපරාධ මර්දනය කිරීම සඳහා ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා. අදාළ පුද්ගලයින් අත්අඩංගුවට ගනිමින් ඉන්නවා. ආයුධ හම්බ වෙනවා. පොලිස් විමර්ශන දියත් වෙමින් පවතිනවා. ඒ නිසා ඔබතුමන්ලාත් දන්නා තොරතුරු ඉදිරිපත් කරලා මේකට සහාය දෙන්න. ඒක තමයි කළ යුතු වන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බලශක්ති අමාත්‍යතුමනි, අමාත්‍යාංශ නිවේදනයේ ඉතිරි කොටස ඉදිරිපත් කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

02. ගරු කථානායකතුමනි, 2025-2044 කාලසීමාව සඳහා කෙටුම්පත් කරන ලද දිගු කාලීන ජනන සැලැස්මට අනුව, 2030 වසර දක්වා ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමට අපේක්ෂිත සූර්ය බලශක්ති ව්‍යාපෘති පහත පරිදි වේ.

| වර්ෂය | එකතුව (මෙගාවොට්) |
|---|---|
| 2025 | 200 |
| 2026 | 370 |
| 2027 | 400 |
| 2028 | 450 |
| 2029 | 450 |
| 2030 | 450 |

- 2024 වසර අවසන් වනවිට;

  වහල මත සවි කරන සූර්ය බලාගාර - මෙගාවොට් 1,535

  (ලංකා විදුලිබල මණ්ඩලය මෙගාවොට් 1,266 + ලංකා විදුලි පුද්ගලික සමාගම මෙගාවොට් 269)

  ප්‍රධාන සූර්ය බලාගාර - මෙගාවොට් 175 (භූමිය මත ඉදි කරන ලද)

  මුළු සූර්ය බල ධාරිතාව - මෙගාවොට් 1,710

  එය මුළු ස්ථාපිත ධාරිතාවෙන් සියයට 20කි.

- 2023 - 2042 කාල සීමාව සඳහා අනුමත දිගුකාලීන ජනන සැලැස්මට අනුව, පුරෝකථනය කරන ලද මුළු සූර්යබල ධාරිතාව මෙගාවොට් 1,644ක් වූ අතර, 2024 දෙසැම්බර් මස වනවිට මුළු සූර්යබල ධාරිතාව මෙගාවොට් 1,586කි. එය පුරෝකථනය කරන ලද මුළු සූර්යබල ධාරිතාවෙන් සියයට 96ක් පමණ වේ.

- සූර්ය විදුලි බලය ප්‍රවර්ධනය සඳහා පහත පියවර ගෙන ඇත.

  - ඉදිරියේදී එක් කළ යුතු සූර්ය විදුලිබල ධාරිතාව දීර්ඝ කාලීන ජනන සැලැස්මට එක් කිරීම.

  - තරගකාරී ටෙන්ඩර් කැඳවීම මහින් සූර්ය විදුලි බලය මිලදී ගැනීම.

  - පාරිභෝජන රටාවට ගැළපෙන පරිදි වහල මත සවි කරන සූර්ය පද්ධති සඳහා යෝජනා ක්‍රම කිහිපයක් පාරිභෝගිකයන් වෙත ලබා දීම.

  - සූර්ය විදුලි බලය ඇතුළු පුනර්ජනනීය බලශක්ති ජාතික පද්ධතියට එක් කිරීම සඳහා සම්ප්‍රේෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා පියවර ගැනීම.

  - පුනර්ජනනීය ව්‍යාපෘති සඳහා අවශ්‍ය අනුමැතීන් ප්‍රමාදයකින් තොරව ලබා දීමට සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ ලංකා විදුලිබල මණ්ඩලය ඒකාබද්ධව කටයුතු කිරීම.

  - වහල මත සවි කරන සූර්ය විදුලි පද්ධති අනුමැතිය සඳහා මාර්ගගත පහසුකම් සැලසීම.

03. • 2024 අවසන් වනවිට;

වහල මත සවි කරන ලද සූර්ය බලාගාර - මෙගාවොට් 1,535

(ලංකා විදුලිබල මණ්ඩලය මෙගාවොට් 1,266 + ලංකා විදුලි පුද්ගලික සමාගම මෙගාවොට් 269)

ප්‍රධාන සූර්ය බලාගාර - මෙගාවොට් 175

මුළු සූර්යබල ධාරිතාව - මෙගාවොට් 1,710

- පියසි මත ඉදිකළ සූර්ය විදුලි ව්‍යාපෘති මඟින් මිලදී ගන්නා විදුලිය සඳහා දැනට ගෙවනු ලබන මිල ගණන් (2025.06.16 සිට) - විදුලි ඒකකයකට (කිලෝවොට් පැය ඒකකට);

  කිලෝවොට් 0 සිට 5 දක්වා - රුපියල් 20.90

  කිලෝවොට් 05 සිට 20 දක්වා - රුපියල් 19.61

  කිලෝවොට් 20 සිට 100 දක්වා - රුපියල් 17.46

  කිලෝවොට් 100 සිට 500 දක්වා - රුපියල් 15.49

  කිලෝවොට් 500 සිට
  මෙගාවොට් 01 දක්වා - රුපියල් 15.07

  මෙගාවොට් 01ට වැඩි - රුපියල් 14.46

- මීට අමතරව සූර්ය බලය ගබඩා කර රාත්‍රී කාලයේදී - night peak එකේදී - නැවත පද්ධතිය තුළට ලබා දීමේදී මෙගාවොට් පැයක් - hour 01ක් - සඳහා රුපියල් 45.80ක් ගෙවනු ලබනවා.
  2025.06.16 දින සිට ගිවිසුම්ගත වී ඇති ගිවිසුම්වලට ඉහත මිල ගණන් යටතේ ගෙවීම් කරන අතර මීට ප්‍රථම ඇති කරගත් ගිවිසුම් සඳහා ගෙවනු ලබන ගෙවීම්වල විස්තරය පහත දක්වා තිබෙනවා.

**වහලය මත සවි කරන ලද සූර්ය බල පැනල සඳහා අදාළ වන අය ක්‍රමයන්**

| අය ක්‍රමය අදාල වන කාලය | මිලදී ගැනීම් සිදු කරන ගිවිසුම් කාල පරාසය | විදුලිය ඒකකයක් සඳහා අගය / රුපියල් |
|---|---|---|
| *ස්ථාවර ගාස්තුඅය ක්‍රමය* | | |
| 2016.09.05 දින සිට | මුල් වසර 07 සඳහා | 22.00 |
| | වසර 08සිට 20 දක්වා | 15.50 |
| 2022.10.25 දින සිට | මුළු වසර 20මසඳහා | කි.වො. 500 දක්වා - 37.00 |
| | | කි.වො. 500 වැඩි-34.50 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 34.50 |
| 2024-07-01 දින සිට | මුළු වසර 20මසඳහා | කි.වො. 500 දක්වා - 27.06 |
| | | කි.වො. 500 වැඩි-23.18 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 23.18 |
| *විචල්‍ය ගාස්තු (විකල්ප) අය ක්‍රමය* | | |
| 2023.06.26 සිට | මුළු වසර 20පුරා මාස තුනෙන් තුනට සිදු කරන සංශෝධන මත. | කි.වො. 20 දක්වා - 48.89 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා- 47.79 |
| | | කි.වො. 100 ටවැඩිකි.වො. 500දක්වා- 44.17 |
| | | කි.වො. 500 වැඩි- 43.77 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 46.46 |
| 2023.10.01 සිට | - එම - | කි.වො. 20 දක්වා - 44.14 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා- 43.02 |
| | | කි.වො. 100 ටවැඩිකි.වො. 500දක්වා-39.72 |
| | | කි.වො. 500 වැඩි-39.32 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 42.03 |
| 2024.01.01 සිට | මුල් වසර 10සඳහා | කි.වො. 20 දක්වා - 36.30 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා-34.11 |
| | | කි.වො. 100 ටවැඩිකි.වො. 500දක්වා-31.58 |
| | | කි.වො. 500 වැඩි-29.66 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 31.95 |
| | 11 වන වසර සිට ඉදිරියට | කි.වො. 20 දක්වා - 15.82 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා-14.31 |
| | | කි.වො. 100 ටවැඩිකි.වො. 500දක්වා-13.04 |
| | | කි.වො. 500 වැඩි-12.05 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 14.34 |
| 2024.04.01 සිට | මුල් වසර 10සඳහා | කි.වො. 20 දක්වා - 34.10 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා-32.16 |
| | | කි.වො. 100 ටවැඩිකි.වො. 500දක්වා-29.75 |
| | | කි.වො. 500 වැඩි-27.92 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 30.23 |
| | 11 වන වසර සිට ඉදිරියට | කි.වො. 20 දක්වා - 14.79 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා-13.30 |
| | | කි.වො. 100 ටවැඩිකි.වො. 500දක්වා-12.10 |
| | | කි.වො. 500 වැඩි-11.15 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 13.46 |

[ගරු කුමාර ජයකොඩි මහතා]

| අය ක්‍රමය අදාළ වන කාලය | මිලදී ගැනීම් සිදු කරන ගිවිසුම් කාල පරාසය | විදුලිය ඒකකයක් සඳහා අගය / රුපියල් |
|---|---|---|
| 2024.07.01 සිට | මුල් වසර 10සඳහා | කි.වො. 20 දක්වා - 31.96 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා-29.88 |
| | | කි.වො. 100 ටවැඩිකි.වො. 500දක්වා-27.62 |
| | | කි.වො. 500 වැඩි-25.89 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 28.23 |
| | 11 වන වසර සිට ඉදිරියට | කි.වො. 20 දක්වා - 13.48 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා-12.02 |
| | | කි.වො. 100 ටවැඩිකි.වො. 500දක්වා-10.90 |
| | | කි.වො. 500 වැඩි-10.00 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 12.35 |
| 2024.10.01 සිට | මුල් වසර 10සඳහා | කි.වො. 20 දක්වා - 30.82 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා-28.77 |
| | | කි.වො. 100 ටවැඩිකි.වො. 500දක්වා-26.58 |
| | | කි.වො. 500 වැඩි-24.89 |
| | | එකතු කිරීමේ යෝජනාක්‍රම- 27.27 |
| | 11 වන වසර සිට ඉදිරියට | කි.වො. 20 දක්වා - 12.59 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා-11.15 |
| | | කි.වො. 100 ටවැඩිකි.වො. 500දක්වා-10.07 |
| | | කි.වො. 500 වැඩි- 9.22 |
| | | මෙ.වො. 01 සහවැඩි- 14.46 |
| 2025.06.16 | මුළු වසර 20ම සඳහා | කි.වො. 05 දක්වා - 20.90 |
| | | කි.වො. 05 ටවැඩිකි.වො. 20දක්වා-19.61 |
| | | කි.වො. 20 ටවැඩිකි.වො. 100දක්වා-17.46 |
| | | කි.වො. 100 වැඩි කි.වො. 500 දක්වා 15.49 |
| | | කි.වො. 500 වැඩි මෙ.වො. 01 දකවා -15.07 |
| | | මෙ.වො. 01 සහවැඩි- 14.46 |
| | වසර 10ක් සඳහා | බැටරි බලශක්ති ගබඩා පද්ධති සඳහා කාල පාදක ගාස්තු අයක්‍රමය.<br>උපරිම ඉල්ලුම් කාලය (18.30 පැය සිට 22.30 පැය දක්වා ) පමණක් රු.45.80ක් පහත කොන්දේසි වලට යටත්ව.<br>• සාමාන්‍ය සැපයුම්: එකලා පද්දති සඳහා කි.වො.5ක් දක්වා සහ අනෙකුත් පද්ධති සඳහා ගිවිසුම්ගත ඉල්ලුම දක්වා.<br>• තොගසැපයුම් : වහලයමත සවිකල සූර්ය පැනලවල ධාරීතාවය 80% ක් දක්වා.<br>• ජාතික විදුලි පද්ධතියෙන් ආරෝපණය කිරිම අක්‍රිය කල හැකි Inverter සඳහා පමණි.<br>• දිවා හෝ උපරිම ඉල්ලුම් කාල තුලදී උපරිම සීමාවන් ඉක්මවා පද්ධතියට අපනයනය කරන බලශක්තිය සඳහා සහ අඩු ඉල්ලුම් කාලය ( 22.30 පැය සිට 05.30 පැය දක්වා ) තුල අපනයනය කරන බලශක්තිය සඳහා ගෙවීමක් සිදු නොකරයි. |
| | | • මෙම අයක්‍රමය 2025.12.16 වෙනිදා හෝ නව ප්‍රතිපත්ති මාර්ගෝපදේශයක් නිකුත් කරන තුරු යන දෙකෙන් මුල්ම අවස්ථාව දක්වා පමණක් වලංගු වේ. |

සටහන: මෙම වහල මත සවිකල සූර්ය බල පැනල සඳහා අදාළ වන අය ක්‍රමය නිර්ණය කිරීමේදී, බැංකු ණය සඳහා ගෙවීම් කරන කාලය තුලදී වැඩි ප්‍රතිලාභයක් ලබාදීම සඳහා, යම් යම් කාල වලදී, ද්විත්ව ස්ථර අය ක්‍රමයක් (two tier tariff) හඳුන්වා දී ඇත.

කමිටුව එකඟවූ මිල සූත්‍ර මත මිල ගනන් තීරණය කරනු ලබයි. පවතින ආර්ථික තත්වයන් හා සූර්ය බල පැනල වල මිල ගනන් සැලකිල්ලට ගනිමින් වාර්ෂිකව මෙම මිල ගනන් ගණනය කිරීම සිදු කරනු ලැබේ.

කෙසේනමුත්, මූල්‍ය දත්තයන් යම් කාලසීමාවක් තුල සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස් වුවහොත් ගෙවීම සිදුකරන මිලගණන් නැවත ගණනය කිරීමට අවධානය යොමු කරනු ලැබයි.

ඉහත කරුණු සලකා බැලීම සිදුකිරීමෙන් අනතුරුව, සූර්ය විදුලි ව්‍යාපෘති වල මිල ගණන් මත ගෙවීම් කටයුතු කැබිනට් අනුමැතියකින් අනතුරුව සිදුකරනු ලබයි.

- 2025 අගෝස්තු මස අවසානය වන විට පියසමත හරහා ස්ථාපිත ධාරිතාව ;

  ලංවිම හරහා ස්ථාපිත ධාරිතාව - 1,706 MW
  ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) හරහා ස්ථාපිත ධාරිතාව - 329 MW
  **පියසමත ඉදිකළ සූර්ය විදුලි ව්‍යාපෘති මුළු ධාරිතාව - 2,035 MW**

- 2025 ඔක්තෝබර් 07 දිනට පොළොවමත ඉදිකල සූර්ය විදුලි ව්‍යාපෘති (ලංවිම හරහා)මුළු ධාරිතාව - 192 MW

- අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන කමිටුවක් මඟින් පවතින ආර්ථික තත්ත්වය පිළිබඳව සැලකිල්ලට ගෙන එකඟ වූ මිල සූත්‍රයක් පදනම් කරගෙන මෙම මිල ගණන් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. බලශක්ති අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, මහජන උපයෝගිතා කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මහ බැංකුව යන ආයතන නියෝජනය වන පරිදි කමිටුවේ සාමාජිකයන් පත්කර ඇත. වසර 20ක ගිවිසුම් කාලයක් සඳහා සාමාන්‍ය අගය - Levelized Cost of Energy - මෙමඟින් ගණනය කෙරේ.
- එසේ ගණනය කරනු ලබන මිල ගණන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත් පසු ක්‍රියාත්මක කෙරේ.

04. • පොළොව මත සවි කරන සූර්ය විදුලි ව්‍යාපෘති මඟින් මිලදී ගන්නා විදුලිය සඳහා දැනට ගෙවන මිල ගණන්;

ප්‍රමිතිගත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම - Standard Power Purchase Agreement එක - යටතේ වූ ව්‍යාපෘති යටතේ එක් ඒකකයකට; කිලෝවොට් පැය එකකට රුපියල් 17.62කි.

තරගකාරි ටෙන්ඩර් කැඳවීම මඟින් මෑතකදී ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිවල සාමාන්‍ය අනුපාතය - රුපියල් 18.71.

එය කප්පාදු කිරීමක් නොව වෙළෙඳ පොළ සාධක වෙනස්වීම මත එකී ප්‍රතිලාභ පාරිභෝගික ජනතාවට ලබා දීමේ අරමුණින් මිල සංශෝධනය කරනු ලබයි. එසේ කිරීම සැබෑ ආයෝජකයින් කිසිසේත්ම අධෛර්යවත් කිරීමක් නොවේ.

- දැනට ක්‍රියාත්මක කර ඇති සූර්ය බලශක්ති ව්‍යාපෘති ගණන - 96 (මුළු ධාරිතාව මෙගාවොට් 175)
- සංවර්ධකයින් ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ඉල්ලුම් පත් ඉදිරිපත් කරමින් පවතී.
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අනුමැතිය හිමි පවතින පොළොව මත සූර්ය බලශක්ති ව්‍යාපෘති
  - සූර්ය විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම - SPPA - අත්සන් කර ඇති සහ පැවරීමට නියමිත ව්‍යාපෘති - 74 (මෙගාවොට් 430)
  - ටෙන්ඩර් කැඳවා ඇති ව්‍යාපෘති;
    - ගිවිසුම් අත්සන් කර ඇති - 26 (මෙගාවොට් 99)
    - ගිවිසුම් අත්සන් කිරීමට නියමිත -55 (මෙගාවොට් 202)

05. වහල මත සූර්ය පැනල ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ විදුලිබල ජාලය පුළුල් කිරීම සඳහා අමතර පිරිවැයකින් තොරව ක්‍රියාකාරී වහල මත සූර්ය පැනල ස්ථාපනය කිරීමෙන් එක් එක් පාරිභෝගිකයාගේ විදුලි පරිභෝජනය ආවරණය කිරීමයි. කෙසේ වෙතත්, පාරිභෝගිකයාගේ ගිවිසුම්ගත විදුලි ඉල්ලුම ඉක්මවා සූර්ය පැනල ස්ථාපනය කිරීමට අවසර ලබා දීමත් සමඟ වහල මත සූර්ය පැනල ස්ථාපනය විශේෂිත ට්‍රාන්ස්ෆෝමරයකට සම්බන්ධ පාරිභෝගිකයින් කිහිපදෙනෙකු අතර බෙදා හරින ලද අතර, එම ට්‍රාන්ස්ෆෝමර්වලට සම්බන්ධ බොහෝ පාරිභෝගිකයින්ට ඔවුන්ගේ වහල මත සූර්ය පැනල ස්ථාපනය කිරීමේ අවස්ථාව මඟ හැරිණ. 2025.03.17 දිනැති අංක 2025/GM/08/DCC චක්‍රලේඛය මඟින්, අනෙකුත් පාරිභෝගිකයින්ට තම වහලවල් මත සූර්ය පැනල සවි කිරීමට අවස්ථාවක් ලබා දෙමින්,

ග්‍රිඩ්සුම්ගත විදුලි ඉල්ලුම දක්වා පමණක් සූර්ය පැනල ධාරිතාව සඳහා අවසර දීමෙන් වහල මත සූර්ය පැනල ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ මූලික අදහස නැවත ස්ථාපිත කරන ලදී.

06. 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත 2025.08.18වන දින පාර්ලිමේන්තුවේදී සම්මත කර ඇත.

ගරු කථානායකතුමනි, ඊට අමතරව මම මේ අවස්ථාවේදී පොඩි සඳහනකුත් කරන්න ඕනෑ. ඊයේ දිනයේ ගරු විපක්ෂ නායකතුමා විසින් මතු කළ ප්‍රකාශයක් පිළිබඳව පැහැදිලි කිරීමක් මේ සමඟම ඉදිරිපත් කිරීමට මම කැමැතියි. එතුමාගේ පක්ෂයේ පක්ෂ නායකයා විධියට එතුමා ඊයේ මෙම ගරු සභාවට පැහැදිලිව කිව්වා, ලංකා විදුලිබල මණ්ඩලය සතුව ඔවුන්ගේ වෘත්තීය සමිතියක් නොමැති බව. නමුත් මා ළඟ දැන් තොරතුරු තිබෙනවා, සමගි සේවක සංගමය ලෙසින් විදුලිබල මණ්ඩලය තුළ අංක 9422 යටතේ ලියාපදිංචි වෘත්තීය සමිතියක් ඇති බවට. එම වෘත්තීය සමිතියේ සංවිධායක වන ආර්.ජී.එස්.ආර්. රූපසිංහ නොහොත් රොෂාන් විසින් අප වෙත ඉල්ලීම් 24ක් අඩංගු ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ලිපිය සැප්තැම්බර් 03වැනි දා තමයි අපට ඉදිරිපත් කරලා තිබෙන්නේ. වෘත්තීය සමිති නියෝජිතයන් 25දෙනෙක් ඊට අත්සන් කර තිබෙනවා. ඒ අත්සන් ලේඛන අවශ්‍ය නම් මට සභාගත කරන්න පුළුවන්. ඒක මම හිතන විධියට, විපක්ෂ නායකතුමාටත් දැනගන්න හොඳ තොරතුරක්. ඔවුන් සමඟ ඔක්තෝබර් 13වැනි දා පැවති රැස්වීමක් ගැන තමයි එතුමා ඊයේ මතු කළේ. එම සිද්ධියට අදාළව මා සමඟ පැවති වෘත්තීය සමිති රැස්වීමට සමගි සේවක සංගමයේ ලේකම් ලෙස සුනිල් විතාන ආරච්චි - ලිපිකරු, සේවක අංකය 19104, සේවා ස්ථානය, ඇතුල්කෝට්ටේ - සහභාගි වී ඇති බවත්, එම අත්සන් ලේඛන මා සතුව ඇති බවත් මම තවදුරටත් දැනුම් දෙනවා.

රටේ ජනාධිපති වීමට සිහින දකිමින් ඉන්නකොට මේක තම වෘත්තීය සමිති පිළිබඳවවත් දැනීමක් නොමැති වීමක්ද? එහෙම නැත්නම් මේක පක්ෂයටත් හොරෙන් වෘත්තීය සමිති හදාගෙන දහස් ගණනක් සේවකයින්ගේ සාමාජික මුදල් වංචා කරන අවස්ථාවක්ද කියන එක ගැන මම හිතන විධියට, විපක්ෂ නායකතුමා වගකීමෙන් යුතුව හොයා බලන්න ඕනෑ. මොකද, ඒ මුදල් සේවකයින් ඔක්කෝම ගෙවනවා, ලියාපදිංචි වෘත්තීය සමිතියක් විධියට. එතකොට පක්ෂයක් දන්නේ නැතුවද ඒ මුදල් එකතු කරන්නේ? ඒ ගැනත් හොයා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා. වෘත්තීය සමිති නියෝජිතයින් 25දෙනෙකුගේ නම් ඇතුළත් අත්සන් ලේඛනය ඇතුළු ලේඛන මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මම ඒ ප්‍රශ්නය යොමු කළේ 2030 වනකොට සියයට 70ක් දක්වා පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම රජයේ ඉලක්කයක් බවට පත්වෙලා තිබෙන නිසායි. එම ඉලක්කය කරා යන්නට සූර්ය බල - solar power - විදුලි ඒකකයක් සඳහා ගෙවන මුදල රුපියල් 37 ඉඳලා රුපියල් 27ට අඩු කළා. නැවත රුපියල් 27 ඉඳලා රුපියල් 24ට අඩු කළා. දැන් රුපියල් 24 ඉඳලා රුපියල් 18ට අඩු කරලා තිබෙනවා. ඇත්තවශයෙන්ම මෙහිදී සිදු වෙන්නේ සූර්ය බලශක්තිය, එහෙම නැත්නම් සුනිත්‍ය බලශක්තිය පලුදු කිරීමක්. ඒ අයට ගෙවන rate එක අඩු කරනකොට සිද්ධ වෙන්නේ සූර්ය බලශක්ති ප්‍රවර්ධනය උදෙසා ක්‍රියාත්මක වුණු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට බරපතළ අගතියක් සිදුවෙලා සූර්ය බලශක්තියට යොමු වන ප්‍රමාණය සහමුලින්ම අධෛර්යවත් කිරීමක්.

මේක disincentive එකක්. ඒ නිසා මම මේ අවස්ථාවේ යෝජනා කරන්න කැමැතියි, කරුණාකරලා සූර්ය බලශක්තියට ගෙවන මුදල් ප්‍රමාණය කපා දමන්නේ නැතිව ඒ තිබුණු තත්ත්වයටම ගෙන එන්න කියලා.

ඒ වාගේම ඔබතුමන්ලා 2030 වනකොට පුනර්ජනනීය බලශක්තිය - renewable energy - සියයට 70 ඉලක්කය කරා ගෙන යෑමට ඒක ඇතුළට LNGත් ඇතුළු කර තිබෙනවා. එතකොට LNG කියන්නේ පුනර්ජනනීය බලශක්තියද? පුනර්ජනනීය බලශක්තියට LNG බලශක්තියත් ඇතුළු කරලා තිබෙනවා. අපි පිළිගන්නවා, ගල් අඟුරු එක්ක සංසන්දනය කළාම LNG බලශක්තිය තුළින් සිදු වන කාබන් විමෝචනය අඩුයි කියලා. නමුත්, LNG කියන්නේ පුනර්ජනනීය බලශක්තිය නොවෙයි. ඒකෙනුත් සල්ෆර් විමෝචනය ඇතුළු පරිසරයට අහිතකර තවත් ක්‍රියාදාමයන් රැසක් සිද්ධ වෙනවා. ගරු ඇමතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට කියන්න කැමැතියි, LNG කියලා පටන් ගත් ව්‍යාපෘති, - උදාහරණයක් හැටියට යුගදනවි - අද වෙනතුරු LNG වෙලා නැහැ කියන එක. ඒ මොකද, ඒකට අවශ්‍ය FSRU එක ක්‍රියාත්මක නොවීම තුළ LNG ව්‍යාපෘති කියලා ක්‍රියාත්මක වෙන්නේ ඉන්ධන බලාගාර, ඩීසල් බලාගාර. ඒ නිසා විශේෂයෙන්ම මම අමාත්‍යවරයාගේ අවධානය යොමු කරන්න කැමැතියි, පුනර්ජනනීය බලශක්තිය පලුදු කරන්නට කටයුතු කරන්නේ නැතිව සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය කරන්නය කියන කාරණයට. අද වනකොට ව්‍යවසායකයන් විශාල ප්‍රමාණයක් අගතියට පත් වෙලා තිබෙනවා. එම නිසා කරුණාකරලා ඒ අයට ගෙවපු ඒ නිශ්චිත මුදල ලබා දීලා, ඒ අයව අධෛර්යවත් කරන්නේ නැතිව, ඒ අයව සූර්ය බලශක්ති ව්‍යාපෘති උදෙසා ධෛර්යවත් කරන රාජ්‍ය ප්‍රතිපත්තියකට යොමු වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, මට නම් මගේ උත්තරයේවත් හොයා ගන්න බැහැ, LNG පුනර්ජනනීය බලශක්තිය කියලා සඳහන් කර තිබෙනවාද කියලා. මගේ අතින් එහෙම කියැවුණේත් නැහැ; මේ උත්තරයේවත් නැහැ. මම දන්නේ නැහැ, ඒක කොහොමද එතුමා උපුටා දැක්වූවේ කියලා. ඇත්තටම අපි එහෙම කරන්නේ නැහැ. Firm energy විධියට අපි LNG හෝ ඩීසල් හෝ ගල් අඟුරු ගන්න ඕනෑ, ජල විදුලිය අඩු වෙන වෙලාවට මේකේ stability එක තබා ගන්න. මොකද, සූර්ය බලශක්තියෙන් හෝ windවලින් ඒක කරන්න බැරි නිසා. ඔබතුමන්ලාගේ ගෙවල්වල විදුලිය හැම තිස්සේම විසන්ධි වීමට ඉඩ තිබෙනවා. ඉතින්, ඒකට තමයි අපට firm energy, ඒ කියන්නේ අපට බර තිබෙන frequency එක, එහෙම නැත්නම් අවස්ථිතිය, විශේෂයෙන්ම grid inertia එක තබා ගන්න පුළුවන් ප්‍රභවයන් ඕනෑ වන්නේ. ඔබතුමා ඒ පිළිබඳව තාක්ෂණික වශයෙන් පොඩ්ඩක් හොයා බැලුවොත් හොඳයි. ඒ හින්දා තමයි අපි ඒවා ප්‍රවර්ධනය කරන්නේ.

ඒ වාගේම ඔබතුමා නැවත කළ දීර්ඝ පැහැදිලි කිරීම ගත්තොත්, ඒ සම්බන්ධව මම ප්‍රශ්න අංක 4 සහ 5 යටතේ පැහැදිලිව පිළිතුරු ඉදිරිපත් කර තිබෙනවා. කිසිම විධියකින් මේවා කපා හැරීමක් නොවෙයි සිදු කරන්නේ. මොකද, solar panelsවල

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කුමාර ජයකොඩි මහතා]

මිල පසුගිය අවුරුද්දට වඩා සියයට 33කින් අඩු වෙලා තිබෙනකොට, ඩොලර් එක රුපියල් 305, රුපියල් 306 වැනි අගයක තිබිලා දැන් රුපියල් 300ට අඩු වෙලා තිබෙනකොට, ඒ ප්‍රතිලාභය ජනතාවට. මොකද, ඔබතුමන්ලා එක වෙලාවක ප්‍රශ්න කරනවා, විදුලි බිල අඩු කරන්නේ නැද්ද කියලා. අනෙක් පැත්තට අහනවා, මේක අඩු කරන්නේ ඇයි කියලා. එහෙම කවදාවත් බිස්නස් එකක් කරන්න බැහැ නේ, ලෝකයේ. වැඩි ගණනට අරගෙන අඩු ගණනට දෙන්න පුළුවන්කමක් නැහැ. එතකොට ඒකට සහනාධාරයක් දෙන්න වුණත් ජනතාවගෙන්; ගෙවල්වල විදුලි බලය නැති වුණත් හැමෝගෙන්ම එකතු කරන බදුවලින් තමයි ගෙවන්න වෙන්නේ. ඉතින්, අපි මේක කළමනාකරණය කරන්නේ ටිකක් වෙනස් විධියට. දැනටත් ගන්න ඕනෑ ප්‍රමාණයට වඩා ගොඩක් අඩුවෙන් තමයි අපි ගන්නේ. එහෙත් අපි බොහොම අමාරුවෙන් මේක අවශ්‍ය විධියට කළමනාකරණය කරනවා. අපේ ඉලක්කය වෙන්නේ මේක පිරිවැයට සමාන කරන්න. හැබැයි, පිරිවැය වැඩියි කියලා අපි ජනන මිල වැඩියෙන් ගන්නේ නැහැ. දැන් අපි ඒක තමයි කරලා තිබෙන්නේ. ඒකෙන් කාටවත් පාඩුවක් සිදු වෙලා නැහැ. ශත පහක්වත් ආයෝජනය නොකර ව්‍යාපෘති පටන් ගත්ත අයට පාඩු සිද්ධ වෙලා තිබෙනවා. මොකද, ඒගොල්ලන් ඉඩමත් ණයට ගන්නේ, බැංකුවෙන් සල්ලි ටිකත් ගන්නවා. ඒගොල්ලන්ගේ අතේ ශත පහක් නැහැ. එහෙම ආයෝජනය කරන්න ගියාම පොඩ්ඩක් පාඩු සිද්ධ වෙනවා. හැබැයි, genuine developersලාට කිසිම විධියකින් පාඩුවක් සිද්ධ වෙලා නැහැ. අපට ඕනෑ තරම් ඉල්ලීම් එනවා. මේ අවුරුද්දේ ජනන සැලැස්මට අනුව ගන්න ඕනෑ ප්‍රමාණය ඉක්මවලා දැන් අපි අවසර දීලා තිබෙනවා. ඒ හින්දා 2030 වෙනකොට අපේ පුනර්ජනනීය බලශක්තිය සියයට 70ක ඉලක්කය කරා අපි ගෙන යනවා. ඒකට අවශ්‍ය යටිතල පහසුකම් ගොඩක් සංවර්ධනය කරන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, පිළිතුර කෙටි කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
අපට grid capacity නැහැ. ඒ ටික කරලා තමයි අපට මේක තව expedite කරන්න පුළුවන් වෙන්නේ. අපි ඒ target එකේ යනවා. තව අවුරුදු දෙකක්, තුනක් යනකොට අනුරාධපුරයෙන් එහා දිගටම සංවර්ධනය කිරීමේ තව සැලැස්මක් අපට තිබෙනවා. ඒවාට අවශ්‍ය මූල්‍ය සම්පාදනය කර ගැනීම, designing කිරීම වාගේ ගොඩක් වැඩ අපි කරගෙන යනවා. අපි ඒක අවුරුදු දෙකක්, තුනක් ඇතුළත කරනවා.

එහෙම කරලා, මීට වැඩිය expedite කරනවා. ඒ වාගේම ඉල්ලුමත් අපි වැඩි කරන්න ඕනෑ. ඒ වාගේම, සූර්ය බලය බැටරි තාක්ෂණය හරහා ගබඩා කරන කාර්යයත් අපි පටන් අරගෙන තිබෙනවා. මේවා කරන්න තිබුණේ, 2018දී, 2019දී විතර. හැබැයි, කවුරුවත් කරලා නැහැ. අපි දැන් පටන් අරගෙන තිබෙනවා. අදාළ ටෙන්ඩර් විවෘත කරලා තිබෙනවා. ලොකු තරගකාරිත්වයක් තිබෙනවා. අපි ඒක welcome කරනවා. ඒ වාගේම ඒක ඉදිරියේදී තවත් දියුණු කරලා මේක ඉස්සරහට ගෙනියනවා. ඒ හින්දා අර වැරදි ආකල්ප ඇති කරන්න එපා. අපි මේවා කපන්නේ නැහැ. ජනතාව වෙනුවෙන් නම් ඡන්දය ගත්තේ, ජනතාවගෙන් නම් ඡන්දය ගත්තේ එහෙම කරන්නේ නැහැ. ලක්ෂ 70කට එහා පාරිභෝගික සංඛ්‍යාවක් ඉන්නවා, ලංකා විදුලිබල මණ්ඩලය යටතේ විතරක්. ඒගොල්ලන් ගැනත් අපි හිතන්න ඕනෑ. විදුලිය වැඩි මුදලට මිලදී අරගෙන, ඒගොල්ලන්ට අඩුවට දෙන්න නම් කවදාවත්, කුමන පක්ෂයකින්වත්, පරණ ආණ්ඩුවකින්වත් සල්ලි ඉතුරු කරලා නැහැ; ණය අරගෙන මිසක්. ඒ හින්දා ඒකත් මතක තියාගෙන අපි ඉස්සරහට යන්න ඕනෑ. ජනතාව ආරක්ෂා කරනවා වාගේම මේ ව්‍යාපාරයත් ආරක්ෂා කරන ප්‍රතිපත්තියක අපි යන්නේ. ඇත්ත ආයෝජකයන්ගෙන් ඕනෑ තරම් හොයලා බලන්න. අපි කිසිම විධියකින් ඒක අකර්මණ්‍ය කරන්න, අධෛර්යවත් කරන්න කටයුතු කරන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, පසුගිය දින කිහිපය පුරා ඇද හැලුණු අධික වර්ෂාපතනය නිසා ගංවතුර තත්වයන් සහ නාය යෑම් සිද්ධීන් සමහර ස්ථානවලින් වාර්තා වෙලා තිබෙනවා. මෙම ආපදා සිදුවීම් සම්බන්ධව සහ ඒ තත්ත්වය පිළිබඳ යම් තොරතුරු ප්‍රමාණයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. ඒ වාගේම රජය ගනිමින් සිටින ක්‍රියාමාර්ග ගැනත් සඳහන් කරන්න කැමැතියි.

විශේෂයෙන් මේ වන විට රට පුරා දිස්ත්‍රික්ක 14ක පමණ, එනම් කුරුණෑගල, අනුරාධපුරය, ගාල්ල, කෑගල්ල, බදුල්ල, මහනුවර, පුත්තලම, කොළඹ, නුවරඑළිය, වවුනියාව, මොනරාගල, කළුතර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවක මේ ආපදාවට ගොදුරු වෙච්ච පුද්ගලයන් 9,500ක් පමණ වාර්තා වෙලා තිබෙනවා. ඉතින් මේ සම්බන්ධයෙන් රජය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් යම් ක්‍රියාමාර්ග ප්‍රමාණයක් අනුගමනය කරගෙන යනවා. ගරු කථානායකතුමනි, අපේ ආපදා කළමනාකරණ විෂය භාර නියෝජ්‍ය ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් කරුණු වාර්තා කරයි. මේ පිළිබඳව අමාත්‍යාංශ ගණනාවක් මෙහෙයවමින් මැදිහත්වීමක් සිදු කරමින් සිටින බව මතක් කරමින්, ඒ අපි කරන කටයුතු පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
ගරු කථානායකතුමනි, පවතින ආපදා තත්ත්වය සම්බන්ධයෙන් ගත්තොත්, දිවයිනේ පසුගිය දින කිහිපය තුළ ඇති වූ අධික වර්ෂාපතනය හේතුවෙන් දිස්ත්‍රික්ක ගණනාවකින් ආපදා සිදුවීම් කිහිපයක් වාර්තා වුණා. නමුත් දැනට රට තුළ කිසිදු

ප්‍රදේශයකින් බරපතළ ආපදා තත්ත්වයක් වර්ධනය වීමක් මේ දක්වා වාර්තා වෙලා නැහැ. ඒ බව කියන්න කැමැතියි. අදාළ ආයතන අතර කාලෝචිත සම්බන්ධීකරණය තුළින් මෙම සිදුවීම් ඵලදායී ලෙස දැනට කළමනාකරණය කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඒවා කිසිවක් ප්‍රධාන ආපදා දක්වා වර්ධනය වෙලා නැහැ.

ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා දැන්වූ පරිදි දිස්ත්‍රික්ක 14කට පමණ මෙය බලපා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 67ක සිදුවීම් වාර්තා වෙලා තිබෙනවා. සමස්තයක් වශයෙන් පවුල් 2,351ක්, ආසන්න වශයෙන් පුද්ගලයින් 9,392ක් ඇතුළුව විවිධ මට්ටම්වල පිරිසක් පීඩාවට පත් වෙලා තිබෙනවා. දිස්ත්‍රික්ක වශයෙන් ගත්තාම, කුරුණෑගල, අනුරාධපුරය, ගාල්ල, කෑගල්ල, බදුල්ල, මහනුවර, පුත්තලම, කොළඹ, නුවරඑළිය, වවුනියාව, මොනරාගල සහ කළුතර යන දිස්ත්‍රික්කවල තමයි මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 67 ඇතුළත් වෙලා තිබෙන්නේ. ගාල්ලේ විතරක් පවුල් 1,009ක්, පුද්ගලයන් 3,506ක් පමණ පිරිසකට මේ අපදා තත්ත්වය බලපා තිබෙනවා. කුරුණෑගල පවුල් 257යි, මාතලේ පවුල් 53යි, කළුතර පවුල් 27යි. මේ අතුරින් පවතින ගංවතුර තත්ත්වයට සෘජුවම සම්බන්ධ නොවුවත් අනුරාධපුර, කෑගල්ල සහ මහනුවර දිස්ත්‍රික්කවලින් මරණ තුනක් වාර්තා වෙලා තිබෙනවා. කෑගල්ල දිස්ත්‍රික්කයේ එක් අයෙකු තවමත් අතුරුදහන් වෙලා සිටිනවා. ඊට අමතරව, තද සුළං සහ බෑවුම් බිඳ වැටීම් හේතුවෙන් නිවාස 377කට අර්ධ හානි සිදු වෙලා තිබෙනවා.

කොළඹ දිස්ත්‍රික්කය ගත්තාම, පීඩාවට පත් පවුල් 32ක් ඔවුන්ගේ ඥාතීන් සමඟ නවාතැන් ගෙන සිටිනවා. තිඹිරිගස්යාය ප්‍රදේශයේ එක් ආරක්ෂක මධ්‍යස්ථානයක් ස්ථාපිත කළා. එහි පවුල් 8කට අයත් පුද්ගලයන් තිස්දෙනෙකු පමණ තාවකාලිකව දැනට නවාතැන් ගෙන තිබෙනවා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් දැනට නිකුත් කරන ලද අනාවැකි සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් සපයන ලද ගංවතුර සහ නායයෑම් අනතුරු ඇඟවීම්වලට අනුව, අවදානමට ලක්විය හැකි සියලු ප්‍රජාවන්ට නිසි අනතුරු ඇඟවීම් නිකුත් කරලා තිබෙනවා.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අපේ Emergency Operation Centre එක තිබෙනවා. එය දැනට පැය 24 පුරාම ක්‍රියාත්මක වෙනවා. 117 හදිසි ඇමතුම් අංකය දරන ඇමතුම් මධ්‍යස්ථානය තිබෙනවා. එයත් මහජන සන්නිවේදනය පහසු කිරීම සඳහා විවෘතව පවතිනවා. ඒ වාගේම, පීඩාවට පත් පවුල් සඳහා ආපදා සහන සේවා මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙලා තිබෙනවා, ඒ පවුල්වලට අවශ්‍ය සහන ලබා දීම සඳහා. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය පරිපාලන ඒකකයන් සමඟ මේ වන විටත් අවශ්‍ය සම්බන්ධීකරණය කරමින් සහන ලබා දීමේ කටයුතුවල යෙදී සිටිනවා. පසුගිය දින කිහිපයේදී වර්ෂාව නිසා ඇති වූ ප්‍රතිඵල නිසා අවහිර වී තිබූ සියලුම මාර්ග සහ විශේෂයෙන් දුම්රිය මාර්ග යථා තත්ත්වයට පත් කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතිනවා. ඊළඟ දිනය තුළ -බොහෝ දුරට අද හෝ හෙට- දුම්රිය සේවා හා මහාමාර්ග සාමාන්‍ය තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කරනවා.

වර්ෂාපතනය ගත්තාම, වර්ෂාපතනය ඇද හැලීමේ ප්‍රවණතාව දැනට අඩු වෙමින් පවතින අතර, පවතින අයහපත් කාලගුණ තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට පත් වනු ඇතැයි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පුරෝකථනය කරනවා. පවතින තත්ත්වය සමීපව නිරීක්ෂණය කරමින් අවශ්‍ය අවස්ථාවලදී කාලෝචිත හා හදිසි ප්‍රතිචාර දැක්වීම සහ ආපදා සහාය ලබා දීම සඳහා විශේෂයෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ආපදා සහන සේවා මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අංශ, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක බල ඇණිය, විශේෂයෙන්ම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් කටයුතු කරන බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

බොහොම ස්තුතියි.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 සහ 2 විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 4.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම.

## විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත: නියමය
## விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம்: கட்டளை
## SPECIAL COMMODITY LEVY ACT: ORDER

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අගෝස්තු 25 දිනැති අංක 2451/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.10.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 දරන යෝජනාව - සුරාබදු ආඥාපනත යටතේ රීති - ද මා ඉදිරිපත් කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Nishantha Jayaweera to start the Debate. You have 12 minutes.

[පූ.භා. 11.49]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, අද දින විවාදයට ලක් කර අනුමත කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙනවා, අංක 962 දරන සුරාබදු නිවේදනය **සංශෝධනය** කිරීම සඳහා වන සුරාබදු ආඥාපනත යටතේ රීති සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ආනයනය කරනු ලබන අල සහ බී ලූනු වෙනුවෙන් පනවනු ලබන වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය කර දේශීය ගොවියාට සාධාරණ මිලක් ලබා දීම සඳහා වන නියමය. අද ඒ දෙකම අනුමත කර ගැනීමට නියමිතයි.

අපි ප්‍රථමයෙන්ම සුරාබදු නිවේදන 962 යටතේ වන සංශෝධනය සාකච්ඡාවට බඳුන් කරමු. සාමාන්‍යයෙන් සුරාබදු දෙපාර්තමේන්තුවට මත්පැන් නිෂ්පාදන මත බදු අය කර ගන්න බලය ලබා දෙන්නේ 52වන අධිකාරිය යටතේ වන සුරාබදු ආඥාපනත මඟින් සහ ඊට ආනුෂංගිකව නිකුත් කර තිබෙන සුරාබදු නිවේදන මඟින්. මත්පැන් නිෂ්පාදන මත සුරාබද්ද අය කරන්නේ කුමන ආකාරයටද කියා පරීක්ෂා කර බැලුවොත්, මත්පැන් නිෂ්පාදකයෙකු සුරාබදු ආඥාපනත මඟින් නියම කර තිබෙන විධිවිධානයන්ට යටත්ව තම මත්පැන් නිෂ්පාදන මත සති 2කට වරක් සුරාබදු ගෙවීමට නියමිත වෙනවා.

ඒ අනුව අප එක මාසයක් සැලකිල්ලට ලක් කළොත්, ඒ මාසයේ පළමු දවස් 15 තුළ නිෂ්පාදනය කරනු ලබන මත්පැන් වෙනුවෙන් ගෙවිය යුතු සුරාබද්ද එම මාසයේ අවසාන දිනට පෙර, ඒ කියන්නේ දවස් 15ක් ඇතුළත ගෙවන්න නියමිත වෙනවා. ඒ වාගේම, එම මාසයේ 16වැනි දින සිට එම මාසය අවසානය දක්වා වන කාල පරිච්ඡේදයට නිෂ්පාදනය කරනු ලබන මත්පැන් වෙනුවෙන් ගෙවිය යුතු සුරාබද්ද ඊත් එක්කම එළැඹෙන මාසයේ 15වැනි දිනට පෙර තමයි ගෙවන්න නියම කරලා තිබෙන්නේ. මෙන්න මේ නියමයන් තිබියදීත්, මත්පැන් නිෂ්පාදනය වෙනුවෙන් ගෙවිය යුතු සුරාබද්ද නියමිත දිනයන්ට ගෙවන්න කෙනෙකු අපොහොසත් වෙනවා නම් ඒ ගෙවන්න ප්‍රමාද වන හැම මාසයකටම සියයට 3ක ප්‍රමාද ගාස්තුවක් අය කරනු ලබනවා. නමුත්, කවුරු හරි නිෂ්පාදකයෙකු ගෙවිය යුතු සුරාබද්ද ගෙවන්නේ නැත්නම් ඒ සුරාබදු බලපත්‍රය අහෝසි කිරීමේ විධිවිධානයක් සුරාබදු ආඥාපනතේ ඇතුළත් වෙනවා. අන්න ඒ විධිවිධානය බලාත්මක කිරීම සඳහා 962 දරන සුරාබදු නිවේදනයෙන් කාල සීමාවක් දක්වා තිබෙනවා. ඒ කාල සීමාව අනුව සුරා බදු නොගෙවූ කවුරු හරි කෙනෙකුට එය ගෙවන්න මාස 6ක උපරිම කාල සීමාවක් දක්වා අවස්ථාවක් ලබා දීලා තිබෙනවා, බලපත්‍රය අහෝසි කිරීමේ කාර්යයට යටත් නොවන ලෙස. අන්න ඒ කාරණය හේතුවෙන් බොහෝ කුඩා නිෂ්පාදන ආයතන ගෙවිය යුතු සුරාබද්ද ගෙවන්නේ නැතුව විශාල කාලයක් -මාස 6ක කාලයක්- ඇදගෙන යෑමට කටයුතු කරනවා. නමුත් ජාතික ජන බලවේගය රජය බලයට පත්වීමත් එක්කම ඒ වනකොට මාස 6කට වැඩි කාලයක් සුරාබදු නොගෙවා හිටපු අයට නිවේදන නිකුත් කරලා කිව්වා එම බදු මුදල් වහාම ගෙවන්න කියලා. ඒ අනුව බොහෝ දෙනෙක් සුරාබදු ගෙව්වා. ඊත් එක්කම, සුරාබදු නොගෙවා හිටපු කිහිපදෙනෙකුගේ බලපත්‍ර අහෝසි කරන්නත් කටයුතු කළා.

මා හිතන විධියට, සුරාබදු දෙපාර්තමේන්තු ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි හිඟ බද්දක් නොගෙවා සිටීම හේතුවෙන් මේ වනකොට කිහිපදෙනෙකුගේ බලපත්‍ර අහෝසි කරලා තිබෙන්නේ. ඉහත කී පරිදි මාස 6ක කාල සීමාවක් ලබා දීම තුළ නිෂ්පාදකයන් කිහිපදෙනෙකු බදු නොගෙවා දිගු කාලයක් රැඳී සිටීමට දරන උත්සාහය අවම කර ගන්න 962 දරන සුරාබදු නිවේදනයට අපි මේ වනකොට සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

සුරාබදු දෙපාර්තමේන්තුවේ හිඟ බදු ප්‍රමාණ ගැන අපි දැන් බලමු. මේ වනකොට සුරාබදු දෙපාර්තමේන්තුව අය කරගත යුතු රුපියල් බිලියන 10.5ක හිඟ බදු තිබෙනවා. ඒ රුපියල් බිලියන 10.5 තුළ හිඟ බද්ද විධියට රුපියල් බිලියන 4.7කුත්, හිඟ බදු නොගෙවීම වෙනුවෙන් සියයට 3 ගණනේ එක්කහු වුණු රුපියල් බිලියන 5.8කුත් ඇතුළත්ව තිබෙනවා. මේ කියපු නීතිමය බාධා හින්දා රුපියල් බිලියන 10.5ක සම්පූර්ණ මුදලක් හිඟ බදු විෂයට අදාළව මත්පැන් නිෂ්පාදනය වෙනුවෙන් අය කර ගන්න සුරාබදු දෙපාර්තමේන්තුවට මේ වනකොට නොහැකි වෙලා තිබෙනවා.

අමුද්‍රව්‍ය මත ගෙවිය යුතු සුරා බද්ද සැලකිල්ලට ලක් කරන කොට පෙනෙනවා, අමුද්‍රව්‍ය මත ගෙවිය යුතු සුරාබදු යටතේ රුපියල් මිලියන 223ක මුදලක් මේ වනකොට හිඟ බද්දක් විධියට සුරාබදු දෙපාර්තමේන්තුවට අය කරගත නොහැකි බාධා මතු වෙලා තිබෙන බව. මෙන්න මේ බාධා මැඬ පැවැත්වීම වෙනුවෙන් තමයි 962 දරන සුරාබදු නිවේදනයට අපි සංශෝධන ඉදිරිපත්

කරලා තිබෙන්නේ. මේ ඉදිරිපත් කරන ලද සංශෝධන බලාත්මක වීමත් සමඟම තවදුරටත් නිෂ්පාදකයෙකු තමන්ගේ නිෂ්පාදන මත දවස් 15කට සැරයක් සුරාබද්ද ගෙවන්න ඕනෑ. ඒත් එක්කම, කවුරු හරි කෙනෙකු එය නොගෙවා සිටිනවා නම් ඒ නොගෙවා සිටින සෑම මාසයක් වෙනුවෙන්ම සියයට 3ක ප්‍රමාද ගාස්තුවක් අය කරනු ලබනවා.

මේ නව සංශෝධන තුළ විශේෂ විධිවිධාන දෙකක් ඇතුළත් කර තිබෙනවා. කෙනෙකු නියමිත දින සිට මාසයක කාලයක් ඇතුළත නියමිත සුරාබදු ප්‍රමාණය තවදුරටත් නොගෙවා සිටිනවා නම් ඒ නිෂ්පාදන බලපත්‍රය වහාම අහෝසි වන විධිවිධානයක් මෙහි ඇතුළත් වෙනවා. හැබැයි, මෙතැනදී විශේෂයෙන්ම නිෂ්පාදන බලපත්‍රය පමණක් අහෝසි කරනවා. ඒ නිෂ්පාදකයාට අවස්ථාවක් ලබා දෙනවා, තමන් නිෂ්පාදනය කරලා තිබෙන මත්පැන් තවදුරටත් අළෙවි කරලා ඒ හිඟ බද්ද ගෙවලා හිඟ බදු ගෙවීම සම්පූර්ණ කරලා යථා තත්ත්වයෙන් තමන්ගේ නිෂ්පාදන කටයුතු කරගෙන යාමට.

ඊට අමතරව, දින 90කටත් වැඩි කාලයක් දිගින් දිගටම හිඟ බදු මුදල් නොගෙවා සිටිනවා නම්, ඒ හිඟ බදු මුදල් අය කර ගැනීම සඳහා සියලු බලපත්‍ර අහෝසි වෙන්න නියමයක් දාලා තිබෙනවා. මෙන්න මේ නියම හතර සහ 962 කියන අලුත් නිවේදනය බලාත්මකවීමත් එක්ක එතෙක් පැවැති නිවේදනය -මාස 6ක කාලයක් ලබා දීමේ නිවේදනය- අවලංගු වෙනවා. බදු අය කර ගැනීම් වඩාත් කාර්යක්ෂම කරලා සුරාබදු දෙපාර්තමේන්තුවේ බදු අය කර ගැනීමේ ක්‍රියාවලිය සහ පරිපාලන කටයුතු වඩාත් කාර්යක්ෂම කර ගන්න ගත්ත ඉතාම හොඳ පියවරක් විධියට තමයි අපට මේක පෙනෙන්නේ. ඇත්තටම ජාතික ජන බලවේග රජය බලයට පත්වීමත් සමඟම විශේෂයෙන්ම සුරාබදු දෙපාර්තමේන්තුවේ පැවැති අඩුපාඩු හඳුනා ගෙන, ඒ අඩුපාඩු නිවැරදි කරන්න විශේෂ ක්‍රම යොදලා තිබෙනවා.

විශේෂයෙන්ම අපට සුරාබදු හිඟ බද්ද අය කර ගන්න තිබෙන විශේෂම බාධාව තමයි දැනට පවතින ආඥා පනතේ ඒ හිඟ බදු අය කර ගැනීම වෙනුවෙන් විශේෂ විධිවිධාන සඳහන් වෙලා නොමැති වීම. ඒ නීතිමය ප්‍රතිපාදන ඇතුළත් වෙලා නැහැ. උදාහරණයක් විධියට දේශීය ආදායම් පනත ගත්තාම, දේශීය ආදායම් පනත යටතේ කවුරු හෝ කෙනෙක් බදු නොගෙවා සිටිනවා නම්, බැංකුවක මුදලක් තිබෙනවා නම් බැංකුවේ තිබෙන මුදල නිවේදනයක් නිකුත් කරලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙන්වා ගන්න පුළුවන්. එහෙමත් නැත්නම් නිශ්චල හෝ චංචල දේපොළක් තිබෙනවා නම් ඒ නිශ්චල හෝ චංචල දේපොළ දෙපාර්තමේන්තුවට අත්පත් කරගෙන එම දේපොළ විකුණලා ඒ හිඟ බදු මුදල පියවා ගන්න පුළුවන්. ඒ ක්‍රමයත් නැත්නම්, ඒ හිඟ බදු මුදල අඩු කර ගැනීම සඳහා නඩු පවරන්න පුළුවන්. අන්න, ඒ වාගේ විශේෂ විධිවිධාන රාශියක් දේශීය ආදායම් පනත තුළ සඳහන් කර තිබෙනවා. නමුත්, සුරාබදු ආඥා පනත යටතේ සුරාබදු නොගෙවීම වෙනුවෙන් විශේෂයෙන්ම දක්වා තිබෙන්නේ බදු නොගෙවනවා නම් බලපත්‍රය අහෝසි වීමක් පමණයි. ඉතින් මෙන්න මේ අඩුපාඩුව අපි වඩාත් හොඳින් හඳුනා ගෙන සුරාබදු ආඥා පනත අහෝසි කරලා සියලු නීතිමය ප්‍රතිපාදන ඇතුළත් කරලා නව පනත් කෙටුම්පතක් සකස් කරලා ඒක ඉදිරිපත් කරන්න මේ වනවිට කඩිනමින් කටයුතු කරගෙන යනවා. ඒකට සුරාබදු දෙපාර්තමේන්තුවේ වෙනම කණ්ඩායමක් දාලා මේ දිනවල ඔවුන් මේ පිළිබඳ විශ්ලේෂණය කරමින් පනත පිළියෙළ කරමින් ඉන්නවා. මේ වනවිට එහි අවසන් අදියරට පැමිණ තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව අපි දැකපු තවත් විශේෂ දෙයක් තමයි මේක. සුරාබදු දෙපාර්තමේන්තුව මෙතෙක් කාලයක් තිස්සේ මේ සුරාබදු අය කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගන්න කිසිම පරිගණක පද්ධතියක් පාවිච්චි කළේ නැහැ. සම්පූර්ණයෙන්ම භෞතික - manual - ලිපිගොනු මඟින් තමයි සියලු බදු අය කර ගැනීම්, ගණනය කර ගැනීම් සියල්ල කළේ. අපි ජාතික ජන බලවේග රජය බලයට පත්වීමත් එක්ක මේ කාරණය විශේෂයෙන් දැකලා ඒ ක්‍රියාවලිය කඩිනම් කරලා සුරාබදු දෙපාර්තමේන්තුව වෙනුවෙන් Revenue Administration System for Excise Department - RASED - නමින් ආදායම් පරිපාලන පද්ධතියක් ස්ථාපනය කරන්න අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කරලා තිබෙනවා. පසුගිය සතියට කලින් තිබුණු කැබිනට් මණ්ඩලය මඟින් එය අනුමත කරලා අලුත් developer කෙනෙක් තෝරා ගෙන ඒ සංවර්ධන කටයුතු මේ වෙනකොට ක්‍රියාත්මක කරන්න ආරම්භ කරලා තිබෙනවා. නව system එක ආවත් එක්කම සුරාබදු දෙපාර්තමේන්තුවේ සියලු ගනුදෙනු -එතනෝල් ප්‍රවාහනයේ සිට සියලු ගනුදෙනු - පරිගණකගත වෙනවා. ඒ වාගේම සියලු මත්පැන් බෝතල් විකිණීමේදී Point-of-Sale - POS - system එකක් මඟින් ඒ සියලු ගනුදෙනු ඒ වෙලාවේදීම real time විධියට දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියේ ඇතුළත් වෙනවා. මේ පද්ධතිය ක්‍රියාත්මක වීමත් එක්කම බදු අය කර ගැනීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම වෙනවා. ඒ පද්ධතිය ඒමත් එක්ක සුරාබදු දෙපාර්තමේන්තුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් එක්ක සම්බන්ධවීම තුළින් ගෙවිය සියලු සුරාබදු මුදල් නිවැරදිව අය කර ගන්න අවශ්‍ය කටයුතු සිද්ධ වෙනවා.

ඊටත් අමතරව විශේෂ application එකක් - App එකක් - මේ වෙනකොට සංවර්ධනය කරලා තිබෙනවා. එළියේ විකුණන මත්පැන් බෝතල් ව්‍යාජ මත්පැන් බෝතල්ද, එහෙම නැත්නම් නිවැරදිව බදු ගෙවලා වෙළඳපොළට නිකුත් කරපු මත්පැන් බෝතල්ද කියලා හඳුනා ගැනීම සඳහා මේ වෙනකොට App එකක් සංවර්ධනය කරලා තිබෙනවා. සංවර්ධනය කරන ලද ඒ App එක නිලධාරින් ඉතාම සාර්ථකව අත්හදා බලා තිබෙනවා. ඒ අත්හදා බැලීම් සාර්ථක වුණාට පසුව මහජනතාවට එය නිකුත් කරන්න බලාපොරොත්තු වෙනවා. එතකොට නිවැරදිව බදු ගෙවපු මත්පැන් බෝතල් විතරයි වෙළඳපොළට නිකුත් විය යුත්තේ.

ඊළඟට ගෙනෙන විධිවිධානය තමයි විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය. ආනයනය කරනු ලබන අල වෙනුවෙන් මෙතෙක් පැවති රුපියල් 60ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රුපියල් 80ක් දක්වා රුපියල් 20කින් සහ බී ලූනු වෙනුවෙන් මෙතෙක් පැවැති රුපියල් 10ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රුපියල් 50ක් දක්වා රුපියල් 40කින් ඉහළ නංවා දේශීය අල ගොවියාට සහ බී ලූනු ගොවියාට සාධාරණ ලාභයක් ලබා දීමට අපේක්ෂා කරනවා. ඒ බදු මුදල් වැඩි කිරීම තුළදී ගොවියාත් පාරිභෝගියකාත් යන දෙපිරිසම ආරක්ෂා කරගන්න කටයුතු කර තිබෙනවා. දැන් මේ බද්ද පැනවීමත් එක්ක මෙතෙක් ආනයනය කරපු ප්‍රමාණ අඩු වෙලා දේශීය නිෂ්පාදන මාර්කට් එකට ඇවිල්ලා ඔවුන්ගේ වෙළඳාම වැඩි වෙලා තිබෙනවා. මම මේ අවස්ථාවේ සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, අද ගෙනෙන මේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය සහ සුරාබදු ආඥාපනත යටතේ රීති සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Sajith Premadasa. You have 12 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 12.03]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දේශීය ගොවියා ආරක්ෂා කිරීමේ අරමුණින් ඉදිරිපත් කළ බදු මුදල් ඉහළ දැමීමේ මාතෘකාවට ප්‍රවේශ වෙන අවස්ථාවේ විශේෂයෙන්ම අපි අවබෝධ කරගන්නට ඕනෑ මේ බදු ඉහළ දැමීමේ ක්‍රියාවලිය පිළිබඳව. මොකක්ද ඒකේ අරමුණ? ඒකේ අරමුණ මිල තරගකාරිත්වය තුළින් දේශීය ගොවියාට, ගොවි පරපුරට ඔවුන්ගේ ජීවනෝපාය ශක්තිමත්ව කර ගැනීම උදෙසා විශේෂ රැකවරණයක්, ආරක්ෂාවක් ලබා දීම. විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - Special Commodity Levy එක - පනවන්නේ අන්න ඒ අරමුණින්.

දළ වශයෙන් ගත්තොත්, අපේ රටේ අර්තාපල් ගොවීන් 20,000ක් පමණ ඉන්නවා. ලොකු ලූනු ගොවීන් 7,000ක් පමණ ඉන්නවා. අර්තාපල් ගොවීන් ඉන්නේ, නුවරඑළිය, කඳපොළ, වැලිමඩ, ඌව පරණගම, හපුතලේ, බණ්ඩාරවෙල, හාලිඇල යන ප්‍රදේශවල. ලොකු ලූනු ගොවීන් බහුතරයක් ඉන්නේ, අනුරාධපුර, මාතලේ, පොළොන්නරුව යන ප්‍රදේශවල. දැන් මේ ක්‍රියාවලිය තුළින් අර්තාපල් කිලෝවක බදු මුදල රුපියල් 60 සිට රුපියල් 80 දක්වාත්, ලොකු ලූනු කිලෝවක බදු මුදල රුපියල් 10 සිට රුපියල් 50 දක්වාත් ඉහළ දමන්නට කටයුතු කර තිබෙනවා. දැන් තිබෙන ප්‍රධාන ගැටලුව මොකක්ද? ප්‍රධාන ගැටලුව මෙයයි. අර්තාපල් ක්ෂේත්‍රය ගත්තොත්, දේශීය අර්තාපල් ගොවියාගේ නිෂ්පාදනවල තොග මිල දළ වශයෙන් රුපියල් 160 සිට රුපියල් 220 දක්වා වෙනවා. හැබැයි, මිලදී ගන්නේ රුපියල් 160ට. හැබැයි, අර්තාපල් කිලෝ එකක් නිෂ්පාදනය කිරීම සඳහා රුපියල් 210ක මිලක් යනවා. එතකොට දේශීය ගොවියාට ලැබෙන්නේ රුපියල් 160 නම්, නිෂ්පාදන මිල රුපියල් 210 නම්, අපි අහනවා, මේ බදු පැනවීමේ ප්‍රතිඵලය නිසියාකාරව සිද්ධ වෙනවාද කියලා. ආනයන අර්තාපල්වල තොග මිල දැන් තිබෙන්නේ, රුපියල් 160ට, රුපියල් 170ට.

විශේෂයෙන් නිෂ්පාදන මිල ඉහළ යෑම නිසා අපේ අර්තාපල් ගොවියාට ගොවිතැනේ නියැළෙන්නටත් බැහැ. ඒ අස්වැන්න නෙළා ගැනීමේ කටයුතු කරන්නටත් බැහැ. මේ තත්ත්වයන් තුළ නිෂ්පාදන පිරිවැය ආවරණය වීමක් සිදු වෙනවාද, නැද්ද කියන එක ගැන අපි ප්‍රශ්න කරන්නට ඕනෑ.

දැන් ලොකු ලූනු ගොවියාට මොකක්ද වෙලා තිබෙන්නේ? දේශීයව ලොකු ලූනු නිෂ්පාදනය කරන ගොවියාගේ ලූනු තොග මිල දළ වශයෙන් කිලෝවක් රුපියල් 125-135 අතර වෙනවා. නමුත් කිලෝවක පිරිවැය රුපියල් 250යි. ආනයනික ලොකු ලූනු මිල රුපියල් 145ක් වැනි අඩු මුදලක පැවතීම නිසා තමන්ගේ අස්වැන්න නිසි මිලකට අළෙවි කරගන්නට බැරිව දේශීය ගොවියා ලොකු අගතියකට පත් වෙලා තිබෙනවා. දැන් ඕවා හිතේ තියාගෙන තමයි මේ බදු දැමීම සිද්ධ කරන්නේ. වර්තමාන තත්ත්වය තුළ අර්තාපල් ගොවියාත්, ලොකු ලූනු ගොවියාත් එම වගාවන්ගෙන් ඉවත් වෙමින් සිටිනවා.

අපේ රට තුළ බී ලූනු නිෂ්පාදනය කරන්නේ මාස දෙකක පරිභෝජනයට අවශ්‍ය ප්‍රමාණයයි. අර්තාපල් නිෂ්පාදනය කරන්නේ මාස දෙකහමාරකටයි. ඉතිරි ඔක්කොම ටික ආනයනය කරනවා. සැප්තැම්බර්, ඔක්තෝබර් මාසවල තමයි බී ලූනු අස්වැන්න නෙළන්නේ. සැප්තැම්බර් ඔක්තෝබර් එක කන්නයක් සහ ජනවාරි, අප්‍රේල් තව කන්නයක් ලෙස අර්තාපල් අස්වැන්න නෙළනවා. අපේ රටේ අර්තාපල්වල වාර්ෂික අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 225,000යි. බී ලූනු අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 325,000යි. මාස දෙකක අවශ්‍යතාව පමණක් රටේ නිෂ්පාදනයෙන් සපුරාලනකොට ඉතිරි මාස 10ම ඉල්ලුම සැපයෙන්නේ ආනයනික නිෂ්පාදනවලින්. ඇත්ත වශයෙන්ම මේ බදු පැනවීමේදී අරමුණු වෙන්නට ඕනෑ, ජාතික ප්‍රතිපත්තිය වෙන්නට ඕනෑ, ගොවියා රැක ගැනීම, ගොවියා ආරක්ෂා කිරීම, පාරිභෝගිකයාට සාධාරණ මිලකට ඒවා මිලදී ගැනීමේ අවස්ථාව නිර්මාණය කිරීම යන කරුණුයි. ඉතින් මේ දේවල් සිද්ධ වෙනවාද? ජාතික ප්‍රතිපත්තියක් යැයි කියාගෙන මේ කරන සූත්‍රය තුළ, මේ කරන වැඩ පිළිවෙළ තුළ දෝෂ රැසක් තිබෙනවා.

එයින් පළමුවැනි දෝෂය තමයි නියමිත වෙලාවට බදු ටික පමුණුවන්නේ නැතිකම. මොකද, බදු පමුණුවනකොට; බදු දමනකොට ඒ වනවිටත් ආනයනකරුවන් විශාල වශයෙන් අපේ රටට අර්තාපල් සහ ලොකු ලූනු ගෙන්වාගෙන රැස්කරගෙන තැබීම තුළ ආනයනකරුවාට වාසිය යනවා, දේශීය ගොවියා හානියට ලක්වෙනවා. ඇත්ත වශයෙන් මේ Special Commodity Levy එක පනවන ආකාරය පිළිබඳව බැලුවොත්, ඉස්සර ඇමතිවරයාට තනි අභිමතයට ඒක ක්‍රියාත්මක කරන්නට හැකියාව තිබුණා. නමුත් දැන් තිබෙනවා, National Tariff Policy Committee එක. නිලධාරීන්ගෙන්, විශේෂඥයින්ගෙන් සමන්විත වූ කමිටුවකින් සාකච්ඡා කරලා, කැබිනට් එකට ඉදිරිපත් කරලා අනුමැතියක් අරගෙන තමයි බදු පනවන්නේ. හැබැයි පසුගිය දවසක මේ බදු පැමිණවීම නිසි ක්‍රමවේදයෙන් බැහැරව, ඒ කියන්නේ National Tariff Policy Committee එකේ අනුමැතියක් නැතිව ක්‍රියාත්මක කරන්නට වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රදීප් කුමාර මහත්මයාට නියෝග කළා. මොකක්ද සිද්ධ වුණේ? ඔහු කිව්වා, නිසි ක්‍රමවේදය අනුගමනය නොකරපු නිසා ඒ බදු පමුණුවන්නට බැහැ කියලා. කෙළින්ම කරපු දේ තමයි, ඔහුව pool එකට දැමීම. ඔහුව තනතුරෙන් ඉවත් කළා. Pool එකට දාලා රජය මේ බදු ටික ක්‍රියාත්මක කළා. රජය බදු ක්‍රියාත්මක කරනකොට අර කියපු ආකාරයට නිසි ක්‍රමවේදය අනුගමනය කරන්නට කටයුතු කළා. මම කියන්න කැමතියි, අධ්‍යක්ෂ ජනරාල් ප්‍රදීප් කුමාර මහත්මයාගේ යෝජනාව අනුගමනය කරලා, ඔහුටත් ඇහුම්කන් දීලා මේ දේ හරියට කළා නම්, රජයට කිසිම අවලාදයක් එල්ල වෙන්නේ නැති බව.

ප්‍රදීප් කුමාර මහත්මයා යෝජනා කරනකොට මේ නිසි ක්‍රමවේදය ක්‍රියාත්මක නොකරන්නටත්, ඉන් පසුව බදු පමුණුවන්නට පෙර එය ක්‍රියාත්මක කරන්නටත් කටයුතු කළේ ඇයි කියන එක අපි මේ අවස්ථාවේ ප්‍රශ්න කරනවා.

ඒ වාගේම මම බොහොම ගෞරවයෙන් කියන්න කැමැතියි, මේ බදු පැමිණවීමේ ක්‍රමවේදය පිළිබඳව හොඳට හිතලා බලන්නට ඕනෑ බව. විශේෂයෙන්ම රටේ දේශීය නිෂ්පාදනවල අස්වැන්න නෙළලා වෙළෙඳ පොළට එන්නට පෙර, යම්කිසි කාලවකවානුවක් තීන්දු කරගෙන වෙළෙඳ අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු අදාළ දෙපාර්තමේන්තු සියල්ලක්ම එකට එකතු වෙලා සාකච්ඡා කරලා නිසි කලට මේ බදු ටික පමුණුවන්නට ඕනෑ. මෙදා පාර බදු පමුණුවනකොට,- උදාහරණයක් වශයෙන් ගත්තොත් ලොකු ලූනු කිලෝග්‍රෑම් 25,000ක් බරැති බහලුම් 750ක් අපනයනකරුවන් විසින්

ගෙනැල්ලා තොග වශයෙන් රැස් කරලා තිබෙනවා. එවැනි තත්ත්වයක් ඇතුළේ බදු ගැසීම තුළ ගොවියාටවත්, පාරිභෝගිකයාටවත් නොවෙයි වාසිය ලැබෙන්නේ, ආනයනකරුවාට තමයි ඒ වාසිය ලැබෙන්නේ. ඒ වාගේම අපි සොයා බලන්නට ඕනෑ, මේ පනවන බදුවලින් ඒ බලාපොරොත්තු වන ඉලක්කය කරා යන්නට පුළුවන්ද කියලා. ඒ desired impact එක සිද්ධ වෙනවා ද? මොකක් හරි impact assessment එකක් ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්නට ඕනෑ.

ප්‍රධාන වශයෙන් ගත්තොත්, මේ ක්ෂේත්‍රයේ බරපතළ ගැටලු රැසක් තිබෙනවා. අපේ අර්තාපල් ගොවියාට, බී ලූනු ගොවියාට ප්‍රමිතියෙන් යුත් බීජ ටික ලැබෙන්නේ නැහැ. නිෂ්පාදන පිරිවැය බොහොම ඉහළ මට්ටමක තිබෙන්නේ. උදාහරණයක් වශයෙන් ගත්තොත්, දේශීය බී ලූනු බීජ කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 40,000යි. දේශීය බීජ මිල වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, නිෂ්පාදන පිරිවැය අඩු කරන වැඩසටහනක් ලබා දෙන්නට ඕනෑ. කෘෂි රසායන, දිලීර නාශක සාධාරණ මිලකට ගොවියාට ලබාදෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ වාගේම ගොවිතැන් කිරීමේ චක්‍රයක් තිබෙනවා. ගොවිතැන් කිරීමේදී ආරම්භය, යෙදවුම්, නිෂ්පාදනය, අළෙවිය, මේ චක්‍රය තුළ කොයි කාලයට ද, කොයි අවස්ථාවට ද රජය මැදිහත් වෙලා නිසි කලට, නිසි ලෙසට බදු පමුණුවන්නේ කියන එක ගැන නැවත වරක් සොයා බලලා අලුත් වැඩ පිළිවෙළකට යන්නට ඕනෑ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. ලොකු ලූනු ක්ෂේත්‍රයෙන්, අර්තාපල් ක්ෂේත්‍රයෙන් ජාත්‍යන්තර වශයෙන් අපට පාඩම් රැසක් ඉගෙන ගන්න තිබෙනවා. අපි ලූනු නිෂ්පාදනය අරගෙන බලමු. විශේෂයෙන්ම ලෝකයේ රටවල් අතරින් චීනය, ඊජිප්තුව, එක්සත් ජනපදය, තුර්කිය තමයි ඉහළම ලූනු නිපදවන රටවල්. ඒ වාගේම, අර්තාපල් නිෂ්පාදනය ගත්තොත් ඉන්දියාව, එක්සත් ජනපදය, ජර්මනිය, බංග්ලාදේශය, ප්‍රංශය, පාකිස්ථානය, නෙදර්ලන්තය වැනි රටවල් විශාල ලෙස අර්තාපල් නිෂ්පාදනය කරනවා. අපි රටක් හැටියට ඉගෙන ගන්නට ඕනෑ, ඒ රටවල මේ දේවල් සාර්ථකත්වයට ඔවුන් භාවිත කරන ක්‍රම. උදාහරණ වශයෙන් කිව්වොත්, apical rooted cutting තාක්ෂණය ඔස්සේ කුඩා පැළ භාවිත කරමින් රෝගවලින් තොර බීජ අර්තාපල් දේශීයව නිෂ්පාදනය කිරීම. සෑම බීජයකටම ඒකාකාරව පොහොර යෙදීම සඳහා වැඩිදියුණු කරපු spray equipment - අපි boom spray equipment කියලා කියනවා - භාවිත කිරීම තුළින් වගා කරන ලද සියලු බීජ මඟින් ඉහළ අස්වැන්නක් ලබා ගන්නට පුළුවන්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

ඒ වාගේම අපි ඉගෙන ගන්නට ඕනෑ, එකම බීජ ප්‍රභේද භාවිත කිරීම වෙනුවට ශ්‍රී ලංකාවේ දේශගුණයට ගැළපෙන ලෙස climate -smart ප්‍රභේද භාවිත කරමින් වගා කටයුතු සිදු කිරීමට. ඒ සඳහා පර්යේෂණ කටයුතු සිදු කර විවිධ බීජ ප්‍රභේද හඳුන්වාදීම සිදු කරන්නට ඕනෑ. Semi-automatic potato planters භාවිත කර වගා කටයුතු සිදු කිරීම මඟින් ශ්‍රමය ඉතිරි කරලා, පිරිවැය අඩු කර ගැනීම සිදු කරන්නට පුළුවන්. එසේම, බීජ අතර පරතරය නිසි පරිදි පවත්වා ගැනීමට හැකිවීම තුළ අස්වැන්න වැඩිදියුණු කරන්නට පුළුවන්. සියුම් පාංශු සහ භෝග කළමනාකරණ ක්‍රම භාවිතය මඟින් ඉහළ ඵලදාවක් ලබා ගන්නට පුළුවන්. ඒ සඳහා භෝග මාරුවෙන් මාරුවට වගා කරන්නට ඕනෑ. එනම්, සෑම වසර 3ත්, 5ත් අතර කාලයකට වරක් එකම ඉඩමක අර්තාපල් සිටුවනු ලබනවා. ඉන් පසුව නැවත වෙනත් ප්‍රභේදයක් වගා කරනු ලබනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න, කථාව අවසන් කරන්න යන්නේ.

ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති - GPS - මඟින් ගොවීන් අධික ලෙස හෝ අඩුවෙන් පොහොර යෙදීම වැළැක්වීම සඳහාත්, අවශ්‍ය ස්ථානවලට නිශ්චිත පොහොර ප්‍රමාණ ඉලක්ක කර ගැනීම සඳහාත් හැකියාව ලැබෙනවා. ලොකු ලූනු වගා කිරීම සඳහා plastic mulching sheets භාවිතය මඟින් වල් පැළෑටි පාලනය කර, පසෙහි තෙතමනය සංරක්ෂණය කර, ලූනු බීජවල ගුණාත්මකභාවය වැඩිදියුණු කරන්නට පුළුවන්.

මම මේ කරුණු කාරණා ඉදිරිපත් කළේ, ඇත්තවශයෙන්ම අප ගෝලීය වශයෙන් ඉගෙන ගත යුතු පාඩම් රැසක් තිබෙන නිසායි. නව තාක්ෂණය ඔස්සේ අපි ඉදිරියට යන්න ඕනෑ. ඒ නිසා රජයට පුළුවන් නම්, ඒ අර්තාපල් ගොවි කණ්ඩායම්, ඒ වාගේම ලොකු ලූනු ගොවි කණ්ඩායම් දියුණු වගා ක්‍රම භාවිත වන රටවලට යවලා, නව තාක්ෂණය උපයෝගී කරගෙන ඒ රටවල වගා කටයුතු කරන්නේ කොහොමද කියන ඒ දැනුම ඔවුන්ට ලබා දීම සඳහා වැඩසටහනක් සකස් කරන්න. එපමණකුත් මදි. රජයේ මැදිහත් වීමෙන් නව තාක්ෂණ පහසුකම් දේශීය ගොවියාට ලබා දීම තුළිනුත් අපට අර්තාපල් ගොවියා රැක ගන්නත් පුළුවන්, ලොකු ලූනු ගොවියා රැක ගන්නත් පුළුවන්. ඒ වාගේම පාරිභෝගිකයාට සාධාරණ මිලකට ඒවා මිලදී ගන්න අවස්ථාව සලසා දෙන්නත් පුළුවන්. නමුත් මේ පවතින සූත්‍රය තුළ නම් ලොකුම ලාභය ලබන්නේ ගොවියාත් නොව, පාරිභෝගිකයාත් නොව, ආනයනකරුවා බව මම මතක් කරන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තිලංක යූ. ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.17]

**ගරු තිලංක යූ. ගමගේ මහතා**
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සුරාබදු ආඥාපනත යටතේ ගෙන එන රීති සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ගෙන එන නියමයක් පිළිබඳව සාකච්ඡා කරන අද දවසේදී මීට පෙර ගරු විපක්ෂ නායකතුමා කළ කථාවේදී කිව්වා,

[ගරු තිලංක යූ. ගමගේ මහතා]

ලූනු කිලෝවක නිෂ්පාදන පිරිවැය රුපියල් 250ක් කියලා. එහෙම ගත්තොත් මම හිතන විධියට, දැනටත් ඒ ගොවීන් අතින් කාලා හරක් බලනවා වාගේ වැඩක් තමයි කරන්නේ. හැබැයි අපි දන්නවා, පසුගිය කාලයට වඩා මේ අවුරුද්දේ අස්වැන්න වැඩි වෙලා තිබෙන බව. ලූනු කිලෝවක නිෂ්පාදන පිරිවැය රුපියල් 250ක් නොවෙයි, රුපියල් 90ක්, 100ක් වාගේ තමයි වෙන්නේ. ඒ නිසා වැරදි තොරතුරු ටිකක් විපක්ෂ නායකතුමා අතට ලැබී තිබෙන බවත් මම කියන්න ඕනෑ.

රටක් විධියට අපි දැන් අපේ ආර්ථික වැඩ පිළිවෙළ ශක්තිමත් කරගෙන, ආර්ථිකය ස්ථාවර කරගෙන තිබෙනවා. ඒ වාගේම අපි දැන් ඩොලරයේ අගය ස්ථාවර කර ගනිමින්, උද්ධමනය තනි ඉලක්කමකට ගෙනැල්ලා, ආර්ථික වර්ධන වේගය වැඩි කර ගනිමින්, අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරා ගනිමින් සිටිනවා. ඒ වාගේම අපි දැන් විදේශ සංචිත වැඩි කර ගනිමින් ඉන්නවා.

සුරාබදු ආඥාපනත යටතේ වූ රීති පිළිබඳව සිදු කරන මේ විවාදයේදී අපේ නියෝජ්‍ය ඇමතිතුමා මේ සාකච්ඡාවට අදාළ මූලික පැහැදිලි කිරීම සිදු කළා. එතැනදී අපි මතක් කරන්න ඕනෑ, පසුගිය කාලය පුරාම මේ සුරාබදු ආඥාපනතේ තිබුණු ලොකු අඩුපාඩුවක් -දෝෂ සහගත තත්ත්වයක්- නිසා මත්පැන් නිෂ්පාදනයේදී ගොඩක් වෙලාවට බදු ගෙවීම් පැහැර හැරපු බව. අපි දැක්කා, මත්පැන්වලට අය කරන බදු ඉතිහාසය පුරාවටම රජයට හරියාකාරව නොලැබුණු බව. අපි දන්නවා, ඒ වෙනුවෙන් දේශපාලන රැකවරණයත් ලැබුණු බව. ඇමතිවරුන්ට හිමිව තිබුණු බලපත්‍රලාභී ඉස්කාගාරවලින් ගොඩක් වෙලාවට නියමිත පරිදි රජයට බදු මුදල් ලැබුණේ නැහැ. රුපියල් බිලියන 10.5ක පමණ මුදලක් තවදුරටත් ඒවායෙන් අය කර ගන්න තිබෙනවා. පසුගිය කාලයේ අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ ඒ අදාළ බලපත්‍ර අහිමි කිරීම් කරනකොට යම් මුදලක් ගෙවීම සිදු කළා. නමුත් ඒ බදු නොගෙවීම සම්බන්ධව නඩු පවරන ක්‍රියාවලියට යනකොට ගොඩක් වෙලාවට දෝෂ සහගත තත්ත්වයන්, ව්‍යාකූලභාවයන් තිබුණා. ඒ නිසා තමයි ගොඩක් වෙලාවට ඒ බදු නිසියාකාරව අය කර ගන්න නොලැබුණේ. නමුත් අපි දැන් ඒ ව්‍යාකූල තත්ත්වය මඟ හරවා තිබෙනවා. ඇත්තටම මෙතැනදී වෙලා තිබෙන්නේ බදු වැඩි කිරීම නොවෙයි, ඒ ව්‍යාකූල තත්ත්වය මඟ හරවා මසක් ඇතුළත බදු මුදල් අය කර ගන්න හැකි වන පරිදි සංශෝධන සිදු කිරීමයි. එතකොට යම් ආකාරයකින් මසක් ඇතුළත ඒ මුදල නොගෙව්වොත්, ඒ අදාළ නොගෙවන මාසයක් ගණනේ සියයට 3ක ගාස්තුවක් අය කරනවා.

දින 90ක් ඇතුළත එම බදු මුදල නොගෙවීම තුළ ඔවුන්ට බලපත්‍ර අහිමි කිරීමක් පවා සිදු කරන විධියට තමයි සුරාබදු ආඥාපනත යටතේ මේ රීති ගෙන එන්නේ. අපි දන්නවා, අරක්කු වාගේ මත්පැන් අදාළ පාරිභෝගිකයා මිලදී ගන්නේ මුදල් ගෙවලා බව. මත්පැන් පානය කරලා, වෙරි වෙලා ඒ සියල්ල සිදු වුණත්, රජයට බදු ගෙවලා තමයි ඔවුන් ඒවා ගන්නේ. නමුත් මාසයක් නොවෙයි, අවුරුද්දක් ගියත් ඉස්කාගාර හිමියන්ගෙන් ලැබිය යුතු ඒ බදු මුදල් රජයට ලැබුණේ නැහැ. මෙන්න මේ කියන දෝෂය වළක්වමින්, අදාළ නඩු කටයුතු සිදු කිරීමත්, නියමිත බදු මුදල් ටික රජයට ලබා ගැනීමත් තමයි සුරාබදු ආඥාපනත යටතේ මේ රීති ගෙන ඒම තුළින් අපි බලාපොරොත්තු වන්නේ.

ඒ වාගේම විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ අද දින ගෙන එන නියමය පිළිබඳව කථා කළොත්, ලොකු ලූනු -බී ලූනු- සහ අර්තාපල් සම්බන්ධයෙන් තමයි මේ බදු පැනවීම සිදු කරන්නේ. ඒක කරන්නේ දේශීය අල ගොවියා, ලූනු ගොවියා රැක ගැනීමේ අරමුණින්. මේ වන විට ලොකු ලූනු සඳහා තිබුණේ රුපියල් 10ක බද්දක්. ඒක අපි මේ බදු සංශෝධනය යටතේ රුපියල් 40කින් වැඩි කරනවා, රුපියල් 50ක් දක්වා. ඒ වාගේම අර්තාපල් සඳහා රුපියල් 60ක්ව තිබුණු බද්ද, රුපියල් 80ක් දක්වා සංශෝධනය කරනවා. අපේ රටට වාර්ෂිකව මෙට්‍රික්ටොන් ලක්ෂ තුනක වාගේ ලූනු ප්‍රමාණයක් අවශ්‍ය වනවා. නමුත්, අපේ රටේ ලූනු වගා කිරීම සම්බන්ධයෙන් ගත්තාම, 2021දී මෙට්‍රික්ටොන් 65,907ක් වගා කළා. පසුගිය කාලයේ අපට ලැබුණු ලොකුම නිෂ්පාදනය බවට පත් වුණේ අන්න ඒ ප්‍රමාණය. එතැනින් පස්සේ 2023දී වගා කළේ මෙට්‍රික්ටොන් 5,084යි. ඒ අනුව අපේ ලූනු නිෂ්පාදනය විශාල ලෙස අඩු වුණා. අපි දන්නවා, ඒකේ ප්‍රතිඵලයක් විධියට අපේ රටට විශාල වශයෙන් ලූනු ආනයනය කරන්න සිදු වුණු බව. ඒකේ අනෙක් ප්‍රතිඵලය තමයි, පසුගිය කාලයේ ලූනු කිලෝවක මිල රුපියල් 300ට, 400ට, 500ට වාගේ ඉහළ යෑම. හැබැයි අපි දන්නවා, මේ රජය බලයට පත් වෙලා ගෙවුණු පසුගිය කාල වකවානුව පුරාම ලූනු කිලෝවක මිල යම් ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යන බව. නමුත්, අපි ගොවියා රැක ගන්නත් ඕනෑ. ඒ වාගේම දේශීයව නිෂ්පාදනය කරන ලූනු ප්‍රමාණය අපේ රටට කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. ඒ නිසා අපට අනෙකුත් පාරිභෝගික අවශ්‍යතා සපුරා ගන්න වෙන්නේ ලූනු ආනයනය කිරීමෙන්. 2024 අවුරුද්දේ ඒ ප්‍රමාණය මෙට්‍රික්ටොන් අටදහස් ගණනකින් වැඩි වුණා. නමුත්, මේ අවුරුද්දේ ලූනු නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 50,000ක වාගේ ප්‍රමාණයක් ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම මේ මාස කිහිපය පුරා විශාල වශයෙන් ලූනු අස්වැන්න ලැබෙමින් තිබෙනවා. ඒ විධියට ලූනු ගොවියා ආරක්ෂා කර ගන්න, අර්තාපල් ගොවියා ආරක්ෂා කර ගන්න තමයි, මේ භාණ්ඩ මත බදු පැනවීම සිදු කරන්නේ.

ඇත්තටම මේ බදු පැනවීම සම්බන්ධයෙන් ගත්තොත්, යම් ආකාරයකින් මීට වඩා අපේ ගොවියා ආරක්ෂා කර ගන්න ඕනෑ. විෂය භාර අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවත් රැස් වෙලා මේ සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේදී මේ ගොවීන්ට සහනාධාර දෙනවාද, ආනයන අත්හිටුවනවාද වැනි සාකච්ඡා ගණනාවක් කළා. ඒ සාකච්ඡා ගණනාවක අවසන් තීරණය බවට පත් වුණේ, මේ බදු පැනවීම ඇතුළේ දේශීය ගොවියා ආරක්ෂා කර ගැනීමයි. ඒකට අපි කියනවා, "සඵල ආරක්ෂණය" කියලා. විශේෂයෙන්ම උසස් පෙළ විභාගයට ආර්ථික විද්‍යාව විෂය හදාරන දරුවන් මේ ගැන දන්නවා. දේශීය නිෂ්පාදකයාගේ එකතු කළ අගය වැඩි කිරීම තමයි අපි effective rate of protection කියලා කථා කරන්නේ. අන්න ඒ එකතු කළ අගය වැඩි කිරීම තමයි මේ තුළින් අපි බලාපොරොත්තු වන්නේ. ඒක ඇතුළේ ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය ආවරණය කර ගැනීමට සමත් වන විධියට තමයි කටයුතු කරන්නේ. ලොකු ලූනු ගොවියාගේ නිෂ්පාදන පිරිවැය රුපියල් 90ත්, 100ත් අතර වෙනවා. එතකොට මේ තුළින් තොග මිල රුපියල් 140ක්, 145ක් වාගේ ප්‍රමාණයකට අපට අරගෙන යන්න පුළුවන්. ඒක තුළ ගොවියාට ආරක්ෂාවක් සැපයෙනවා. ඒ තුළින් අල ගොවියා, ලොකු ලූනු ගොවියා ආරක්ෂා කර ගන්න අපි බලාපොරොත්තු වනවා.

අපි දන්නවා, average එක විධියට ගත්තොත්, සියයට 20ක වාගේ ප්‍රමාණයක් තමයි අපේ රටට අවශ්‍ය නිෂ්පාදනය සිදු වෙන්නේ කියලා. අපි අනෙක් ඔක්කෝම ගන්නේ ආනයනය කිරීමෙන්. නමුත්, අපට රටක් විධියට දේශීය ආර්ථිකය, නිෂ්පාදන ආර්ථිකය නඟාසිටුවමින්, දේශීය ගොවියා ආරක්ෂා කර ගනිමින්, ඔවුන් දිරිගැන්වීමේ ක්‍රියාවලියක් අවශ්‍ය වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ වෙනුවෙන් අපි මේ භාණ්ඩ මත බදු සංශෝධනය කරද්දී එක පැත්තකින් අපට පාරිභෝගිකයා ආරක්ෂා කර ගන්නත් ඕනෑ, අනෙක් පැත්තෙන් දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කර ගන්නත් ඕනෑ.

ඒ වෙනුවෙන් බොහොම පැහැදිලිව ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව මඟින් මේ තීන්දු තීරණ අරගෙන තමයි ඒ කටයුතු කර තිබෙන්නේ. ඇත්තටම ගත්තොත්, මේ ආරක්ෂා කර ගැනීම ඇතුළේ දේශීය ආර්ථිකය සුරක්ෂිත කර ගැනීම, සේවා නියුක්තිය ආරක්ෂා කර ගැනීම, විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම, මිල උච්චාවචනය අවම මට්ටමක පවත්වාගෙන යෑම වාගේම ස්ථාවර ආර්ථිකයක්, නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනහා ගැනීම වෙනුවෙන් මේ සංශෝධනය අපි සිදු කරනවා කියන එක විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමියට බෙහෙවින් ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.26]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මට පෙර කථා කළ කථිකයාගේ speech එක අහගෙන හිටියාම, පසුගිය කාලයේදී ජනාධිපතිතුමා ඇතුළු අමාත්‍යාංශයේ ඉන්න ඇමතිවරුන් කියපු කථා මෙතුමා අහලාද මේ කථාව මෙතැන කළේ කියන එක පිළිබඳව විශාල සැකයක් තිබෙනවා. දෙසැම්බර් මාසයෙන් පස්සේ ආයෙත් ලංකාවට ජීවිතේට හාල් ගෙනෙන්නේ නැහැ කිව්වා. මේ වනකොට පොන්නි සම්බා ගෙනෙන්න සියලු කටයුතු ලැහැස්ති කර තිබෙන්නේ. රට තුළ කීරි සම්බා හිඟයක් තිබෙනවා. පොන්නි සම්බා ගෙනෙන්න යනවා. යම් ආකාරයකින් කරන්නේ නැහැ කියපු වැඩක් ආණ්ඩුව කළත් ඒක අපි අගය කරනවා. මම හිතන විධියට, කිහිප දෙනෙකුට ලයිසන් දෙන්නේ නැතුව පොදුවේ ඕනෑ කෙනෙකුට ලයිසන් දුන්නාම එතැන monopoly එක අඩු වෙනවා. ඒ නිසා ඒක හොඳයි.

අර්තාපල්, ලූනු වාගේ දේවල් ආනයනය කිරීම සම්බන්ධයෙන් ගැටලු රාශියක් පසුගිය කාලයේදී අපි මතු කළා. ආනයනයේදී බදු පැනවීම සම්බන්ධව ඇමතිවරයා තමන්ගේ කැමැත්තට යම් යම් කාරණා කරන්න යෑම තුළින් මොකක්ද සිද්ධ වෙන්නේ? මම හිතන විධියට, ජනාධිපතිවරයා තමයි මේකට අදාළ ගැසට් පත්‍රය නම් නිකුත් කර තිබෙන්නේ. හැබැයි, වංචා, දූෂණ චෝදනා තිබෙන සමහර ඇමතිවරු දැනට මේකේ ඉන්නවා. එහෙම අය අපි හඳුනාගෙන ඉන්නවා. එවැනි එක්කෙනෙකු ගැන මම තව ටිකකින් කියන්නම්. ඒ වාගේ ඇමතිවරු ඉන්නකොට මේවායේ වංචා, දූෂණ වෙන්න ඉඩ තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ආණ්ඩුව ප්‍රතිපත්තියක් වශයෙන් ආනයනය කරන්නේ නැහැ, හාල් ගෙනෙන්නේ නැහැ කිව්වා. හැබැයි, රටේ ජනතාවට, පාරිභෝගිකයාට හානියක් වෙන්නේ නැතුව හාල් ගෙනෙන එක පිළිබඳව අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත්, මේ කියපු දෙයයි, කරන දෙයයි අතර තිබෙන පරස්පරය තමයි මම මේ පෙන්නුම් කර දුන්නේ. ඒ වාගේම ආනයනය කිරීම තුළින් ඊළඟ කන්නයෙන් පසුව ගොවියාට හානියක් සිදු වනවාද, නැද්ද කියන එකත් ආණ්ඩුව හොයා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සුරාබදු ආඥාපනත යටතේ ගෙනෙන රීති සම්බන්ධයෙන් කථා කිරීමේදී කිව යුතු කාරණයක් තිබෙනවා. Excise Department එක මාස 6ක වාගේ කාලයක් තුළ බදු නොගෙවපු කට්ටියට මාසයක කාලයක් ලබා දීලා, ඒ බදු මාසයක් ඇතුළත ගෙව්වේ නැත්නම් ඔවුන්ගේ ලයිසන් cancel කිරීම පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. බදු වැඩි කරගන්න එක හොඳයි. හැබැයි, මේ ආණ්ඩුව බලයට එන්න පෙර ප්‍රධාන පොරොන්දු දෙකක් දුන්නා. රනිල් වික්‍රමසිංහගේ සමයේදී දුන්නු බාර් පර්මිට් දේශපාලන අල්ලස් ලෙස තමයි ලබා දුන්නේ. පළමුවෙනි පොරොන්දුව හැටියට ඒවා cancel කරනවාය කිව්වා. හැබැයි, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පමණක් ඡන්ද දායකයන් 4,500කට මේ වනකොටත් එක බාර් එකක් තිබෙනවා. මේ, අලුතින් ලබා දුන් බාර්. ඒ පිළිබඳ නම් ලැයිස්තුව ඉදිරිපත් කළා. ඒ පිළිබඳව CID එකට යොමු කරලා තිබෙනවාය කිව්වා. හැබැයි, තවම පරීක්ෂණයක්වත් නැහැ. හරි, ඒක කමක් නැහැ කියමුකෝ. මොකද, පසුගිය ආණ්ඩුව කරපු දේවල්වලට නෛතික ක්‍රියාමාර්ග ගන්න කාලයක් යන නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් නියෝජනය කරන ජාතික ජන බලවේගය පක්ෂයෙන් පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයෙක් සහ නියෝජ්‍ය ඇමතිවරයෙක් - මම නම කියන්නම්, චතුරංග අබේසිංහ සහ නජිත් ඉන්දික කියන පුද්ගලයන් දෙදෙනා - පසුගිය මාසය ඇතුළත කිංග්ස්බරි හෝටලයට ගිහිල්ලා, ව්‍යාපාරිකයෙකු හමු වුණා කියලා චෝදනා එල්ල වනවා. ඒ ව්‍යාපාරිකයා හමු වෙලා තිබෙන්නේ මොකටද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ ව්‍යාපාරිකයා හමු වෙලා තිබෙන්නේ සීමාසහිත කළුතර ඉස්කාගාර සමුපකාර සමිතිය, අංගන්ගොඩ, මලේගොඩ, පයාගල කර්මාන්තශාලාව,- මේ permit එක සුවිශේෂී permit එකක්. මේකට import කරන්නත් පුළුවන්, distribute කරන්නත් පුළුවන්. ඊට අදාළ ලේඛනය මම සභාගත කරන්නම්. මේක 1950ටත් පෙර සුද්දාගේ කාලයේ සිට තිබුණු permit එකක්. කළුතර සමුපකාරයට අයිති මේ ඉස්කාගාරය පවත්වාගෙන යෑමේදී ඒක තව පාර්ශ්වයකට ලබා දීම සම්බන්ධයෙන් නඩු ක්‍රියාමාර්ග යනවා. මේක සමුපකාරයට අයිති ඉස්කාගාරයක්. ඒක විකුණන්න, ඒක මිලදී ගන්න බලාපොරොත්තු වෙච්ච පුද්ගලයාගේ සහ ඒ ආයතනයේ නම මම සඳහන් කරන්නේ නැහැ, ආයතන සහ ව්‍යාපාරිකයන් කඩා වට්ටන්න අපි කැමැති නැති නිසා. මම ළඟ ඒ ලියුම - Letter of Interest to Lease and Restart the Co-operative Distilleries Society, Payagala - තිබෙනවා. මේ පුද්ගලයෝ දෙදෙනා ඒ ව්‍යාපාරිකයා හමු වෙන්න ගිහිල්ලා තිබෙනවා, කිංග්ස්බරි හෝටලයට. මම කියන්නේ, වහාම මේ පිළිබඳ පරීක්ෂණයක් ආණ්ඩුවෙන් කරන්න ඕනෑ කියලායි. ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට කිසිම අයිතියක් නැහැ, මෙවැනි දේවල් කරන්න. චතුරංග අබේසිංහ කියන්නේ, co-operative එකට අයිති ඇමති නොවෙයි. එතුමා Ministry of Industry සම්බන්ධව ඉන්න නියෝජ්‍ය ඇමතිවරයා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් මේ ආණ්ඩුව යටතේ,-

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. එතුමා කියපු

[ගරු නජිත් ඉන්දික මහතා]

සිද්ධිය මම සමාජ මාධ්‍යවලිනුත් දැක්කා. මම එතුමාගෙන් ඉල්ලන්නේ පාර්ලිමේන්තුවේදී යම්කිසි දෙයක් කියනකොට ඒ සම්බන්ධව වගකීම්සහගත වෙන්න ඕනෑ කියන එකයි. මම හෝ නියෝජ්‍ය ඇමතිවරයා කිසිම ආකාරයකින් එහෙම ගනුදෙනුවක් ගැන කථා කරලා නැහැ. එහෙම කථා කරන්න අපට අයිතියක් හෝ හැකියාවක් හෝ බලයක් නැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කවුරු හෝ කොහේදී හරි කැමරාවක් අටවාගෙන YouTube channel එකක් කළ පලියට, ඒකේ තිබෙන ඒවා අරගෙන වගකීමක් නැතුව මේ සභාවට ඇවිල්ලා කියන්න බැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. ඒ කරපු පෞද්ගලික අපහාසය සම්බන්ධයෙන් අදාළ නීතිමය ක්‍රියාමාර්ග අපි ගනිමින් ඉන්නවා. ඒ සම්බන්ධයෙනුත් අපි සභාව දැනුවත් කරන්නම්. මම එතුමාගෙන් ඉල්ලනවා, මේ වාගේ කොහේ හරි යන ඒවා අරගෙන ඇවිල්ලා, මේ සභාවේ අත්හරින්න එපා කියලා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒක ඔහේ යන දෙයක් නොවෙයි. YG Holdings ආයතනයේ නිලධාරින් හම්බ වෙන්න ඔබතුමන්ලා කිංග්ස්බරි හෝටලයට ගියේ මොකටද? ඔබතුමන්ලා කිංග්ස්බරි හෝටලයට ගියා නේ? ඔබතුමන්ලා කිංග්ස්බරි හෝටලයට ගියා. ඒ CCTV footage අරගෙන බලන්න. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනතාව මේ රජයට mandate එකක් ලබා දුන්නේ වංචා සහ දූෂණ නවත්වන්න. මම මේ කාරණය වගකීමෙන් කියන්නේ. පසුගිය සමයේදී Payagala Distilleries එකට bottling plant එකක් තිබුණා. එවකට හිටපු ඇමතිවරයෙක් මේ bottling plant එක වික්කා. ඒක මහා පරිමාණ වංචාවක්. ඒ උදාහරණයම නැවත ක්‍රියාත්මක කරන්න තමයි කිංග්ස්බරි හෝටලයට ගියේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමන්ලා කිංග්ස්බරි හෝටලයට මොකටද ගියේ? මේ රටේ ජනතාව මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තැබුවා. අද වනතුරු අපිත් සුබ පතන එකම දේ තමයි, මේ ආණ්ඩුව වංචා සහ දූෂණ මර්දනය කිරීම. හැබැයි, එක පැත්තකින්, දුන්නු බාර් පර්මිට් එක අල්ලස් ලෙස දුන්නාය කිව්වා; ඒකට action එකක් නැහැ. තව පැත්තකින්, ඇමතිවරු ගිහින් ඩීල් දාන්න හදනවා; ඒවාට action එකක් නැහැ. හැබැයි මම අගය කරනවා, එතනෝල් distributorsලා සහ producersලා distilleries සඳහා මාස 6ක කාලයක් බදු නොගෙවා ඉන්න දීලා තිබුණු සහනය මාසයක කාලයකට අඩු කරලා, ගෙව්වේ නැත්නම් ඒකට අදාළව ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව. ඇත්තටම මම ආණ්ඩුවට ඒ ගැන සුබ පතනවා. හැබැයි, මෙන්න මේ ඇමතිවරුන්ගේ දූෂිත ක්‍රියා පිළිබඳවත් ක්‍රියාමාර්ග ගන්න. මොකද, හැම දෙයටම ඔබතුමන්ලා නේ CID යන්නේ. ආණ්ඩු පක්ෂයටම පුළුවන්, මන්ත්‍රීවරයෙකුට විරුද්ධව මෙහෙම චෝදනා ඇවිල්ලා තිබෙනවා කියලා කිංග්ස්බරි හෝටලයට ගිහින් CCTV පරීක්ෂා කරන්න. එතකොට එතුමන්ලා lobby එකේදී හම්බ වුණාද, නැද්ද කියලා හොයා ගන්න පුළුවන්. ඒක ගිහින් බලා ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

Order, please! දිවා ආහාර විවේකය සඳහා සභාවේ වැඩකටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ වනකොට සාකච්ඡා කරමින් තිබෙන්නේ, සුරාබදු ආඥාපනතේ 32වන වගන්තිය යටතේ මත්පැන් නිෂ්පාදනය මත බදු ගෙවීමේ කාල සීමාව සහ අධිභාරය අය කිරීම සම්බන්ධයෙන් පනවා ඇති රීති සහ 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2වන වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සම්බන්ධයෙන් වන නියමය ගැනයි. විශේෂයෙන් අල සහ ලූනුවලට පසුගිය කාලයේ දිගටම පවත්වාගෙන ආපු බද්ද වැඩි කර තිබෙනවා. ඒ සම්බන්ධව විශේෂයෙන් සාකච්ඡා කරනවා.

මේ අවස්ථාවේ මේ අල සහ ලූනු සඳහා ඇති බද්ද වැඩි කරන්න හේතුව මොකක්ද? කවුරුත් දන්නවා, අපේ රටේ භෝග නිෂ්පාදනය වෙනුවෙන් මහන්සි වන ගොවි ජනතාවක් ඉන්න බව. ඒ අය විවිධ නිෂ්පාදන වෙනුවෙන් මැදිහත් වීම් කරනවා. විශේෂයෙන් අපේ රටේ ලූනු වගාව ගත්තාම අපි දන්නවා, දඹුල්ල, සීගිරිය හා අනුරාධපුර ප්‍රදේශවල විශාල ප්‍රමාණයෙන් ඉතිහාසයේ සිට ලූනු වගාවේ නියැළී සිටි ගොවි ජනතාව 2020න් පසුව, ඒ කියන්නේ 2021, 2022 හා 2023 වනකොට ලූනු වගා නොකරන තත්ත්වයටම එම වගාව අතහැරියා කියන එක. හැබැයි, 2025 වර්ෂය වනකොට ගොවි ජනතාව වුවමනාවෙන්, උනන්දුවෙන් නැවත හෙක්ටෙයාර 2,644ක් වගා කළා. අපි ආණ්ඩුව විධියට ලූනු වගාවේ යෙදෙන, ගොඩ භෝග වගාවේ යෙදෙන ගොවි ජනතාවට හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක පොහොර සහනාධාරයක් ලබා දෙන්න තීරණය කරලා, එම සහනාධාරය අපි දුන්නා. ගොවි ජනතාව දිරිමත් කරලා, අපි එම කටයුත්ත කළා.

සාමාන්‍යයෙන් ලූනු කිලෝ එකක් නිෂ්පාදනය කරන්න ගොවියෙකුට රුපියල් 90ත්, 100ත් අතර නිෂ්පාදන පිරිවැයක් දරන්න වනවා. හැබැයි, ලූනු අස්වනු නෙළන කාලය වනකොට ලූනු මිල පහත බහිනවා. ඒකට හේතුව මේකයි. අපේ රටේ අවශ්‍යතාවට අනුව අපේ රටේ ලූනු නිෂ්පාදනය වෙන්නේ නැහැ. වර්ෂයකට අපේ රටට අවශ්‍ය වනවා ලූනු මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක්. සාමාන්‍යයෙන් අපේ රටේ මාසයකට මෙට්‍රික්ටොන් 25,000ක පරිභෝජනයක් තිබෙනවා. දැන් හෙක්ටෙයාර 2,644න් ආසන්න වශයෙන් අපි බලාපොරොත්තු වුණා මෙට්‍රික්ටොන් 50,000ක අස්වැන්නක්. ඒ කියන්නේ, මාස දෙකකට අවශ්‍ය ප්‍රමාණයට ලූනු නිෂ්පාදනය කරලා තිබෙනවා. හැබැයි, ගොවි ජනතාවට ඒවා විකුණ ගන්න බැරිව තිබුණේ. ලූනු නිෂ්පාදනය කිරීම වෙනුවෙන් දැරූ පිරිවැයවත් එම ගොවි ජනතාවට නැති වන මට්ටමක් තිබුණේ. එම තත්ත්වය තුළ ආණ්ඩුව විධියට අපි කල්පනා කරලා, රුපියල් 10ක් ලෙස පනවා තිබුණු බද්ද රුපියල් 50ක් දක්වා වැඩි කළා. ඒකෙන් දැන් ගොවියාට වාසියක් ඇවිල්ලා තිබෙනවා. ඇයි අපි ඒක කළේ? අපේ රටේ ගොවි ජනතාව ආරක්ෂා කර ගන්න ඕනෑ නිසා; නිෂ්පාදනය වෙනුවෙන් මහන්සි වන ගොවි ජනතාව ආරක්ෂා කර ගන්න ඕනෑ නිසා.

ඊළඟට, අර්තාපල් කිලෝ එකකට රුපියල් 60ක් ලෙස පනවා තිබුණු බද්ද අපි රුපියල් 80 දක්වා ඉහළ නැංවුවා. අර්තාපල් කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 210කට ආසන්න පිරිවැයක් යනවා. ඒක ඇත්ත. හැබැයි, මීට පෙර කථා කළා විපක්ෂ නායකතුමා. එතුමා කිව්වා, බී ලූනු කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 250ක වියදමක් යනවා කියලා. විපක්ෂ නායකතුමාගෙන් අපි අහනවා, බී ලූනු කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 250ක් වැය වෙන්නේ කුමන වාර්තා අනුවද, ඒ මොන පොහොර යොදලාද, මොනවාද යොදා තිබෙන්නේ කියලා. ගොවි ජනතාව එපමණ වියදමක් දරන්නේ නැහැ. රුපියල් 90ක්, 100ක් වැය වන එක ඇත්ත. ඒක තමයි ඇත්ත ගණන් බැලීම.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම බදු පැනවීම තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ එක පැත්තකින් අපේ රටේ පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම. අනෙක් පැත්තෙන් ගොවි ජනතාව ආරක්ෂා කර ගැනීම. ඒ නිසා අපි කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට ගොවි ජනතාවට වැඩි පහසුකම් දීලා, දෙන්න පුළුවන් උපරිම සහයෝගය දීලා ගොවි ජනතාව තවත් දිරිමත් කරලා මෙම භෝග නිෂ්පාදනය වැඩි කර ගන්න ඕනෑකම තිබෙනවා. දැන් වෙළෙඳ පොළේ බී ලූනු ටික විකුණා ගන්න පුළුවන් මට්ටමට, අල ටික ලාභයක් ලැබෙන විධියට විකුණා ගන්න පුළුවන් මට්ටමට මිල ඉහළ ගිහින් තිබෙනවා. අපි ආණ්ඩුව විධියට අපේ රටේ ගොවි ජනතාව ආරක්ෂා කිරීම වෙනුවෙන් ගත යුතු තීරණ ටික, තීන්දු ටික අදාළ මොහොතේදී ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගොවි ජනතාව බලාපොරොත්තු වුණේ අවම වශයෙන් බී ලූනු කිලෝ එකකට රුපියල් 140ක්, 145ක් වාගේ මිලක්. හැබැයි දැන් රුපියල් 150, 160 දක්වා මිල ඉහළ ගිහින් තිබෙනවා. ඒ අනුව දැන් හොඳ තත්ත්වයක් වාර්තා වෙමින් තිබෙනවා. ගොවි ජනතාවගේ මේ ප්‍රශ්න ටික ගැන අපි පසුගිය කාලයේ සාකච්ඡා කළා, ගත යුතු තීන්දු තීරණ ටික ගත්තා. ඒ සම්බන්ධයෙන් මේ ගෙනැල්ලා තිබෙන නියමය ඉතාම යහපත් ලෙස දකින්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම අද ඉදිරිපත් කරන අනෙක් කාරණය තමයි, සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය යටතේ මත්පැන් නිෂ්පාදනය මත බදු ගෙවීමේ කාල සීමාව සහ අධිභාරය අය කිරීම සම්බන්ධයෙන් වන රීති. ඇයි මේ කාරණය ඉදිරිපත් කරන්නේ? මේ නීති රෙගුලාසි වෙනස් කරන්නේ ඇයි? අපි දන්නවා මේ වෙනකොට 962 දරන සුරාබදු නිවේදනය මඟින් ක්‍රියාත්මක වන අධි භාරයන් අය කර ගැනීම සහ හිඟ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් තිබෙන නීති රීතිවලින් රිංගලා යන බොහෝදෙනෙක් ඉන්න බව. ඒ නීති රීතිවලින්, ඒ සිදුරුවලින් රිංගලා ගිහින් බදු ගෙවන්නේ නැතිව හැංගි හැංගී ඉන්නවා. මගේ අතේ තිබෙනවා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට 2025.09.30 වන දිනට එන්න තිබෙන හිඟ බදු ආදායම සඳහන් පත්‍රිකාවක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙකේ සමාගම් 14ක් තිබෙනවා. මේ වෙනකොට හිඟ බදු විශාල ප්‍රමාණයක් තිබෙනවා. ප්‍රධාන පෙළේ සමාගම් 14ක් ඇතුළේ බිලියන 10ක් හිඟ බදු අය වෙන්න තිබෙනවා.

අනෙක් පැත්තෙන් ගත්තාම, විශේෂයෙන්ම මේ අවුරුද්දේ - 2025 වර්ෂයේ - රුපියල් බිලියන 1ක හිඟ බදු ප්‍රමාණයක් තිබෙනවා. 2025 ජනවාරි මාසයේ ඉඳලා මේ වෙනකොට රුපියල් බිලියන 1ක හිඟ බදු ප්‍රමාණයක් තිබෙනවා. නමුත්, එම මුදල අය කර ගන්න බැරුවයි තිබෙන්නේ. මේ බදු නොගෙවා රිංගලා යන්න තිබෙන ක්‍රමවේදය මොකක්ද? දවස් 15ක් ඇතුළත තමන් නිෂ්පාදනය කරන දේවල්වලට ඒ මාසයේ ඊළඟ දවස් 15 ඇතුළත බදු ගෙවන්න ඕනෑකම තිබුණත්, ඒ බදු මුදල නොගෙවා දිගින් දිගට, දිගින් දිගට ඇදගෙන යනවා. ඒ නිසා අපි මේ රීති මඟින් මොකක්ද කරන්නේ? මෙකෙන් කරන්නේ වෙන මොනවත් නොවෙයි, තමන් කරන නිෂ්පාදනවලට ගෙවිය යුතු බදු මුදල අවම මාසයක් ඇතුළත ගෙවිය යුතුව තිබෙනවා; අවම මාසයක් ඇතුළත ගෙව්වේ නැත්නම්, මාසයක් යනකොට නිෂ්පාදනය අත්හිටුවන තැනට ගේන්න නීති රෙගුලාසි වෙනස් කරගෙන තිබෙනවා. ඒ වාගේම නොගෙවා තවත් ඉදිරියට යනවා නම්, මාස තුනක් යනකොට එම බලපත්‍රය සම්පූර්ණයෙන්ම අත්හිටුවන්න පුළුවන් විධියට නීතිය වෙනස් කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම බදු ගෙවන්නේ නැතුව හැංගිලා හිටපු බොහෝ දෙනෙකුගෙන් බදු අය කර ගැනීමට අපි කටයුතු කරනවා. අපි දන්නවා, බදු අය කර ගන්නේ මේ රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් බව. විශේෂයෙන්ම අපි මෑත කාලයේ අය කර ගත් බදු, පසුගිය කාලයට සාපේක්ෂව ගත්තාම මේ රටේ ජනතාවගේ සංවර්ධනය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. මම මේ කිව්වේ, සුරාබදු සම්බන්ධයෙන්.

ඊළඟට, ඒකත් එක්කම ගැට ගැහුණු කාරණයක් තමයි එතනෝල්. ඒ සම්බන්ධයෙන් ගෙවීමට ඇති හිඟ බදු මුදල විධියට රුපියල් මිලියන 193ක් තිබෙනවා. එතනෝල් නිෂ්පාදනය සඳහා වන හිඟ බදු මුදල් ගෙවලා නැහැ. එතැන රුපියල් මිලියන 193ක් තිබෙනවා. ඒ වාගේම, රා නිෂ්පාදනය වෙනුවෙන් රුපියල් මිලියන 7ක් ගෙවන්න තිබෙනවා. මේ හැම එකකම නිෂ්පාදනය වෙනුවෙන් ගෙවන්න තිබෙන සුරා බදු නොගෙවා හැංගි හැංගී ඉන්නවා. එම නිසා අපි ආණ්ඩුවක් විධියට කල්පනා කරනවා, විශේෂයෙන්ම මේ බදු අය කර ගැනීම වෙනුවෙන් තිබෙන නීති රෙගුලාසි වෙනස් කරලා, එම බදු අය කර ගැනීම සඳහා පහසුවක් හදා ගනිමින්, එසේ අය කර ගනු ලබන බදු මුදල් මේ රටේ ජනතාවගේ සංවර්ධනය වෙනුවෙන්, මේ රටේ ජනතාවගේ උන්නතිය වෙනුවෙන් පාවිච්චි කරන්න. එම නිසා ගෙවුණු කාලය ඇතුළේ අපි ඒ බදු මුදල් නිසි ලෙස ජනතාවගේ සංවර්ධනය වෙනුවෙන් පාවිච්චි කරලා තිබෙනවා, සංවර්ධනය වෙනුවෙන් යොදවා තිබෙනවා, ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම සුරාබදු අය කර ගැනීම සම්බන්ධව අද මේ ගෙනැවිත් තිබෙන රීති අනුමත කරමින් ආණ්ඩුවක් විධියට ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරියට අරගෙන යෑම වෙනුවෙන් අපි මැදිහත් වීමක් කරනවාය කියන පණිවුඩය මම මේ ගරු සභාවට ලබා දෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.10]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අවාසනාවන්ත සිද්ධියක් වෙලා තිබෙනවා. වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට වෙඩි තියලා ඝාතනය කර තිබෙනවා. හැබැයි, එතුමාගේ යටගිය දවස, යටගිය දේවල් දැන් Facebook එකේ, YouTube එකේ පළ කරලා තිබෙනවා. දැන් ඒවා කියලා වැඩක් නැහැ. එතුමා මිදිගම කොට්ඨාසය දිනලා නීත්‍යානුකූලවයි සභාපති බවට පත්වෙලා තිබෙන්නේ. සභාපතිවරයා හැටියට ප්‍රාදේශීය සභාව ඇතුළේ ඉන්නකොට තමයි අද එතුමාට වෙඩි තියලා තිබෙන්නේ. අද මෙතැන මැති ඇමතිවරු ඉන්නවා, සමහර අය 1988-1989 කාලයේ හිර ගෙවල්වල හිටපු අය. ඒ වුණත් දැන්

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ඒගොල්ලෝ මැති ඇමතිවරු. දැන් ඇමති. එදා හිරේ සිටියත්, 1988 -1989 කාලයේ මොනවා කළත්, දැන් ඒ අය ඇමතිවරු. ඒක නිසා ඇමති ඇමතිමයි, මන්ත්‍රී මන්ත්‍රීමයි, ඒ වාගේ ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රාදේශීය සභා සභාපතිමයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපටත් බලපෑමක් තිබෙනවා. මෙතෙක් කල් අපට ලබා දී තිබූ ආරක්ෂාව මේ ආණ්ඩුව අයින් කරලා තිබෙනවා. අපට මොනවා හෝ වුණොත් ආණ්ඩුව වග කියන්න ඕනෑ. අපි මේ ආණ්ඩුවට ඍජුවම ප්‍රතිප්‍රහාර එල්ල කරනවා, ආණ්ඩුවේ වැරදි පෙන්වා දෙනවා. විපක්ෂයේ ඉන්නකොට මේ වාගේ ප්‍රශ්න තිබෙනවා. ඒ ගැන මම මීට වැඩිය කථා කරන්න කැමැති නැහැ.

දැන් මේ අල, ලූනු ගැන කථා කරද්දී මම කියන්න ඕනෑ, මම මීට මාස තුනකට කලින් තමයි කිව්වේ, ආනයනය කරන අල සහ ලූනු සඳහා බද්දක් ගහන්න කියලා. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනැල්ලා මම මෙතැනදී ඒක කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තුවාලය හොඳටම කුණු වුණාම ඒ තුවාලය සනීප කරන්න බැහැ. තුවාලය කුණු වුණාම කකුල කපන්න වෙනවා. මේ අල බද්ද අද නොවෙයි ගහන්න තිබුණේ, මීට මාස තුනකට කලින්. ලූනු බද්ද ගහන්න තිබුණේත් මීට මාස තුනකට කලින්. ඊයේ පෙරේදා වැස්සට ඌව පරණගම අල කොටු විනාශ වෙලා, වැලිමඩ අල කොටු විනාශ වෙලා. දැන් අල කුණු වෙනවා. අල කොටුවලට ගංවතුර ඇවිල්ලා විනාශ වුණා. ඒ වාගේම ලූනු කොටු ඔක්කෝම විනාශ වුණා. ඒ මදිවට තව මාස තුනකට ඇති වෙන්න අල ආනයනය කරලා තිබෙනවා. ඒ වාගේම තව මාස තුනකට ඇති වෙන්න ලූනු මේ වෙළෙඳ පොළේ තිබෙනවා. නමුත් අද තමයි බද්ද ගහලා තිබෙන්නේ. මේ බද්ද ගහන්න තිබුණේ මීට මාස තුනකට කලින්. එතකොට ආනයනික අල ටිකත් ඉවර වෙනවා, ලූනු ටිකත් ඉවර වෙනවා. ඒ වාගේම අල ගොවියාට සහනයක් ලැබෙනවා, ලූනු ගොවියාටත් සහනයක් ලැබෙනවා. වැඩේ ඉවර වුණාට පස්සේ බදු ගහලා වැඩක් නැහැ. මේක තමයි වෙලා තිබෙන්නේ. මේ ආණ්ඩුව හොඳ තීන්දු ගත්තත්, නරක තීන්දු ගත්තත් ඒවා ගන්නේ ජනතාවට අසාධාරණයක් වුණාට පසුවයි. ජනතාවට යහපතක් වන තීන්දු ගන්න. මේක මම මීට මාස තුනකට කලින් කිව්වේ, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනැල්ලා. නමුත් ඒක වුණේ නැහැ.

ඊළඟ කාරණය මේකයි. පොන්නි සම්බා සහ පාල් සම්බා කියලා වර්ග දෙකක් ගෙන්වන්න හැකි වන පරිදි දැන් ගැසට් එකක් ගහලා තිබෙනවා. ගැසට් එක ගැහුවේ කවදාද? එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරපු දවස නම් මට මතක නැහැ. මා හිතන විධියට, මේ මාසයේ 13වැනි දාට ආසන්න දිනයකයි. හැබැයි, ගැසට් එක ගැහුවේ මේ මාසයේ 15වැනි දා. එතැන වෙලා තිබෙන්නේ ලොකු වංචාවක්ද, හොරකමක්ද, සහයෝගයක්ද - support එකක්ද - කියන එක අපි දන්නේ නැහැ. ගැසට් එක 15වැනි දා ගැහුවා. ගැසට් එක ගහලා තිබෙන්නේ කොහොමද දන්නවාද? 28වෙනි දා වෙන කොට හාල් නැව්ගත කරන්න ඕනෑ කියලායි. 15වැනි දා ගැසට් එක ගැහුවා. 28වැනි දා වෙනකොට හාල් නැව්ගත කරලා අවසන් වෙන්න ඕනෑ. ලබන මාසයේ 15වැනි දා වනකොට හාල් ගෙනෙන්න ඕනෑ කියලා තමයි ගැසට් එක ගැහුවේ. ආණ්ඩුවට හිතවත් යම් ව්‍යාපාරිකයෝ කිහිප දෙනෙක් එකතු වෙලා මේ වෙන කොට චෙන්නායි වරායෙනුයි, තුත්තුකුඩිය වරායෙනුයි හාල් පටවලා තිබෙනවා. 15වැනි දා වෙන කොටම - ගැසට් එක ගහන්න ඉස්සෙල්ලා- චෙන්නායි වරායට හාල් ගෙනාවා; තුත්තුකුඩිය වරායට හාල් ගෙනාවා. කන්ටේනර් 20 ගණනේයි එක්කෙනෙකුට දුන්නේ. පස්දෙනා කන්ටේනර් 20 ගණනේ කොම්පැනි නවයකට දැම්මා. අනෙක් අයට ගන්න දුන්නේ නැහැ. කොම්පැනි පහකට, දහයකට ඒ ව්‍යාපාරිකයෝ පස්දෙනා ඒවා දා ගත්තා. අද වෙනකොට කොළඹ වරායට හාල් ඇවිල්ලා ඉවරයි. කොහොමද දවස් 5ක් ඇතුළත චෙන්නායි මෝල්වලින් කොටලා, තුත්තුකුඩි මෝල්වලින් කොටලා වී ටික හාල් කරලා චෙන්නායි වරායට සහ තුත්තුකුඩිය වරායට ගෙනාවේ? ගැසට් එක ගැහුවේ රෑ 12.00ට. ගැසට් එක ගහපු දවසේ උදේ වෙනකොට හාල් වරායට ඇවිල්ලා ඉවරයි. ඒ ව්‍යාපාරිකයෝ හිතවත් ආණ්ඩුවටද, ඇමතිතුමාටද කියලා කියන්න මම දන්නේ නැහැ. ආණ්ඩුව ගැන මම කියන්නේ නැහැ. ඇමතිතුමාට හිතවත් ව්‍යාපාරිකයන් පස්දෙනෙක් මේ වෙනකොට සහල් ගෙනැල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ දවස්වල ඉන්දියාවට නිවාඩු. චෙන්නායිවලට මේ දවස්වල නිවාඩු. හරියටම නිවාඩු දවස් පහ ඇල්ලුවා. දවස් පහක් චෙන්නායිවලට නිවාඩු. මේ දවස්වල තුත්තුකුඩියටත් නිවාඩු. මේ දීපාවලි නිවාඩුව අස්සේ කිසිම ව්‍යාපාරිකයෙකුට හාල් ටික ගෙනෙන්න බැහැ. ඒ ව්‍යාපාරිකයන් මේ ආණ්ඩුවට හිතවත්, එහෙම නැත්නම් වෙළෙඳ ඇමතිතුමාට හිතවත් අයයි. ඉස්සර හොරකම් කළා. යකෝ! මේක මාර හොරකම් කිරිල්ලක් නේ. අහුවෙන්නේ නැති වෙන්නයි අද මේ හොරකම කරන්නේ. මේක අල්ලන්න බැහැ නේ. ගැසට් එක ගැහුවා; බඩු ආවා. අල්ලන්න බැහැ. *[බාධා කිරීමක්]* අන්න ආණ්ඩුවේ මන්ත්‍රීතුමෙක් කිව්වා, "අපි එහෙම තමයි" කියලා. අයියෝ මන්ත්‍රීතුමා, ඔබතුමා මොනවාද කථා කරන්නේ? ඔබතුමා එහෙම කියන්න එපා. ඔබතුමා ජාතික ජන බලවේගයේද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ? අද වෙනකොට ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක් විතරක් හාල් ගෙන්වනවා. අනෙක් කිසි කෙනෙකුට ගෙන්වන්න බැහැ. අනෙක් අයට හාල් ගෙන්වන්න බැරි ඇයි? දැන් චෙන්නායිවලට නිවාඩු. දැන් තුත්තුකුඩියට නිවාඩු. ඒ නිසා දැන් ඉන්දියාවෙන් හාල් ගෙන්වන්න බැහැ. 28වැනි දාට නැව්ගත කරන්න බැහැ. 28වැනි දා වෙනකොට බඩු පටවන්න බැහැ. ඒක නිසා අනෙක් කිසිම ව්‍යාපාරිකයෙකුට හාල් ගෙන්වන්න බැහැ. 28වැනි දා වෙන කොට ආණ්ඩුවට හිතවත්, ඇමතිතුමාට හිතවත් ව්‍යාපාරිකයෝ එකතු වෙලා දැන් හාල් ගෙනෙනවා. එතකොට මෙහේ මොකක්ද වුණේ? හාල් මෝල්කාරයෝ මෙහේ තිබුණු කීරි සම්බා රුපියල් 360ට විකුණුවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රුපියල් 260ට පාලන මිල ගැහුවාට කීරි සම්බා රුපියල් 260ට ගන්න කොහේවත් තිබුණේ නැහැ. මෝල්කාරයෝ රුපියල් 320ට, 340ට හාල් විකුණලා ඉවරයි. එතකොට මෝල්කාරයෝත් ගොඩ. දැන් පොන්නි සම්බායි, අනෙක් හාල් එකයි දෙකම එනවා. හැබැයි, පාල් සම්බා රුපියල් 260ට විකුණන්න වෙන්නේ නැහැ. පාල් සම්බා විකුණන්න වෙන්නේ රුපියල් 340ට. හැබැයි, පොන්නි සම්බා රුපියල් 260ට විකුණන්න පුළුවන් වුණොත් අපේ රටට ඒකවත් වාසියක් වේවි. එක්කෝ, ඒ වාසිය ගොවියාට තියෙන්න ඕනෑ; නැත්නම් පාරිභෝගිකයාට තියෙන්න ඕනෑ. එක්කෝ, ගොවියා කන්න ඕනෑ. එහෙම නැත්නම් පාරිභෝගිකයා කන්න ඕනෑ. මේ හාල් ගෙනෙන එකට අදාළව කිලෝවකට රුපියල් 65ක බද්දක් ගහලා තිබෙනවා. එක්කෝ, සත 25ක, රුපියලක බද්දක් ගහලා කන එකාට හාල් ටික දෙන්න ඕනෑ. රුපියල් 65ක බද්දක් ගහපු එක අඩු කරලා බත් කන එකාට හාල් දෙන්න ඕනෑ, කිලෝ එකක් රුපියල් 200ට, 150ට. "බත් කාපල්ලා" කියලා බත් කන මිනිහාට හාල් ටික දෙන්න ඕනෑ. නමුත්, දැන් බත් කන මිනිහාටත් නැහැ; ගොවියාටත් නැහැ. අරහෙන් මෙහෙන් හාල් ආනයනය කරන කොට, එක පැත්තකින් ගොවියාගේ බඩට වදිනවා; අනෙක් පැත්තෙන් බත් කන මිනිහාගේ බඩට වදිනවා. මේකේ දෙපැත්තක් මොකක්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? එක්කෝ, බද්ද අඩු කරලා මිල අඩු කරලා බත් කන මිනිහාට හාල් ගෙනැල්ලා දෙන්න ඕනෑ, කාපල්ලා කියලා. එහෙම නැත්නම්, ගොවියාට පොහොර සහනාධාරය විධියට දීලා හරි, එහෙම නැත්නම් අතින් සල්ලි දීලා හරි කියන්න ඕනෑ වවපල්ලා, වවලා අපේ රටේ මිනිසුන්ට කන්න

දීපල්ලා කියලා. නමුත්, මේ දෙකෙන් එකක්වත් වෙන්නේ නැහැ. 28වැනි දායින් පස්සේ අයේ හාල් නැව්ගත කරන්න බැහැ.

දැන් ලුණු කන්ටේනර් 800ක් වරායේ තිබෙනවා. මේ විධියට ගැසට් එක ගහලා ගෙන්වපු ලුණු අන්න වරාය අස්සේ දිය වෙනවා. අඩුම වශයෙන් ඒ ලුණු ටික පැකට් එකක් රුපියල් 50ට හරි මේ රටේ මිනිසුන්ට දුන්නා නම් මොකක්ද වෙන්නේ?

ගැහුවා ගැසට් එක. ලුණු ගෙන්නුවා. ලුණු ටික නිදහස් කිරීම නැවැත්තුවා. දැන් ඒ ලුණු ටික වරායේ. හාලුත් 28වැනි දායින් පසුව ගෙනාවොත් මේකමයි වෙන්නේ? 28වැනි දා රෑ 12.00ට ඉස්සෙල්ලා නැව්ගත කරලා තිබෙන්න ඕනෑ. අන්න ඒක තමයි ගැසට් එකේ නීතිය. ඕක තමයි ඉතින් තත්ත්වය. ඔහොම කොහොමද, කරන්නේ?

ඒ වාගේම, අරක්කු ගැනත් කථා කළා. මහත්තයෝ, මත්පැන්වලින් tax අය කරගන්න වුණත්, මිනිස්සු බොන්න ඕනෑ. Tax ගහන්නත් මිනිස්සු බොන්න ඕනෑ. කොහොමද බොන්නේ? රුපියල් 4,600යි, ගල් බෝතලය. ඒක බිව්වොත් තමයි ආණ්ඩුවට tax එක හම්බ වෙන්නේ; බද්ද හම්බ වෙන්නේ. බද්ද අය කර ගන්න නම්, මිනිස්සු බොන්න ඕනෑ මහත්තයෝ. ආණ්ඩු පක්ෂය පැත්තේ ඉන්න මහත්තයෙක් කිව්වා, tax එකතු කරගන්නවා කියලා. Tax එකතු කරගන්නත්, බොන්න එපායැ. මිනිස්සු බිව්වොත් නේ, අපට tax අය කරගන්න පුළුවන් වෙන්නේ. පසුගිය ආණ්ඩුව කාලයේදීත් මම මේ ගැන කිව්වා. හැබැයි, ගිය ආණ්ඩුවත් ඒක කළේ නැහැ. ගිය ආණ්ඩුවත් වැඩේ වරද්දගත්තා. බොන එකාට රුපියල් 2,000ට, 2,500ට බෝතලය දෙන්න පුළුවන්. අද වටලන නිසා ගම්වල කසිප්පු නැති වෙලා තිබෙන්නේ. ඒ නිසා බොන කෙනාට රුපියල් 2,000ට, රුපියල් 2,500ට අරක්කු බෝතලය දෙන්න පුළුවන්.

රංග දිසානායක මහත්මයා කිව්වා, මේ ඔක්කෝම දූෂිතයි කියලා. රජයේ ආයතන සියයට 60ක් දූෂිත ලු. එහෙම නම් අධ්‍යාපන අමාත්‍යාංශය දූෂිත වෙන්න ඕනෑ, පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය දූෂිත වෙන්න ඕනෑ, බන්ධනාගාර දෙපාර්තමේන්තුව දූෂිත වෙන්න ඕනෑ, පොලිසිය දූෂිත වෙන්න ඕනෑ, ආරක්ෂක අමාත්‍යාංශය දූෂිත වෙන්න ඕනෑ, ජනාධිපති කාර්යාලය දූෂිත වෙන්න ඕනෑ. ඇයි යකෝ, සියයට 60ක් රජයේ ආයතන දූෂිතයි ලු! එයාගේ නෝනලා දෙදෙනා වැඩ කරපු බැංකුව දූෂිත නැද්ද? මහ බැංකුවේ නේ, හිටියේ. මම එදා කිව්වා නේ අර්ජුන මහේන්ද්‍රන්ට passport එක release කළේ කවුද කියලා. ඒක කියන්න බැරි වුණා. රජයේ ආයතන ඔක්කෝම දූෂිත ලු. දූෂිත නම්, ආණ්ඩුව කියන්න එපායැ, රජයේ මේ අහවල්, අහවල්, අහවල් ආයතන දූෂිතයි කියලා. ඒවා කියන්නේ නැහැ. රජයේ ආයතන ඔක්කෝම දූෂිත ලු. එහෙම නම් මේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය ඇතුළු මේ සියලු දෙනාත් දූෂිත වෙන්න ඕනෑ. එහෙම නොවෙයි, එයා ඒක කියන්න ඕනෑ. රජයේ මොන මොන ආයතනද දූෂිත කියලායි කියන්න ඕනෑ.

ඊළඟ කාරණය මධ්‍යම සංස්කෘතික අරමුදල ගැනයි. එයට අදාළ ලේඛන මම මෙහිදී සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා. ඇමතිතුමා දැන් මෙතැන නැහැ. එතුමා හොඳ මනුස්සයා. හැබැයි, එහි හොරකම්, වංචා කිහිපයක් වෙලා තිබෙනවා. සජිත් ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ අඩුපාඩු දැන් හොයන්න එපා. ඒ කාලයේත් අඩු පාඩු වෙලා තිබෙනවා නම් හොයන්න. හැබැයි, දැනුත් මේ අමාත්‍යාංශයේ, මධ්‍යම සංස්කෘතික අරමුදලේ අඩුපාඩු ගොඩක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඒවාට අදාළ ලේඛන **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඊළඟ කාරණය මේකයි. රුහුණ විශ්වවිද්‍යාලයේ සමසෞඛ්‍ය විද්‍යා පීඨයට සිසුන් බඳවාගෙන නැහැ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයට බඳවා ගෙන තිබෙනවා, ජයවර්ධනපුරට බඳවා ගෙන තිබෙනවා, කොළඹ විශ්වවිද්‍යාලයට බඳවා ගෙන තිබෙනවා. හැබැයි, රුහුණ විශ්වවිද්‍යාලයට බඳවා ගෙන නැහැ. එතකොට ඒ ළමයින්ගේ අනාගතයට මොකද වෙන්නේ? ළමයි 250ක් බලාගෙන ඉන්නවා, එම පීඨයට යන්න. නමුත් තවම බඳවා ගෙන නැහැ. ඒකට හේතුව හැටියට විශ්වවිද්‍යාලය මොකක්ද කියන්නේ? අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබෙනවා ලු; බඳවා ගන්න අවස්ථාව දෙන්නේ නැති ලු; අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රශ්න තිබෙනවා ලු. මේ ඉන්නේ ඒ ප්‍රදේශයේ අපේ මන්ත්‍රීතුමන්ලා. මේ මිනිස්සුන්ට මොනවත් දීලා නැහැ නේ. මේ මේ අයට අවස්ථාව දීලා බඳවා ගන්නකෝ. මාතර මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේ ඉන්නවා නේ. 50:50 හරි දීලා, මන්ත්‍රීතුමන්ලා හරහා අරගෙන හරි බඳවා ගන්නකෝ. ඇයි යකෝ, ඒ බඳවා ගැනීම් කරන්නේ නැතුව කියනවා, පුරප්පාඩු තිබෙනවා ලු; බඳවා ගෙනත් නැති ලු; අනධ්‍යයන කාර්ය මණ්ඩලය නැතුව වැඩ කරන්නත් බැරි ලු. අනධ්‍යයන කාර්ය මණ්ඩලය නැතුව වැඩ කරන්න බැරි නිසා අර ළමයි අවුරුදු 2ක් එළියේ ඉන්න ඕනෑ. මොකක්ද, මේ වැඩේ? එහෙම නොවෙයි නේ, කළ යුත්තේ. එම විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට බඳවා ගන්න මාතර දිස්ත්‍රික්කය තුළ ඕනෑ තරම් දරුවෝ නැද්ද? විද්‍යා, ගණිත අංශවලින් උසස් පෙළ පාස් වෙච්ච දරුවෝ ඕනෑ තරම් ඉන්නවා. රුහුණ විශ්වවිද්‍යාලයේ පවතින ඒ ප්‍රශ්නය ලොකුවට බලපානවා.

මේ වාගේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා. මේවා හංගලා කියන ඒවා නොවෙයි. අපි මේවා කියනවා, පෙන්වා දෙනවා. එහෙම කියන්න ඕනෑ නිසා තමයි අපි දැනුත් මේවා කියන්නේ. මේවා පෙන්වා දෙන්න තමයි අපි ඇවිල්ලා ඉන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියට මම ස්තුතිවන්ත වෙනවා, මට මේ කාලය ලබා දීම ගැන.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමිඳික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
අපේ චාමර සම්පත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා, ලූනු සහ අලවලට ගහපු බද්ද පිළිබඳ කරුණු. එතුමාගේ කථාවෙන් හැඟුණේ අද මේ බද්ද ගහනවා වාගේයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
නැත්නම් කවදාද?

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

එහෙම නොවෙයි. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ 2025 අගෝස්තු මාසයේ 25වැනි දින අංක 2451/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය තමයි නීතිමය අවශ්‍යතාවන්ට යටත්ව පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා මෙසේ ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා, ඒක නිසා අදහස් ප්‍රකාශ කරන කොට හරියට සොයලා බලලා කියන්න. ජනතාවට වැරැදි පරාවර්තන දෙන්න එපා. මාස 2කට කලිනුයි මෙම නියමය ගැසට් පත්‍රයේ පළ කරලා තිබෙන්නේ. අද ඔක්තෝබර් 22වන දා. අගෝස්තු මාසයේ 25වන දා ගහපු මේ ගැසට් එක - *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා මගේ නම කිව්වා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මන්ත්‍රීතුමා, බද්ද අද ගැහුවත්, මාස 3කට කලින් ගැහුවත්- *[බාධා කිරීමක්]* මම පිළිගන්නවා. මම මේ ආණ්ඩුවට දෝෂාරෝපණය කරනවා නොවෙයි. බද්ද කවදා ගැහුවත්, අදත් අල රුපියල් 140යි, ලූනු රුපියල් 90යි ගරු මන්ත්‍රීතුමා. ඒවා විකුණන්න බැහැ. ඒක පිළිගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.23]

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ගෙනෙන නියමය සහ සුරාබදු ආඥාපනත යටතේ ගෙනෙන රීති ගැන සාකච්ඡා කරන්න කලින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට මම කනගාටු වෙනවා මීට කලින් කථා කළ මන්ත්‍රීතුමාගේ ක්‍රියා කලාපය ගැන. මොකද, මේවා සජීවීව විවිධ නාළිකාවල විකාශනය වෙනවා. ඒ හැසිරීම මන්ත්‍රීවරයෙකුට ගැළපෙනවාද කියන ප්‍රශ්නය මතු වෙනවා. අපි අල, ලූනු ගැන කථා කළාට එතුමාගේ කථාවේ වැඩි හරියක් තිබුණේ හාලුයි, ලුණුයි ගැන. යන්නේ කොහෙද, මල්ලේ පොල් න්‍යායෙන් කථා කරලා අපි ඒ ගැන කියනකොට ඒවා දරාගන්න බැරිව එහෙම හැසිරෙන එක අපට පුදුමයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2014 ජනවාරි මස 20වන දින අංක 1846/8 අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශ කරන ලද සුරාබදු ආඥාපනත යටතේ ගෙනෙන රීති ගැනත් අද විවාද කරනවා. පසුගිය කාලයේ හිටපු ජනාධිපතිවරුන්ගේ හිතමිතුරන්ට බදු සහන දීපු, එහෙම නැත්නම් බදු ගෙවීම පැහැර හැරීමට ඉඩ දීපු අවස්ථා තිබුණා. ඒ පනත්වලට මුවාවෙලා, ඒ පනත්වල ප්‍රතිපාදන පාවිච්චි කරලා තමන්ගේ ගජ මිතුරන්ට සහන දුන්නා. නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා මේ වෙනකොට රුපියල් බිලියන 10කට ආසන්න මුදලක් බදු විධියට අයකර ගන්න තිබෙනවා කියලා. පසුගිය කාලයේ මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ සමාගමේ අයිතිකරුවන්ට අයත් මත්පැන් නිෂ්පාදන සමාගමක් තිබෙනවා. අයකර ගන්න තිබෙන බදු මුදල්වලින්, රුපියල් බිලියන 10න් රුපියල් බිලියන 6.75ක්ම අයකර ගන්න තිබෙන්නේ ඒ සමාගමෙන්. මෙතුමන්ලා හෙට අනිද්දා ඒකාබද්ධ විපක්ෂයක් හදන්න යන්නේ එවැනි ජනාධිපතිවරු එක්ක එකතුවෙලායි කියන එක බදු ගැන කථා කරන මේ වෙලාවේ අපි කියන්න ඕනෑ.

විශාල වශයෙන් බදු මුදල් ගෙවීම පැහැර හැරපු තවත් ආයතන තිබෙනවා. ඒ ආයතන අතරත් ඔය ගජ මිතුරන්ගේ බැල්ම, ඇල්ම වැටිච්ච ආයතන කිහිපයකුත් තිබෙනවා. කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමෙක් සඳහන් කළ ලැයිස්තුවේ එවැනි ආයතනත් ඇතුළත් වෙලා තිබුණා. අපි ආණ්ඩුව ගත්ත මොහොතේ තීරණයක් ගත්තා, සුරාබදුවලට අදාළ ආඥාපනත සංශෝධනය කරන්න. ඒක අපි 2025 අය වැයේදී ප්‍රකාශ කළා. අවුරුදු 112ක් විතර පරණ, රටේ ආදායම් මාර්ගවලින් තුන්වැනි තැන තිබෙන සුරාබදු ආදායමට අදාළ ආඥාපනත සංශෝධනය කිරීමට අදාළ කැබිනට් සන්දේශය කැබිනට් අමාත්‍යවරු අනුමත කරලා පාර්ලිමේන්තුවේ අනුමැතියට එවලා තිබෙනවා. අපි සැලකිය යුතු, සංවේදී කාරණයක් තමයි බදු කියන්නේ. පසුගිය වසර තුළ රුපියල් බිලියන 225ක ආදායමක් සුරාබදුවලින් උත්පාදනය කළා. වර්තමාන රජය ඒක බිලියන 240 දක්වා පුරෝකථනය කළා. ඒ පුරෝකථනය ඇතුළේ මැයි මාසයට අදාළ ආදායමින් සියයට 104ක බදු මුදලක් අපට ලබා ගන්න පුළුවන් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ආඥාපනත අනුව මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරන යම්කිසි ආයතනයක් පළමුවැනි දින 15 ඇතුළත නිෂ්පාදනය කරන, බෝතල් කරන මත්ද්‍රව්‍ය ලීටරයකට අදාළ බදු මුදල ඊළඟ දින 15 ඇතුළත ගෙවන්න ඕනෑ කියලා. ඒ වාගේම මාසයේ දෙවැනි දින 15 ඇතුළත නිෂ්පාදනය කරන මත්ද්‍රව්‍යවලට අදාළ බදු මුදල ඊළඟ මාසයේ පළමුවැනි දින 15 ඇතුළත ගෙවන්න ඕනෑ. මත්පැන් සඳහා ගෙවන බදු මුදල මාස 6ක් ඇතුළත ගෙවන්න ඕනෑ කියලා ආඥාපනතේ විධිවිධානවල සඳහන් කර තිබෙනවා. ඒ නිසා තමයි ගොඩක් අය නිසි කලට බදු ගෙවන්නේ නැතිව රටට ආදායම අහිමි කරලා තිබුණේ. ඒ වාගේම මේ පනතේ විශේෂ කාරණයක් තිබෙනවා. ඒ අනුව බදු මුදල් නොගෙවා සිටීම තුළ කළ හැකි වන්නේ, මත්පැන් බලපත්‍රය අහෝසි කිරීම පමණයි. අපි රජයක් විධියට ඒ සඳහා වැට බඳිමින් සිටිනවා. 2024 සිට ඔවුන්ගෙන් විශාල තැන්පත් මුදලක් ලබා ගන්නවා වාගේ කාරණා කිහිපයක් ගැන අපි සලකා බලමින් ඉන්නවා.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, බදු ගෙවීමට මාස 6ක් දක්වා ලබා දී තිබුණු සහන කාලය සුරාබදු ආඥාපනතට ගෙනෙන මේ අලුත් රීති මඟින් මාස 3 දක්වා අඩු කරලා තිබෙන බව. ඒ වාගේම බදු මුදල් නොගෙව්වොත් මාසයකට පස්සේ ඔවුන්ගේ බලපත්‍රය, ඒ කියන්නේ B1 කියන බෝතල් කිරීමේ බලපත්‍රය අහෝසි කරන්න මේ මඟින් විධිවිධාන සලසා තිබෙනවා. ඒ විතරක් නොවෙයි නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මාස 3කට පස්සේ ඒ සියලු නිෂ්පාදන ක්‍රියාවලිය අත්හිටුවන්න පුළුවන්. ඒ අනුව මේ රීති මේ රටේ බදු මුදල් අය කර ගැනීම කාර්යක්ෂම කිරීම සඳහා වූ වැදගත් රීති බව අපි කියන්න ඕනෑ.

ඊළඟ එක තමයි විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ 2025.08.25 දිනැති අංක 2451/10 දරන ගැසට් පත්‍රයේ පළ කළ අර්තාපල් සහ ලූනු සම්බන්ධ වූ නියමය. සාමාන්‍යයෙන් අපේ රටේ වාර්ෂිකව ලූනු මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක් පරිභෝජනය කරනවා. වාර්ෂිකව පරිභෝජනය කරන ප්‍රමාණය බෙදලා ගත්තොත්, මාසයකට මෙට්‍රික්ටොන් 25,000ක විතර ප්‍රමාණයක් තමයි පරිභෝජනය වෙන්නේ. හැබැයි අස්වැන්න නෙළන කාලයේ, අගෝස්තු මාසයේ ඉඳලා නොවැම්බර් මාසය දක්වා කාලයේ ගැසට් මඟින් තමයි ආනයනික අර්තාපල් සහ ලූනුවල මිල පාලනය කරන්නේ. ඒක සාම්ප්‍රදායික විධියට කරපු දෙයක්. හැබැයි, මේ වතාවේ සාම්ප්‍රදායික විධියට කළාට, මෙතුමා කිව්වා වාගේ ඒ කාලයේ ගජ මිතුරන්ට සහන ලැබෙන විධියට මේ ගැසට් ගැන කලින් ඒ අය දැනුවත් කළා. මා ළඟ සංඛ්‍යාලේඛන තිබෙනවා. මේ සංඛ්‍යාලේඛනවල තොරතුරු තිබෙනවා. විපක්ෂ නායකතුමාත් මේ ගැන සඳහන් කළා. එතුමා කිව්වා, මේ නීතිය දමනකොට, මේ බද්ද පනවනකොට ලූනු ආනයනය කරලා ඉවරයි කියලා. සාමාන්‍යයෙන් ලූනු තියා ගන්න පුළුවන් මාස තුනක් නම්, මේ බදු පැනවීමට පෙර මාස තුන ඇතුළත ආනයනය වැඩි වෙලාද කියලා බැලුවොත් එහෙම දෙයක් වෙලා නැහැ. අල ගත්තොත්, මැයි මාසයේ මෙට්‍රික්ටොන් දහසයදාස් ගණනයි, ජූනි මාසයේ දහහතරදාස් ගණනයි, ජූලි මාසයේ දහසයදාස් ගණනයි, අගෝස්තු මාසයේ දහහත්දාහයි ආනයනය කර තිබෙන්නේ. මේ බද්ද පැනෙව්වාට පස්සේ මෙට්‍රික්ටොන් දහතුන්දාස් ගාණට අඩු වෙලා තිබෙනවා.

ඒ වාගේම ලූනු සම්බන්ධයෙන් කලින් මාස තුන ගැන සැලකුවොත්, මැයි මාසයේ මෙට්‍රික්ටොන් විසිහයදාස් ගණනක්, ජූනි මාසයේ මෙට්‍රික්ටොන් තිස්දහස් ගණනක්, ජූලි මාසයේ මෙට්‍රික්ටොන් විසිහත්දහස් ගණනක්, අගෝස්තු මාසයේ මෙට්‍රික්ටොන් විසිනවදහස් ගණනක් ආනයනය කර තිබෙනවා. සැලකිය යුතු කාරණය තමයි සැප්තැම්බර් මාසයේ ඒ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 8,789ක් දක්වා අඩු වෙලා තිබෙන එක. සාමාන්‍යයෙන් ගත්තොත්, අපේ පරිභෝජන ප්‍රමාණය වන මෙට්‍රික්ටොන් 25,000ත්, 30,000ත් ඇතුළත ප්‍රමාණයක් තමයි ආනයනය කරලා තිබෙන්නේ. විපක්ෂය එතුමන්ලාගේ කෙටි පරමාර්ථ සඳහා මේ වෙලාවේ මේ ගැන බොරු වපුරවමින් ඉන්නවා, සමාජගත කරමින් ඉන්නවා. ඒ වාගේම විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්තයා කිව්වා, නිෂ්පාදන පිරිවැය බොරු ඉලක්කමක්, ඒකේ ඇත්ත ඉලක්කම 90ත්, 100ත් අතර කියලා. එහෙම කියන ගමන්, මේක නැවත ගොඩ ගන්න ඕනෑ, කාර්යක්ෂම කරන්න ඕනෑ කියලා රටේ නැති යෝජනා ටිකක් එතුමා ඉදිරිපත් කළා. අපි දන්නවා, පසුගිය ආණ්ඩුවල එතුමාත් ඇමතිවරයකු වශයෙන් සිටි බව. විපක්ෂ නායකතුමනි, ඔය කියන යෝජනා නොවෙයි සරල යෝජනා ටිකක් තිබෙනවා, මේ ගොවීන්ගේ වගාව දෙගුණයකින් කාර්යක්ෂම කරන්න පුළුවන්. ඒ සඳහා එක ගොවියෙකුට ලක්ෂ එකහමාරක විතර මුදලක් තමයි වැය වෙන්නේ. හැබැයි, ඔබතුමන්ලාගේ පාලන කාලය ඇතුළේ ඒ වාගේ සරල දේවල්වලට ගියේ නැහැ. අපි ඒවාට යන්න ලෑස්ති වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අඩුම තරමින් බීජ ලූනු ටිකවත්, බීජ අර්තාපල් ටිකවත් හරි වෙලාවට, නිසි මිලට දෙන්න බැරි වෙච්ච කට්ටිය තමයි අද ඇවිල්ලා අපට කියන්නේ, අපට උපදෙස් දෙන්න එන්නේ ලෝකයේ මෙහෙමයි, අර රට මෙහෙමයි කියලා. එහෙම විපක්ෂයක් තමයි ඉන්නේ. බොහොම හොඳයි. ඔය විපක්ෂය දිගටම එකට එකතු වෙලා - ඒකාබද්ධ වෙලා - ගමන යන්න. අපි දැක්කා, තැන් තැන්වල ඉඳගෙන කථා කරන මන්ත්‍රීවරුන්ගේ අදහස් හරි සමානයි කියලා. ඔබතුමන්ලා ඒකාබද්ධ වෙලා එකට ගමන යන්න. එතකොට අපට ආණ්ඩුව කරගෙන යන්න ලේසියි.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චානක සම්පත් මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.32]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සම්බන්ධයෙන් වූ නියමයක් ද අද දින ඉදිරිපත් කර තිබෙනවා. අල ගොවියා සහ ලූනු ගොවියා පිළිබඳව සද්භාවයෙන් කටයුතු කරනවා කියන හැඟීමට මුවා වෙලා අද මේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ගෙනෙන නියමය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මේ රටේ පාරිභෝගිකයා සහමුලින් අමතක කරලාද මේ බදු වැඩි කිරීම කළේ කියන කාරණය අප පළමුවෙන්ම අහන්න ඕනෑ. අල ගොවියා, ලූනු ගොවියා ආරක්ෂා කරන්න ඕනෑ කියලා අපි දන්නවා. අපට මතකයි, 2007 වර්ෂයේ සිට තමයි අලවලට, ලූනුවලට බදු පනවලා අල ගොවියා සහ ලූනු ගොවියා ආරක්ෂා කරන්න මුලින්ම පටන් ගත්තේ කියලා. අදට අවුරුදු 20කට ආසන්න කාලයක් වෙනවා. නමුත් තවම මේ රටේ අල ගොවියාත්, ලූනු ගොවියාත් සුරක්ෂිත වෙලා නැහැ. ඒ නිසා මේ ක්‍රමවේදයේ යම් ගැටලුවක් තිබෙනවා කියන කාරණය අපි පිළිගන්න ඕනෑ. මේ ආණ්ඩුව බලයට එනකොට කිව්වා, ඔවුන්ට මේ සඳහා විසඳුම් තිබෙනවා කියලා. එදා හිටපු ආණ්ඩු අල, ලූනුවලට බදු පනවනකොට ඔවුන් කිව්වා, බදු පනවන්නේ කොමිස් ගන්න කියලා. එහෙම නැත්නම් ගජ මිතුරන්ව සතුටු කරන්න කියලා. අද ආණ්ඩු කරන, ඇමතිකම් කරන, එදා විපක්ෂයේ හිටපු, එදා වෘත්තීය සමිතිවලට නායකත්වය දීපු මේ ඇමතිවරු එහෙම තමයි එදා කිව්වේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එදා හිටපු ඇමතිවරු බදු පැනෙව්වේ කොමිස් ගන්න නම්, එදා හිටපු ඇමතිවරු බදු පැනෙව්වේ තමන්ගේ ගජ මිතුරන්ට සහාය දෙන්න නම්, අදටත් ඒක ඒ විධියටම කෙරෙනවාද, නැත්නම් අද ඒක වෙනස් වෙලාද අපට අහන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අල නිෂ්පාදනය ගත්තොත්, මේ රට තුළ තවම නිෂ්පාදනය වෙන්නේ සියයට 28ක විතර ප්‍රමාණයක්. ඒ වාගේම ලූනු නිෂ්පාදනය ගත්තොත්, මේ රටට අවශ්‍ය ලූනු ප්‍රමාණයෙන් සියයට 4ක පමණ ප්‍රමාණයක් තමයි මේ රට තුළ නිෂ්පාදනය වෙන්නේ. ඒ නිසා මේ රටට සියයට 72කට ආසන්න ප්‍රමාණයකින් අල ආනයනය කරන්නට අද අපට සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම සියයට 96ක ප්‍රමාණයක් ලූනු ආනයනය කරන්නට සිදු වෙලා තිබෙනවා. අල සඳහා රුපියල් 80ක බදු මුදලකුත්, ලූනු සඳහා රුපියල් 50ක බදු

[ගරු චානක මාදුගොඩ මහතා]

මුදලකුත් පැනවීම වෙනුවෙන් තමයි අද අපි මේ විවාද කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැනදී වැදගත් කාරණයක් තිබෙනවා. අද වෙනකොට වසර 20කට ආසන්න කාලයක් මේ පාර්ලිමේන්තුවේ බදු ගැන කථා කරමින්, බදු පනවනවා කියමින් අපි අල ගොවියා, ලූනු ගොවියා ආරක්ෂා කර ගන්නට කථා කළා. හැබැයි, එක පැත්තකින් අල ගොවියා, ලූනු ගොවියා ආරක්ෂා කර ගන්නකොට, අනෙක් පැත්තෙන් මේ රටේ සිටින පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම පිළිබඳවත් අපි සිතන්නට ඕනෑ. ඒ නිසා අල ගොවියා, ලූනු ගොවියා ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඒවාට බදු පනවනවාට වඩා, ඔවුන්ට යම් සහනාධාරයක්, නිශ්චිතව තමන්ගේ ආදායම වැඩි කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කර දීම තමයි වැදගත් වන්නේ කියලා මා විශ්වාස කරනවා.

මේ ආණ්ඩුව එදා විපක්ෂයේ සිටියදී බදු පනවන එකට විරුද්ධව කථා කළා. ලූනු ගොවියා, අල ගොවියා පාරට බස්සලා ඔවුන්ගේ වෘත්තිය පිළිබඳව, ඔවුන්ගේ නිෂ්පාදන වැඩි කර ගන්න එක පිළිබඳව කථා කළා. ඒ නිසා මීට වඩා හොඳ වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරනවා නම්, ඒක තමයි විය යුත්තේ කියා මා විශ්වාස කරනවා. නැත්නම් ලබන වසරේදීත් අල ගොවියා, ලූනු ගොවියා ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් බදු පැනවීම කරන්න සිද්ධ වෙනවා. නමුත් ඒ තුළින් ලූනු ගොවියාත්, අල ගොවියාත් ආරක්ෂා කරන්න ලැබෙන්නේ නැහැ. මොකද, මේ රටේ ලූනු අවශ්‍යතාවෙන් සියයට 4ක ප්‍රමාණයක් තමයි තවම ලූනු නිෂ්පාදනය වෙන්නේ. සියයට 28ක් පමණයි අල නිෂ්පාදනය වෙන්නේ. අල නිෂ්පාදනය සියයට 50ක් දක්වා වැඩි කරන්න, ඒ වාගේම මේ රට තුළ ලූනු නිෂ්පාදනය සියයට 30ක්, 40ක් දක්වා වැඩි කරන්න අපට පුළුවන් නම්, මේකට නිශ්චිත උත්තරයක් ලබාගත හැකි වන්නේ ඒ තුළින් පමණයි කියා මා විශ්වාස කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ නිසා ඒ පිළිබඳවත් හිතන්න කියන කාරණයත් සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ මොහොතේ රට තුළ පවතින අයහපත් තත්ත්වය තුළ මිනිසුන් විශාල පිරිසක් අපහසුතාවට පත් වෙලා සිටිනවා. විවිධ ප්‍රශ්න නිසාත්, අද දවසේ ඇද හැළෙන මේ වර්ෂාපතනය නිසාත් විශාල වශයෙන් රටේ ජනතාව අසරණභාවයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා, ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා, ග්‍රාම නිලධාරි මහත්ම, මහත්මීන් හරහා රජය යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ තුළ සමහර වෙලාවට ග්‍රාම නිලධාරි මහත්වරුන් ඒ අවතැන් වෙච්ච උදවිය පිළිබඳව ඔවුන්ගේ නිර්ණායක ඔස්සේ සලකා බලනකොට, ඔවුන්ගේ කුස්සිය යට වෙලා නම් පමණයි අද දවසේ ඔවුන්ට යම්කිසි සහනාධාරයක් දෙන්න කටයුතු කරන්නේ. ඒ නිසා ග්‍රාම නිලධාරි මහත්වරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ මොහොතේ තිබෙන තත්ත්වය අවබෝධ කරගෙන තීන්දු තීරණ ගන්න යම් බලයක්, යම් අවස්ථාවක් ලබා දෙන්න කියා මා රජයෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. එහෙම කරන්න පුළුවන් නම් ඒක වටිනවා කියන කාරණයත් සිහිපත් කරමින්, අද දවසේ මට මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.37]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ විශේෂයෙන්ම අපි විවාදයට ලක් කරන්නේ සුරාබදු ආඥාපනත යටතේ වන 962 දරන සුරාබදු නිවේදනයට ගෙනෙන සංශෝධනයක් සහ මේ රටේ ගොවි ජනතාවට සහන සැලසීම සඳහා ගෙනෙන නියමයක් පිළිබඳවයි. මේ වෙලාවේ මම පළමුවෙන්ම කථා කරන්න කැමැතියි, ගොවි ජනතාව සඳහා ගෙනෙන නියමය සම්බන්ධයෙන් වන කාරණාව ගැන. මම නියෝජනය කරන්නේ ගොවි ජනතාව සිටින දිස්ත්‍රික්කයක්. විශේෂයෙන්ම දේශීය අර්තාපල් ගොවීන් වැඩි දිස්ත්‍රික්කයක් වන බදුල්ල දිස්ත්‍රික්කයයි මා නියෝජනය කරන්නේ. විශේෂයෙන්ම අර්තාපල් ගොවීන් සහ බී ලූනු - ලොකු ලූනු - ගොවීන් ඔවුන්ගේ අස්වැන්න විකුණාගන්න ගිහිල්ලා යම් අපහසුතාවකට මුහුණ දුන් බව මෙහිදී අපි පිළිගන්න ඕනෑ. සාධාරණ මිලක් ඔවුන්ට ලැබුණේ නැහැ. මෙවර මුලින්ම අල ගලවනකොට, ලූනු ටික වෙළෙඳ පොළට එනකොට ඔවුන්ට ඒවා දෙන්න ටිකක් අපහසු වුණා. ඒකට බලපෑ හේතු තිබෙනවා. කොහොම නමුත්, රජයක් හැටියට අපි ඒ තත්ත්වය වේගයෙන් වෙනස් කරන්න පසුගිය දවස්වල තීන්දු ගත් බව අපි ගොවි ජනතාවට කියන්න කැමැතියි. මෙතැන විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් කියපු කරුණු නිවැරදි නැහැ. විපක්ෂ නායකතුමාගේ සිටම කියපු සමහර කරුණු සාවද්‍යයි කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. මේ ලොකු ලූනු සහ අර්තාපල් ගොවීන්ගේ අස්වැන්න මුලින් නෙළනකොට, සාමාන්‍යයෙන් අස්වැන්න එක්වරම වෙළෙඳ පොළට එන්නේ නැහැ, ටික ටික එන්නේ. ඒ වෙලාවේ අපි රජයක් හැටියට බද්දක් පිළිබඳ සාකච්ඡා කළා.

අපි දන්නවා, පසුගිය ඉතිහාසයේ මේ විධියට බදු ගහන්න පෙරාතුව ගොවියා ගැන කල්පනා කරලා නොවෙයි සමහරු බදු ගැහුවේ ඇමතිතුමන්ලා ගැන කල්පනා කරලා. ඔවුන්ට හිතවත් ආනයනකරුවන් ගැන සලකා තමයි බදු ගැහුවේ. අපි දන්නවා, සීනි බද්ද ශත 25ක් වුණේ ඒ ක්‍රමයෙන් බව. එතකොට තමයි විශාල වශයෙන් තොග ගෙනැල්ලා දේශීය උක් ගොවීන් අපහසුතාවට පත් වුණේ. ඒ විධියට ඉතිහාසයේ අපේ රටේ වෙච්ච දේවල් අපි දන්නවා. දැන් මේ වාගේ දෙයකට බදු පනවනකොට ගොවියා ආරක්ෂා කරන්නත් ඕනෑ, පාරිභෝගිකයා ආරක්ෂා කරගන්නත් ඕනෑ. ඒ නිසා ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවේ මේ පිළිබඳව සාකච්ඡා කරලා, එතැන ගන්නා තීන්දු කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, කැබිනට් මණ්ඩලයෙන් තීන්දුවක් අරගෙන තමයි මේ බදු පනවනු ලැබුවේ. ලොකු ලූනු සහ අර්තාපල් ගොවීන්ට සහන සැලසීම සඳහා ආනයනික අර්තාපල්වලට සහ ලොකු ලූනුවලට මේ බද්ද පැනෙව්වේ 2025.08.26වැනි දා. දැන් අපි නීති කර්තව්‍යයක් හැටියට ඒ ගැන මේ පාර්ලිමේන්තුවේ විවාද කරලා එකඟතාව ගන්න තමයි අද මේවා ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කොහොම නමුත් අපි විදේශීය අර්තාපල්වලට - ආනයනික අර්තාපල්වලට - ලංකා ඉතිහාසයේ වැඩිම බදු මුදල මේ වෙලාවේ පනවා තිබෙනවා. ඒ කියන්නේ, කිලෝග්‍රෑම් එකකට රුපියල් 80ක බද්දක් පනවා තිබෙනවා. ඒ වාගේම, බී ලූනු සඳහා රුපියල් 50ක බදු මුදලක් අපි පනවා තිබෙනවා. ඇත්තටම ගත්තොත්, අපි මේ බදු පැනෙව්වේ දේශීය ගොවියා ආරක්ෂා කරගන්න ඕනෑ නිසායි. ගොවි ජනතාවත් බුද්ධිමත් ජනතාවක් නිසා මේක තේරුම් ගනියි කියලා

අපි හිතනවා. මේක දවසින් දෙකෙන් විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. විශාල මාෆියා ගණනාවකට මේ රටේ බොහෝ ක්ෂේත්‍ර අද නතුවෙලා තිබෙනවා. ඉතින්, මේවා නිවැරදි කරන්න යම් කාලයක් ගත වනවා.

විදේශීය අර්තාපල් ලංකාවට ගෙනැල්ලා තිබෙන නිසා ඒවා මේ වෙනකොටත් වෙළෙඳ පොළේ සිල්ලරට ගන්න පුළුවන්. විදේශීය අර්තාපල් කිලෝග්‍රෑම් එකක් රුපියල් 180ට, 190ට ගන්න පුළුවන්. නමුත්, අපේ දේශීය ගොවියාට අර්තාපල් කිලෝ එකක් නිෂ්පාදනය කරන්නම රුපියල් 200 ඉක්මවන මුදලක් වැය වෙනවා. මේ විධියට අපේ ගොවියාට නිෂ්පාදනය සඳහා වැඩි මිලක් වැය වෙන්නත්, ඉන්දියාවේ, පාකිස්තානයේ ගොවියාට වැය වන මිල අඩු වෙන්නත් බලපාන හේතුවක් තිබෙනවා. අපේ රටට අවශ්‍ය බීජ නිෂ්පාදනය කරන ගොවිපොළවල් ඉස්සර අපේ රටේ තිබුණා. සීතාඑළියේ, රහංගල ඒවා තිබුණා. ඒවාට වග කියන කට්ටිය තමයි මේ විපක්ෂයේ ඉදිරි පෙළ ඉන්නේ. ඒ බීජ නිෂ්පාදනය බිඳ වැට්ටුවා, විනාශ කළා. ඒ නිසා අද අපට වැඩි හරියක් බීජ අර්තාපල් විදේශ රටවලින් ගෙන්වාගන්න සිදු වෙලා තිබෙනවා. ග්‍රැනෝලා බීජ අර්තාපල් හොන්ඩරයක් -කිලෝ 50ක්- නැත්නම් ගැලීනා, රූනෝමි, ලපර්ලා වාගේ බීජ අර්තාපල් හොන්ඩරයක් ගන්න රුපියල් 35,000ක්, 40,000ක් වැය වෙනවා. එවැනි මිලකට බීජ අර්තාපල් අරගෙන හිටෙව්වාට පස්සේ අපේ රටේ දේශීය අර්තාපල් වැඩි මිලකට නොදුන්නොත් ගොවියාට ඔවුන්ගේ වගා කටයුතු පවත්වාගෙන යන්න බැහැ. පොහොර ටික ගණන් ගියා, බෙහෙත් ටික ගණන් ගියා. ඔවුන් ඒවාට මුහුණ දීලා තිබෙනවා. දැන් අපි රජයක් නිසා අපට මේවා විවේචනය කරන්න බැහැ. අපේ රටේ දේශීය අර්තාපල් ගොවියා වෙන්න පුළුවන්, බී ලූනු ගොවියා වෙන්න පුළුවන්, ඔවුන් ශක්තිමත් කරන්න දැන් අපි මේ සම්බන්ධයෙන් යම් ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ.

මම සන්තෝෂ වනවා, වර්තමාන කෘෂිකර්ම අමාත්‍යාංශය උසස් තාක්ෂණයෙන් යුක්ත පටක රෝපණ බීජ අර්තාපල් නිෂ්පාදනයට මේ වෙනකොට අත ගහපු එක ගැන. මෙවර මුල් බීජ අර්තාපල් ලක්ෂ 15ක් ගොවියා අතර බෙදා දෙනවා. සාමාන්‍යයෙන් එක බීජ අර්තාපල් අලයක් රුපියල් 8ක් විතර වනවා. ඒකෙන් සියයට 50ක් රජය දරාගෙන රුපියල් 4ට ගොවියාට ලබා දෙනවා. මේ විධියට බීජ අර්තාපල් ලක්ෂ 15ක් ලබා දුන්නාම ඒක මුල් පරම්පරාවේ බීජයක් බවට පත් වෙලා තව වාර 4ක් - පරම්පරා 4ක් - බීජ කරන්න පුළුවන්කම ලැබෙනවා. මේ සැරේ ලබා දුන් බීජ අර්තාපල් ලක්ෂ 15ක ප්‍රමාණය ක්‍රමානුකූලව වැඩි කරලා තව අවුරුදු 3ක් වාගේ යනකොට ඒක ලක්ෂ 60 දක්වා වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් වෙළෙඳ පොළෙන් විදේශීය බීජ අර්තාපල් හොණ්ඩරයක් රුපියල් 40,000ට ගන්නකොට අපි මේ හදන ක්‍රමය යටතේ බීජ අර්තාපල් හොණ්ඩරයක් හදන්න ගොවියාට නිෂ්පාදන වියදම විධියට වැය වෙන්නේ රුපියල් 10,000යි. මේ සඳහා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළ අපි අනුගමනය කරනවා.

අපි දන්නවා, ඉතිහාසයේ කළේ බදු ගහලා විතරක් අත පිහදාගන්න එක කියලා. ඒ විතරක් නොවෙයි. ජාතික ජන බලවේග රජය මේ සම්බන්ධව කැබිනට් තීන්දුවකුත් ගත්තා. ආහාර සුරක්ෂිතතා කමිටුවේදීත් කථා කරලා ඒකට අනුව අපි තීන්දු කළා, බදු ගහලා විතරක් ගොවියා ආරක්ෂා කරන්න බැරි නිසා රාජ්‍ය අංශය මැදිහත් වෙලා ගොවියාගේ අර්තාපල් සහ බී ලූනු මිලදී ගන්න. යාපනයෙන් රතු ලූනු මිලදී ගන්නත් අපි තීන්දු කළා. පසුගිය දවස් 5ක් තුළ ගොවියාගෙන් අර්තාපල් මිලදී ගත් සංඛ්‍යාලේඛන මා ළඟ තිබෙනවා. වෙළෙඳ අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා අපි තීන්දුවකට ආවේ ගොවියාට සහනයක් වෙන්න අර්තාපල් ටික සතොසට අරන් අළෙවි කරලා දෙන්නයි. ඒ වාගේම පෞද්ගලික අංශයේ කීල්ස් සහ කාගිල්ස් ආයතන විසිනුත් අර්තාපල් මිලදී ගන්න රජයත් එක්ක එකඟතාවකට ආවා. ඔවුන් එකඟ වුණා, අතරමැදියන්ගෙන් තොරව ගොවියාගෙන් අර්තාපල් කිලෝව රුපියල් 210ට ගන්න. ඒ වාගේම බී ලූනු කිලෝව රුපියල් 130ට ගන්නත් තීන්දු කළා. අර්තාපල් කිලෝව රුපියල් 210ට ගන්න අපි තීන්දු කරනකොට කැප්පෙටිපොල, නුවරඑළිය වැනි ප්‍රදේශවල සිටින සාමාන්‍ය අතරමැදියා වෙළෙඳ පොළෙන් අර්තාපල් මිලදී ගත්තේ රුපියල් 160ක, රුපියල් 140ක වාගේ මිලකට. අපි ඒක රුපියල් 210ට වැඩි කළා. දඹුල්ලේ අතරමැදි වෙළෙන්දෝ බී ලූනු කිලෝව රුපියල් 90ට ගන්නකොට, අපි ඒක රුපියල් 130ට වැඩි කළා. ඒ අනුව අපි මිල වැඩි කරලා දුන්නා. අද වෙනකොට සතොස තීන්දු කරලා තිබෙනවා, බී ලූනු රුපියල් 140ට ගන්න. ඉතින් දැන් ගන්නවා. පසුගිය දින 5ක කාලය තුළ ඒ විධියට සතොස විතරක් මිලදී ගත් අර්තාපල් ප්‍රමාණය කිලෝ 61,305ක්. අපි දන්නේ නැහැ, කීල්ස් එක ගත් අර්තාපල් ප්‍රමාණය සහ කාගිල්ස් එක ගත් අර්තාපල් ප්‍රමාණය. ඔවුන් අර්තාපල් කිලෝව රුපියල් 210ට ගන්නවා. ඒ හින්දා මම අපේ ගොවි ජනතාවට කියනවා, වැලිමඩ, බෝගහකුඹුරට එන්න, කැප්පෙටිපොලට යන්න, නුවරඑළියට යන්න, ඔබේ අර්තාපල් කිලෝව රුපියල් 210 ගණනේ ගන්න ඔක්කෝම කටයුතු අපි සූදානම් කර තිබෙනවා කියලා. ඒ වාගේම බී ලූනු ගොවීන්ට - ලොකු ලූනු ගොවීන්ට - අපි කියනවා, තඹුත්තේගමට යන්න, දඹුල්ලට යන්න, ඒවායේ centres දාලා තිබෙන්නේ, ඔබේ බී ලූනු රුපියල් 140ට ගන්න සැලසුම් කරලා තිබෙනවා කියලා. ඒ වාගේම යාපනයට යන්න, අපි රුපියල් 225ට රතු ලූනු කිලෝව මිලදී ගන්න සැලසුම් කරලා තිබෙනවා. අපි බදු ගහලා විතරක් නැවතුණේ නැහැ. ක්‍රමවේදත් සැකසුවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඔබතුමියට පැහැදිලි කළා වාගේ ඒ ක්‍රමවේදයෙන් එහාට ගිහිල්ලා ඉදිරි දැක්මත් සහිතව දැන් බීජ අර්තාපල් ගොවියා ලවා නිෂ්පාදනය කරන ක්‍රම හදලා තිබෙනවා. මම ළඟදි ගියා, අපේ බොරලන්ද සත්ව ගොවිපළට. අපි කොරියානු ආණ්ඩුවත් එක්ක එකතු වෙලා නවීන තාක්ෂණය යොදාගෙන ගොවියාට බීජ අර්තාපල් නිෂ්පාදනයට ඉඩකඩ සකස් කරලා දී තිබෙනවා. මේවා එකපාරට කරන්න බැහැ. මම මුලින් කිව්වා වාගේ රහන්ගල, සීතාඑළිය ගොවිපළවල් විනාශ කරලා, මේ රටේ කෘෂි කර්මාන්තය විනාශ කරලා දාපු ඉතිහාසයක් තමයි අපට තිබුණේ. දැන් අපි ඒවා ක්‍රමානුකූලව ගොඩනඟනවා. ඒක ගොවි ජනතාව තේරුම් ගනීවි කියලා මම හිතනවා.

කෘෂි කර්මාන්තය මේ විධියට බිඳ වැටුණේ ඇයි? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙට්‍රික්ටොන්වලින් ගත්තොත්, වසරකට මේ රටේ දේශීය පරිභෝජනයට බී ලූනු මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක් අවශ්‍යයි. නමුත් 2024 වසරේ මේ රටේ ගොවියා නිෂ්පාදනය කළේ බී ලූනු මෙට්‍රික්ටොන් 8,828යි කියලා වාර්තා කරනවා, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය. හැබැයි අපට වසරකට බී ලූනු මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක් ඕනෑ. එතකොට ඉතුරු ටික ආනයනය කරන්න සිද්ධ වනවා. ඒකට පාර කැපුවේ කවුද? ඇයි, මිනිස්සු ඒ විධියට එළවලු නිෂ්පාදනයෙන් ඈත් වෙන්නේ? ඇයි, බී ලූනු නිෂ්පාදනයෙන්, අර්තාපල් නිෂ්පාදනයෙන් ඈත් වෙන්නේ? ඒකට නොයෙක් හේතු බලපෑවා. මේ රටේ බීජ නිෂ්පාදනය කඩා වැට්ටුවා, මේ රටේ පොහොර නිෂ්පාදනය කඩා වැට්ටුවා, මේ රටේ පොහොර නැති කළා, අර්බුදයක් ඇති කරලා රසායනික පොහොර නැති කරලාම දැම්මා. කෘෂි කර්මාන්තයේ ඒ වැටුණු වැටිල්ල තවම නඟාසිටුවන්න බැරි වුණා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අන්න එවැනි තත්ත්වයක් මේ රටේ තිබුණා කියන එක තමුන්නාන්සේලාට මතක් කරන්න මම කැමැතියි. කොහොම නමුත්, මේ රටේ ගොවි ජනතාවගෙන් ආ ජනාධිපතිවරයෙක් හැටියට අනුර කුමාර දිසානායක සහෝදරයා

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

හිටපු කෘෂිකර්ම ඇමතිවරයෙක්. එතුමාත් ලාල් කාන්ත ඇමතිතුමන්ලා ඇතුළු මේ රජයත් උත්සාහ ගන්නවා, රටේ ගොවියාගේ අනාගතය සුරක්ෂිත කරන්න.

මම මුලින් කථාව ආරම්භ කළේ ගොවීන්ට සිද්ධ වූ යම් ප්‍රශ්නයක් සම්බන්ධවයි. අපේ ලොකු ලූනු ගොවියාට, අර්තාපල් ගොවියාට මුලින්ම හොඳ මිලක් ලබා දෙන්න බැරි වුණා. මොකද, රටේ මූල්‍ය තත්ත්වය දුෂ්කර තත්ත්වයක තිබුණේ. පැවති මාෆියාවෙන් ක්‍රමානුකූලව නීත්‍යනුකූලව රට නිදහස් කර ගන්න යම් කාලයක් ගත වුණා. ඒ වාගේම මේ සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා කියන එකත් අපි මේ මොහොතේ මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඔබතුමියට කිව්වා, මේ රටේ ජනතාවගේ - පාරිභෝගිකයාගේ - පැත්ත මේ රජයට බලන්න වෙනවා කියලා. මම දැක්කා, මාතෘකාවෙන් පිට පැනලා සමහර අය කථා කළ ආකාරය. වෙළෙඳ ඇමතිතුමාත් තවත් සුළු මොහොතකින් මෙතැනට එනවා. මේ සමහර අය මතු කරපු ප්‍රශ්නවලට රජය වෙනුවෙන් මම උත්තර දෙන්න ඕනෑ. ජාවාරම්කාරයොත් එක්ක එකතු වෙලා ආණ්ඩු කරපු කණ්ඩායම් රට නොමඟ යවන්න හදනවා. මේ රටේ නීතියකට රීතියකට යටත්ව, සාධාරණව, යුක්තිගරුකව කටයුතු කරනකොට, පිළිවෙළකට කටයුතු කරනකොට, සැලසුම් සහගතව කටයුතු කරනකොට ඔවුන්ට රිදෙන එක ගැන අපට කරන්න දෙයක් නැහැ. අපි රටේ ජනතාවට කියන්න කැමැතියි, අපි මේ කාර්යය ක්‍රමානුකූලව කරන්න සූදානම් බව. නවීන තාක්ෂණය අද මේ රටට කැඳවන්න ඕනෑ. මේ රටේ ගොවියාට ඒ තාක්ෂණය දෙන්න ඕනෑ. ඔවුන්ගේ අස්වැන්න වැඩි කර ගන්න අවශ්‍ය ක්‍රමවේද සකස් කරන්න ඕනෑ. ඔවුන්ට සාධාරණ වෙළෙඳ පොළක් සකස් කරන්න ඕනෑ. ඒ, අපේ ප්‍රතිපත්තිය, අපි මේ රටේ ජනතාවට වෙච්ච පොරොන්දුව. ඒවා ඉෂ්ට කරන්න දැන් අපි සූදානම් කියන කාරණය මම මේ මොහොතේ මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඔබතුමියට කිව්වා, මේ රටේ වාර්ෂික බී ලූනු අවශ්‍යතාව මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක් බව. නමුත්, ගිය අවුරුද්දේ දේශීය නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 8,828යි. අපේ අර්තාපල් ගොවියා සම්බන්ධයෙනුත් මම කථා කරන්න ඕනෑ. අපේ රටේ පසුගිය හොඳම කාලයේ අර්තාපල් වගා කරනකොට අපි හෙක්ටෙයාර 5,000ක විතර අර්තාපල් වගා කළා. නමුත්, හෙක්ටෙයාර 5,000ක් වගා කරපු ප්‍රමාණය මේ අවුරුද්දේ හෙක්ටෙයාර 2,500කට වාගේ පහත වැටිලා තිබෙනවා. බීජ අර්තාපල්වල මිල ඉහළ යනකොට, පොහොර ප්‍රශ්න එනකොට මේ විධියට ඒ වගාව බිඳ වැටෙනවා. ඒ නිසා අපි කල්පනා කරනවා, අපේ ගොවියා ශක්තිමත් කරන්න නම් ඔවුන්ගේ උපරිම වගා බිම් ප්‍රමාණය වගා කරන්න ඕනෑ, ඉහළම ඵලදාවක් ලබන්න පුළුවන් බීජ ටික දෙන්න ඕනෑ, පොහොර ටික හොඳින් සම්පාදනය කරන්න ඕනෑ, වෙළෙඳ පොළ හදන්න ඕනෑ කියලා. ඒවාට ක්‍රමානුකූලව අපි දැන් ක්‍රම සම්පාදනය කරමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ අපි විවාදයට ලක් කරනවා, සුරාබදු ආඥාපනත යටතේ වූ රීති. ඒ සම්බන්ධවත් මම කථා කරන්න කැමැතියි. මෙතැනදී අලුත් බදු පැනවීමක් කරන්නේ නැහැ. රජයට බදු හරියට අය කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඔය ඉස්කාගාරවල නිෂ්පාදනය කරන මත්පැන් ජනතාව පානය කරලා තිබෙන්නේ. එහෙම නම්, ජනතාව ඒවාට මුදල් ගෙවලා තිබෙන්නේ. ඒ ගෙවපු මුදල් ව්‍යාපාරිකයන් විසින් රජයට බදු වශයෙන් ගෙවන්නේ නැත්නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. රජයක් විසින් ඒවා අය කර ගත යුතුව තිබෙනවා. අපි දන්නවා, ඔය සමහර ඉස්කාගාර දේශපාලනඥයන්ගේ කියලා. අද විරුද්ධ පක්ෂවල සිටිමින් කෑ ගහන අයටත් ඉස්කාගාර තිබෙනවා. ඒවා ඒ කාලයේත් බදු නොගෙවපු ඒවා, බදු පැහැර හැරපු ඒවා. ඒ එකින් එක කියන්න අපි සූදානම් නැහැ. හැබැයි, මින් ඉස්සරහට ඔවුන්ට ඒ විධියට බදු පැහැර හරින්න ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. සාධාරණ විධියට ඒ බදු අය කර ගන්න ඕනෑ. මෙහිදී අපට කිසිම කර්මාන්තකරුවෙක්, ව්‍යාපාරිකයෙක් අපහසුතාවට පත් කරන්න බැහැ. නීත්‍යනුකූලව එම බදු අය කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. සමහරු නීත්‍යනුකූල ලෙස බදු ගෙවලා කටයුතු කරනකොට, සමහර මහා පරිමාණ ඉස්කාගාර හිමියෝ බදු ගෙවන්නේ නැත්නම් ඒවා අය කර ගන්න නීතියේ තිබෙන දුර්වල තැන් වහලා ශක්තිමත් නීති හදන එක අපේ රජයේ වගකීමක් බව මම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 9වන මාසයේ 30වෙනි දා වෙනකොට අරක්කු නිෂ්පාදනවලට අදාළව බදු පැහැර හැරපු ප්‍රමාණය - ගෙවපු නැති බදු ප්‍රමාණය - රුපියල් මිලියන 10,555ක්. මේක පොඩි ගණනක් නොවෙයි. මා නියෝජනය කරන වැවිලි අමාත්‍යාංශයට 2025ටම ප්‍රාග්ධන වියදමට ලැබුණු මුදල හා සමානයි, මේ සමාගම් 9වන මාසයේ 30වෙනි දා වෙනකොට පැහැර හැරපු බදු ප්‍රමාණය. මේ රටේ ජනතාවගේ සංවර්ධනයටයි මේ බදු මුදල් යොදවන්නේ. මෙහිදී ප්‍රධාන වශයෙන් බදු පැහැර හැරපු සමාගමක් තිබෙනවා. ඒ ප්‍රමාණය රුපියල් මිලියන 6,775ක්. එය ලංකාවේ තිබෙන ලොකුම සමාගමක්. ඊළඟට තවත් සමාගමක් බදු පැහැර හැරලා තිබෙනවා, රුපියල් මිලියන 1,205ක. මෙලෙස මේ බදු ගෙවීම් පැහැර හරින්නේ නීතියේ තිබෙන සමහර තැන් පාවිච්චි කරලායි. ඒ නිසා, මේ සංශෝධනය ගෙනෙන්නේ මාස හයක් කල් මරමින් පැහැර හැරපු බදු එක මාසයක් තුළ අය කරගන්න පුළුවන් ක්‍රමවේදයක් හදන්න, එය කාර්යක්ෂම කරන්න වාගේම අනෙක් ආයතනවලටත් සාධාරණය ගේන්න. ඒ නිසා මේක ජනතාවාදී සංශෝධනයක් හැටියට අපි සලකනවා. මෙය, මේ රටේ ගොවියා ආරක්ෂා කරගන්න පනවපු බද්දක්. මේ රටේ බත් කන, ව්‍යංජනයක් භුක්ති විඳින සමස්ත ජනතාවම තීන්දු කරයි කියලා අපි හිතනවා, අප කවුරුත් එක්කහු වෙලා මේ රටේ ගොවියා ආරක්ෂා කරන්න ඕනෑය කියන එක. ඔවුන්ට තව තවත් සහන ලබා දෙන්න ඕනෑ. ඔවුන්ට හොඳ වටිනාකමක් ලබා දෙන්න ඕනෑ. රජයක් හැටියට අපි ඉදිරියේදී ඒ කාර්යය මීට වඩා මැනවින් කරන්න සූදානම් කියන පණිවුඩය මා ලබා දෙනවා. මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සරත් කුමාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සරත් කුමාර මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சரத் குமார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SARATH KUMARA took the Chair.*

[பி.ப. 1.53]

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்திலே கலந்துகொள்வதில் நான் மகிழ்ச்சி யடைகின்றேன். பெரிய வெங்காயம், உருளைக்கிழங்கு என்பவற்றின் வரிவிதிப்புச் சம்பந்தமாக இங்கு பேசப்படு கின்றது. எங்களுடைய மாவட்டத்தில் ஒரு காலத்தில் பெரிய வெங்காயம் உற்பத்தி செய்யப்பட்டது. பின்னர் அதற்கான விதைகளுக்குத் தட்டுப்பாடு ஏற்பட்டு உற்பத்தி குறை வடைந்ததனால், பாதிக்கப்பட்ட விவசாயிகள் அவ்வுற்பத்தியில் நாட்டம் கொள்ளாமை காரணமாக அந்த நிகழ்ச்சித்திட்டம் நடைபெறாமல் இருக்கின்றது.

அதைவிடுத்து, நான் இங்கு இன்னுமொரு முக்கியமான விடயம் சம்பந்தமாகப் பேசலாமென்று நினைக்கின்றேன். அண்மையில் பல பிரச்சினைகளுக்கு மத்தியில் நடந்து முடிந்த உள்ளூராட்சி மன்றத் தேர்தலின் பின்பு ஆளுங்கட்சியும் எதிர்க்கட்சியும் போட்டிபோட்டுப் பல பிரச்சினைகளுக்கு மத்தியில் சபைகளை அமைத்தார்கள். விரும்பியோ, விரும்பாமலோ அந்தக் கட்சிகள் இணைந்து சபைகளை நடாத்துவதில் பல சிக்கல்கள் இருக்கின்றன. ஆனால், எல்லாச் சபைகளிலும் மக்கள் தாம் விரும்பிய கட்சிகளை ஆதரித்துப் பிரதிநிதிகளைத் தெரிவு செய்தார்கள். தமது பிரதேசத்தில், தமது வட்டாரத்தில் காணப்படுகின்ற தேவைகளை நிறைவேற்றுவதற்கும் பேசுவதற்கும் அரசிடம் முறையிடு வதற்குமாகவே இவ்வளவு பணம் செலவழித்து நடத்தப்பட்ட இந்தத் தேர்தலில் உறுப்பினர்கள் தெரிவுசெய்யப்பட்டு அனுப்பி வைக்கப்பட்டார்கள். ஆனால், அந்த உறுப்பினர் களில் யாருமே மாவட்ட அபிவிருத்திச் சபைக் கூட்டங்களிலோ அல்லது பிரதேச ஒருங்கிணைப்புக்குழு கூட்டங்களிலோ பங்குபற்ற முடியாததொரு துர்ப்பாக்கிய நிலை ஏற்பட்டுள்ளது. உள்நாட்டலுவல்கள் அமைச்சு 3/2025 இலக்கச் சுற்றுநிருபத்தின்மூலம் "தவிசாளரும் உப தவிசாளரும் இரண்டு உறுப்பினர்களும் மாத்திரம் அந்தக் கூட்டங்களில் கலந்து கொள்ளலாம்" என்ற அறிவிப்பை வெளியிட்ட காரணத்தினால் அந்தந்தப் பிரதேசத்திலிருந்து தெரிவுசெய்யப்பட்ட பிரதிநிதிகள் எவருமே அவற்றில் கலந்துகொள்ள முடியாத நிலை இருக்கின்றது. ஆட்சியிலிருக்கின்ற கட்சியின் தவிசாளரும் உப தவிசாளரும் மாத்திரம் சபைக் கூட்டங்களில் இருப்பார்கள்; எதிர்க்கட்சியில் இருக்கின்றவர்களுக்கு எந்தச் சந்தர்ப்பமும் இல்லாத துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக் கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அவர்கள் தமது மக்களின் பிரச்சினைகளை யாரிடம் முறையிடுவது அல்லது எப்பொழுது முறையிடுவது? என்ற பல பிரச்சினைகள் இருக்கின்றது. ஆகவே, உள்ளூராட்சி மன்றங்களின் மக்கள் பிரதிநிதிகளை அந்தப் பிரதேசத்தில் உள்ள அபிவிருத்திக் குழுத் தலைவர்கள் மாதத்தில் ஒருமுறை யாவது அல்லது இரண்டு மாதத்திற்கு ஒருமுறையாவது சந்தித்து மக்களுடைய பிரச்சினைகளை, தேவைகளை அறியக்கூடிய ஒரு சந்தர்ப்பத்தை ஏற்படுத்தும் வகையில் இந்தச் சுற்றுநிருபத்தில் சில மாற்றங்களைக் கொண்டுவர வேண்டுமென்று வேண்டிக் கொள்கின்றேன். அது மாத்திரமல்லாமல், இந்தப் பிரதேச மக்களின் குறைகளை, தேவைகளை பிரதேச மட்டத்திலோ அல்லது மாவட்ட மட்டத்திலோ முன்வைத்து, மத்திய அரசுக்குச் சமர்ப்பிப் பதற்கும் சந்தர்ப்பம் வழங்கப்பட வேண்டும்.

அதுபோல், உள்ளூராட்சிச் சபைகளில் இடப் பிரச்சினை என்பது எல்லா மாவட்டங்களிலும் இருக்கின்றது. இந்தச் சபையில் ஆளுங்கட்சியில் 159 உறுப்பினர்கள் இருக்கின் றார்கள். அவர்களில் சிலர் சபையில் ஆளுங்கட்சியின் தரப்பில் அமர்வதற்கு இடமில்லாத காரணத்தினால் எதிர்க்கட்சித் தரப்பின் ஆசனங்களில் அமர்ந்திருக்கக்கூடிய வாய்ப்பையும் சந்தர்ப்பத்தையும் ஏற்படுத்திக் கொடுத்திருக்கின்றீர்கள். இதேபோன்ற நிலைமையை அந்தப் பிரதேசங்களிலும் ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்று அன்பாக வேண்டிக் கொள்கின்றேன்.

அடுத்து, வவுனியா மாவட்டத்தில் க.பொ.த. உயர்தரத்தில் 3 "A" சித்தி பெற்ற மாணவர்களையும் க.பொ.த சாதாரண தரத்தில் 9 "A" சித்தி பெற்ற மாணவர்களையும் இணைத்து 167 மாணவர்களுக்கான ஒரு பாராட்டு விழாவைக் கடந்த 18ஆம் திகதி நடாத்த நாங்கள் ஒழுங்கு செய்திருந்தோம். அந்த விழாவை நடாத்துவதற்குரிய மண்டபத்துக்காக அனுமதி கோரி ஒரு பாடசாலைக்கு விண்ணப்பித்திருந்தோம்; அதற்கு அனுமதி மறுக்கப்பட்டிருக்கின்றது. அதனை அந்த மாணவர்களையும் அந்த நிகழ்வினையும் அவமானப்படுத்தும் ஒரு நிகழ்வாகவே நாங்கள் பார்க்கின்றோம். அந்த 167 மாணவர்களையும் உற்சாகப்படுத்துவதற்கும் அவர்களைப் பாராட்டுவதற்கும் நாங்கள் ஒரு பாடசாலை மண்டபத்தினைக் கோரியபொழுது அது நிராகரிக்கப்பட்டது. அவ்வாறு ஒரு சுற்றுநிருபம் இருக்கின்றதா? என நாங்கள் அறிய விரும்புகின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)
ஆம், நான் முடிக்கிறேன்.

அத்தோடு, அது ஒரு பாடசாலை நாளுமல்ல! விடுமுறை நாளான சனிக்கிழமை என்பதால் அந்தப் பாடசாலையின் மண்டபத்தைத் தந்திருக்கலாம். ஆனால், தராமல்

[ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා]

நிராகரித்துவிட்டதனால் நாங்கள் வேறு இடத்தில் அந்த நிகழ்வினை நடத்தவேண்டிய துர்ப்பாக்கிய நிலை ஏற்பட்டது. அவ்வாறு கொடுக்க முடியாதெனச் சுற்றுநிருபம் இருக்கின்றதா என கௌரவ பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரிடம் கேட்டு, விடைபெறுகிறேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.58]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**

(மாண்புமிகு பஸ்மின் ஷரீப்)

(The Hon. Fasmin Sharif)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2007ஆம் ஆண்டின் 48ஆம் இலக்க, விசேட வியாபாரப் பண்ட அறிவீட்டுச் சட்டத்தின் கீழான கட்டளை சம்பந்தமான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்காக மிக்க நன்றி! வியாபாரப் பண்ட அறிவீட்டுச் சட்டமானது நுகர்வோருக்கு மாத்திரமல்ல, உள்ளூர் உற்பத்தியாளர்களுக்கும் மிகுந்த பயனளிக்கக்கூடியது. கடந்த அரசாங்கக் காலத்தில் முறையற்ற விதத்தில் உணவுப் பண்டங்கள் இறக்குமதி செய்யப் பட்டமையால், சீனி இறக்குமதி போன்றவற்றில் பல்வேறு மோசடிகள் இடம்பெற்றதை நாங்கள் எல்லோரும் நன்கறிவோம். இந்தச் சட்டத்தை நடைமுறைப்படுத்துவதன் மூலம் இனிமேல் இவ்வாறான மோசடிகள் இடம்பெற மாட்டாது. விசேடமாக, வெங்காயம், பருப்பு, சீனி உள்ளிட்ட பொருட்களுக்கு ஒழுங்கமைக்கப்பட்ட வகையில் வரிவிதிப்பு முன்னெடுக்கப்படவுள்ளதன்மூலம் நுகர்வோர் நியாயமான விலையில் பொருட்களைப் பெற்றுக்கொள்வதற்கான சந்தர்ப்பம் கிடைக்கப்பெறும் என்பதில் எவ்வித சந்தேகமும் இல்லை. இறக்குமதியாளர் நுகர்வோர்மீது சுமையைத் திணித்து தங்கள் வாழ்க்கையை உயர்த்திக்கொண்டு வாழ்வதற்கு இடமளிக்கப்பட மாட்டாது. இனிவரும் காலங்களில் அன்றாட வாழ்வின் தேவைகளுக்காக இறக்குமதி செய்யப்பட்ட உணவுப் பண்டங்களை மக்கள் நேர்மையான முறையில் நியாயமான விலையில் சந்தைகளிலே இலகுவாகப் பெற்றுக்கொள்வார்கள்.

விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டத்தின்படி, அமைச்சர் விரைவான முடிவை எடுக்கக்கூடிய திறனைக் கொண்டிருப்பதால், உலக சந்தையிலிருந்து தேவையான உணவுப் பொருட்களை உடனடியாக இறக்குமதி செய்துகொள்ள முடியும். அதேவேளையில், அரசாங்கத்திற்குத் தேவையான சந்தர்ப்பத்தில், இறக்குமதி வரிகளில் மாற்றத்தைக் கொண்டுவர முடியும். விசேடமாக, குறித்த உணவுப் பொருட்களின் விபரம் வர்த்தமானியில் அறிமுகப்படுத்தப்படும். இதன்மூலம் உள்ளூர் விவசாய உற்பத்தியாளர்கள் பாதுகாக்கப்படுவதோடு, அவர்களுடைய உற்பத்திகளுக்கும் முக்கியத்துவம் அளிக்கப்படும். கடந்த காலங்களில் அதிகளவு உணவுப் பொருட்கள் இறக்குமதி செய்யப்பட்டதனால் உள்நாட்டு உற்பத்தியாளர்கள் பெரியளவில் பாதிக்கப்பட்டதை நாம் எல்லோரும் அறிவோம். எனவே, அரசாங்கம் உணவுப் பொருட்களின் இறக்குமதியைக் கட்டுப்படுத்துவதன்மூலம் உள்நாட்டு உற்பத்தியாளர்களின் பொருட்களுக்குச் சந்தை வாய்ப்பு, பாதுகாப்பு என்பன அதிகரிக்கப்படும்.

அதேவேளையில், கடந்த காலங்களில் இறக்குமதியாளர்கள் பலதரப்பட்ட பிரச்சினைகளை எதிர்நோக்கி வந்தார்கள். இந்தச் சட்டத்தின்மூலம் இறக்குமதியாளர்கள் இலகுவான முறையில் பொருட்களை இறக்குமதி செய்வதற்கான வாய்ப்பு ஏற்படுத்திக் கொடுக்கப்பட்டுள்ளது. இறக்குமதித் துறையில் ஒரு கட்டுப்பாடு - ஓர் ஒழுங்குவிதி - பேணப்படும். இதன்மூலம் நுகர்வோர் பாரிய நன்மைகளை அடைவார்கள். ஒருங்கிணைந்த வரிவிதிப்பின்படி இவை முன்னெடுக்கப்படும். குறித்த பொருட்களுக்கு ஏற்ப வரியினைச் செலுத்திவிட்டு, மிக இலகுவாக இறக்குமதிப் பொருட்களை இதன்மூலம் பெற்றுக்கொள்ள முடியும். இதில் பெரியளவில் நிருவாகச் சிக்கல் இருக்கப் போவதில்லை. சூழ்நிலைக்கு ஏற்ப, உள்நாட்டு உற்பத்திப் பொருட்களைக் கருத்திற்கொண்டுதான் இறக்குமதிக்கான அனுமதிகள் வழங்கப்படும். எனவே, மக்களது உண்மையான தேவையை அறிந்து, நுகர்வோருக்குத் தேவையான உணவுப் பண்டங்களை இறக்குமதி செய்யும் விடயத்தைப் பரிசீலனை செய்து மக்களின் அன்றாட உணவுத் தேவையை நிறைவுசெய்வதற்கும், மக்களின் உணவுத் தேவையை வளப்படுத்தி உறுதிசெய்வதற்கும் ஒருங்கிணைந்த சட்டமாக இந்த விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம் எதிர்வரும் காலங்களில் பயன்படுத்தப்படும்.

அடுத்து, இன்றைய விடயத்துடன் தொடர்பு இல்லாவிட்டாலும், எமது மக்களுடைய சில சமூகப் பிரச்சினைகள் சம்பந்தமாக இங்கு கூற வேண்டும். அதாவது, இன்றைக்குச் சில சமூக ஊடகங்களில் முஸ்லிம்களுடைய 'ஜனாசா'க்கள் சம்பந்தமாகப் பொய்யான தகவல்களைச் சிலர் பரப்பிக் கொண்டிருக்கிறார்கள். அநேகமாக முஸ்லிம்கள் இறந்த ஒருவரின் மையத்தை ஒரு நாளைக்குள் - 24 மணித்தியாலத்திற்குள் - அடக்கம் செய்வதற்கு முயற்சி செய்கிறார்கள் என்பது உங்களுக்குத் தெரியும். 'கொரோனா' வினால் உயிரிழந்த முஸ்லிம்களுடைய மையத்துகள் எரிக்கப்பட்ட பிரச்சினை சம்பந்தமாக Minister of Justice and National Integration Hon. Harshana Nanayakkara அவர்களுடன் நேற்றும் இன்றும் நீண்ட நேரம் நான் உரையாடினேன். அப்பொழுது அது சம்பந்தமாகக் கௌரவ அமைச்சர் அவர்கள் ஒரு தெளிவான விளக்கத்தை வழங்கினார். அதாவது, "முஸ்லிம்களுடைய மையத்துகளை அடக்கம் செய்வது சம்பந்தமாக எந்தக் கால நீடிப்பும் செய்யப்பட மாட்டாது. ஓர் ஊரிலோ அல்லது ஒரு கிராமத்திலோ 5 பேருக்கும் அதிகமானவர்கள் - அதாவது, 15 - 20 பேர் - ஒரே இடத்தில் மரணித்தால், அந்த 'மையத்து'களை நீதிபதியின் பரிந்துரையின்மூலம் அடக்கம் செய்ய நடவடிக்கை எடுக்க வேண்டும். ஏனென்றால், இது விசேட අවස්ථාව ஒன்றாக இருக்கிறது" என்பதாகும். அதேபோல, நோய்வாய்ப்பட்டு ஒருவர் இறந்தாலும் அந்த 'மையத்தை' உடனடியாகக் coroner மூலம் விடுவிப்பதற்கு நாம் நடவடிக்கை எடுப்போம். இலங்கையில் இருக்கக்கூடிய பெரும்பாலான coroners இது சம்பந்தமான நியாயமான அறிவைப் பெற்றுள்ளார்கள். ஒருசில coroners தங்களுடைய ஆதாயத்தைக் கருத்திற்கொண்டு இந்த விடயத்தில் பொய்யான தகவல்களை மக்களிடம் பரப்பிக் கொண்டிருக்கின்றார்கள். இவ்வாறான நடவடிக்கைகளை ஆளும் கட்சியைச் சேர்ந்த முஸ்லிம் பிரதிநிதிகளுடனும் எதிர்க்கட்சியைச் சேர்ந்த முஸ்லிம் பிரதிநிதிகளுடனும் அரசாங்கம் கலந்தாலோசித் துத்தான் எடுக்கும் என்பதை இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

அதேபோன்று, இந்த வாரம் இன்னுமொரு முக்கிய பிரச்சினையாக இருக்கின்ற முஸ்லிம்களுடைய புனித நூலான 'அல்-குர்ஆன்' பற்றி பேசிக்கொண்டு இருந்தார்கள். இது சம்பந்தமாகவும் நாங்கள் බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු සුනිල් සෙනෙවි அவர்களுடன் நீண்ட நேரம் உரையாடினோம். அதேபோல, பாராளுமன்றத்திலுள்ள அனைத்து முஸ்லிம் MPs உடனும் உரையாடியுள்ளோம். கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுடைய அரசாங்கக் காலத்தில் 'அல்-குர்ஆன்' பிரதிகளை airportஇல் எந்த நிலைமையில் வைத்திருந்தார்கள் என்பதுஉங்களுக்குத் தெரியும். கால்களில் உதைபடக்கூடிய நிலைமையில்தான் அவை வைக்கப்பட்டிருந்தது. ஆனால், இன்று நாங்கள் பாதுகாப்பாக, மதிக்கத்தக்க வகையில் ஒரு containerஇல் வைத்துள்ளோம். வருங்காலங்களில் நாங்கள் அந்த 'அல்-குர்ஆன்' பிரதிகளை விடுப்பதற்கு நடவடிக்கை எடுப்போம். நேற்றும்கூட கௌரவ அமைச்சர் அவர்கள் பாராளுமன்றத்தில் அது சம்பந்தமாக நீண்ட விளக்கமொன்றைக் கொடுத் திருந்தார். அதன்படி வருங்காலத்தில் நாங்கள் செயற் படுவோம். இன்னும் பல விஷயங்களைப் பேச வேண்டியுள்ளது. ஆனால், ஒதுக்கப்பட்ட நேரம் போதாமலுள்ளது.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්පොල ප්‍රදේශයේ අම්බුළුවාව කියලා ප්‍රදේශයක් තිබෙනවා. ඒක විදේශ සංචාරකයන් හුඟක් එන ප්‍රදේශයක් වෙලා තිබෙනවා. අද ඒ ප්‍රදේශයේ ජනතාව අතර වැරැදි මතයක් ගිහිල්ලා තිබෙනවා, අපි ඒ ප්‍රදේශයට කිසිම action එකක් ගන්නේ නැහැ කියලා. ඒක බොරු කථාවක්. අපේ ගරු සුනිල් සෙනෙවි ඇමතිතුමා තමයි ඒ අමාත්‍යාංශය සම්බන්ධව කටයුතු කරන්නේ. අපේ ගරු ලාල් කාන්ත ඇමතිතුමා, Minister of Justice and National Integration එක්ක සාකච්ඡා කරලා අපි ඉදිරියේදී ඒක රජයට පවරා ගන්න සියලුම වැඩකටයුතු කරගෙන යනවා. ගිය ආණ්ඩු කාලයේ වාගේ අපි හිතුමතයට වැඩ කරන්නේ නැහැ. ඒකේ නීත්‍යානුකූල පැත්ත හොයලා, නීතියේ තිබෙන සියලුම සංශෝධන ටික කරලා ඉදිරියේදී අපි අනිවාර්යයෙන් ඒක ලබා ගන්නවා. ඒ වාගේම ඒකට අපේ රජය තුළින් කරන්න පුළුවන් සියලුම වියදම් ටික කරලා එය වැඩිදියුණු කරලා ජනතාවට ඒ සේවය ලබා ගන්න පුළුවන් විධියට හදනවා.

ඊළඟට, තව ස්වාමීන් වහන්සේ නමක් අපේ මන්ත්‍රීතුමා ගැන, ඇමතිතුමා ගැන,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මම අවසන් කරන්නම්.

ලොකු ප්‍රශ්නයක්, ඒ කියන්නේ ජාතීන් අතර අසමගිය ඇති වන විධියට කථාවක් පවත්වාගෙන යනවා. ඒ වාගේ දේවල්වලට අපේ රජය තුළින් කවදාවත් ඉඩක් නැහැ කියන එක ඒ ස්වාමීන් වහන්සේ අනිවාර්යයෙන් දැනගන්න ඕනෑ. මේ රට සිංහල බෞද්ධ ජනතාවටත්, මුස්ලිම් ජනතාවටත්, දෙමළ ජනතාවටත්, ක්‍රිස්තියානි ජනතාවටත් - මේ රටේ ජීවත් වන සියලුදෙනාට - අයිතිවාසිකම් තිබෙන රටක්. ඒ නිසා එක කණ්ඩායමකට - මුස්ලිම් වේවා, දෙමළ වේවා, ඕනෑ කෙනෙකුට - අනවශ්‍ය විධියට ප්‍රශ්න ඇති කරලා සමගිය කඩන්න එපා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.07]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, இன்றைய தினம் நடைபெறுகின்ற விவாதத்தில் கலந்துகொண்டு உருளைக் கிழங்கு, பெரிய வெங்காயம் என்பவற்றுக்கு விதிக்கப்படும் விசேட இறக்குமதித் தீர்வை தொடர்பில் கருத்துத் தெரிவிப்பதற்கு முதல் ஒரு விடயத்தைக் கூறலாமென நினைக்கின்றேன்.

உலக சுகாதார ஸ்தாபனமானது, மார்பகப் புற்றுநோய் தொடர்பில் விழிப்புணர்வை ஏற்படுத்துவதற்காக இந்த மாதத்தை விழிப்புணர்வூட்டும் மாதமாகப் பிரகடனப்படுத்தி இருக்கிறது. இவ்விடயம் சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை ஒன்றை இன்றைய தினம் பெண் பாராளுமன்ற உறுப்பினர்கள் ஒன்றியத்தினர் கொண்டுவர இருக்கிறார்கள். 2022ஆம் ஆண்டு எங்களுடைய நாட்டில் 5,000க்கும் மேற்பட்டவர்கள் மார்பகப் புற்றுநோயால் மரணித்து இருக்கிறார்கள். எமது நாட்டில் புற்றுநோயால் மரணிக்கின்ற பெண்களில் 28 சதவீதமானவர்கள் மார்பகப் புற்றுநோயால் மரணிக்கிறார்கள். குறித்த ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் என்னால் கலந்துகொள்ள முடியாதுவிட்டாலும், மேற்குறித்த விடயத்தை ஓர் அவதானத்துக்குரிய விடயமாகக் கருதி, ஒத்திவைப்புப் பிரேரணையாகக் கொண்டுவருகின் றமைக்கு அவர்களுக்கு என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று காலையில் இடம்பெற்ற வெலிகம பிரதேச சபை தவிசாளரின் அகோரமான கொலைச் சம்பவமானது எல்லோரையும் மிக மோசமாகப் பாதித்திருக்கிறது. இந்தக் கொலைச் சம்பவம் தொடர்பில் உரிய விசாரணைகள் நடத்தப்பட வேண்டும் என்பதுடன், சட்டத்துக்கும் ஒழுங்குக்கும் பொறுப்பான அமைச்சர் அவர்கள் இது சம்பந்தமான விளக்கமொன்றை நாளை பாராளுமன்றத்தில் வழங்க வேண்டுமெனவும் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன். இன்று இந்த நாட்டில் அரசியல் வாதிகளுடைய பாதுகாப்பு மாத்திரமல்ல, பொது மக்களுடைய பாதுகாப்பும் அச்சுறுத்தலுக்கு உள்ளாகி இருக்கின்றது. பட்டப் பகலில் ஓர் அரச காரியாலயத்துக்குள் புகுந்து, உள்ளூராட்சிச் சபைத் தவிசாளரைக் கொலை செய்வதென்பது சாதாரண ஒரு விடயமல்ல. குறித்த பிரதேச சபைத் தவிசாளரின் நியமனம் இடம்பெற்ற தினத்தில் அவருக்கு ஆதரவாக வாக்களிக்க இருந்தவர்களைக் கடத்திச் சென்று தடுத்து வைத்திருந்த விவகாரத்திலும் அரசாங்கத்தின்மீது சந்தேகம் எழுந்திருந்தது. இந்தப் பின்னணியிலே இந்தக் கொலை நடைபெற்று இருக்கின்றது. எனவே, இதற்கு அரசியல் ரீதியாகச் சம்பந்தம் இருக்கின்றதா? என்ற கேள்வி எழுந்திருக்கின்றது. இந்தக் கொலைச் சம்பவத்தைத் திசை திருப்புவதற்காக வேறு சில காரணங்களைச் சொல்லி, கொலையுண்டவருக்கு எதிராகவும் அவரை அவமானப்படுத்தும் விதமாகவும் சில கருத்துகளை வெளியிடுவதற்குச் சில ஊடகங்கள் முயற்சிக்கின்றன.

[ගරු රවුෆ් හකීම් මහතා]

இந்தக் கொலைக்குப் பின்னால் அரச தரப்பு ஆட்களும் இருக்கிறார்களா? என்ற சந்தேகம் வலுவாக இருக்கின்றது. எனவே, இவ்விடயம் சம்பந்தமாக அவசரமாக நடவடிக்கை எடுக்கப்பட வேண்டும். நீங்கள் கொலைச் சம்பவங்களுடன் சம்பந்தப்பட்டவர்களைக் கைது செய்து வருகின்றீர்கள். குறிப்பாக, நீதிமன்றத்துக்குள் கொலைச் சம்பவத்தை மேற்கொள்வதற்கு உதவிய பெண்ணொருவரை வெளிநாட்டில் வைத்து கைதுசெய்து, நாட்டுக்குக் கொண்டுவந்து இருக்கிறீர்கள். அதேபோல், இன்று நாட்டுக்குள் இடம்பெற்றிருக்கின்ற கொலையுடன் தொடர்புடையவர்களையும் உடனடியாகக் கைதுசெய்து, சட்டத்தின்முன் நிறுத்த வேண்டுமென அழுத்தம் திருத்தமாகச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

உருளைக் கிழங்கு, பெரிய வெங்காயம்மீது விதிக்கப்படுகின்ற புதிய இறக்குமதித் தீர்வை குறித்து இன்று நாங்கள் விவாதித்துக்கொண்டு இருக்கின்றோம். உற்பத்தியைப் பெருக்குவதில் பங்களிப்புச் செய்கின்ற விவசாயப் போதனாசிரியர்களின் விவகாரம் குறித்து இந்த அரசாங்கம் கூடிய கவனம் செலுத்த வேண்டும். அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற விவசாயப் போதனாசிரியர்களுக்கான ஆளணியில் இன்னும் நிரப்பப்படாமல் இருக்கும் வெற்றிடங்கள் குறித்து நான் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். இந்தப் பதவிக்கான போட்டிப் பரீட்சை முடிவுகள் வெளியாகியும், இன்னும் நியமனம் வழங்கப்படாமல் தடைப்பட்டிருப்பது மிகவும் மோசமான ஒரு விடயமாகப் பார்க்கப்படுகின்றது. இப்பதவி தொடர்பான SOR மாற்றப்பட்டும் அவர்கள் இன்னும் தரமுயர்த்தப்படவில்லை. அதாவது, தரம் IIIஇல் இருப்பவர்கள் 5 வருட சேவையின் பிற்பாடு தரம் IIக்கும் அதற்குப் பிற்பாடு தரம் Iக்கும் தரமுயர்த்தப்படுகின்ற விவகாரம் நீண்ட காலமாகத் தடைப்பட்டு இருக்கின்றது. இது ஒரு குறைபாடாக இருந்துகொண்டு இருக்கின்றது.

விவசாய ஊக்குவிப்புக் காரியாலயமானது, இன்று கல்முனையில் இல்லாமல் பெரிய நீலாவணையில் மாத்திரம் இருக்கின்றது. அது சாய்ந்தமருதில் இருந்தாலும், கல்முனையில் இல்லாத விவகாரம் என்னுடைய கவனத்துக்குக் கொண்டுவரப்பட்டு இருக்கின்றது. இது சம்பந்தமாகவும் அரசாங்கம் கவனத்தில் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மேலும், இன்று காலை வாய்மூல விடைக்கான வினாக்கள் நேரத்தில் கௌரவ எம்.எஸ். உதுமாலெப்பை அவர்களால் அம்பாறை மாவட்டத்திலுள்ள நெற்களஞ்சியசாலைகள் சம்பந்தமாக கேள்வி கேட்கப்பட்டபோது, நெல்லைக் கொள்வனவு செய்கின்ற விவகாரத்தில், அங்குள்ள களஞ்சியசாலைகளுக்கு அடுத்த வருடம் தொடக்கம் நெல் உலர்த்தும் இயந்திரங்கள் பெற்றுக்கொடுக்கப்படுமென உறுதியளிக்கப்பட்டது.

அம்பாறை மாவட்டத்தில் உற்பத்தி செய்யப்படுகின்ற நெல்லில் 20 சதவீதத்தைத்தான் அரசாங்கம் கொள்வனவு செய்யக்கூடியதாக இருக்கின்ற நிலைமையில், நெல்லின் ஈரத்தன்மையைப் பொறுத்து 17 சதவீதத்துக்கும் குறைவான நெல்லை மாத்திரம் கொள்வனவு செய்கின்ற நிலைமை ஏற்படும்போது விவசாயிகள் பாதிக்கப்படுவார்கள். இவ்வாறான பிரச்சினைகளை மிக மோசமாக எதிர்நோக்குகின்ற பிரதேசங்களில் ஒன்றான அம்பாறை மாவட்டத்தில் கடந்த வருடம் சிறுபோகத்தின்போது மாத்திரம் 265,000க்கும் மேற்பட்ட மெற்றிக்தொன் நெல் உற்பத்தியாகி இருக்கின்றது. அதற்கு முன்னைய வருடத்தைவிடவும் 33,000 மெற்றிக்தொன் நெல் கூடுதலாக உற்பத்தியாகி இருக்கிறது. இவ்வாறு கூடுதலான நெல் உற்பத்தி மேற்கொள்ளப்படுகின்ற அம்பாறை மாவட்டத்தில் நெற்களஞ்சியசாலைகளை அதிகரிக்கவேண்டிய அவசியம் இருக்கின்றது. இந்த அடிப்படையில், இவ்விஷயங்களை இன்னும் துரிதப்படுத்திச் செய்துதர வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மாத்தளை, பொலன்னறுவை, அநுராதபுரம், யாழ்ப்பாணம் போன்ற மாவட்டங்களில் உருளைக் கிழங்கு, பெரிய வெங்காயம் என்பவற்றின் உற்பத்திகள் கூடுதலாக இடம்பெறுகின்றன. செப்ரெம்பர் - ஒக்ரோபர் மாத காலப் பகுதி அவற்றின் அறுவடைக் காலமாக இருப்பதால், இந்தக் காலப் பகுதியில் அவற்றுக்கு விசேட இறக்குமதித் தீர்வையை விதிப்பதன்மூலம் சந்தை விலையைக் கட்டுப்படுத்துவதற்கும் விவசாயிகளுக்குக் கூடுதலான விலையைப் பெற்றுக் கொடுப்பதற்குமான ஒரு முயற்சி பாரம்பரியமாக கடந்த காலங்களில் இருந்து செய்துவந்தாலும், இதன்மூலம் உண்மையிலேயே அடுத்தடுத்த வருடங்களில் உற்பத்தியை அதிகரிக்க முடியுமா? என்பது சம்பந்தமான ஒரு பாரிய சந்தேகத்தை நேற்று நடந்த ஆலோசனைக் கூட்டத்தின்போதும் நான் எழுப்பி இருந்தேன். ஏனென்றால், இந்த நாட்டின் பெரிய வெங்காய சந்தைப்படுத்தலில் 4 சதவீதத்தை மட்டுமே கடந்த வருடம் உள்நாட்டில் உற்பத்தி செய்திருந்தார்கள். 4 சதவீதம் என்பது வெறும் 8,000 மெற்றிக்தொன் மாத்திரம்தான். இரண்டு இலட்சத்துக்கும் மேற்பட்ட மெற்றிக்தொன் இறக்குமதி செய்யப்படும்போது, வெறும் 8,000 மெற்றிக்தொன் மாத்திரமே கடந்த வருடம் உள்நாட்டில் உற்பத்தி செய்யப்பட்டது. இம்முறை அதை 50,000 மெற்றிக்தொன்னாக அதிகரிக்கலாம் என்ற ஒரு முன்னறிவித்தலை அரசாங்கம் செய்திருக்கிறது. இது நடைமுறையில் சாத்தியமாகுமா என்பதைக் கவனிப்பதற்கு விவசாயப் போதனாசிரியர்களையும் அது சம்பந்தமான Agriculture Extension Officersஐயும் அந்த இடங்களுக்கு அனுப்ப வேண்டும்.

இன்று விதை வெங்காயம் மிகக் குறைந்தளவிலே கிடைக்கப் பெறுகின்றது. எனவே, அதைப் பெற்றுக் கொடுக்கின்ற விடயத்தில் அரசாங்கம் கூடிய கவனம் செலுத்த வேண்டும். அதேநேரம், இந்த வரி விதிக்கப்படுவதற்கு முன்னரே ஏறத்தாழ 25,000 மெற்றிக்தொன் பெரிய வெங்காயம் இறக்குமதி செய்யப்பட்டு இருப்பதாகச் சொல்லப்படுகின்றது. இது உண்மையிலே அமைச்சைப் பாதிக்கின்ற ஒரு விவகாரமாகும். எனவே, இது சம்பந்தமான சரியானதொரு விளக்கத்தை இந்தச் சபைக்குத் தர வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.17]

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. අපි ආණ්ඩු බලය ලබා ගන්නා අවස්ථාවේදී මෙරට කෘෂි කර්මාන්තය සම්පූර්ණයෙන් බිමට සමතලා කරලා

තිබුණේ; ගොවි ජනතාව දණින් වැටිලා හිටියේ. ආණ්ඩුව විධියට අපි පොරොන්දු වුණා, ගොවි ජනතාවට ලස්සන ජීවිතයක් උදා කර දෙනවා, ඔවුන් ආර්ථික වශයෙන් ශක්තිමත් කරනවා කියලා. ඒ වෙනුවෙන් ආණ්ඩුවක් වශයෙන් අපි මුල ඉඳන්ම කටයුතු කළා. එහි ප්‍රතිඵලයක් හැටියට ප්‍රථමයෙන්ම වී ගොවියා ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට අපට හැකියාව ලැබුණා. ඒ අනුව අපි වීවලට සහතික මිලක් පනවා මේ කන්නයේදී ගොවි ජනතාවට ආර්ථික වශයෙන් ශක්තිමත් වීමට හොඳ අවස්ථාවක් ලබා දුන්නා. ආණ්ඩුව හරහා වී මිල දී ගැනීම කරද්දී අපි බලාපොරොත්තු නොවුණු ආකාරයට ජනතාව ඉතා උද්‍යෝගිමත්ව පැමිණ වී ගබඩාවලට වී ලබා දුන්නා. ඇතැම් පළාත්වල පවතින වී ගබඩා ටික ප්‍රමාණවත් වුණේ නැහැ, ඒ නිසා තවත් ගබඩා දෙකතුනක් ඉදි කිරීමට සිද්ධ වුණා කියලා අපට දැනගන්නට ලැබුණා. අපි මේ අවස්ථාවේදී වී ගොවියා ශක්තිමත් කිරීමට සමත් වුණා. අපි එතැනින් නැවතුණේ නැහැ. ඒ එකතු කර ගත්තු වී ටික ඔන්න දැන් සතොස හරහා පාරිභෝගික ජනතාවට සහන මිලට ලබා ගැනීමට අවස්ථාව උදා කර දී තිබෙනවා. අපි ඒ විධියට තමයි වී ගොවි ජනතාව වෙනුවෙන් මැදිහත් වෙලා කටයුතු කළේ. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරු විවිධ කාරණා ප්‍රකාශ කරනවා මම අහගෙන හිටියා. පාරිභෝගිකයන්ට පොන්නි සම්බා, කීරි සම්බා මිල දී ගැනීමේ අපහසුතා තිබෙනවා, ගැටලු තිබෙනවා ආදි විවිධ කාරණා එතුමන්ලා ඉදිරිපත් කළා. කලින් පැවැති ආණ්ඩු යටතේ එතුමන්ලාගේ හිත මිතුරන්ට ආදායම් උත්පාදනය කර ගන්න, අනීතික ලෙස උපයා ගැනීම් සිදු කර ගන්න හැකියාව තිබුණත්, අපි ආණ්ඩු බලය ලබා ගැනීමත් එක්ක එවැනි අකටයුතුකම්වලට ඉඩ නොමැති නිසා ඔවුන්ගේ අඳෝනා අද දින මේ පාර්ලිමේන්තුවේදී අපට ඇහුණා. සමස්තයක් වශයෙන්, මේ රටේ ජනතාවගෙන් සියයට 20ක් වාගේ ප්‍රමාණයක් තමයි පොන්නි සම්බා සහ කීරි සම්බා පාවිච්චි කරන්නේ. ඒ ප්‍රමාණය අපට මේ අවස්ථාවේදී ආනයනය කරලා හෝ ලබා ගැනීමට හැකියාව පවතිනවා. මොකද, බහුතරයක් ඒ සහල් පාවිච්චි කරන්නේ නැහැ. ඒ නිසා සාමාන්‍ය ජනතාවට එහි විශාල ගැටලුවක් තිබෙනවා කියලා අපි හිතන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ගෙනෙන නියමය ගත්තොත්, එහි විශේෂත්වය මේකයි. අල ගොවියාට සහ ලූනු ගොවියාට අපි පොරොන්දු වුණා, වී ගොවියා වාගේම ආර්ථික වශයෙන් ශක්තිමත් වීමට ඔවුන්ට හොඳ අවස්ථාවක්, හොඳ මිලක් ලබා දෙනවා කියලා. ඉතින්, ආණ්ඩුවක් වශයෙන් අපි දැන් ඒ සඳහා කටයුතු කරමින් ඉන්නවා. කලින් හිටපු ජනාධිපතිතුමෙක් පාරිභෝගිකයන්ගෙන් ඇහුවා මට මතකයි, "බොම්බයි ලූනු කැවද? අල ලාභද?" කියලා. ඒ, ඉන්දියාවේ ගංවතුර නිසා ලූනු කිලෝව රුපියල් 600ට, 700ට ගිය වෙලාවේ. නමුත්, දැන් විපක්ෂයට අඳෝනාවක් නඟන්න දෙන්නේ නැතුව සතොස හරහා සහන මිලට ලූනු මිල දී ගැනීමට අවස්ථාව ලබා දෙමින්, ලොකු ලූනු කිලෝවක් සඳහා ආනයනික බද්ද රුපියල් 10කින්, රුපියල් 40 සිට 50 දක්වාත්, අල සඳහා බද්ද රුපියල් 60 සිට 80 දක්වාත් ඉහළ දැමීමට කටයුතු කර තිබෙනවා. මේ හරහා අපි බලාපොරොත්තු වෙනවා, දේශීය අල ගොවියා ශක්තිමත් කිරීමට. මා දන්නා හැටියට ඔවුන් වසරේ එක් කන්නයක් තමයි වගා කටයුතු කරන්නේ. ඒ ආදායමෙන් තමයි ඊළඟ කන්නය වගා කරන කල් ඔවුන් ඉදිරි වර්ෂය පුරා ජීවත් වෙන්නේ. ඉතින් මේ ආනයනික බද්ද වැඩි කිරීම හරහා පාරිභෝගිකයන්ට යම් කිසි බලපෑමක් සිද්ධ වෙනවා යනුවෙන් විපක්ෂය හඬ නැඟුවාට, පාරිභෝගිකයන්ට සතොස හරහා හාල් මිලදී ගැනීමේ හැකියාව තිබෙන විධියටම ඔන්න දැන් දේශීය ගොවීන්ගෙන් ලබා ගන්නා ලොකු ලූනු ටිකත් සහන මිලට ලබා ගැනීමට හැකියාව ලැබෙනවා. ඉතින් ඒ නිසා කාටවත් ලූනු ගැන, අල ගැන කතන්දර කිය කියා අඬන්න දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගෙන තිබෙනවා, වසර 113ක් පමණ පැරණි සුරාබදු ආඥා පනත. ඇත්තටම සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ තිබෙන වගකීම් එක්ක බලද්දී ඔවුන්ගේ ප්‍රධාන කාර්යයක් බවට පත්ව තිබෙනවා, මත්පැන් නිෂ්පාදන බදු අය කර ගැනීම, බලපත්‍ර ලබා දීම, බලපත්‍ර අවලංගු කිරීම සහ වැටලීම්. මේ පනවන රීති හරහා සුරාබදු ආදායම වැඩි කර ගැනීමට තමයි මූලික අවධානය යොමු කරලා තිබෙන්නේ. සංඛ්‍යා දත්ත එක්ක බලද්දී 2024දී මත්පැන් ආශ්‍රයෙන් රුපියල් බිලියන 225.5ක ආදායමක් උපයාගෙන තිබෙනවා. මේ වසරේ රුපියල් බිලියන 242ක් උපයා ගන්න තමයි ඉලක්ක කරගෙන තිබෙන්නේ. මේ 10වන මාසය වන විටත් ඒ ඉලක්කය සපුරා ගැනීම පෙනෙන මානයේ අප ඉන්නේ. ඒ වාගේම දුම්කොළ නිෂ්පාදනය ගත්තාම, 2024දී රුපියල් බිලියන 1.2ක ආදායමක් තමයි ලබා තිබුණේ. මේ වසරේදී ඒ තුළින් රුපියල් බිලියන 2ක ආදායමක් අපේක්ෂා කරනවා. ඉතින් කියන්න සතුටුයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 මැයි වෙද්දී - මාස 6ක් ගතවෙද්දී - සුරාබදු දෙපාර්තමේන්තුව අපේක්ෂිත ආදායම සියයට 104කින් ලබා අවසන් බව. එවැනි තත්ත්වයක් තුළදී දේශීය ආදායම් වැඩි කර ගැනීමට සුරාබදු දෙපාර්තමේන්තුව ඒ දක්වන දායකත්වයට නීතිමය වශයෙන් ශක්තියක්, ආවරණයක් ලබා දීමේ බලාපොරොත්තුවෙන් තමයි අද මේ රීති පනවන්නේ.

අපේ රාජ්‍ය සේවකයන්ට වැටුප් ලැබෙනවා, මාසයේ 25වැනි දාට. ඒ වාගේම පෞද්ගලික අංශයේ සේවකයන්ටත් නිශ්චිත දවසක වැටුප් ලැබෙනවා. අපි ඒක මාසයේ 10වැනි දා කියලා ගනිමු. එතකොට 25වැනි දාට සහ 10වැනි දාට ඔවුන්ට වැටුප් ලැබෙනවා. රාජ්‍ය සේවකයන්ට වාගේම, පෞද්ගලික අංශයේ සේවකයන්ට නිශ්චිත දිනයක වැටුප් ගෙවනවා වාගේම, අන්න ඒ විධියටම, රජයට ලබා දෙන්න ඕනෑ බදු ආදායම ලබා දීමටත් නිශ්චිත දවසක් දෙන්න ඕනෑ. ඉතින් ඒ සුරාබදු ආදායම වැඩි කර ගැනීම සහ ඒ කටයුතු නිසි ක්‍රමයකට ගෙන ඒමේ අරමුණින් සෑම මසකම 15වන දිනයට අදාළව, ඒ කියන්නේ සෑම මසකම 1වන දා සිට 15වන දා දක්වා වන සුරාබදු මුදල් ටික එම මාසයේ අවසාන දිනයේත්, -ඒ කියන්නේ 30 වන හෝ 31 වැනි දිනයේත්- එම මාසයේ 16 වැනි දින සිට 30වන හෝ 31වන -අවසන්- දින දක්වා වන බදු මුදල් ටික ඊළඟ මාසයේ 15වන දිනයේත් ගෙවීමට කටයුතු කළ යුතුයි. ඒ විධියට නිශ්චිත දින දෙකක් ලබා දී තිබෙනවා. ඒ අනුව ඒ බදු ගෙවීම උපරිම මාස එකක් ඇතුළත සිද්ධ කළ යුතුයි. බදු ගෙවීම පැහැර හැරීම සහ කල් දැමීම හමුවේ ඔවුන්ට සියයට 3ක අධිභාරයක් ගෙවීමටත් සිද්ධ වෙනවා. ඇත්තටම කලින් කථා කළ අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා වාගේම, කලින් තිබුණා මාස හයක කාලයක්, බදු ගෙවන්න. ඒ මාස හයක කාලය ඇතුළත නොගෙව්වොත් තමයි බලපත්‍රය අහෝසි කරන්නේ. හැබැයි දැන් දින 90ක් ඇතුළත බලපත්‍රය අහෝසි වෙනවා, නිසි ලෙස බදු නොගෙවා පැහැර හැරියොත්. ඉතින් නීතිමය රාමුවකට රටේ බදු ආදායම, සුරාබදු ආදායම ගෙනැල්ලා, විධිමත් විධියට ආදායම් ලැබීමට මේ රීති මහඟු උදව්වක් වන බව අපට පෙනී යනවා.

අපේ ආණ්ඩුව බලය ලබා ගැනීමට පෙර ඇතැම් අය තමන්ගේ හිත මිතුරු මැති ඇමතිකම්වලට මුවා වෙලා ආණ්ඩුවට, රජයට, භාණ්ඩාගාරයට බදු මුදල් ගෙවන්නේ නැතුව පැහැර හැරපු අවස්ථා තිබුණා. නමුත් දැන් කියන්න සතුටුයි, අපේ ආණ්ඩුව බලයට පත් වෙලා, විවිධ නීතිමය ක්‍රියාමාර්ග, නඩු හබ ඔස්සේ පියවර ගනිමින්, සුරාබදු ආදායම වශයෙන් විශාල මුදලක් එකතු කර ගනිමින් සිටිනවා. ඉතින් එදා එහෙම යටිමඩි ගහපු ආදායම අද යම් පිළිවෙළකට, රාමුවකට අනුව උපයා ගැනීමට අපි සමත් වෙලා තිබෙනවා.

[ගරු හිරුනි විජේසිංහ මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුරාබදු ආඥා පනත යටතේ සුරාබදු නිලධාරින්ට බලය තිබෙනවා, නීති විරෝධී මත්ද්‍රව්‍ය වැටලීම්, මත්පැන් වැටලීම් කිරීමට. ඉතින් ඔවුන්ගේ ආදායම ඇත්තටම වැඩි කර ගන්න ඕනෑ නම් ඒ කටයුතු කළ යුතුයි. මිනිසුන්ගෙන්, සමාජයෙන්, ඒ වාගේම පොලීසිය පැත්තෙනුත් එන අදහසක් තමයි, සුරාබදු ආඥා පනත යටතේ සුරාබදු නිලධාරින්ටත් වැටලීම් බලය තිබෙනවා කියන එක. හැබැයි, දැන් ඒක පොලිස් නිලධාරින්ගේ පිට දාලා නේ තිබෙන්නේ. සුරාබදු වැටලීම් සුරාබදු නිලධාරින් කරන්නේ නැහැ කියනවා. එවැනි කාරණා සිහියට නැඟෙද්දී කියන්න ඕනෑ, මේ මාසයේ 31වැනි දා ආරම්භ කිරීමට නියමිතයි, අපේ රටේ නවමු ජාතික මෙහෙයුමක් බවට පත් වෙන, විෂ මත් ව්‍යසනය පරදන "රටම එකට" ජාතික මෙහෙයුම. මා විශ්වාස කරනවා, ඒ මෙහෙයුමේදී නීති විරෝධී මත්පැන් හා මත් ද්‍රව්‍ය වැටලීම්වලට පොලීසිය සමඟ සුරාබදු නිලධාරිනුත් එක්ව කටයුතු කරලා මේ රටේ තිබෙන නීති විරෝධී මත්පැන් සහ විෂ මත් ද්‍රව්‍ය උවදුර මේ රටින් තුරන් කිරීමට සහයෝගය දක්වයි කියලා.

ආණ්ඩුවක් වශයෙන් මේ පනත් ඔස්සේ ගොවීන් ශක්තිමත් කිරීමට ගත්ත විධිමත් පියවර අපි ඉතා අගය කොට සලකනවා. ඒ වාගේම, මේ තිබෙන අයහපත් කාලගුණ තත්ත්වය නිසා එළවලු මිල ඉහළ යෑමක් සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, සමස්තයක් වශයෙන් ගත්තාම මේ මාස දහයක වාගේ කාලය පුරාම මේ රටේ කෘෂි කර්මාන්තයෙන් ලැබෙන ආදායම ගොවි ජනතාව වෙතටත්, ඒ ද්‍රව්‍ය පාරිභෝගිකයන් වෙතටත් ලස්සනට ගලා ගෙන ගිහිල්ලා, මිල පරතරයක් පවත්වා ගෙන ගිහින් පාරිභෝගිකයා සහ ගොවීන් යන දෙගොල්ලම වාසි ලැබුවා. අපි ඒ ගැන කියන්න සතුටුයි. මේ වසරේ ඇති වුණු මේ අනපේක්ෂිත තත්ත්වය නිසා, යම් කිසි මට්ටමකට එළවලු මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. නමුත්, එය යථා තත්ත්වයට පත්වීමත් එක්ක, ගොවි ජනතාවට සහ පාරිභෝගිකයන්ට හොඳ කලදසාවක් උදා වෙයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.28]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති, ලසන්ත වික්‍රමසේකර මැතිතුමාගේ ඝාතනය පිළිබඳව රජය වහා සොයා බලා කටයුතු කරයි කියලා මුලින්ම බලාපොරොත්තු වෙනවා. දේශපාලනය කරනකොට යම් කිසි ආරක්ෂාවක් ලැබිය යුතුයි කියන මතයේ මා ඉන්නවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට ඒ අවශ්‍ය පහසුකම් ලබා දිය යුතුයි කියන එක මම මේ වෙලාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් පොඩ්ඩකට කලින් මට දඹුල්ලෙන් දුරකථන ඇමතුමක් ලැබුණා. ඒ අය කිව්වා, දඹුල්ලේ කෘෂි ගබඩාවට යාබදව තිබෙන ඉඩමක් පුද්ගලයෙක් බුල්ඩෝසර් ගෙනැල්ලා හාරනවා, ඒ සම්බන්ධයෙන් නගර සභාවේ අය සමඟ බහින්බස්වීමක් ඇති වෙලා තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒක කියන්න හේතුව මේකයි. අපි ඊයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී දීර්ඝ සාකච්ඡාවක් කළා. එතැනදී පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපි ඔක්කොම එකඟ වෙච්ච කාරණාවක් තිබෙනවා. යම් යම් අවස්ථාවලදී මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පනවනවා. මේ ආණ්ඩුවෙන් විතරක් නොවෙයි, කලින් ආණ්ඩුවලිනුත් පැනෙව්වා. ඒ බද්ද පනවන්නේ ගොවි ප්‍රජාව බේරා ගන්නයි. මොකද, ඔවුන්ගේ අස්වැන්න නෙළන කාලයට පිටරටින් ලූනු හා අල ගෙනාවොත්, ඔවුන්ගේ ආදායමට ඒකෙන් බලපෑමක් පහරක් වදින නිසා.

2024 මැයි මාසයේ ශ්‍රී ලංකාවේ ජාතික තීරු බදු ප්‍රතිපත්තිය - National Tariff Policy of Sri Lanka - කැබිනට් මණ්ඩලයෙන් සම්මත වුණා. ඒ ලේඛනය මා ළඟ තිබෙනවා. මම ඒ ලේඛනය **සභාගත*** කරනවා.

මේ රජයත් ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා. ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනකොට, එහි තිබෙන මූලික හරය අනුව, යම් අවස්ථාවලදී දේශීය ගොවියා බේරා ගැනීම සඳහා අපි එවැනි බදු පනවන්න ඕනෑ. නමුත්, ඒ බදු පනවන කොට යම් ක්‍රියාදාමයක් තිබෙන්න ඕනෑ. මේකට මූලික හේතුව වුණේ, මා විසින් 2021 මැයි මාසයේ 21වැනි දා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාට ලියපු ලියුමක්. එම ලිපිය මම **සභාගත*** කරනවා.

ඒ ලියුම ලියන්නේ, සීනි ගනුදෙනුවෙන් රජයට වූ අලාභය පිළිබඳ වෝහාරික විගණන වාර්තාවක් ලබා ගන්න කියලා. රුපියල් 50ට තිබුණු බද්ද ඇමතිවරයා විසින් midnight gazette එකකින් ශත 25ට අඩු කිරීම නිසා, ඒකේ තිබුණු අභ්‍යන්තර තොරතුරු ගලා යෑම හරහා යම් යම් පුද්ගලයෝ අධික වාසියක්, බිලියන ගණනක වාසියක් ලබා ගත්තා. දෙසැම්බර් මාසය වෙනකොට එය රුපියල් බිලියන 15.9ක් හැටියට අපේ කමිටුව වාර්තා කරලා තිබුණා. නමුත්, අද වෙනකොටත් මේ සීනි බදු වංචාවට මොකක්ද වුණේ කියන කාරණයට රජයට පිළිතුරක් දී ගන්න බැරි වෙලා තිබෙනවා.

ඒ නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා කරද්දී, මේ ක්‍රියාදාමය වෙනස් විය යුතුයි කියන ස්ථාවරයට එවකට පැවති ආණ්ඩුවත්, IMF එකත් එකඟ වුණා. එතැනදී තිබෙන එක කාරණාවක් තමයි, ඇමතිවරයාට බද්ද ගහන්න බැහැ, කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ගන්නේ නැතිව. ඉස්සර සිද්ධ වුණේ, බද්ද ගහපු ඊට පස්සේ කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ගන්න එක. දැන් කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය අරගෙන තමයි මේ බද්ද පනවන්නේ. හැබැයි, මේ බද්ද පනවනකොට ඒකේ නොයෙකුත් කොන්දේසි තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, දින 45කට විතරයි මේ බද්ද ගහන්න පුළුවන්. ඊළඟට, මේ බද්ද ගහන්න ඕනෑ ජනවාරි පළමුවැනි දා. හිතුණු, හිතුණු අවස්ථාවල මේ බද්ද ගහන්න බැහැ. ජනවාරි පළමුවැනි දා බද්ද ගහලා කියනවා, මෙන්න මේ කාලයට අලවලට බද්දක් ගහනවා, මෙන්න මේ කාලයට ලූනුවලට බද්දක් ගහනවා කියලා. දැන් ගරු මන්ත්‍රීතුමියක් කියනවා මම අහගෙන හිටියා, "විපක්ෂයට මේ ගැන කථා කරන්න අයිතියක් නැහැ, අඬන්න ඕනෑ නැහැ" කියලා. මට හිතෙන විධියට, එතුමියත් මේවා කියවලා බලන්න ඕනෑ. මොකද, ඒ බද්ද අය කරනකොට ඒකේ ක්‍රියාපටිපාටිය ඒ විධියටම අනුගමනය කරන්න ඕනෑ. මේකට පක්ෂ, විපක්ෂ භේදයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවි මහත්මයාගේ අලවලට

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මිලක් නැති වුණාම, ලූනුවලට මිලක් නැති වුණාම මොකක්ද වෙන්නේ කියලා ඔබතුමා දන්නවා. මේ දවස්වල ගොවීන්ගේ ලූනු විකුණා ගන්න බැරිව බොහෝ කරදරවලට මුහුණ දෙන්න ඔවුන්ට සිද්ධ වෙලා තිබෙනවා. ඔව්, අද ලූනු කිලෝග්‍රෑම් එකක් රුපියල් 130ට, රුපියල් 140ට යන එක ඇත්ත. නමුත්, ලූනු කිලෝග්‍රෑම් එකක් රුපියල් 90ට විකුණා ගන්න බැරිව ලොකු ප්‍රශ්න මතු වුණා. ඒ නිසා අපි මේ වෙනුවෙන් නිකම් අඬනවා නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නයට විසඳුමක් හොයන්න අවශ්‍යයි කියන එක තමයි අපි මේ අවස්ථාවේදී රජයට පෙන්වා දෙන්නේ.

ඊයේ පැවති සාකච්ඡාව දිහා බලන්න. ඊයේ Department of Agricultureහි Ms. G.G.V. Shyamali, Additional Director General (Development), Mr. M.C. Jayasinghe, Additional Director (Crop Leader for Potato) සහ Mr. D.D.R. Kanchana, Crop Leader for Big Onion සමඟ ඉතාම වැදගත් සාකච්ඡාවක් කළා. එතැනදී අපි පිළිගත්ත එක දෙයක් තමයි, "ඔව්, එක පැත්තකින් බදු පනවන්න ඕනෑ, ඒකේ ප්‍රශ්නයක් නැහැ" කියන එක. ඒක කලින් කියන්න ඕනෑ. නමුත්, මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද? ජාතික තීරුබදු ප්‍රතිපත්තිය කියන්නේ නීතිය නොවෙයි. පරණ නීතියට අනුව තමයි දැන් වැඩ කරන්නේ. එතකොට මේ නීතියයි, ප්‍රතිපත්තියයි අතර පරස්පරයක් තිබෙනවා. ඒ නිසා, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාට මම කියන්න කැමැතියි, ඔබතුමා පුළුවන් තරම් ඉක්මනට මේ පරස්පරය වෙන් කරලා මේ ප්‍රතිපත්තිය නීතියක් බවට පරිවර්තනය කරන්න කියලා. එතකොට මේ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙන්න හැකියාවක් තිබෙනවා. දැන් බලන්න, මේ වෙච්ච සාකච්ඡාවේ මූලික දෙයක් තමයි, ගොවි මහත්මයාට ගබඩා capacity එකක් තිබෙන්න ඕනෑ කියන එක. ගබඩාවක් හදන්න ඕනෑ කියන එක අපි තේරුම් ගත්තා. එවකට පැවති ආණ්ඩුවේ මට කැබිනට් ඇමතිකමක් තිබුණේ නැහැ. නමුත්, මම කැබිනට් නොවන ඇමතිවරයෙක් හැටියට අපේ National Policies and Economic Affairs අමාත්‍යාංශය හරහා proposal එකක් ගෙනාවා, තෙතමනය හා උෂ්ණත්වය පාලිත ලංකාවේ ප්‍රථම කෘෂි ගබඩාව හදන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ලේඛනය මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

මේකේ සියලුම කාරණා පහදා දීලා තිබෙනවා. මේකේ business model එක තිබෙනවා, මේක කරන්නේ කොහොමද කියලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපි ගොවි සමාගම් එකතු කරලා, ඔවුන්ටත් කොටස් අයිති වන විධියට සමාජ කොටස් - social shares - හැටියට මුදල් අය කර ගන්නේ නැතිව කොටස් බෙදාදීමේ වැඩ පිළිවෙළකුත් ආරම්භ කළා. දැන් අද වෙනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? අද දඹුල්ලෙන් මට call කළේ ඇයි? වෙලා තිබෙන්නේ මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ප්‍රභාෂ්වර ගබඩාව ගැන දන්නවා. ඒකේ මෙට්‍රික්ටොන් 5,000ක් ගබඩා කරන්න පුළුවන්. එහි chambers 6ක් තිබෙනවා. උෂ්ණත්වයයි, තෙතමනයයි පාලනය කරන්න පුළුවන්. උදාහරණයක් හැටියට ලූනු තියාගන්න පුළුවන් සති දෙකයි, නැත්නම් සති තුනයි නේ. හැබැයි, මේ chambers හරහා අපට පුළුවන් උෂ්ණත්වයයි, තෙතමනයයි නොයෙකුත් ආකාරයට පාලනය කරලා මාස 8ක් වෙනකම් මේ ලූනු තියාගන්න. තෙතමනයයි, උෂ්ණත්වයයි පාලනය කරලා සහ ඒක GAP ක්‍රමයට වැව්වොත් මාස 8ක් ලූනු තියාගන්න පුළුවන්. සමහර වෙලාවට ලූනු ගොවියා මොකද කරන්නේ? දවස් 90ක් තියාගන්නේ නැතිව දවස් 75න් ලූනු ටික ගලවාගෙන එනවා. ඒවා ගෙනැල්ලා මේ ගබඩාවල දැම්මොත් ඒ ලූනු කුණු වෙලා යනවා. එතකොට මේක අසාර්ථක වෙනවා. ඒ නිසා ඒක කරන්න බැහැ. ඒක කරන්න නම් GAP එක ගැන ගොවි මහත්මයාට කියලා දෙන්න ඕනෑ; training programme එකක් තිබෙන්න ඕනෑ. ඒ සඳහා අපට අද තාක්ෂණය පාවිච්චි කරලා traceability එකක් කරන්න පුළුවන්. ඒ හරහා අපට පුළුවන් තාක්ෂණය ගෙනැල්ලා මේ ගොවි මහත්මයාව දියුණු කරලා ඔහුගේ අස්වැන්න ගබඩා කරන්න පුළුවන් තැනකට ගේන්න. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? 2019 ඉඳලා 2025 වෙනකම් මේ ගබඩාව විවෘත කරන්නේ නැහැ. මට තේරුම් ගන්න බැහැ, මොකක්ද මේකේ තිබෙන ප්‍රශ්නය කියලා. හැබැයි, අද වෙනකොට ඒක වටේට ගබඩා පැටව් ගහලා තිබෙනවා. අද තිබෙන ප්‍රශ්නය ඒකයි. අද තිබෙන ප්‍රශ්නය මොකක්ද? මෙන්න තව කෙනෙක් විශාල ගබඩාවක් ගහන්න යනවා. "ගබඩාව ගහන්න ඔයගොල්ලන්ට අනුමැතිය කෝ?" කියලා නගර සභාවෙන් ඇහුවාම ඒගොල්ලන් කියනවා, "අපට ඒවා අදාළ නැහැ, අපි මේ ගබඩාව ගහනවා" කියලා.

ගරු ඇමතිතුමා, ඔබතුමා මගේ මිත්‍රයා. ඔබතුමා දන්නවා, දැන් අවුරුදු 20ක් තිස්සේ පොඩි මිනිහා වෙනුවෙන් අපි සටන් කළ බව. මෙතැන ගොවියා වෙනුවෙන් සටන් කරන්න අවශ්‍යයි. මම දන්නවා, ඔබතුමා වෙළෙඳ ඇමති. ලාල් කාන්ත ඇමතිතුමා කෘෂිකර්ම ඇමති. ඔබ දෙගොල්ලන්ගේ සහයෝගයෙන් මේ කටයුතු කරන්න ඕනෑ. මේක නිර්මාණය කරපු මනුස්සයා හැටියට මම ඕනෑ වෙලාවක, - *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, ඔබතුමා පස්සේ කථා කරන්න. ගරු ඇමතිතුමනි, මේකේ concept එක මොකක්ද, මේකේ කරන්නේ මොකක්ද කියලා ඕනෑ වෙලාවක කියන්න මම සූදානම්. පොඩි පොඩි අඩුපාඩු තිබෙන්න පුළුවන්. පටන් ගන්නකොට හැම දේකම අඩුපාඩු තිබෙනවා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, මම කියනකල්. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ මේකට විසඳුමක් සොයන්න. මේකේ දේශීය ගොවියාගේ ලූනු, දේශීය ගොවියාගේ අල මෙට්‍රික්ටොන් 5,000ක් ගබඩා කරන්න පුළුවන්. හැබැයි, අර පැටව් ගහපු ඔක්කොම කන්ටේනර්වල මොනවාද ගබඩා කරන්නේ? චීනයෙන් ගෙනාපු ලූනු, පාකිස්තානයෙන් ගෙනාපු ලූනු, ඉන්දියාවෙන් ගෙනාපු අල, ඉන්දියාවෙන් ගෙනාපු ලූනු. නමුත්, අපේ ගොවි මහත්මයාගේ ලූනු ටික ගබඩා කර ගන්න තැනක් නැහැ. මෙවැනි බදු ගහන එකේ ප්‍රශ්නයක් නැහැ. නමුත්, එය ප්‍රතිපත්තිමය ආකාරයට සිදු කරන්න ඕනෑ. ඒ ප්‍රතිපත්තිය නීතියක් කරන්න ඕනෑ. අපි ගොවි මහත්මයාට දිය යුතු ගබඩාව ලබා දෙන්න ඔබතුමන්ලාට හැකි වේවායි ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.38]

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ගෙනෙන නියමය සහ සුරාබදු ආඥාපනත යටතේ ගෙනෙන රීති පිළිබඳව තමයි අද අපි සාකච්ඡා කරන්නේ. ඇත්තටම මේ බදු පනවන්නේ මොකටද කිව්වොත්, රජයක් හැටියට අපි ජනතාවට සහන සලසන්න බදු පනවන්න ඕනෑ. එක

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා]

පැත්තකින්, ඒ බදු පනවන්න හේතුවක් තමයි ඒ ලැබෙන බදු මුදලින් ජනතාවට සේවය කිරීම. ඒ වාගේම කෘෂි කාර්මික භෝගවලට බදු පැනවීමට හේතුව තමයි, ගොවියා ආරක්ෂා කිරීම. ඔබතුමන්ලා දන්නවා, මේ වෙද්දී ගොවියා බී ලූනු සහ අල අළෙවි කර ගන්න බැරිව ප්‍රශ්න රාශියකට මුහුණ දී සිටින බව. මේ සඳහා මිලක් ලබා ගැනීමට තමයි මේ බදු පනවා තිබෙන්නේ.

ඔබතුමන්ලා දන්නවා ඇති, මීට පෙර සීනි බදු වංචාව වාගේ දේවල් මේ රටේ සිද්ධ වුණු බව. ඒක වුණේ කොහොමද කියලාත්, ඒ සීනි බදු වංචාව පිටුපස හිටියේ කවුද කියලාත් ඔබතුමන්ලා දන්නවා ඇති. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය කියන හැම ආයතනයක්ම එකතු කරගෙන තමයි මේ බදු පනවන්න අපි තීන්දු තීරණ ගන්නේ. හැබැයි, ඔබතුමන්ලා දන්නවා ඇති, මීට පෙර හිටපු ආණ්ඩු තනි පුද්ගලයන්ට ඕනෑ විධියට තමයි මේ හැම ක්‍රියාවලියක්ම සිද්ධ කළේ කියන එක. අපි ආණ්ඩුවක් වශයෙන් තීරණය කර තිබෙනවා, මේ හැම දෙයක්ම කණ්ඩායමක් වශයෙන්, එක රැනක් වශයෙන් එකට ඉඳගෙන සිද්ධ කරන්න. එතකොට මේ බදු පනවද්දී හැම කෙනෙක් ගැනම සොයා බලන්න අපට පුළුවන්. අපි දන්නවා, වෙන ආණ්ඩු කාලවල බදුවලින් හොරා කාපු විධිය. ඒ බදු මුදල් තමන්ගේ හිතවතුන්ට බෙදා දුන් විධිය. හැබැයි, මේ වනතෙක් අපි එවැනි ආකාරයේ කිසිදු ක්‍රියාවලියකට මැදිහත් වෙලා නැහැ. අපි මේ සම්බන්ධයෙන් නිසියාකාරව ක්‍රියා කර තිබෙනවා.

බදු පිළිබඳව කථා කළොත්, අපට මේ වනකොට සුරාබදුවලින් බිලියන 10.5ක හිඟ මුදලක් තිබෙනවා. ඇත්තටම මේ හිඟ මුදල කුඩා ආයතන ගණනකින් එන්න තිබෙන මුදල්. ඒ කියන්නේ, සීමිත ප්‍රමාණයකින්. අනෙක් අය බදු ගෙවලා තිබෙනවා. මේ බදු දැල ශක්තිමත් කරන්න ඕනෑ, බදු ගෙවන අයවත් ආරක්ෂා වෙන්න. නැත්නම්, බදු ගෙවන කට්ටිය හැම දාම බදු ගෙවනවා. නොගෙවන අය නොගෙවා ඉන්නවා. ඒ වාගේම තමයි, මේ බදු මාස 6ක් ඇතුළත ගෙවන්න කියලා කිව්වාට, අවුරුදු ගණන් ගෙවන්නේ නැතිව ඉඳලා තිබෙනවා. ඒ ගෙවන්නේ නැතිව ඉඳලා තිබෙන්නේ, එයාලා නඩු මාර්ගවලට ගිහිල්ලා, එක එක හිතවතුන් ලවා කටයුතු කරලා, ඒවායෙන් නිදහස් වෙලා තිබෙන නිසායි. ඒක නිසා තමයි මෙච්චර බදු මුදලක් අයකර ගැනීමට නොහැකි වෙලා තිබෙන්නේ. හැබැයි, අද දින ඉදිරිපත් කර තිබෙන මේ සුරාබදු ආඥාපනත යටතේ රීති තුළින් මාස 3ක් ඇතුළත මේවා අයකර ගැනීමට අපට පුළුවන් වෙනවා.

ඊළඟ කාරණය තමයි, කෘෂිකාර්මික භෝග. අපි දන්නවා, වෙනත් රටවල අක්කරයක් වගා කළොත් ඒකෙන් වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් ලැබෙන බව. නමුත් අපට තවමත් අක්කරයක් වගා කළොත් එන්නේ බොහොම පොඩි නිෂ්පාදන ප්‍රමාණයක්. ඒකට මූලික හේතුව තමයි, අපි මේ ගැන පරීක්ෂණ මට්ටමට ඇවිල්ලා නොතිබීම. අපි තවමත් පැරණි ක්‍රමයට තමයි භෝග වගාව කරන්නේ. ඉදිරියේදී මේ සඳහා නිසි ක්‍රියාමාර්ග ගන්න අපි මේ වෙද්දි සාකච්ඡා කරමින් යනවා. ඉදිරියේදී අදාළ නිලධාරීන් සහ තාක්ෂණවේදීන් යොදවාගෙන ඉතාම හොඳ තත්ත්වයේ බීජ අපේ රටේ නිෂ්පාදනය කරන්න අපි බලාපොරොත්තු වනවා. අපි මේ වෙද්දි විදේශ රටවලින් තමයි වැඩි වශයෙන් බීජ ගේන්නේ. ලංකාවේ නිෂ්පාදනය කරන ඒවා බොහොම අඩු ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ හින්දා ඒ නිෂ්පාදන ක්‍රියාවලියත් අපි මේ වෙද්දි කරගෙන යනවා.

බදු ගෙවන ජනතාව ආරක්ෂා කර ගැනීම සඳහා තමයි අපි මේ පනත් ශක්තිමත් කරන්නේ. මොකද, මේ හැම බදු මුදලක්ම අපේ රටේ ජනතාවගේ සුබසිද්ධිය තකා තමයි අපි යොදවන්නේ. අපේ ආණ්ඩුව පටන් ගත්තා විතරයි අපි ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දුන්නා. ඒ පොහොර සහනාධාරය ලබා දෙන්න මේ මුදල් තමයි අපි වැය කළේ. අපි කෘෂි කර්මාන්තය වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරගෙන යනවා. මේ වෙද්දි වැව් අමුණු සුද්ධ කරනවා, ඇළ වේලි සුද්ධ කරනවා, ඒ වාගේම ගොවියාට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙනවා. ඒවා දෙන්න තමයි අපි මේ බදු මුදල් එකතු කරන්නේ.

ඔබතුමන්ලා දන්නවා, මේ බදු මුදලුත් එක්ක මේ රටේ සංවර්ධන ක්‍රියාවලිය ඉස්සරහට යන බව. හැබැයි මේ බදු මුදල්වලට මෙතෙක් කාලයක් මොනවාද වුණේ කියලාවත් කාටවත් හොයා ගන්න බැරි වුණා. ඇත්තටම මේ රටේ බදු මුදල්වලට වෙච්ච දේවල් ගැන හිතාගන්නවත් බැරිව ගියා. මේ බදු මුදල් කොහේටද යොදවන්නේ කියන්නවත් බැරිව ගියා. ඒවායෙන් කොමිස් ගත්තා, සංවර්ධන ක්‍රියාවලියක් කළත් ඒකෙන් කොමිස් ගත්තා. කොමිස් අරගෙන ඒ බදු මුදල් අයාලෙ වියදම් කළා. එහෙම වියදම් නොකර, ජාතික ජන බලවේග ආණ්ඩුව මේ වෙද්දි ඒ හැම බදු මුදලක්ම ජනතාවට යන විධියට වැඩ සලස්වා තිබෙනවා. ඒක තමයි අපේ ආණ්ඩුවේ විශේෂම කාර්යය.

වගා බිම් ගැන කථා කළොත්, ඔබතුමන්ලා දන්නවා මේ වෙද්දි අපි වගා කරන්නේ බොහොම පොඩි බිම් ප්‍රමාණයක බව. අපි ඒ වගා බිම් ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ. එලෙස වගා බිම් ප්‍රමාණය වැඩි කරන්න නම් අපි ගොවීන් ආරක්ෂා කරන්න ඕනෑ, ගොවීන්ට බිම් ටික ලබා දෙන්න ඕනෑ, ගොවීන්ට නව තාක්ෂණය ලබා දෙන්න ඕනෑ. ඒ හැම දෙයක්ම ජාතික ජන බලවේග ආණ්ඩුව හැටියට අපි කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම අපි තීරණය කරලා තිබෙනවා, හැම දිස්ත්‍රික්කයම වගා කරන්න පුළුවන් හැම බිමකම වගා කරන්න. ඒකට මූලික හේතුව මෙයයි. අපි දන්නවා, පිට රටින් ගොඩක් ආහාර ද්‍රව්‍ය අපට ගේන්න වෙලා තිබෙන බව. වගා කළ හැකි සියලු බිම් ටික වගා කළාට පස්සේ - බදු මුදල් ගන්නේ නැතිව- මිනිසුන්ට අවශ්‍ය ආහාර ටික අපිම නිෂ්පාදනය කරගෙන ස්වයංපෝෂිත ආර්ථිකයකට යන්න අපට පුළුවන්කම ලැබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.44]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று விசேட வியாபாரப் பண்ட அறவீட்டு சட்டத்தின் கீழான கட்டளைகள்மீது விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. இந்த நாட்டிலே அண்மைக் காலமாக விவசாயிகளின் உற்பத்திப் பொருட்களுக்கு நியாயமான விலை கிடைப்பதில்லையென்ற வேதனை மிகுந்த செய்திகளை ஊடகங்கள் வாயிலாக நாம் அறிகின்றோம். அதேபோல, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மன்னார், வவுனியா மற்றும் புத்தளம் போன்ற இன்னோரன்ன மாவட்ட விவசாயிகளை நேரடியாகச் சந்திக்கின்றபொழுதும் அவர்கள் இவ்வாறான

செய்திகளை எங்களுக்குச் சொல்கிறார்கள். அரசாங்கத்தைப் பொறுத்தவரையிலே அது உருளைக்கிழங்கு, வெங்காயம் போன்ற இன்னோரன்ன விவசாயப் பொருட்களை இறக்குமதி செய்கின்றபோது, எமது நாட்டில் அவற்றின் உற்பத்திக் காலங்களை அறிந்து அதற்குச் சமாந்தரமாக ஏற்ற திட்டமிடல்களைச் செய்கின்றபொழுது உள்ளூர் உற்பத்தியாளர்களுடைய பாதிப்பைத் தடுக்க முடியும். நான் இதற்குப் பொறுப்பான அமைச்சராக இருந்த காலங்களிலே எங்களுடைய அமைச்சின்மூலம் Cost of Living Committee மற்றும் கமத்தொழில் அமைச்சு, வர்த்தக அமைச்சு, கடற்றொழில் அமைச்சு, Ministry of Public Administration போன்ற பல அமைச்சுகளுடன் அந்த விவசாயப் பொருட்களின் உற்பத்திக் காலத்திற்கு 3 மாதங்களுக்கு முன்னர் கூடி, எந்தப் பொருளுக்கு எந்தக் காலத்திலே வரி விதிக்க வேண்டும் என்ற விஷயங்களை ஆராய்ந்து, அவற்றின் உற்பத்திக் காலங்களிலே விவசாயிகளைப் பாதுகாப்பதற்கான திட்டங்களை மேற்கொண்டிருந்தோம்.

கடந்த சில மாதங்களில், குறிப்பாக வெங்காயம் உட்பட பல மரக்கறிகளையும் இறக்குமதி செய்கின்றபோது, அவற்றை உற்பத்தி செய்கின்ற விவசாயிகள் அழுதுபுலம்புவதையும் சொல்லொணாத் துயரங்களை அனுபவிப்பதையும் காண்கிறோம். அவர்கள் உற்பத்தியை மேற்கொள்வதற்குச் செலவழிக்கின்ற பெறுமதியைக்கூட விற்பனையின் ஊடாகப் பெறமுடியாமையால் மிகவும் கஷ்டப்படுகிறார்கள். இதுகுறித்து கடந்த காலங்களிலே விவசாயிகளுக்காகப் பல போராட்டங்களை முன்னெடுத்த, அவர்களுக்காக முன்னின்ற அமைச்சர் வசந்த சமரசிங்ஹ அவர்களுக்கு, கமத்தொழில் அமைச்சு போன்ற இன்னோரன்ன அமைச்சுகளுடன் இணைந்து எதிர்காலத்திலே இவ்வாறான நிலைமை வராமல் பாதுகாக்க வேண்டிய தார்மீகப் பொறுப்பு இருக்கின்றது என்பதை இந்த உயரிய சபையிலே சொல்லிவைக்க விரும்புகின்றேன்.

அதேபோல, திருகோணமலை மாவட்டத்தில் முத்துநகர் பிரதேச விவசாயிகள் தங்களுடைய காணிகளைத் தங்களுக்குத் தாருங்கள் எனக் கேட்டுத் தொடர்ந்தேர்ச்சியாகப் போராட்டங்களை நடத்தி வருகின்றார்கள். 1983ஆம் ஆண்டுக்குப் பிறகு அவர்களால் தொடர்ந்தேர்ச்சியாக விவசாயம் செய்யப்பட்டு வந்த அந்தக் காணிகள் தங்களுக்குரியதெனத் தெரிவித்து, துறைமுக அதிகாரசபையினர் வழக்குத் தாக்கல் செய்திருக்கின்றனர். அதாவது, கடந்த வருடம் அங்குள்ள ஒரு குளத்தைப் புனரமைப்புச் செய்வதற்கு நிதி ஒதுக்கப்பட்டு, அந்தக் குளத்தை புனரமைக்கச் சென்றபொழுது, குறித்த காணியில் விவசாயம் செய்ய முடியாமல் அவர்கள் தடுக்கப்பட்டிருக்கின்றனர். அந்த மக்களுக்கு விவசாயத்தை விட்டால் வேறு வழியில்லை. அவர்கள் தம்புள்ளையில் உள்ளவர்களாக இருக்கலாம் அல்லது நுவரெலியாவில் உள்ளவர்களாக இருக்கலாம் அல்லது முத்துநகரில் உள்ளவர்களாக இருக்கலாம்! அந்த விவசாயிகளைப் பாதுகாக்க வேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. அவர்களுக்கு அந்தக் காணியைக் கொடுக்க முடியாவிட்டால், அதற்கு மாற்றீடாக அருகில் உள்ள காணிகளை வழங்குங்கள்!

இன்றும்கூட, நான் திருகோணமலை மாவட்ட NPP பாராளுமன்ற உறுப்பினர் கௌரவ ரொஷான் அவர்களுடன் பேசியபோது அவர் சொன்னார், “குறித்த காணிக்கு முன்னால் இருக்கின்ற காணியை மாற்றுக் காணியாகக் கொடுப்பது சம்பந்தமாகத்தான் நாங்கள் முயற்சி செய்கின்றோம், பரிசீலிக்கின்றோம்” என்று. நான் அவரிடத்தில் சொன்னேன், “அதை ஒரு வாக்குறுதியாக அந்த மக்களுக்கு கொடுங்கள்!” என்று. ஏனென்றால், அவர்கள் இன்றுவரை ஜனாதிபதி செயலகத்துக்கும் பிரதமர் அலுவலகத்துக்கும் பலமுறை அலைந்து திரிகின்றார்கள். சாதாரணமாக விவசாயத்தைச் செய்து வாழ்ந்தவர்களுக்கு வேறு தொழில் தெரியாது. விவசாயத்தை விட்டால் அவர்களுக்கு இன்னொரு தொழில் செய்ய முடியாமையால் பல நூறு விவசாயக் குடும்பங்கள் கஷ்டப்படுகின்றன. அத்துடன் அது Department of Wildlife Conservation இற்குச் சொந்தமான காணியென்றும் அவர் சொன்னார். அண்மையில்தான் அது தொடர்பாக gazette பண்ணப்பட்டிருக்கின்றது. அது பாரம்பரியமாக Department of Wildlife Conservationஇற்குச் சொந்தமான காணியல்ல. முன்னொரு காலத்திலே முன்னாள் அமைச்சர் தயா கமகே அவர்கள் அம்பாறை மாவட்டத்திலே நகரத்தைச் சுற்றியிருந்த Department of Wildlife Conservationஇற்குச் சொந்தமான ஆயிரக்கணக்கான ஏக்கர் காணிகளை விடுவித்து அங்குள்ள விவசாயிகளுக்கும் அங்குள்ளவர்களுக்கும் கொடுத்திருந்தது எனக்கு ஞாபகமிருக்கின்றது. எனவே, சட்டங்கள் மக்களுக்காகத்தான் இருக்கின்றது.

கௌரவ அமைச்சர் வசந்த சமரசிங்ஹ அவர்கள் இங்கே இருக்கின்றார். திருகோணமலை மாவட்ட சிங்கள, முஸ்லிம், தமிழ் மக்களுடைய ஒட்டுமொத்த வாக்குகளைப் பெற்று வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சராக ஒருவரும், பாராளுமன்ற உறுப்பினராக ஒருவரும் இம்முறை உங்களுக்குக் கிடைத்திருக்கிறார்கள். எனவே, அந்த மக்களுக்கான தீர்வை ஆளுங்கட்சியில் இருக்கின்ற நீங்கள்தான் கொடுக்க முடியும். எதிர்க் கட்சியினரான நாங்கள் அங்கு போய்ப் பார்க்கவும் பேசவும் அவர்களுடைய குறைகளை இங்கே வந்து சொல்லவும்தான் முடியும். எனவே, தயவுசெய்து ஓரிரு தினங்களுக்குள்ளே இது சம்பந்தமாக ஓர் இறுதி முடிவை அவர்களுக்கு அறிவித்து, அந்த Department of Wildlife Conservationஇற்குச் சொந்தமான காணியையாவது alternative காணியாக விவசாயிகளுக்கு வழங்கி அவர்கள் விவசாயத்தைச் செய்வதற்குரிய நடவடிக்கைகளை உடனடியாக எடுக்க இந்த அரசாங்கம் முன்வர வேண்டும். கௌரவ பிரதமர் அவர்கள் பத்து நாட்களில் தீர்வு தருவதாகச் சொன்னதாகச் சொன்னார்கள். அதன் பிறகு மேலும் பத்து நாட்கள் காத்திருக்குமாறு சொன்னதாகவும் இரண்டாவது தடவை கோரிய பத்து நாட்களும் கடந்த 20ஆம் திகதியுடன் முடிவடைந்ததாகவும் சொல்கின்றார்கள். அவர்களைப் பொறுத்தவரையிலே, வேறு வழியில்லாமல்தான் அரசாங்க அதிபருடைய அலுவலகத்திற்கு முன்னால் ஆர்ப்பாட்டத்தை மேற்கொள்கின்றார்கள். இது நல்லதல்ல! தயவுசெய்து அவர்களுடைய கோரிக்கைக்குச் சாதகமான தீர்வாக, குறிப்பிட்ட ஒரு காலகட்டத்துக்குள் Department of Wildlife Conservationஇற்குச் சொந்தமான காணியை அந்த மக்கள் விவசாயம் செய்வதற்காகப் பெற்றுக்கொடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

அதேபோல, இன்னுமொரு பிரச்சினை பூதாகரமானதாகிக் காணப்படுகின்றது. புல்மோட்டையில் உள்ள கனிய மணல் கூட்டுத்தாபன ஊழியர்கள் கடந்த இரண்டு தினங்களாக ஆர்ப்பாட்டம் ஒன்றை LMSL, Lanka Mineral Sands Limitedஇற்கு முன்னால் மேற்கொண்டு வருகின்றார்கள். புல்மோட்டையில் உள்ள கனிய மணல் கூட்டுத்தாபனம் அந்த வளத்தின்மூலம் மில்லியன் டொலர் கணக்கான வருமானத்தை நாட்டுக்கு ஈட்டிக் கொடுக்கின்றது. அங்கு முன்னாள் அமைச்சர் ஒருவர் - உங்களுடைய காலத்து அமைச்சர் அல்ல - காலியைச் சேர்ந்தவர் - 2023ஆம் ஆண்டு 10ஆம் மாதம் 40 பேரை நியமித்திருக்கின்றார். அந்த 40 பேரும் காலி

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

மாவட்டத்தைச் சேர்ந்தவர்கள். அந்த 40 பேரில் 17 பேர்தான் மீதமாக இருக்கின்றார்கள். ஏனையவர்கள் தொழிலைக் கைவிட்டுச் சென்றுவிட்டார்கள். புல்மோட்டையிலே கனிய மணல் கூட்டுத்தாபனம் உள்ளதால் அங்குள்ள மக்கள் ஆர்ப்பாட்டம் செய்து தங்களுக்கும் நியமனம் தாருங்கள் என்று கேட்டபொழுது, 2024ஆம் ஆண்டிலே அந்த ஊரைச் சேர்ந்த 34 பேரை நியமித்திருக்கின்றார்கள். அவர்களுக்கு மூன்று மாத காலம் சம்பளம் வழங்கப்பட்டுள்ளது; உங்களுடைய அரசாங்கம் வந்த பிறகு சம்பளம் வழங்குவது நிறுத்தப்பட்டிருக்கின்றது. அதேபோல, 2024ஆம் ஆண்டு 07ஆம் மாதம் 46 பேரை நியமித்திருக்கின்றார்கள். அந்த 46 பேரும் இன்று வரை வேலை செய்கின்றார்கள்; சம்பளம் வழங்கப்படவில்லை. அதன்பிறகு 2024ஆம் ஆண்டு 08ஆம் மாதம் 11 பேரை நியமித்திருக்கின்றார்கள். அந்த 91 ஊழியர்களும் சம்பளமில்லாமல் 15 மாதங்களாக வேலை செய்து கொண்டிருக்கின்றார்கள். அவர்கள் அந்த ஊரைச் சேர்ந்தவர்கள்; அந்த ஊரைச்சுற்றியுள்ளவர்கள்.

இந்த கனிய மணல் கூட்டுத்தாபனத்தினால் அங்கு நிறையப்பேர் புற்றுநோயினால் மரணித்திருக்கின்றார்கள். அந்தப் பகுதியிலுள்ள மக்களுக்குப் பல பாதிப்புக்கள் இருக்கின்றன. அந்த கனிய மணல் கூட்டுத்தாபனத்தின்மூலம் கிடைக்கின்ற பணம் இந்த நாட்டுக்கு வருவாயாக வந்துகொண்டிருக்கின்றது. அவ்வாறு இருக்கின்றபொழுது வேறு மாவட்டங்களில் இருக்கின்றவர்களுக்குத் தொழிலையும் சம்பளத்தையும் கொடுத்துவிட்டு, அங்கிருக்கின்றவர்களுக்கு அவர்களின் வேண்டுகோளின் பேரிலே ஆர்ப்பாட்டத்திற்குப் பிறகு தொழிலைக் கொடுத்துவிட்டுச் சம்பளம் கொடுக்காமல் வேலை வாங்கிக்கொண்டிருப்பது நியாயமானதா? என்று நான் இந்த அரசாங்கத்திடம் கேட்கின்றேன்.

ஆகவே,இந்த விடயத்திலே கவனம் செலுத்தி, LMSL, Lanka Mineral Sands Limited இல் கடமையாற்றும் 91 ஊழியர்களுக்குமுரிய சம்பளத்தை வழங்குவதற்கு நடவடிக்கை எடுக்குமாறு அரசாங்கத்திடம் நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

எங்களுடைய அமைச்சர் அவர்கள் தம்புத்தேகமவைச் சேர்ந்தவர்; அதேபோல மாண்புமிகு ஜனாதிபதி அவர்களும் அந்த மாவட்டத்தைச் சேர்ந்தவர். எங்களுடைய பிரதி அமைச்சர் உபாலி சமரசிங்ஹ அவர்களும் விவசாய மாவட்டமான வவுனியாவைச் சேர்ந்தவர். விவசாயிகளுடைய பிரச்சினை உங்களுக்கு நன்றாகத் தெரியும். அவர்களின் விடயத்திலே கருணை காட்டுங்கள்! நாங்கள் அரசியலாக இதைப் பேசவில்லை. விவசாயிகள் நொந்து, வேதனைப்பட்டு வாழ முடியாமல் கஷ்டப்பட்டுக் கொண்டிருக்கின்றார்கள். அவர்களைப் பாதுகாப்பதற்கான முறையில் எதிர்காலத்தில் உங்களுடைய செயற்பாடுகளை முன்னெடுங்கள்! இன்று பல 'சதொச' நிறுவனங்கள் மூடப்பட்டுள்ளன. நீங்கள் அல்ல, இதற்கு முன்னர் இருந்த கோட்டாபய ராஜபக்ஷ அரசாங்கம் நான் ஆரம்பித்த 'சதொச' நிறுவனங்களை மூடியது. அவற்றை மீளத் திறப்பதன் ஊடாக விவசாய உற்பத்திப் பொருட்களை மக்கள் வாங்குவதற்கும் விற்பதற்குமான வழிமுறைகளைச் செய்து, மக்களுக்குச் சாதாரண விலையில் பொருட்களை வழங்குங்கள்! என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.53]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2වන වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සම්බන්ධයෙන් වන නියමය පිළිබඳවත් අද විවාද කෙරෙනවා. ඒ යටතේ අද විශේෂයෙන් සාකච්ඡාවට ගන්නේ අලවලට සහ ලූනුවලට පනවපු බද්ද පිළිබඳවයි. අපි පසුගිය දවස්වල ලූනු කිලෝග්‍රෑමයක් ආනයනයේදී පනවපු රුපියල් 10ක බද්ද, රුපියල් 50ක් කළා. ඒ කියන්නේ, රුපියල් 40කින් බද්ද වැඩි කළා. ඒ වාගේම අල කිලෝග්‍රෑමයක් ආනයනයේදී පනවා තිබුණු රුපියල් 50ක බද්ද රුපියල් 30කින් වැඩි කර, රුපියල් 80ක් කළා. අපි එහෙම කළේ දේශීය අල සහ ලූනු ගොවියාගේ අලවලටත්, ලූනුවලටත් යම් මිලක් වෙළෙඳ පොළ තුළ පවත්වා ගන්නයි. මොකද, ඒ අය අපේ රටේ පරිභෝජනයට අවශ්‍ය අල සහ ලූනු නිෂ්පාදනයෙන් යම් කොටසක් සම්පූර්ණ කරනවා. ඒ අය නිෂ්පාදනවල රඳවා තබා ගැනීමේ අවශ්‍යතාව වෙනුවෙන් තමයි එම තීරණය ගත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සාකච්ඡාව අතරතුර තව බොහෝ කථා බහ එකතු වුණා. ඒ නිසා මම හිතුවා, එම සමහර කථා බහවලට උත්තරයක් දෙන එක හොඳයි කියලා. මොකද, අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ආසන්නයේ තිබෙන අපේ cool room එක සම්බන්ධයෙන් කථා කළා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ විවිධ අදහස් ඉදිරිපත් කරන මන්ත්‍රීවරු මට හිතෙන්නේ තමන්ට හිතෙන දේවල් කියාගෙන යනවාය කියන එකයි. මොකද, මේක පාර්ලිමේන්තුව නේ. එහෙම නේද, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි? දැන් ඉස්සර වාගේ නොවෙයි නේ. පාර්ලිමේන්තුවේ කියන ඕනෑ එකක් live දෙනවා. ඒ නිසා තමන්ට හිතෙන එකක් දැන් කිව්වාම, ඒ වෙලාවේදීම ඒක ප්‍රචාරය වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් ඒ කියන හැම දෙයක්ම ඇත්ත නොවෙයි. ඕනෑ බොරුවක් කියනවා. මන්ත්‍රීවරු වුණාම වගකීමකින් කථා කරන්න ඕනෑ නේද, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි? ඇත්ත කිව්වා නම් ප්‍රශ්නයක් නැහැ. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියපු සමහර කරුණු ඇත්ත. විපක්ෂය ඉදිරිපත් කරන සමහර කරුණුත් අපි අවධානයට ලක් කරනවා. මොකද, අල, ලූනු සම්බන්ධයෙන් වාගේම සහල් ආනයනය සම්බන්ධයෙනුත් පට්ටපල් බොරු කියනවා. බොරු කියලා සභාවෙන් යනවා. ඒක නේ කෙරෙන්නේ.

ලූණු සම්බන්ධයෙන් කිව්වොත්, අපි ලූණු ගැන කථාව පාර්ලිමේන්තුවේ කථා කරලා අවසන් කළා. ලංකාවට ලූණු ගෙනෙන්න අපි අවසර දුන්නේ ලූණු හිඟයක් ආපු නිසා. ලූණු ගෙනෙන්න කියලා කිව්වා. ඒ නිසා ලූණු ගෙනාවා. හැබැයි, ලූණු ගෙන්වන්න දුන් කාලය ඉක්මවා ලූණු ගෙනාවා. Sri Lanka Customs එකේ නීතිය අනුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, ලූණු ගෙනෙන්න දුන් කාලය ඉක්මවා ලූණු ගෙනාවාම Customs එක කරන්නේ මොකක්ද? වරායෙන් නැව්ගත කළ දිනයට CUSDEC එක දාන්න තිබෙනවා. Bill of Lading නැව්ගත කළ දිනයට පසුව නම් තිබෙන්නේ නිදහස් කරන්නේ නැහැ. ඒගොල්ලන් ඒකට සැහෙන කල් පොර බැදුවා; ඔට්ටු වුණා. ඔක්කෝම කන්ටේනර් 560කට ආසන්න ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. නමුත්, කන්ටේනර් 800ක් කියලා ඔහේ කියනවා, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි. ඔබතුමාට ඒ ගැන මතක ඇති. මොකද, ඔබතුමාත් හිටියා නේ පාර්ලිමේන්තුවේ. ඔහේ කියනවා,

800ක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරු හොර CUSDEC හදලා bulk වශයෙන් ගෙනාවා, ත්‍රිකුණාමල වරායට. Bulk වශයෙන් කන්ටේනර්වල ගෙනාවා, ටොන් 10,000ක්. ලුණු මෙට්‍රික් ටොන් 186,000ක් ගෙනාවා. අවුරුද්දකට අපේ රටේ මිනිසුන්ට ලුණු අවශ්‍ය මෙට්‍රික් ටොන් 170,000යි. අපි දවස් 20ට මෙට්‍රික් ටොන් 180,000ක් ලුණු ගෙනාවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආනයන ගැන ප්‍රශ්න අහනවා නේ, අපේ රටේ අය. දවස් 10න්, 12න් බඩු ගෙනෙන්නේ කොහොමද කියලා අහනවා. එහෙම නේද, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි? ලංකාවේ ආනයනකරුවෝ බඩු ගෙනෙන හැටි කොහොමද කියලා ඇහුවොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දවස් තුනෙන් නොවෙයි, දවසෙනුත් බඩු අරගෙන එනවා, ඉන්දියාවේ වරාය ආසන්නයේ ලොරි ගහගෙන ඉන්නවා වාගේ. අපටත් තිබෙන ප්‍රශ්නය ඒකයි. දැන් මේ ලුණු කථාව කාගේ හරි හිතවතෙකුගේ වුවමනාවට කරන්නේ. එම නිසා ආණ්ඩුව නිශ්චිතව තීරණයක් ගත්තා, ඒ ලුණු නිදහස් කරන්නේ නැහැ, එහෙම නිදහස් කරන්න බැහැ කියලා. අපි ගත්ත තීරණය අනුව කැබිනට් මණ්ඩලය තීරණය කළේ, Bill of Lading තිබෙන්නේ නැව්ගත කළ දිනයට පසුව නම් නිදහස් කරන්නේ නැහැ කියායි. ඒ අදාළ නැව්ගත කළ දිනය තිබෙනවා. එදාට පසුව නැව්ගත කරන ඒවා නිදහස් කරන්නේ නැහැ. ඒක නිශ්චිතයි. එතකොට ආනයනකරුවා දන්නවා, මේක තමයි දිනය කියලා. හොරට බිල් හදලා තිබුණා. හොරට නැව්ගත කළ දින හදලා තිබුණා. CUSDEC හදලා තිබුණා. ඒ විතරක් නොවෙයි, quality එක ෆේල් වුණු ඒවා තිබුණා. මඩත් එක්ක ලුණු ගෙනැල්ලා තිබුණා. කන්ටේනර් 560ක් තිබුණා. Sri Lanka Customs එක ඒවා නිදහස් නොකර තිබුණා. ඒ කන්ටේනර් 560න් දැන් සමහර ඒවා රාජ සන්තක වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් Sri Lanka Customs එකෙන් රාජ සන්තක කළාට පස්සේ ඒවා වෙන්දේසි කරන system එකක් තිබෙනවා. ඒ ක්‍රමයට කටයුතු කරනවා. රටේ ඇති තරම් ලුණු තිබෙනවා. හම්බන්තොට ලුණු ලේවායේ, අලිමංකඩ ලුණු ලේවායේ, පුත්තලම ලුණු ලේවායේ දැන් ලුණු කඩනවා. ගෙනාපු ලුණුත් තිබෙනවා. එම නිසා දැන් ලුණු කථාව ඉවරයි. නමුත් මොකක් හරි කියන්න ඕනෑ නිසා තමයි මේවා කියන්නේ.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මම සහල් සහ අල ගැන කියන්න කලින් ඔබතුමා මතු කරපු cool room එක ගැන කියන්න ඕනෑ. මොකද, ඉන්දියානු ආධාරයක් යටතේ තමයි ඒක හැදුවේ. ඔබතුමා කිව්වා වාගේ 2019දී තමයි හදන්න පටන් ගත්තේ. CECB එක තමයි අපේ consultant. ඉන්දියානු කොන්ත්‍රාත් සමාගමක් තමයි ඒක හදන්නේ. ගරු මන්ත්‍රීතුමනි, සැප්තැම්බර් මාසයේ 22වැනිදා ඒ contractor ගෙනැල්ලා, CECB එකත් ගෙනැල්ලා කිව්වා, ඔබ දැන් මේකේ වැඩ අවසන් කරන්න කියලා. අපට ප්‍රශ්න තුනක් තිබුණා. වහලයෙන් තෙමෙනවා, පොළොව balanced නැහැ. ඒ වාගේම එහි කටයුතු සඳහා අඩි 20ක් උසට racks ගහන්න ඕනෑ. ඒවායේ තමයි බඩු දාලා හසුරුවන්නේ. ඒක ඇතුළේ දුවන පොඩි වාහන අවශ්‍යයි. ඒ වාගේම පොළොව balance වෙන්න ඕනෑ. ඒ නිසා පොළොව හදන්න, වහලයේ තෙමෙන එක හදන්න, අපට ඒ වාගේ issues තුනක් තිබුණා. ඒ issues තුන අපට address කරන්න කිව්වා. පොළොව හරියට balance කරලා දෙන්න ඕනෑ, වහලයේ තෙමෙන එක හදන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ප්‍රධානම ප්‍රශ්නය විධියට cooling system එකේ machinesවල ප්‍රශ්නයක් තිබෙනවා. ඔහු කියනවා, "මට දමපු ToR අනුව මට තිබෙන්නේ, බඩු දැම්මාට පස්සේ සියයට 5ට අඩුවෙන් තියන්න, මම කූල් කරලා දෙන එකයි" කියලා. ඒක තමයි ඔහු ToR එක අනුව හදලා තිබෙනවා කියන්නේ. මේ ප්‍රශ්න ඔක්කෝමත් එක්ක අපි පසුගිය 22වැනිදා සාකච්ඡා කළා. අපි ඔහුට කිව්වා, මේ මාසය ඇතුළත එහි වැඩ අවසන් කරන්න ඕනෑ, දෙසැම්බර් මාසයේ මුල ඉඳලා අපට එහි වැඩකටයුතු පටන් ගන්න අවශ්‍යයි කියලා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මේ අවුරුද්දේ Budget එකෙන් racksවලට රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා. නිකම් බඩු අහුරන්න බැහැ. එම racksවලට සහ ඇතුළේ දුවන වාහනවලට රුපියල් මිලියන 360ක් ඕනෑ. උඩට උස්සන, පහළට ගන්න අවශ්‍ය ඒක ඇතුළේ දුවන forklifts ඕනෑනේ. බඩු අසුරන්න අවශ්‍ය racks ඕනෑ. ඒ වාගේම cubicles 6ක් තිබෙනවා. එතැන ටොන් 5,180ක් දමන්න පුළුවන්. ඒ වාගේ අවශ්‍යතා තිබෙනවා. මේ නිසා ඒකට අවශ්‍ය කරන තාක්ෂණික ක්‍රියාවලිය නැතුව අපි භාර ගත්තොත් වෙන්නේ මොකක්ද? අපි වැරදිකාරයෝ වෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඒ කොන්ත්‍රාත්කරුවා ගෙන්වලා ඇහුවාම ඔහු මොකක්ද කියන්නේ? CECB එක consultant විධියට අපට කියනවා, "මෙයා කොන්ත්‍රාත් කටයුතු නියමිත කාලයට වඩා වැඩි කාලයක් ප්‍රමාද කළා" කියලා. ඔබතුමා ඒක පිළිගන්නවානේ. 2019දී තමයි ඒක හදන්න දුන්නේ. දැන් 2025. වැඩි කාලයක් අරගෙන තිබෙනවා. එම නිසා ප්‍රමාද වුණු කාලයට අදාළව liquidity charges විධියට රුපියල් මිලියන 60ක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. Contractor කියනවා, "මගෙන් ඒක අඩු කරනවා නම් මට හදන්න බැහැ" කියලා. දැන් අපි මොකක්ද කරන්නේ? ඒක ඉන්දියානු රජයේ ආධාරයක්. ඒ වාගේම අපිත් කටයුතු කරන්නේ රජයක් විධියට. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, එම නිසා අපි දෙගොල්ලෝම මේක කථා කරලා බේරා ගන්නත් ඕනෑනේ. ඒක ඉන්දියානු රජයේ ආධාරයක් හැටියට ගෙනාවේ. මෝදි අගමැතිතුමා ආපු වෙලාවේ අපි ඒක නිල වශයෙන් විවෘත කළා. එම නිසා අපට ඒ කටයුත්ත අවසන් කරන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ඇමතිතුමනි,-

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔබතුමා කිව්ව එක හරි. ඇත්ත වශයෙන්ම ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට 2020දී, එහෙම නැත්නම් 2021දී ඒක විවෘත කරන්න තිබුණා. ඔහොම නිකම් තිබෙනකොට වහලවල්වලින් වතුර ලීක් වෙනවා, අනම්මනම් ප්‍රශ්න වෙනවා. ඒක අපි පිළිගන්නවා. ඒකේ විවාදයක් නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක නිසානේ ගරු මන්ත්‍රීතුමා, මාර්තු මාසයේ මෝදි අගමැතිතුමා ආපු වෙලාවේ අපි ඒක නිල වශයෙන් විවෘත කළේ. මම ගිය මාසයේ World Food India 2025 Summit එකට ඉන්දියාවට ගියා. මම ඉන්දියාවේ ආහාර සුරක්ෂිතතා ඇමතිවරයා හමුවෙලා අපිත් එක්ක කරපු සාකච්ඡාවේදී - courtesy meeting එකේදී - ඔහු මගෙන් ප්‍රශ්න දෙකක් ඇහුවා. එක ප්‍රශ්නයක් තමයි දඹුල්ලේ මෙම ඉදිකිරීම. ඒ කියන්නේ, මීට අවුරුදු 6කට කලින් අපේ රටේ cool room එකක් හදන්න ඒ අය අපට ආධාරයක් කළා. මේ කරපු අපරාධය ගැන ඔහු අපෙන් ඇහුවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට තත්පර 30ක කාලයක් දෙන්න, ගරු ඇමතිතුමා.ඒ පිළිබඳව අපට ඇඟිල්ල දිගු කරන්න එපා, ගරු ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, නැහැ, ඔබතුමාට ඇඟිල්ල දිගු කළේ නැහැ. ඔබතුමා පෙන්වා දුන් කරුණු අනුව මේකේ තිබෙන අඩු පාඩු ගැනයි මම කිව්වේ, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා ගත්ත උත්සාහය වාගේම, පසුගිය දවස්වල සමහරු; අර වහගෙන හිටපු කට්ටියත් ගේට්ටුව ළඟට ගිහිල්ලා ආවානේ, ගරු හර්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමා ගියේ නැහැ. මම දැක්කා, කට්ටිය ගිහිල්ලා ඉන්නවා. එහෙම නේද? පසුගිය අවුරුදු 5ක් තුළම ඒක විවෘත කරන්නේ නැතුව හිටපු අය ගිහිල්ලා කියනවා, මෙන්න මේක වහලා කියලා. ඔව්, අවුරුදු 4ක්, 5ක් විතරම මේක තමයි වෙලා තිබුණේ. අපි ඇවිල්ලා මාර්තු මාසයේ ඒක නිල වශයෙන් විවෘත කළා. ගරු අනුර දිසානායක ජනාධිපතිතුමාත්, මෝදි අගමැතිතුමාත් ඒක නිල වශයෙන් විවෘත කළා. අපි ඒකේ operations පටන් ගන්න ලැහැස්තියි. Budget එකෙන් මුදල් වෙන් කරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඉතින්, Budget එකෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. Contractor අපට වැඩ අවසන් කරලා දෙන්න ඕනෑ. අපේ consultant කියනවා, ප්‍රමාදය වෙනුවෙන් රුපියල් මිලියන 60ක් කපන්න ඕනෑ කියලා. Contractor කියනවා, මිලියන 60ක් කැපුවොත් මට මේක කරලා වැඩක් නැහැ කියලා. ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයේ නිලධාරිනුත් අපිත් එක්ක මේ ගැන සාකච්ඡා කළා. අපි කිව්වා, "මේක සුහදව විසඳාගමු. මේක ඔබතුමන්ලාගේ ආධාරයක්, අපේත් මුදල් වෙන් කර තිබෙනවා. මේ වැඩේ කෙරෙන්න ඕනෑ" කියලා. දෙසැම්බර් මාසයේ මුල වෙනකොට අපි කොහොම හරි එහි වැඩකටයුතු පටන් ගන්න සුහදව කථා කරලා ඉවර කර ගන්න තමයි අපි දැන් හදන්නේ, ගරු මන්ත්‍රීතුමා. ඒ සඳහා තමයි අපි දැන් කටයුතු ලැහැස්ති කරන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ඇමතිතුමනි, මට තත්පර 30ක කාලයක් දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු හර්ෂ මන්ත්‍රීතුමා, තත්පරය, තත්පරය කියලා ඔබතුමා මගේ කාලය ගන්නවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔබතුමා කිව්ව කාරණය හොඳයි. නමුත්, අවුරුදු 5ක් තිස්සේ විවෘත කළේ නැති එකට ඒ අසරණ මනුෂ්‍යයාට කරන්න දෙයක් නැහැනේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි මම කිව්වේ. අපි ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයටත් කිව්වා. මේ කරපු damage එක නිසා ඒ contractorටත් ඒක අවාසියක් තමයි. ඒ මනුෂ්‍යයා හදලා දුන්නු කාලයේ විවෘත කළා නම්, මේ ප්‍රශ්නය වෙන්නේ නැහැ නේ. ඔබතුමා කියන එක හරි. නමුත් ආණ්ඩුවක් හැටියට අපි කටයුතු කිරීමේදී, Procurement Guidelines තිබෙනවා; ඒවා follow කරන්න ඕනෑ. ඒ කරන ඒවාට audit queries එන්න පුළුවන්. ඒ නිසා අපි කැබිනට් මණ්ඩලයට දාලා අනුමැතියක් ගන්න ඕනෑ. අපි මොනවා හරි කරලා ඒක කරන්න ඕනෑ. අපි CECB එකටත් කිව්වා, ඔය ගොල්ලන් මේක කියන්න කියලා. Contractorටත් කිව්වා, අපි මේක පටන් ගන්න ඕනෑ කියලා. අපි Budget එකෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. අපි රාක්ක ටික ගෙනෙන්න ඕනෑ; forklifts ටික ගන්න ඕනෑ. දෙසැම්බර් මාසයේ මුල අපි මේක පටන් ගන්නවා. ඒ පටන් ගන්න අවශ්‍ය කරන මුදල් ටිකත් අපි වියදම් කරන්න ඕනෑ. මොකද, Budget එකෙන් මුදල් වෙන් කරලායි තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ඇමතිතුමනි, ඉතා වැදගත් කාරණයක් කියන්න තිබෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා මාගේ වෙලාව ගන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
( மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔබතුමා ඇමති නේ. මම ඕනෑ වෙලාවක සූදානම් ඔබතුමාත් එක්ක මේක ගැන සාකච්ඡා කරන්න. මේ තිබෙන්නේ Business Plan එක. මේ Business Plan එකේදී ආණ්ඩුව වියදම් කරන්න ඕනෑ නැහැ, forklifts ගන්න. ඕනෑ තරම් රාජ්‍ය-පෞද්ගලික ක්‍රමයකට මේක කරන්න පුළුවන්. Farmers' associations එකතු කර ගන්න පුළුවන්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියන්නේ මුළු එකටම අදාළව නේ. මේකේ තිබෙනවා, chambers හයක්. Chambers හයම ක්‍රියාත්මක කරනකොට සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවත්, ලංකා සතොස ආයතනයටත් chambersවලින් එකක් හෝ දෙකක් දෙන්නත්, අනෙක් ඒවා පෞද්ගලික අංශයත් එක්ක ඒකාබද්ධව ක්‍රියාත්මක කරන්නත් තමයි අපි plan කරන්නේ. අපට Business Plan එකක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. වැඩේ තිබෙන්නේ ඒක පටන් ගන්න contractorගෙන් බේරා ගන්න එපායැ. ඒක බේරාගෙන අපි මේක පටන් ගන්නවා. මේ ඉතිහාසයේ, පරණ පව් තමයි, ගරු මන්ත්‍රීතුමනි. ඒක නිවැරැදි කරන්න එපායැ. ඒක නිසා අපි මේ අවුරුද්ද ඇතුළත ඒ කටයුතු අවසන් කරලා සක්‍රිය කරන්න අවශ්‍ය කරන කටයුත්ත අපේ ආණ්ඩුව විසින් කරනවා. ඒකට අදාළ මුදල් වෙන් කරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* Okay, thank you.

මේ කථාව අස්සේ අල සහ ලූනු පිළිබඳ කථාවත් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා අල, ලූනු කථාව නිකමට කියාගෙන යනවාද කියලා මට හිතුණා. සමහර කථා කියාගෙන යනකොට නිකම්ම කියාගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල සහ ලූනු ප්‍රශ්නයේදී ටිකක් බරපතළ වන්නේ ලූනු ප්‍රශ්නය. සාමාන්‍යයෙන් ලංකාවේ මිනිස්සු මාසයකට ලූනු පරිභෝජනය කරනවා, මෙට්‍රික් ටොන් 30,000කට ආසන්න ප්‍රමාණයක්. ඒකේ average එක මෙට්‍රික් ටොන් 25,000යි - 30,000යි අතර. ලූනු මෙට්‍රික් ටොන් 30,000කට ආසන්න ප්‍රමාණයක් සාමාන්‍යයෙන් පරිභෝජනය කරනවා. ඒක කියන්නේ

කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 ජනවාරි මාසයේ ඉඳන් ලංකාවට ආනයනය කරන ලද ලොකු ලූනු ප්‍රමාණය ජනවාරි මාසයේ මෙට්‍රික් ටොන් 28,565යි; පෙබරවාරි මාසයේ මෙට්‍රික් ටොන් 29,199යි; මාර්තු මාසයේ 17,317යි; අප්‍රේල් මාසයේ 28,494යි; මැයි මාසයේ 28,722යි; ජූනි මාසයේ 30,597යි; ජූලි මාසයේ 27,900යි; අගෝස්තු මාසයේ 25වැනි දා වෙනකොට 26,200යි; අගෝස්තු 31වැනි දා වෙනකොට 29,600යි. ඒ කියන්නේ සාමාන්‍යයෙන් මාසයකට මෙට්‍රික් ටොන් 30,000කට ආසන්න -මෙට්‍රික් ටොන් 27,000ත් - 30,000ත් අතර average එකක් - ලූනු අපි ආනයනය කරනවා. යල කන්නය තමයි අපේ ලූනු අස්වැන්න වැඩිම කන්නය. මේ කන්නයේ අපේ ලූනු අස්වැන්නේ forecast එක තිබුණේ, මෙට්‍රික් ටොන් 50,000යි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ලූනු අවශ්‍යතාව මාසයකට මෙට්‍රික් ටොන් 25,000යි කියලා කියන්නේ, අවුරුද්දකට මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් අවශ්‍ය වෙනවා කියන එකයි. අඩුම බැලුවත් මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් පරිභෝජනය කරනවා. මාස දෙකක ලූනු තමයි අපි හදන්නේ. මාස දහයක ලූනු ආනයනය කරන්න වෙනවා. මම අහගෙන කියනවා, "මාස තුනකට ලූනු ගෙනැල්ලා ගබඩා කරලා තියාගෙන ඉන්නවා. ඒවා තිබෙද්දී තමයි මේ බදු ගැහුවේ" කියලා. අනේ පව්! අඩුම ගණනේ Sri Lanka Customsහි data බලන්න ඕනෑ. එහෙම නැත්නම් මේවාට එන data බලන්න ඕනෑ. ඊට කලින් ඇවිල්ලා තිබෙන data බලන්න ඕනෑ. මම මීට කලිනුත් කිව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරු හිතුණු ගමන් බොරු ඕනෑ එකක් කියාගෙන යනවා. අගෝස්තු මාසයේම ඇවිල්ලා තිබෙන්නේ මෙට්‍රික් ටොන් 29,000යි. අපි බද්ද ගැහුවේ 25වැනි දා. 25වැනි දා වෙනකොට ඇවිල්ලා තිබෙන්නේ මෙට්‍රික් ටොන් 26,000යි. අපේ ගරු රංජිත් මන්ත්‍රීතුමනි, 25වැනි දාට කලින් මෙට්‍රික් ටොන් 50,000ක් ඇවිල්ලා තිබුණා නම්, අන්න කියන්න පුළුවන් බද්ද ගහන්න කලින් ලූනු මෙට්‍රික් ටොන් 25,000ක් විතර වැඩියෙන් ගෙනැල්ලා ගබඩා පුරවාගෙන තිබුණා. අන්න ආණ්ඩුව හිතවතුන්ට ලූනු ගෙනෙන්න කියලා අවස්ථාව දීලා ලූනු ගෙනාවා කියලා. එහෙම කරලා නැහැ. අපට average එක විධියට ගත්තොත් දවසකට මෙට්‍රික් ටොන් දාහයි ඕනෑ. ඇවිල්ලා තිබෙන්නේ එච්චරයි.

හැබැයි, ඒකේ අනෙක් කථාව මොකක්ද? පසුගිය 25වැනි දා අපි බදු ගැහුවා. ගරු ගයන්ත මන්ත්‍රීතුමනි, බදු ගැහුවාට පස්සේ ලූනු එන එක අඩු වෙලා තිබෙන්නේ. 25වැනි දායින් පස්සේ අපේ රටේ ලූනු ආපු ප්‍රමාණය ගත්තාම අගෝස්තු මාසයේ 25වැනිදා ඉඳන් අගෝස්තු 31 වෙනකොට මෙට්‍රික් ටොන් 3,071යි, දවස් හතකට. ඊට පස්සේ සැප්තැම්බර් මාසයේ 01වැනි දා සිට සැප්තැම්බර් මාසයේ 28වැනි දා වෙනකල් මෙට්‍රික් ටොන් 7,202යි. සාමාන්‍යයෙන් මෙට්‍රික් ටොන් 30,000ක් ආපු ලූනු ප්‍රමාණය දැන් එයින් හතරෙන් එකයි එන්නේ. ඇයි, දේශීයව නිෂ්පාදනය කරන ලූනු තිබෙනවා. ඊට පසුව ඔක්තෝබර් මාසයේ 01 වැනි දා ඉඳලා ඔක්තෝබර් මාසයේ 26 වනකල් CUSDEC දමා තිබෙනවා. අද 22 වැනි දා වුණාට 26 වැනි දා වනකල් CUSDEC ඇවිල්ලා තිබෙනවා, Sri Lanka Customs එකෙන්. Sri Lanka Customs එකේ data අනුව 26 වැනි දා වෙනකොට මෙට්‍රික් ටොන් 8,045ක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අනුව ගත්තාම මම මුලිනුත් කිව්වා වාගේ මාසයකට මෙට්‍රික් ටොන් 25,000ක් පරිභෝජනය කරනවා නම්, මාස 2ට 50,000යි. අපි මාස 2ට ලූනු මෙට්‍රික් ටොන් 50,000ක් ගෙනාවේ නැත්නම් වෙන්නේ පරිභෝජනයට දේශීය ලූනු ඕනෑ වෙන එකයි. හැබැයි, දේශීය ලූනු නිපදවා තිබෙන්නේ මෙට්‍රික් ටොන් 50,000යි. අපි ගෙන්වා තිබෙන්නේ ලූනු මෙට්‍රික් ටොන් 15,000යි. දැනට අපි දේශීය ලූනු මෙට්‍රික් ටොන් 35,000ක් පරිභෝජනය කර තිබෙන්න ඕනෑ. එතකොට ලූනු මෙට්‍රික් ටොන් 50,000ක් අපි පරිභෝජනය කරන කොට, මෙට්‍රික් ටොන් 15,000ක් ආනයනය කර තිබෙනවා. දේශීය ලූනු මෙට්‍රික් ටොන් 35,000ක් පරිභෝජනයට ගියාම, මේ මාස 2 යනකොට ලූනු බෙහෙවින් අඩු වෙනවා. මේ ලූනු ප්‍රශ්නය ආවා, මීට සති 2-3කට කලින්.

පසුගිය මාසයේ 3 වැනි දා ඉඳලා අපි පෞද්ගලික අංශයත් එක්ක ඒකාබද්ධව; ආර්ථික මධ්‍යස්ථාන, පෞද්ගලික අංශය, ලංකා සතොස ඒකාබද්ධව රුපියල් 130 ගණනේ ලූනු මිල දී ගැනීම ආරම්භ කළා. එසේ ලූනු මිල දී ගැනීම ආරම්භ කළාට පසුව ලූනු වෙළෙඳ පොළ තුළ ලූනු කිලෝවක මිල ඉහළ යන්න පටන් ගත්තා; රුපියල් 150ට, 160ට මිල ඉහළ ගියා. අපි අල කිලෝවක් රුපියල් 210ට, 220ට ගන්න පටන් ගත්තා. නුවර එළියේ අල මිල රුපියල් 240, 250 දක්වාම ඉහළ ගියා. ඒ ආකාරයට වෙළෙඳ පොළ ඇතුළේ යම් උච්චාවචන සිද්ධ වෙනවා. අප ඒක පාවිච්චි කරන්නේ ගොවියාගේ මිල ආරක්ෂා කිරීමට මිස ඒ ඇතුළේ සදාකාලිකව උත්තර හොයන්න නොවෙයි.

මම අහගෙනයි සමහරු කියනවා, මාස 3කට කලින් බදු ගහන්න ඕනෑ කියා. මාස 3කට කලින් බදු ගැහුවා නම් ලූනු කන්න වෙන්නේ රුපියල් 600ට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම කියන්නේ ඒකයි. වචනවල තරමටම ඒවායේ තිබෙන අර්ථයත් තේරුම් ගන්න ඕනෑ. මොකද, මාස 3කට කලින් බදු ගැහුවා නම් ලූනු කිලෝවක් කන්න වෙන්නේ රුපියල් 600ට. රුපියල් 600ට ලූනු කන්න වුණා නම් පාරිභෝගිකයාට කියාවි, "අන්න ලූනු මිල වැඩි වෙලා; ආණ්ඩුව ආවා විතරයි ලූනු මිලත් වැඩි වෙලා" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මට තවත් විනාඩි 3ක් විතර ඉල්ලා ගන්නවා, අපේ ගරු උපාලි සමරසිංහ නියෝජ්‍ය ඇමතිතුමාගෙන්.

මේ කථාව මම කියන්නේ නිකම් නොවෙයි. මේ බද්ද ගැහුවේ පාරිභෝගිකයා සහ ගොවියා කියන දෙදෙනාම රකින්නයි. ඒ නිසා තමයි අල ගොවියාටත්, ලූනු ගොවියාටත් රුපියල් 130න්, 140න් උඩ මිලක් හම්බ වුණේ. ඒ විතරක් නොවෙයි, දැන් කිව්වානේ, ලූනු ගබඩා කරන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ගැන කථා කළා, ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවේත්. ඒක කරන්න විධියක් නැහැ. මොකද, අපේ රටේ ලූනු ගොවියා පාවිච්චි කරන්නේ යූරියා. ඇමෝනියා නයිට්‍රේට් ගැහුවොත් විතරයි ලූනු ටික කාලයක් හෝ කල් තියා ගන්න පුළුවන් වන්නේ. ඒ නිසා අපි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට කියනවා, ලූනු කල් තියා ගැනීම වෙනුවෙන් ගොවියා දැන් පුරුදු කරන්න කියලා. මේ පාවිච්චි කරන fertilizer වුණත් වෙනස් කළේ නැත්නම්, අපේ ලූනු කල් තියා ගන්න බැහැ. ඒ නිසා ලූනු කල් තියා ගැනීම සඳහා මේ සමහර ක්‍රමවේද වෙනස් කරන්න වෙනවා. එහෙම වෙනස් නොකර මේ වැඩේට යන්න බැහැ.

ලූනු සහ අලවලට බදු ගැහුවේ ඒවා අවශ්‍ය ප්‍රමාණයට නිශ්චිත ලෙස ගෙන එන්න සහ ගොවියාත්, පාරිභෝගිකයාත් රකින්නයි. එහෙම නැතුව මාර්කට් එකට ලූනු එනකල් ඉඳලා බද්ද ගැහුවා නොවෙයි. ඒ නිසා එහෙම පට්ටපල් බොරු කියන්න එපා. මේ

[ගරු වසන්ත සමරසිංහ මහතා]

විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ වාගේ දේවල් කියන්න කලින් අපේ ගරු ගයන්ත මන්ත්‍රීතුමන්ලා වාගේ ගණන් ඉලක්කම් තේරෙන කෙනෙක්වත් මේවා ගැන ඒ අයට කියා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

ආනයනය කර තිබෙන ප්‍රමාණය පිළිබඳ තොරතුරු Sri Lanka Customs එකේ තිබෙනවා. මේ විස්තර ආණ්ඩුවට විතරක් නොවෙයි, විපක්ෂයේ ඔබතුමන්ලාගෙන් ඕනෑම කෙනෙකුට දෙනවා, මෙන්න මේවායි ඒ තොරතුරු යනුවෙන්. අපි මේ තත්ත්වය මේ විධියටම දිගටම පවත්වාගෙන ගියොත් ලබන මාසය, අප්‍රේල් මාසය විතර වනකොට ලූනු මිල රුපියල් 400ට යනවා. ඒ ගැනත් මම පාර්ලිමේන්තුවේදී කියා තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවට ඒ ගැනත් තීරණයක් ගන්න වෙනවා. අල සහ ලූනුවල ප්‍රශ්නය අපි විසඳුවේ ගොවියාත්, පාරිභෝගිකයාත් දෙදෙනාම ගැන හිතලා. ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව ඉදිරියටත් වෙළෙඳ පොළේ ලූනු සහ අල මිල පිළිබඳව සැලකිලිමත් වෙනවා කියන කාරණයත් මම ඔබට කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි, මම අහගෙනයි මේ කථා අස්සේ හාල් ගැනත් කථාවක් කිව්වා. ඒ නිසා ඒ ගැනත් කියන්න ඕනෑ. මොකද, කීරි සම්බා හිඟය පිළිබඳව පසුගිය 13 වැනි දා අපි කැබිනට් මණ්ඩලයේදී තීරණයක් ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආහාර සුරක්ෂිතතා කමිටුව හැටියට මැයි මාසයේ 23වැනි දා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. අපේ රටේ කීරි සම්බා පරිභෝජනය සියයට 10යි; හැබැයි, නිෂ්පාදනය සියයට 7 යි. සියයට 3ක හිඟයක් තිබෙනවා. 260ට විකිණිය යුතු කීරි සම්බා අර සියයට 3 හිඟය පාවිච්චි කරලා, 300ට විකුණනවා. ව්‍යාපාරිකයෝ රුපියල් 245ට මිල දමා, රුපියල් 55ක් වැඩිපුර අතින් සල්ලි ගන්නවා. ඒ මාෆියාව කරගෙන යනවා, මහමෝල්කරුවෝ ටික. පොළොන්නරුවේ වීමෝල් සතුව විතරක් කීරි සම්බා වී මෙට්‍රික් ටොන් 80,000ක් තිබෙනවා. ඒ වී ටික කොටකොටා තමයි දෙන්නේ. කීරි සම්බා ගත්තොත් තමයි නාඩු හාල් දෙන්නේ.

2025 අවුරුද්දේ යල සහ මහ කන්නවල වී අස්වැන්න ගත්තොත්, අපේ රටේ අතිරික්ත වී අස්වැන්නක් තිබෙනවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ප්‍රභේදවල - varietiesවල - අස්වැන්න ප්‍රමාණවත් නැහැ. නාඩු සියයට 64ක් තිබෙනවා. රතු සහල් සියයට 21ක් තිබෙනවා. කීරි සම්බා සියයට 7 යි. සම්බා සියයට 6ක් තිබෙනවා. අනෙකුත් සහල් සියයට 2ක් තිබෙනවා. හැබැයි, අපේ කීරි සම්බා පරිභෝජනය සියයට 10කට ආසන්න ප්‍රමාණයක් වනවා. ඒ පරිභෝජනයේදී ඇති වන හිඟය පාවිච්චි කරලා කීරි සම්බා රුපියල් 300ට විකුණලා අතිරික්ත ලාභ ලබනවා. එසේ අතිරික්ත ලාභ ලබන එක නවත්වන්න නම්, වෙළෙඳ පොළේ කීරි සම්බාවලට ආදේශකයක් ගෙනැල්ලා දමන්න ඕනෑ කියලා ගත් තීරණයට කැබිනට් මණ්ඩලය පසුගිය ජූනි මාසයේදී අවසර දුන්නා. ඒ වාගේම ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවට කිව්වා, යල කන්නයේ කීරි සම්බා සහල් අස්වැන්න බලලා, ඒ සහල් අස්වැන්නේ ප්‍රමාණාත්මක වර්ධනයක් තිබෙනවාද කියලා බලලා ඒ ප්‍රමාණාත්මක වර්ධනයට සාපේක්ෂව කීරි සම්බා ලැබෙනවාද කියලා බලන්න කියලා. ඒ අනුව ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවේ සභාපතිවරුන් ලෙස ගරු ලාල් කාන්ත ඇමතිතුමායි මමයි ඒකාබද්ධව තීරණයක් අරගෙන පසුගිය 13වැනිදා කැබිනට් මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළා, කීරි සම්බා සහල් මෙට්‍රික් ටොන් 20,000කට වැඩි ප්‍රමාණයක් රටට ගෙන්වා ගැනීම ඉලක්ක කරගෙන. එම ඉලක්කය සම්පූර්ණ කර ගන්න යද්දී සමහරු හිතාගෙන ඉන්නවා, wholesale හාල් ගෙනෙන්න දෙයි කියලා. එහෙම ගේන්න දෙන්නේ නැහැ. ඉන්දියාවේ හාල් ගේන්න පුළුවන් කොහොමද කියලා අපි දන්නවා. ලංකාවේ සහල් ආනයනය කරන ආනයනකරුවන් 200කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඒ අය මෙහෙන් පණිවුඩය ආපු ගමන් එහෙට call එක දෙන්න, මෝල් තියාගෙන ඉන්නවා. ඒක, චාමර මන්ත්‍රීතුමා දන්නේ නැති වුණාට ආනයනකරුවන් දන්නවා, ආනයනකරුවන්ගේ සංගමයේ අය දන්නවා. මට ඇහුණා උදේ කියනවා, අපේ හිතවතුන්ට දීලා තිබෙනවා කියලා. එහෙම නම් ඉතින්, අර පිටකොටුවේ ආනයනකරුවන්ගේ සංගමයේ ඉන්න ඔක්කෝම අය අපේ හිතවත්තු වෙන්න ඕනෑ. ඒක ආනයනකරුවන්ගේ සංගමය. අපි 13 වැනිදා කැබිනට් මණ්ඩල තීරණය ගත්තා. ගැසට් පත්‍රය 13වැනිදා රෑ අත්සන් කළා. අපි 14 වෙනිදා දැනුම් දුන්නා, නැව්ගත කිරීමේ දිනය - Bill of Lading - ඒ කියන්නේ 28වැනිදා වනකල් එක් ආනයනකරුවෙකුට කීරි සම්බා ආදේශිත "Pal ponni" කියන සහල් වර්ගය සහ "GR 11" කියන සහල් වර්ගය ගෙන්වන්න පුළුවන් වන්නේ මෙට්‍රික් ටොන් 520යි කියලා. කන්ටේනර් 20යි කියන්නේ ඒක. මොකද, කන්ටේනර් එකකට දමන්න පුළුවන් වෙන්නේ මෙට්‍රික් ටොන් 26යි. එතකොට 10යි කියන්නේ මෙට්‍රික් ටොන් 260යි. 20යි කියන්නේ, මෙට්‍රික් ටොන් 520යි. ගණන් හදන්නේ එහෙමයි. එක් ආනයනකරුවෙකුට ගේන්න පුළුවන් මෙට්‍රික් ටොන් 520යි කියලා අපි දැනුම් දුන්නා. සාමාන්‍යයෙන් ලංකාවට හාල් ගෙන්වන අන්ද්‍රා ප්‍රදේශයේ, තෙලගනාවල, තමිල්නාඩුවල තමයි "GR 11", "Pal ponni" කියන හාල් වර්ග තිබෙන්නේ. ඒ හාල් Vizag වරායෙන් එනවා, චෙන්නායිවලින් එනවා, තුත්තුකුඩිවලින් එනවා, කට්ටුපල්ලිවලින් එනවා. ඒ ප්‍රදේශවල තිබෙන වරායවලින් තමයි නැව් එන්නේ. ඒ වරායවලින් සතියකට නැව් 6ක් එනවා. සමහර වරායවලින් සති දෙකට නැව් 12ක් එනවා. සමහර වරායවලින් එක නැවයි එන්නේ. ඒ නිසා සතියකට එන නැව් ප්‍රමාණයෙන් අපට ගන්න පුළුවන් වෙන්නේ කන්ටේනර් 20යි. ඒවාත් ඔක්කෝම බලලා, එක් කෙනෙකුට දමන්න පුළුවන් උපරිම ප්‍රමාණයත් බලලා, රටට අවශ්‍ය හාල් ප්‍රමාණය කොච්චරද කියන එකත් බලලා තමයි අපි මේක තීරණය කළේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කාලය අවසන්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

28වැනිදා දක්වා කියා නැව්ගත කිරීමේ කාලය අප සීමා කරන්නේ උපරිමය සති දෙකකටයි. සමහරුන්ට ඒක මැජික් වාගෙයි. විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු කියනවා මා අහගෙනයි, අපි ඒ ගැන අපි කලින්ම කියලා කියා. අද නැවක් ඇවිල්ලා තිබෙනවා. හෙටත් නැවක් එනවා. සෙනසුරාදත් නැවක් එනවා. මේ පණිවුඩය ලැබුණු ගමන් ඒ ගොල්ලෝ දවස් දෙකෙන් අදාළ නිෂ්පාදන නැව්ගත කරනවා. ලංකාවේ වාගේම එහේ ලොකු මෝල් තිබෙනවා. ඒ ගොල්ලෝ කොටන මෝලට order එක දමලා, ලංකාවට හාල් ගෙන්වන අය හාල් ගේනවා. ඒවා මැජික් නොවෙයි. නමුත් මෙහේ සමහර අයට ඒවා මැජික්. ඒ අය අපට මැජික් පෙන්වන්න හදනවා. ඒ අයට ඒවා මැජික් වුණාට අපට ඒවා මැජික් නොවෙයි. ආනයනකරුවන් ආනයනය කරන්නේ කොහොමද කියලා දැනගෙන තමයි අපි මේ වැඩේ කරන්නේ. සති දෙකක් දුන්නේ ඇයි? ගේන එක සීමා කරන්නයි, ගේන ප්‍රමාණය සීමා කරන්නයි. මෙට්‍රික් ටොන් 520ක් කියලා දැම්මේත් සීමා කරන්නයි. නැත්නම් අපට තිබුණා නේ ඕනෑ තරම් ගේන්න කියලා open කරන්න. එහෙම කරන්නේ නැහැ. එක් ආනයනකරුවෙකුට ගෙනෙන්න පුළුවන් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 520ක් කරලා ගෙනෙන එකත් සීමා කළා. 28වැනිදාට පස්සේ සති තුනක් ඒ කියන්නේ නොවැම්බර් 15 වනකල් කාලය දුන්නා. ඒ ඇයි කියලා

දන්නවාද? ඉන්දියාවේ විතරයි ඒ හාල් වර්ගය තිබෙන්නේ. ඉන්දියාවේ ඉඳලා මේ නැව්වලට එන්න මාස ගණනක් ගත වෙන්නේ නැහැ. ඒ නිසා උපරිම සතියක් දෙකක් ඇතුළත ඒ නැව් එන්න ඕනෑ. ඒ වාගේම ලංකාවේ වරායෙන් සති තුනක් ඇතුළත හාල් ටික නිදහස් කර ගන්න ඕනෑ කියන කථාවත් කියලා තමයි අපි ඒ හාල් ආනයනය කරන්න දුන්නේ.

ඒ නිසා පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කරලා ඇති තරම් බොරු කියන එක විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගේ විලාසිතාවක් බවට පත් වුණාට ආණ්ඩුවක් හැටියට අපි කියනවා, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරන ප්‍රගතිශීලී විවේචන - positive criticisms - භාර ගන්න අපි ලැහැස්තියි කියලා. ඒ වාගේම ඒවාට සාධනීය මැදිහත්වීමක් කරලා මේ රට ඉස්සරහට ගෙන යන්න ගොවියාත්, පාරිභෝගිකයාත් වෙනුවෙන් අවශ්‍ය මැදිහත්වීම කරන්න අපි ලැහැස්තියි. එවැනි දේවල් භාර ගෙන සාකච්ඡා කරලා ඉස්සරහට යන්න අපි ලෑස්තියි. ඒකයි හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි අපි කිව්වේ, ප්‍රශ්නයක් තිබෙන තැන ඒ ගැන සාකච්ඡා කරන්න අපි ලෑස්තියි කියලා. හිටපු ගමන් කියනවා කන්ටේනර් 800ක ලුණු තිබෙනවා කියලා. පට්ටපල් බොරු. දවස් තුනකින් ලංකාවට හාල් ගෙනෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, අපේ ආනයනකරුවෝ දවස් තුනෙන් ලංකාවට හාල් ගෙනෙනවා. ලංකාවට හාල් ගේන්න කිව්වාම පිටකොටුවේ ඉන්න ආනයනකරුවෝ හාල් ගෙනෙනවා. ඒක දන්න නිසා තමයි අපි දවස් 12ක් දුන්නේ. දැන් ඒක මැජික් එකක් වෙලා. නොදන්නාකමට ඒක මැජික් වුණාට, අපි තොරතුරු දැනගෙන, එන නැව් ගණන බලලා තමයි කටයුතු කරන්නේ. අපි ආනයනකරුවන්ගේ ප්‍රමාණ සහ හැකියාව ගැනත් දන්නවා. ඒ සියලු විස්තර හොයලා, අත්දැකීමක් අරගෙන රටට GR 11 සහ කීරි සම්බා ආදේශන සහල් මෙට්‍රික්ටොන් 20,000ක්, 40,000ක් අතර උපරිම ප්‍රමාණයක් ආවත් ඇති කියන අදහසින් තමයි අපි මේක කළේ.

ඒ නිසා මේ බදු පැනවීම් සහ ආනයන සීමා ලිහිල් කිරීම් සියල්ල සිදු කරන්නේ පාරිභෝගිකයාගේත්, ගොවියාගේත් ආරක්ෂාව ගැන හිතලා. ඒ වෙනුවෙන් තමයි මේ ආණ්ඩුව කටයුතු කරන්නේ. ඒ සඳහා පාර්ලිමේන්තුව තුළ ඉදිරිපත් කරන විපක්ෂයේ හොඳ අදහස්වලටත් කන් දෙන්න අපි සූදානම්. රට ඉස්සරහට ගෙන යන වැඩ පිළිවෙළට සහයෝගය දෙන්න, අපිත් එක්ක වැඩ කරන්න එකතු වෙන්න කියන ආරාධනය විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කරමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.19]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සන්තෝෂ වෙනවා මොනරාගල දිස්ත්‍රික්කයේ අපේ හිතවත් මන්ත්‍රීවරයෙක් මූලාසනයේ සිටියදී මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමගි ජන බලවේගයේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා අද දවල් වෙඩි තියලා ඝාතනය කරලා තිබෙනවා. අපි මේක හෙළා දකිනවා. එතුමා ප්‍රජාතන්ත්‍රවාදීව දේශපාලන පක්ෂයක්, කඳවුරක් තෝරා ගෙන තරග කරලා සියයට 67ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගෙන තිබෙනවා. අපට මතකයි, එතුමා සභාපති පුටුවට තරග කරද්දී යම් සිද්ධි කීපයක් සිදු වුණා. එකක් තමයි, ආණ්ඩුවේ මැති ඇමතිවරු 300ක විතර පිරිසක් අරගෙන ගිහිල්ලා එතුමා දිනන එක වළක්වන්න එදා යම් තර්ජනයක් කළා. එතැන හිටපු පළාත් පාලන කොමසාරිස්වරියට තර්ජනය කළා. ඒ බාධක අස්සේ තමයි එතුමා සභාපති වුණේ. ඒ විතරක් නොවෙයි. මන්ත්‍රීවරියක් සහ මන්ත්‍රීවරයෙක් අතුරුදහන් වුණා. අපි අහනවා පොලිස්පතිතුමාගෙන්. ඒ පරීක්ෂණවලට මොකක්ද වුණේ? ඒ පරීක්ෂණවලට මොකක්ද වුණේ? ඒක නාටකයක්ද? එතුමා සභාපති පදවියට පත් වෙන එක වළක්වන්න විශාල වෙහෙසක් දැරුවා ආණ්ඩුවේ හිටපු පාර්ශ්ව. අද එතුමා කාර්යාලයේ සිටියදී මහ දවල් වෙඩි තියලා මරලා තිබෙනවා. මේක තමයි රටේ ආරක්ෂාව. මේක මේ අවුරුද්දේ 101වැනි වෙඩි ප්‍රහාරය. දැනට මෙතුමා ඇතුළු 57දෙනෙක් මැරිලා තිබෙනවා. ඒක හෙළා දකින ගමන් අපි කියනවා, ආණ්ඩුව මේකේ වගකීමත්, මේ රටේ ආරක්ෂාව නැතිකමේ වගකීමත් භාර ගන්න ඕනෑ කියලා. අපි කියනවා, මේක දේශපාලන මිනී මැරුමක්, දේශපාලන ඝාතනයක් කියලා.

අපි දන්නවා, මෙතැන ඉන්න උදවිය මීට ඉස්සෙල්ලා කරලා තිබෙන දේවල්. ඡන්දය දෙන්න ගිය මිනිස්සු මරපු අය ඉන්න ආණ්ඩුවක් තිබෙන්නේ. දේශපාලන පක්ෂයක් තෝරා ගත්තා කියලා, ඒ දේශපාලන පක්ෂයේ සභාපති මරපු කට්ටියක් පාලනය කරන ආණ්ඩුවක් තිබෙන්නේ. මම මතක් කරන්න ඕනෑ, කීර්ති අබේවික්‍රම, ලයනල් ජයතිලක, ජී.වී.එස්. ද සිල්වා, මෙරිල් කාරියවසම්, ජිනදාස වීරසිංහ, විජය කුමාරතුංග, හර්ෂ අබේවර්ධන කියන මේ සියලුදෙනා දේශපාලන කරන්න ඇවිල්ලා තමයි ඝාතනය වුණේ.

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ලසන්ත මහත්මයා ප්‍රජාතන්ත්‍රවාදීව දේශපාලනය කරන්න ආපු නිසා තමයි අද ඝාතනය කරලා තිබෙන්නේ. අද ආරක්ෂාවක් නැහැ. තැන් තැන්වල මිනිස්සු මරනවා. අද මන්ත්‍රීවරුන්ගේත් ආරක්ෂාව නැති කරලා තිබෙනවා. මේ රට කොතැනටද යන්න හදන්නේ? ආණ්ඩුවේ නගර සභාවක සභාපතිවරයෙක් කියනවා මම දැක්කා, "අපි ලෑස්තියි මේ ආණ්ඩුව තියා ගන්න, ලක්ෂයක් මරලා හරි. අපට මේ වැඩේ පුරුදුයි" කියලා. අපි අහනවා. මේගොල්ලෝ ඒකටද මේ අර අදින්නේ? අපි කථානායකතුමාගෙනුත් ඉල්ලා සිටිනවා මේ දේශපාලනඥයන්ට ආරක්ෂාව දෙන්න කියලා. මොකද, මේකේ ඉන්නේ දේශපාලනයට, ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව කාලයක් කටයුතු කරපු උදවිය. මේ රටේ අවුරුදු 76ක් ආරක්ෂා කරපු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න කටයුතු කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලනවා. ආණ්ඩුව මේ වගකීම් භාර ගන්න ඕනෑ. ඒකට වෙන වෙන කථා කියන්න බැහැ. ආණ්ඩුවේ වැරැද්දෙන්, ආරක්ෂාව නැතිකමින් තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ආහාර සුරක්ෂිතතාවය ගැනත් කථා කළා. අපි අහනවා, ආණ්ඩුව මේ බදු මුදල් පැනවීමෙන් ගොවියා ආරක්ෂා වුණාද කියලා. නැහැ. අද උඩරට අල ගොවියා අල විකුණන්නේ රුපියල් 180ට. බී ලූනු ගොවියාට බී ලූනු ටික විකුණා ගන්න විධියක් නැහැ. ටොන් 50,000ක් එනවා නම් ඇමතිතුමා, අස්වැන්න එන්න ඉස්සෙල්ලා මේ බද්ද දාන්න ඕනෑ.

මේ රටේ තිබෙනවා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව. එහි අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් ඉන්නවා. එතුමා තමයි මේ ගැසට්

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

නිවේදනය නිකුත් කරන්නේ. නමුත් මේ ගැසට් නිවේදනය නිකුත් කරලා තිබෙන්නේ ජනාධිපතිවරයා. හැබැයි, සති දෙකකට ඉස්සෙල්ලා තමුන්නාන්සේගේ සභාපතිත්වයෙන් යුත් ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවෙන් මේ තීන්දුව අරගෙන තිබෙනවා. හැබැයි, ගැසට් එක ගහලා තිබෙන්නේ සති දෙකකට පස්සේ. *[බාධා කිරීමක්]* සති දෙකකට පස්සේ. අධ්‍යක්ෂ ඒ ජනරාල් ප්‍රදීප් කුමාර මහතා අස් වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේ පස්සේ කථා කරන්න. මේ කාලය තුළ විතරක්,-

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පැහැදිලි කරන්න අවශ්‍යයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඇයි, ප්‍රදීප් කුමාර මහතා අස් වුණේ? සති දෙකකට ඉස්සෙල්ලා නොවෙයිද කමිටුව මේ තීන්දුව ගත්තේ? සති දෙකකට ඉස්සෙල්ලා කමිටුව මේ තීන්දුව අරගෙන තිබෙන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව ඒක දානවා බදු ප්‍රතිපත්තිය පිළිබඳ තීරණ ගන්න කමිටුවට. බදු ප්‍රතිපත්ති තීරණ ගන්න කමිටුවෙන් තමයි බදු පිළිබඳ තීරණය ගන්නේ. ඒ තීරණය අරගෙන තමයි ජනාධිපතිතුමාට යවන්නේ. ඔබතුමා සම්පූර්ණ වැරදි අර්ථකථනයක් කරන්නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
තමුන්නාන්සේලාගේ ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවෙන් මේ තීන්දුව අරගෙන තිබෙන්නේ සති දෙකකට ඉස්සෙල්ලා. *[බාධා කිරීමක්]* ඒ ආරංචිය ගියා ආනයනකරුවන්ට; වෙළෙන්දන්ට. වෙළෙන්දෝ මොනවාද කළේ? ඒ සති දෙක ඇතුළත අල ටොන් 23,000ක් මේ රටට ගෙනැල්ලා තිබෙනවා, පරණ බද්දට.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඒ නිසා මේ වාසිය ගිහිල්ලා තිබෙන්නේ ගොවියාට නොවෙයි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා සම්පූර්ණ අසත්‍ය කියන්නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඇමතිතුමා ගොවියාට නොවෙයි මේ වාසිය -

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා, ඊට කලින් මාසයේ කොච්චරක් ගෙනැත් තිබෙනවාද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මට ඒක වැඩක් නැහැ.*[බාධා කිරීමක්]* මම අහන්නේ මේ තීරණය කළාට පස්සේ. *[බාධා කිරීමක්]* අපි අහන්නේ, වෙළඳ ඇමතිගෙන්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම කියන්නද, කමක් නැද්ද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
කියන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඊට කලින් මාසයේ ගෙනාපු අල සහ ලූනු දෙකේම විස්තර කියන්නම්. ඊට කලින් මාසයේ ගෙනාපු අල මෙට්‍රික්ටොන් කීයද දන්නවාද? ඊට කලින් මාසයේ අල මෙට්‍රික්ටොන් 17,108යි. දැන් අහගන්න කෝ. *[බාධා කිරීමක්]* ඒක තමයි කියන්නේ. ඔබතුමා බොරු නේ කියන්නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔබතුමා බොරු කියන්න එපා. ඔබතුමා සමගි ජන බලවේගයේ ලේකම්තුමා ලෙස,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, වේලාව සීමිත නිසා අපි අවසන් කරමු. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලයත් අවසන්. [බාධා කිරීමක්]

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අල ඇවිල්ලා තිබෙනවා, මෙට්‍රික්ටොන් 17,108ක්. ලූනු ඇවිල්ලා තිබෙනවා, මෙට්‍රික්ටොන් 29,354ක්. ඊට කලින් මාසයේ 30,000යි. *[බාධා කිරීමක්]* ඒක තමයි. ඊටත් කලින් මාසයේ 39,000යි. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා, ඊට කලින් මාසයේ මෙට්‍රික්ටොන් 30,000යි. *[බාධා කිරීමක්]* ඉතින් ඒක තමයි. ඊට කලින් මාසයේ 30,000යි. ඒක වැඩි වෙලා නම් 50,000ක් වෙන්න එපා යැ. ඒ හැම මාසයේම average එක 30,000යි. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, සභාව කල් තැබීමේ විවාදය තිබෙන නිසා දැන් අවසන් කරමු.

ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට mike එක දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්. *[බාධා කිරීමක්]* ඔබතුමා අවසන් කරන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අහනවා මේ ක්‍රමය හරි නම් කොහොමද අල අද රුපියල් 180ක් වෙන්නේ? 200ක් යනවා අල කිලෝවක නිෂ්පාදන වියදම. තමුන්නාන්සේලා වේලාවට මේක ගැසට් කළේ නැහැ. *[බාධා කිරීමක්]* මේක ගැන විගණනයක් කරන්න. මේක ගැන බලන්න. තමුන්නාන්සේලා හරියට කළා නම් අල රුපියල් 180ට යන්නේ නැහැ. අද ලූනු ගොවියාට ලූනු විකුණා ගන්න බැරුව ඉන්නවා. මේක තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තියේ වැරැද්ද. මම හිතන හැටියට ටොන් 41,000ක් අලයි, ලූනුයි ගෙනැල්ලා තිබෙනවා, ඔය සති දෙක ඇතුළත. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.28]

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද හරි අපූරු දවසක්. මොකද, දැන් විපක්ෂය පැත්තේ සිටින කට්ටිය මීට වසරකට පමණ පෙර මේ පැත්තේ පුටුවල ඉඳගෙන ගත් තීන්දු තීරණවල ප්‍රතිඵල ගැන තමයි අද කථා කරන්න තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලින් සුරාබදු ආඥාපනතට අදාළව ඒගොල්ලන් ගත්ත තීන්දුවලට අනුව මේ රටේ මහජනතාව මත් කරලා, බදුවලට හොඳට පොලු තැබුවා. මට කලින් කථා කරපු ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා දන්නවා, අපේ රටේ ජනතාව කවදාකවත් ණයට වෙරි වුණේ නැහැ. බිබිලේ බාර් එකෙන් ණයට බිව්වේ නැහැ, මහියංගනය බාර් එකෙන් ණයට බිව්වේ නැහැ. අපේ රටේ මිනිස්සු ණයට වෙරි වුණේ නැති වුණාට මෙතුමන්ලාගේ ලොක්කෝ ස්කාගාරවල කට්ටිය ඇති පදමට පොලු තියලා තිබෙන්නේ. අන්න, ඒගොල්ලන් රකින්න තමයි ඔය පුටුවල ඉන්න අය ඒ පනත් හැදුවේ. අන්න, ඒගොල්ලන්ගෙන් බදු අය කරගන්න තමයි අද මේ රීති සම්මත කරගන්නේ.

ඔබතුමන්ලා අපට හොඳ රටක් භාර දුන්නේ නැහැ. ඉස්සෙල්ලා අපි කිව්වා, අපේ රටේ මිනිස්සු ණයට මුකුත් කළේ නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ මිනිස්සු තෙල් ගැහුවා, ණයට නොවෙයි. හැබැයි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පාඩු ලැබුවා. අපේ මිනිස්සු විදුලිය ගත්තා, ණයට නොවෙයි. හැබැයි, ලංකා විදුලිබල මණ්ඩලය පාඩු ලැබුවා. අපේ මිනිස්සු ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් වතුර ගත්තා, ණයට නොවෙයි. හැබැයි, ජලසම්පාදන මණ්ඩලය පාඩු ලැබුවා. අපේ මිනිස්සු බස් එකේ ගියා, ඒ ණයට නොවෙයි. හැබැයි, ලංගම පාඩු ලැබුවා. එහෙම රටක් තමයි ඔබතුමන්ලා හැදුවේ. ඔය පුටු රත් කරමින් අපේ ආයතන පාඩු ලබපු රටක් තමයි හැදුවේ. අද මේ ගැන කථා කරන්නේ ඒ නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ සුරාබදු එක්කම අපේ රටේ තිබෙන අනෙක් මහා දැවැන්ත කාරණය තමයි මත්ද්‍රව්‍ය. අද උදේත් මේ සභාවේදී කථා කළා, අද උදෑසන සිදු වුණු මරණයක් ගැන. මම ඒ ගැන පසුව කියන්නම්. අපේ රටේ හිටපු පාලකයෝ මොනවා නැති වුණත් ඇති පදමට අපේ රට මත් කුඩුවලින් පිරෙව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය මාස 9 පුරාවට අපේ රටට මෙතුමන්ලා හදපු පාලකයෝ හෙරොයින් විතරක් කිලෝ 1,248ක් - අර මහ මුහුදේ පාවෙලා ආපු තොගයට අමතරව මම මේ කියන්නේ - ගෙනැල්ලා ඉවරයි. ඒ වාගේම, අයිස් කිලෝ 1,852ක් අපේ රටට ගෙනාවා, පසුගිය මාස දෙකේ. අපි ඒවා ඇල්ලුවා.

අපේ ගමේ ඉන්නවා "ලේකම් මාමා" කියලා මාමා කෙනෙක්. මම ඒ මාමාගෙන් ඇහුවා, "මාමා, වී කිලෝ එකක වී ඇට කීයක් තිබෙනවාද?" කියලා. එතුමා දවසක් විතර ගැණලා වෙන්න ඇති කිව්වා, වී කිලෝ එකක වී ඇට 45,000ක් තිබෙනවා කියලා. මෙතුමන්ලා දන්නවා ඇති වී ඇටයක් තරම් නේ අයිස්, කුඩු බොනවා ඇත්තේ. වී මුට්ටයක වී ඇට තිබෙනවා 2,250,000ක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන්නේ මෙතුමන්ලාගේ සගයෝ ගෙනාපු කුඩු ප්‍රමාණය වී ඇටවලින් ගත්තොත්, සාමාන්‍යයෙන් මිනිස්සු 137,000,000කට බොන්න පුළුවන් තරම් මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් තමයි අපි අල්ලාගෙන තිබෙන්නේ. නිකමට හිතලා බලන්න, ඒ පාලකයෝ නම් මේ පුටුවල සිටියේ, අද ඔය කුඩු ටික මේ රට පුරාම ගිහින් ඉවරයි. එහෙම වුණා නම්, ගමේ ඉන්න අපේ පුංචි දරුවෝ විතරක් නොවෙයි, මේ නගරයේ ඉන්න මහත්වරුන්ගේ දරුවෝ පවා ඒවාට බිලි වෙලා ඉවරයි. එහෙම රටක් තමයි අපි මේ වෙනස් කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. උදේ කිව්වා නේ, එතුමන්ලාගේ සභාපති කෙනෙක් ඝාතනය වුණා කියලා. ඒක ඇත්ත. ඔය ඝාතකයෝ නිර්මාණය කළේ කවුද? ඔය පුටුවල ඉන්න ගොඩක් මහත්වරුන්ගේ ඝාතකයින් නිර්මාණය කළේත් ඔබතුමන්ලාම තමයි. තමන්ගේ ඝාතකයා නිර්මාණය කරපු මිනිස්සු තමයි මේ ඉන්නේ. පාතාලයට ඇති පදමට කවලා පොවලා, හදලා වඩලා, පාතාලය නිර්මාණය කරලා, අද ඒ පාතාලයම තමන්ගේ ඝාතකයන් බවට පත් වෙලා තිබෙනවා. ඔව්, හරියට පරීක්ෂණ සිද්ධ වෙයි. අපට පරීක්ෂණ කරන්න බැහැ නේ. ඒකට අපරාධ විමර්ශන අංශය ඉන්නවා, පොලීසිය ඉන්නවා, උසාවිය තිබෙනවා. ඒක හරියට සිද්ධ වෙයි. හැබැයි, ඒ ඝාතකයන්ගේ නිර්මාතෘවරුන්ට අද තමන් හදපු අය උත්තර දෙන්න පටන් අරගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම මේ මාතෘකාවෙන් එහාට ගියොත්, අපේ ප්‍රදේශයේ - බදුල්ල දිස්ත්‍රික්කයේ - අල පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්ත නේ. අල පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මොකක්ද, ප්‍රධාන ප්‍රශ්නය? යෙදවුම් මිල වැඩිවීම. යෙදවුම් මිල අඩු කරන්න නම් මොකක්ද කරන්න ඕනෑ? නිෂ්පාදන පිරිවැය අඩු කරන්න නම් මොකක්ද කරන්න ඕනෑ? අපේ රටේ බීජ අල කිලෝ එකක මිල අඩු කරන්න ඕනෑ. අපි ආනයනික බීජ අල තමයි වගා කරන්නේ.

ආනයනික බීජ අල අපිට තිබෙන්නේ. අපේ රටේ ඒවා නිෂ්පාදනය වුණේ නැහැ. මහත්වරුනි, ඔබතුමන්ලා අවුරුදු 76ක් තිස්සේ හදපු රටේ, අල බීජ නිෂ්පාදනය කළේ නැහැ. අන්න දැන් අපි ඒකට සැලැස්මක් හැදුවා. අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයට

[ගරු සුදත් බලගල්ල මහතා]

එන්න කෝ. සමහර දවසට අපි ඊ 11.00, 12.00 වෙනකම් අපේ අමාත්‍යාංශයේ වැඩ. ඇති පදමට යෝජනා ඇවිල්ලා තිබෙනවා. මේ තිබෙන්නේ, බීජ අල නිෂ්පාදනය කරන්න අපේ රටේ මහත්මයෙක් අපෙන් ඉල්ලපු එක ඉල්ලීමක්. ඔව්, තව අවුරුදු දෙක, තුනක් යනකොට අපි අපේ රටේ බීජ නිෂ්පාදනය පටන් ගන්නවා. ශ්‍රේෂ්ඨ ඉතිහාසයක් තිබිච්ච අපේ රටේ වගාවල බීජ ගත්තාම, ඒ බීජවල ඉතිහාසය මරලා දැමුවේ ඔබතුමන්ලා. අපි නැවත අපේ බීජවලට පණ දෙනවා. අවුරුදු දෙකක්, දෙකහමාරක් යනකොට මේ රටේ අල ගොවියාට සියයට 25කින් නිෂ්පාදන පිරිවැය අඩු කරගන්න පුළුවන් බීජ නිෂ්පාදනය අපි පටන් ගන්නවා. එහෙම නැතුව ඒක ආපු ගමන් කරන්න බැහැ. එහෙම උත්තර නැහැ. බෝක්කුවක් හදන්න කිව්වොත්, අපිට දවසෙන් හදන්න පුළුවන්. හැබැයි මේ බිඳ වට්ටපු, කඩා දමපු, විනාශ කරපු මනුස්සකම් දවසෙන්, දෙකෙන් හදන්න බැහැ. ඒවාට යම් කාලයක් ගත වෙනවා. අපි ඒක කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට බොහොම කෙටි කාලයක් ලැබිලා තිබෙන්නේ. ඒ නිසා මේ අවස්ථාවේ විපක්ෂයේ මහත්වරුන්ට මම අවධාරණය කරනවා, ඔබතුමන්ලා සාම්ප්‍රදායික විධියට හිතන්න එපා කියලා. ඔබතුමන්ලා විධියට අපි හිතුවා නම් අද අපි ආණ්ඩු පක්ෂය පැත්තට එන්නේ නැහැ. අපි ඔබතුමන්ලා හිතපු විධියට විරුද්ධව හිතපු නිසා තමයි අද ආණ්ඩු පක්ෂයේ ඉන්නේ. හැබැයි ඔබතුමන්ලා තවම ඉන්නේ පරණ තැන. ඒ පරණ තැන සිටිමින් විපක්ෂය වෙනස් වෙන්නේ නැත්නම් සදාතනික විපක්ෂයක් තිබෙන්නේ. මේක වෙනස් ආණ්ඩුවක් කියන එක හොඳින් තේරුම් ගන්න. ඒ වෙනස් ආණ්ඩුව සම්බන්ධයෙන් වෙනස් තීන්දු-තීරණ ගන්න හිතන්න. එහෙම නැත්නම් සාම්ප්‍රදායික විපක්ෂයක් තියේවි. හැම දාම උදේට ඇවිල්ලා කෑ ගහලා යන, කැන්ටිමට ගිහිල්ලා තේ එකක් බොන විපක්ෂයක් තියේවි. නැවත මේ පුටුවට එන්න ඕනෑ කියලා හිතනවා නම් අපිට වඩා උසස් වෙන්න, අපිට වඩා පියවරක් ඉස්සරහට යන්න, අපට වඩා හිතන්න. එහෙම නැත්නම් ඉන්න වෙන්නේ ඔතැනම තමයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සරත් කුමාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சரத் குமார அவர்கள் அக்கிராசனத்திலின்றும் அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SARATH KUMARA left the Chair and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 3.35]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ වැදගත් අවස්ථාවේ මටත් වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. මොකද, මම නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රී කෙනෙක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්න එක හොඳයි කියලා මම හිතනවා. මොකද, මම විශේෂයෙන්ම කථා කරන්න යන්නේ ගොවීන්ගේ ප්‍රශ්නයක් ගැන.

නුවරඑළියේ වැඩි හරියක් ඉන්නේ අල ගොවියෝ. මේ අල ගොවියන්ට තිබෙන ප්‍රශ්නය ගැන මම practically කියන්නම්. ප්‍රායෝගිකව මම ඒ ගැන කියන්න කැමැතියි. මොකද, මෙතැන කථා කරන්න ඕනෑ නිසා මම මේක කියන්නේ නැහැ. අදාළ ප්‍රශ්නය ගැන මම හොඳටම දන්න නිසා මේ ගැන කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. මොකද, නුවරඑළියේ සියයට 60ක් ඉන්නේ අල ගොවියෝ කියලායි මම හිතන්නේ. ඒ ගොල්ලෝ ජීවත් වෙන්නේ ඒකෙන්. ගොවියෝ ගත්තොත්, 15ක්, 20ක් විතර එක එක ගොවියෝ ළඟ වැඩ කරනවා. ඒ මිනිස්සුන්ට රැකියාව දෙන්න ඕනෑ, කෑම දෙන්න ඕනෑ. ඒ ඔක්කෝම දීලා තමයි අපි අල නිපදවන්නේ. අල කිලෝවක් නිපදවන්න රුපියල් 200ක් යනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒක පිළිගන්නවාද, නැද්ද දන්නේ නැහැ. මට නම් තොරතුරු හරියට කියන්න පුළුවන්. හැබැයි නුවරඑළියේ දැන් අල කිලෝවක් විකුණන්නේ රුපියල් 180ට.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

බදුල්ල, බණ්ඩාරවෙල.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

නැහැ. නුවරඑළියේත් ඒ ගණනට තමයි විකුණන්නේ. නැත්නම් කැප්පෙටිපොල මාර්කට් එකට යන්න ඕනෑ, බණ්ඩාරවෙල මාර්කට් එකට යන්න ඕනෑ. නුවරඑළියේ අල කිලෝවක් විකුණන මිල දන්නවා. ඔක්කෝම ප්‍රදේශවල එක මිලට තමයි දැන් අල විකුණන්නේ. වැඩිම වුණොත් රුපියල් 10ක් වැඩි කරයි, එච්චරයි. එහෙම බලනකොට මේ අල ගොවීන්ට රුපියල් 20ක පාඩුවක් ඇතුව තමයි අල විකුණන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියලා මම හිතනවා. ඒ ගොල්ලන් ගෙවල් උකස් කරලා, රත්තරන් උකස් කරලා - ඔක්කෝම කරලා - අන්තිමට පාඩු ලබනවා නම් ඒ බිස්නස් එක කරන්නේ කොහොමද? ඒක කරන්න බැහැ. එහෙම නම් ඒක අත් හරින්න ඕනෑ. නුවරඑළියේ ගොවියා දැන් අල ගොවිතැන අත්හරින්න තමයි ලැහැස්ති වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා අද ඒ අයට phone කරලා බලන්න. කෘෂිකර්ම ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. සීතාඑළිය ගබඩාවේ බීජ අල තිබෙනවා. නමුත් දැන් බීජ අල විකුණන්න බැරි වෙලා තිබෙනවා. ඇයි? අල නිපදවන්න කවුරුත් කැමති නැහැ. අල නිපදවලා පාඩු ලබන්නේ මොනවාටද? ඒක, එක ප්‍රශ්නයක්.

අනෙක් ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, නුවරඑළියේ climate එක ගැන ඔබතුමා දන්නවා. නුවරඑළියේ climate එක අනුව හැම දාම, දවස් 365න් 265ක් වහිනවා කියලායි මම හිතන්නේ. වැස්ස නිසා අපට බෙහෙත් වැඩිපුර ගහන්න වෙනවා, කෘමිනාශක වැඩිපුර පාවිච්චි කරන්න වෙනවා. ඒ නිසා අපේ cost of production is very high. බණ්ඩාරවෙල, කැප්පෙටිපොල

වාගේ ප්‍රදේශවල අල හදනවාට වඩා නුවරඑළියේ අල හදන එකේ cost of production වැඩියි. ඒ නිසා තමයි නුවරඑළියේ අලවල මිල වැඩි වන්නේ. ඉතින් මේක සාමාන්‍යයෙන් පිළිවෙළට ක්‍රමානුකූලව කරන්න ඕනෑ. වෙළෙන්දනුත් යම් කිසි ප්‍රමාණයක් හම්බ කරන්න ඕනෑ, ගොවිනුත් හම්බ කරන්න ඕනෑ, පාරිභෝගිකයාටත් සාධාරණයක් වෙන්න ඕනෑ. පාරිභෝගිකයාට සාධාරණයක් වෙන්න ඕනෑය කියලා ගොවියෝ අමාරුවේ දාන්න එපා. ගොවියෝ අමාරුවේ දාන්න ඕනෑ නැති නිසා අල ගන්න මිනිස්සු අමාරුවේ දාන්නත් එපා.

මම හිතන්නේ නුවරඑළියේ දැනට අල බිස්නස් කරන අය 50කට වඩා ඉන්නවා. ඉස්සර එක කඩයකින් අල ගෝනි 300ක් විකුණනවා. දැන් අල ගෝනි 50ක් තමයි විකුණන්නේ. ඒ, ඇයි? පිටරටින් අල ගෙන්වා විකුණනවා. පිටරට අල තමයි දැන් විකුණන්නේ. පිටරටින් එන අලවල තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවාද, නැද්ද මම දන්නේ නැහැ. මම හරියට කියන්නම්. පිටරටින් අල ගෙන්වා ඒගොල්ලන් cool room එකේ store කරනවා. Iranවලින් අල ගෙන්වා cool room එකේ තියනවා. තව මාසයක් ගියාට පස්සේ ඒ අල පැළ වෙනවා. ඒ පැළ වෙච්ච අල තමයි ඒ ගොබය ගලවලා මාර්කට් එකට දාන්නේ. ඒ පැළවෙච්ච අල කන එක අපේ ඇඟට හොඳ නැහැ. හැමෝම ඒක තේරුම් ගන්න ඕනෑ. පැළ වෙච්ච අල ගන්න එක එච්චර සුදුසු නැහැ. Ring එකක් එනවා, අල ගෙඩිය ඇතුළෙන්. ඔයගොල්ලන් දන්නවාද, නැද්ද දන්නේ නැහැ. මම මේ බිස්නස් එක අවුරුදු 30ක් තිස්සේ කරන්නේ. මම ගොවියෙක් විධියටත් කටයුතු කරනවා. අනෙක් එක, ලීක්ස් කිලෝ එකක් හදන්න රුපියල් 100ක් යනවා. නුවරඑළියේ දැන් ලීක්ස් කිලෝවක් රුපියල් 70යි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
දැන් ගණන නොවෙයි නේ?

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
නැහැ, නැහැ, ලීක්ස් කිලෝවක් රුපියල් 70යි. කැරට් කිලෝවක් හදන්න රුපියල් 110ක් යනවා. මාර්කට් එකේ කැරට් කිලෝව රුපියල් 120යි. බීට්රූට් කිලෝවක් හදන්න රුපියල් 90ක් යනවා. රුපියල් 60ටයි විකුණන්නේ. මෙහෙම යනකොට ගොවිතැන් කරන්න කවුරුවත් කැමැති වෙන්නේ නැහැ. නුවරඑළියේ අපේ වතුවල මිනිස්සුන්ට රුපියල් 1,700ක් - රුපියල් 1,350ක් පඩිය දුන්නාට එළවලු කොටුවලින් මිනිස්සු රුපියල් 4,000ක පඩියක් ගන්නවා.

ඉතින් මේ ප්‍රශ්නය අපි විසඳා ගන්නේ කොහොමද? ඉතින් ඒක නිසා කරුණාකරලා ඔබතුමා මේ සම්බන්ධව plan එකක් හදන්න. මේ ආණ්ඩුවේ විතරක් නොවෙයි, පසුගිය ආණ්ඩුවේත් ඔය ප්‍රශ්නයම තිබුණා. ඊට ඉස්සෙල්ලා ආණ්ඩුවේත් තිබුණා. මමත් මේ Parliament එකේ අවුරුදු 20ක් තිස්සේ ඉන්නවා. ඒ අවුරුදු 20 තිස්සේත් මේ ප්‍රශ්නයම තිබුණා. හිටපු අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා වෙළෙඳ අමාත්‍ය ධුරයේ ඉන්නකොට ටිකෙන් ටික අපි මේ ගැන එතුමාට කියනවා. මේ වෙලාවට පොඩ්ඩක් බද්ද වැඩි කරන්න කිව්වොත් එතුමා ඒක කළා. ඔබතුමාටත් මම April වෙනකොට මේ ගැන කිව්වා. ඔබතුමා ඒක ගණන් ගත්තේ නැහැ. කනගාටුයි, මේ වෙලාවේ ඒක කියන්න වුණු එකට. April වෙනකොට tax එක ටිකක් වැඩි කරලා තිබුණා නම් දැන් මේ විධියට ගොවියා අමාරුවේ වැටෙන්නේ නැහැ. දැන් අපිත් හැම දාම බලාපොරොත්තු වන්නේ harvest එක 1:10ක් ලැබෙනවා නම් අපට යම් කිසි ලාභයක් ලැබෙනවා කියලායි. Harvest එක 1:7ක් ලැබෙනවා නම් අපට පාඩුයි. ඒ නිසා කරුණාකරලා ඔබතුමා මේ ගැන හිතලා කටයුතු කරන්න කියලා මම කියනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
පොඩ්ඩක් ඉන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මට ඔබතුමාට දෙයක් කියන්න තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කියපු නිසා මම මේ ගැන කිව යුතු වෙනවා. අද නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානයෙන් මට එළවලු මිල ගණන් එවලා තිබෙනවා. අද අර්තාපල් කිලෝවක් විකිණෙන්නේ රුපියල් 200ටයි. තොග මිල රුපියල් 220යි. අද අර්තාපල් ගැනුම් මිල 200යි, විකුණුම් මිල 220යි.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ඒකට හේතුව මම කියන්නම්. මේ දවස් ටිකේම වැස්ස. ඒ නිසා කවුරුවත් අල ගලවන්නේ නැහැ. අල තිබෙන මිනිහා විකුණනවා, කිලෝව රුපියල් 200ට. එච්චරයි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා දැන් තිබෙන මිලද, සතියකට කලින් තිබෙන මිලද කියන්නේ?

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
දවස් හතරකට, පහකට ඉස්සෙල්ලා පැවති මිල බලන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
බදුල්ල, බණ්ඩාරවෙල අලවලට වඩා නුවරඑළියේ අල කිලෝවක මිල රුපියල් 80ක් වැඩියි.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
මා ළඟ ඒ විස්තර තිබෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මා ළඟත් විස්තර තිබෙනවා. බදුල්ල, බණ්ඩාරවෙල අලවලට වඩා නුවරඑළියේ අල කිලෝවක මිල රුපියල් 80ක් වැඩියි. නුවරඑළියේ අල ගණන් වැඩියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

මේ දවස් හතර පහේ නුවරඑළියේ අල ගලවන්න බැහැ. පොඩ්ඩක් වැස්ස වැඩියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

හරි. ඒක ස්වාභාවික තත්ත්වයක්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

කිලෝවකට රුපියල් 200ත් මදියිනේ? රුපියල් 200 කියන්නේත් cost එක විතරයි ලැබෙන්නේ. ඒත් පාඩුයි. දැන් බලන්න. සීතාඑළියේ ගබඩාවල අල විකුණන්න බැරිව ඉන්නවා. Hayleys Company එකෙන් tropical බීජ අල ගෙන්වන්න ලැහැස්ති වෙනවා. නමුත්, කවුරුවත් ඉල්ලන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා මේකට යම් කිසි ක්‍රමයක් හදන්න. ආවේණික භෝග ආවේණික පළාත්වල වගා කරන්න කියන්න. දැන් හැම තැනම හැම වගාවක්ම කරනවා. බෝංචි වවන තැන කැරට් වවනවා. කැරට් වවන තැන ලීක්ස් වවනවා. ඉතින් කොහොමද මේකේ system එක යන්නේ? Agriculture Ministry එකෙන් මේ කටයුත්ත හරියට කරන්න ඕනෑ. ඔබතුමාටම දොස් කියන්න ඕනෑ නැහැ. නමුත්, Agriculture Ministry එකේ මේවා ගැන පාලනයක් නැහැ. ඒ පාලනය හරියට කරන්න ඕනෑ. මම වැඩිපුර කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මට නියමිත වෙලාව අවසන් කියනවා. අපි ජනාධිපතිතුමාටයි, ඔබතුමාටයි කඳපොල ප්‍රදේශයෙන් postcards 3,000ක් විතර එවනවා. ඒ ඔක්කෝම dustbin එකට දමන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

නැහැ, නැහැ.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

ඒකට පිළිවෙළක් කරන්න. ඔබතුමාට මතකද, ලූනු නිසා ඉන්දියාවේ තිබුණු එක ආණ්ඩුවක් පෙරළුණා. අපට එහෙම ආණ්ඩු පෙරළන්න ඕනෑ නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

අපි අල ගොවියාත් බේරා ගන්නවා, ලූනු ගොවියාත් බේරා ගන්නවා, ඔබතුමාත් බේරා ගන්නවා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

හොඳයි, හොඳයි. දැන් හොරු අල්ලනවා; කුඩු අල්ලනවා; නඩු දමනවා; ගොවියන් පාරට දමනවා! එච්චරයි ඔයගොල්ලන් කරන වැඩ. ගොවියන් මහ පාරට දමන්න එපා. මේ, ගොවිතැන් කරන රටක්, agricultural country එකක්. ගරු ඇමතිතුමනි, cool room එකක් හදලා තියන්න. ඒ cool room එක අත්‍යවශ්‍යයි. නුවරඑළියේත් හදන්න පුළුවන් නම් වඩාත් හොඳයි.

මට නියමිත වෙලාව අවසන්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට නියමිත කාලය *අවසානයි.*

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

එහෙමනම් ඇමතිතුමනි, thank you. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී යම් වැඩ පිළිවෙළක් කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.44]

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම රටක්, ඒ රටේ විභවතාවන් සංවර්ධනයට යොදා ගන්නවා. සමහර රටවල් දියුණු වෙලා තිබෙනවා, තෙල් හින්දා. සමහර රටවල් දියුණු වෙලා තිබෙනවා, මුතු, මැණික්, රිදී හින්දා. සමහර රටවල් දියුණු වෙලා තිබෙනවා, රත්රන්, මිනිරන් හින්දා. ඒ අතින් ගත්තාම අපේ රටේ සංවර්ධන මූලෝපායයන් හොයාගෙන යද්දී අපි විශ්වාස කරනවා, කෘෂි කර්මාන්තයට ප්‍රබල තැනක් තියේවි කියලා.

හැබැයි අද උදේ ඉඳලාම අපි දැක්කා, විපක්ෂය මේ සංවාදය ඇතුළේ කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන්, ගොවියා සම්බන්ධයෙන්, ජනතාව සම්බන්ධයෙන් අඬනවා, වැලපෙනවා, පොළොවේ හැපෙනවා. එහෙම හැපෙන විපක්ෂය මේ රටේ කෘෂි කර්මාන්තය ඇදලා දැම්මේ කොතැනටද? මේ රටට නිදහස ගන්නකොට කෘෂි කර්මාන්තයෙන් දළ ජාතික නිෂ්පාදිතයට සියයට 49ක දායකත්වයක් දුන්නා. නමුත් අවුරුදු 76ක් ගියාට පසුව ඒ දායකත්වය සියයට 7- 8ක ප්‍රමාණයකට පහත වැටී තිබෙනවා. එහෙම තිබියදී තමයි ඔවුන් ගොවියා ගැන කඳුළු හලන්නේ. එහෙම තිබියදී තමයි අභිමානවත් කෘෂි කර්මාන්තයක් ගැන කථා කරන්නේ. විපක්ෂයට මේ මාතෘකාව සම්බන්ධයෙන් කියන්න දෙයක් නැහැ. අලවලට පනවපු බද්ද රුපියල් 60 සිට රුපියල් 80 දක්වා වැඩි කළා. කියන්න දෙයක් නැහැ, ඒක හොඳයි. ලූනුවලට පනවපු බද්ද රුපියල් 10 සිට රුපියල් 50 දක්වා වැඩි කළා. කියන්න දෙයක් නැහැ, ඒක හොඳයි. අද මොනවාද කියන්නේ?

කලින් නම් තිබුණා, "සතියේ බොරුව" කියලා එකක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක අපි බින්දා. ඊට පසුව තිබුණා, "දවසේ බොරුව". ඒකත් අපි බින්දා. චාමර සම්පත් මන්ත්‍රීතුමා මීට මොහොතකට කලින් කෑ ගහලා ගියා. ලූනු සම්බන්ධයෙන් මහ අඳෝනාවක් නඟලා මේ බද්ද පනවන්න අපි ප්‍රමාද වුණා, ඊට කලින් ඇති තරම් ලූනු ලංකාවට ගෙනාවා කියලා එතුමා කිව්වා. දැන් වසන්ත සමරසිංහ ඇමතිතුමා එකින් එකට කිව්වා, මාසෙන් මාසෙට ගෙනාපු ලූනු ප්‍රමාණ ගැන. දැන් ඒ මන්ත්‍රීතුමා කෝ? කියපු බොරුවට මොකද වුණේ? පැය එකහමාරක් යනකොට ඒ බොරුව ගලේ ගහලා කුඩු කරලා ඉවරයි. චාමර සම්පත්

මන්ත්‍රීතුමා නම් කමක් නැහැ කියන්නකෝ. කනගාටුවට කාරණය මෙයයි. එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ලූනු අල්ලා ගත්තේ නැහැ, අල අල්ලා ගත්තා. අල අල්ලාගෙන කිව්වා, බද්ද පනවන්න කලින් මාසයේ මෙච්චර ගෙනැල්ලා තිබෙනවා කියලා. වසන්ත සමරසිංහ ඇමතිතුමා ඊට මාස ගණනකට කලින් පැවති සංඛ්‍යා ලේඛන පවා කිව්වා. බලනකොට ඒ ගණනම තමයි. ඒ කියන්නේ, කලින් සතියක් තිබිච්ච බොරුව, දවසක් තිබිච්ච බොරුව, පැයක් තිබිච්ච බොරුව දැන් කියනකොටම අනෙක් පැත්තෙන් කුඩු කරලා ඉවරයි.

මේ වාගේ විපක්ෂයක්, මේ තරම් අසරණ වෙච්ච විපක්ෂයක් ඉතිහාසයේ අපි කවදාවත් දැක්කේ නැහැ. කනගාටුවට කරුණ ඒකයි. රටක සංවර්ධනයට හොඳ විපක්ෂයක් අවශ්‍යයි. තාර්කික, බුද්ධිමත්, විවේචන ගෙනෙන විපක්ෂයක් අවශ්‍යයි. කනගාටුවට කාරණය තමයි, ඔවුන් කියන කරුණක් විනාඩියක් යන්නට කලින් අනෙක් පැත්තෙන් කඩලා බිඳලා, සුනු විසුනු කර දමන තත්ත්වයට පරිවර්තනය වීම.

අපි ගොවියා ආරක්ෂා කරගන්න ඕනෑ. කොරෝනා වසංගතයෙන් පසුව ලෝකයේ සංවාදයක් ඇති වුණා, ආහාර නිෂ්පාදනය සම්බන්ධයෙන්. සමහර රටවල් හිතුවා, සල්ලි තමයි ප්‍රබල, සල්ලි කාලා ජීවත් වෙන්න පුළුවන් කියලා. හැබැයි, මාසයක්, දෙකක්, තුනක් රට වහනකොට සල්ලි කාලා ජීවත් වෙන්න බැහැ, නිෂ්පාදනය තමයි වැදගත් වන්නේ කියන එක තේරුණා. ඒ, අපි හිතුවාටත් කලින්. අපේ රටේත් නිෂ්පාදනය බිඳ වට්ටපු එක තමයි මේ ප්‍රශ්නයට මුල් වුණේ. ඒ නිසා අපි දේශීය ගොවියා රැක ගන්න ඕනෑ; දේශීය ගොවියා ආරක්ෂා කර ගන්න ඕනෑ. ඒ ගොවියා රැක ගැනීම වෙනුවෙන් තමයි අපි විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් ආණ්ඩුව පැත්තෙන් ඉදිරිපත් කරන්නේ. ඒක විතරක් කරලා ඔවුන් රැක ගන්න බැහැ. ලෝකයේ ක්‍රියාත්මක වෙන්නේ, සාපේක්ෂ වාසි පිරිවැය න්‍යාය. ඒ නිසා එක එක රටවල් ඒ රටවල තිබෙන සම්පත් අනුව, තාක්ෂණය අනුව නිෂ්පාදනය කරනවා. එහෙම අඩුවට නිෂ්පාදනය කරන දේවල් එන්න දෙන්නත් ඕනෑ. හැබැයි, එහෙම අඩුවට නිෂ්පාදනය කරන දේවල් එනකොට තමන්ගේ දේශීය නිෂ්පාදන, දේශීය ගොවියා ආරක්ෂා කර ගන්නත් ඒ රට මැදිහත් වෙන්න ඕනෑ.

අද උදේ විපක්ෂ නායකතුමා මේ සභාවේදී සඳහන් කරනවා අපි දැක්කා, මේවායින් ගොවියාට ලාභයකුත් නැහැ, පාරිභෝගිකයාට ලාභයකුත් නැහැ කියලා. හැබැයි, එතුමාට අමතක වුණා, 2015දී සිදු වුණු සීනි වංචාව. එතුමා කියන එක හරි. එතුමා කණ්ණාඩියක් ඉදිරියට ගිහිල්ලා එතුමාගේ මුහුණ දිහා බලාගෙනම කියන්න ඕනෑ, මේකෙන් ගොවියාට වාසිත් නැහැ, මේකෙන් පාරිභෝගිකයාට වාසිත් නැහැ කියලා. සීනි බදු වංචාවෙන් රුපියල් කෝටි ගණන් සජිත් ප්‍රේමදාස මහත්මයලා හිටපු, රනිල් වික්‍රමසිංහ මහත්මයලා හිටපු ආණ්ඩුවට ගත්තා. ඒක තමයි අද ඇවිත් කියන්නේ. මේ බදු පැනවීමේ ගොවියා රැක ගැනීමට තමයි. ගොවියා රැක ගන්න මේක විතරක් කරලා හරියන්නේ නැහැ.

ඒ වාගේම අල ගොවීන් ඉන්නේ 20,000ක් විතර. ලූනු ගොවීන් ඉන්නේ 7,000ක් විතර. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි පාරිභෝගිකයින් විශාල ප්‍රමාණයක් ඉන්නවා. පාරිභෝගිකයින් ගැන අපි හිතන්නත් ඕනෑ. ඒ නිසා ගොවියා සම්බන්ධයෙන් හිතලා බදු ගහලා විතරක් හරියන්නේ නැහැ. වර්තමාන රජය එතැනට විතරක් නොවෙයි අවධානය යොමු කරලා තිබෙන්නේ. විශේෂයෙන් අඩු පිරිවැයකට මේවා නිෂ්පාදනය කරන්න ඕනෑ. අඩු පිරිවැයකින් නිෂ්පාදනය කළොත් තමයි ගොවියාට ලාභයක් ලැබෙන්නේ. ඒ නිසා අපි නිෂ්පාදන පිරිවැය අවම කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් ගොවියාට සහනාධාර ටික දෙන්න ඕනෑ; හොඳ බීජ ටිකක් දෙන්න ඕනෑ; හොඳ පොහොර ටිකක් දෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, තාක්ෂණයත් දෙන්න ඕනෑ.

අද වනකොට ලෝකයේ තත්ත්වය ගැන බලන්න. අපේ රටේ වර්ග කිලෝමීටර 65,000ක් තිබෙනවා. නෙදර්ලන්තයේ තිබෙන්නේ වර්ග කිලෝමීටර 41,000යි. හැබැයි, නෙදර්ලන්තය අවුරුද්දකට ඩොලර් බිලියන 136ක කෘෂි කාර්මික දේවල් හදලා අපනයනය කරනවා. එහෙමයි ඒ රටේ තිබෙන්නේ. අපේ රටට වඩා කුඩා රටක් වුණත්, නෙදර්ලන්තය ඩොලර් බිලියන 136ක කෘෂි කාර්මික දේවල් හදලා අපනයනය කරනවා. අපි වර්ග කිලෝමීටර 65,000ක් තියාගෙනත් ඩොලර් බිලියන ගණනාවක කෘෂි කාර්මික දේවල් පිට රටින් ගෙනෙනවා. ඒ නිසා අපි හිතනවා, බදු පැනවීමෙන් විතරක් ගොවියා ආරක්ෂා කරගන්න බැහැ කියලා. ගොවියා රැක ගන්න තවත් ගොඩක් දේවල් සිද්ධ වෙන්න ඕනෑ. නිෂ්පාදන තාක්ෂණය මේකට ගේන්න ඕනෑ. නිෂ්පාදන පිරිවැය අවම කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, අපි මහා පරිමාණ කෘෂි කර්මාන්තයට යන්න ඕනෑ. ඒකක පිරිවැය අඩු වෙන්නේ මහා පරිමාණ කෘෂි කර්මාන්තය ඇතුළේ. ඒ වාගේ දැවැන්ත වෙනස්කම් ටිකක් ඇතුළේ තමයි ගොවියාත්, පාරිභෝගිකයාත් කියන දෙදෙනාම රැකගෙන යන්න පුළුවන් වෙන්නේ කියලා අපි හිතනවා. ඒක කවදාවත් විපක්ෂය කළේ නැහැ. අද මේ කිඹුල් කඳුළු හෙළුවාට විපක්ෂය පැත්තෙන් හැමදාමත් ගොවියාට වින කරපු එක තමයි කළේ. තිබුණු බීජ ගොවි පොළවල් ටික වහලා, බාල පොහොර ගෙනැල්ලා, කාබනික පොහොරවලට ගිහිල්ලා කෘෂි කර්මාන්තය හාන්සි කළේ විපක්ෂය. එහෙමයි ඔවුන් කෘෂි කර්මාන්තයට සැලකුවේ. හැබැයි, වර්තමාන රජය එහෙම නොවෙයි. ගොවියාගේ දුක, කඳුළ හඳුනන මේ රජය මේ රටේ ගොවියා වෙනුවෙන් වී ටික මිලදී ගන්න වැඩ පිළිවෙළ හැදුවා. හිස් වෙච්ච වී ගබඩා ටික නැවත සුද්ද පවිත්‍ර කරලා ඒ වැඩ පිළිවෙළවල් ටික හැදුවා. ගොවියාගේ පැත්තෙන් පොහොර සහනාධාරය ලබා දුන්නා. ආණ්ඩුව මැදිහත් වෙලා වී මිලදී ගැනීමේ ක්‍රියාවලියකට ගියා. පසුගිය කාලයේ අපි එහෙම දේවල් දැක්කේ නැහැ. එතුමන්ලා රාජ්‍ය යන්ත්‍රණය සම්පූර්ණයෙන් බිඳ වට්ටලා තිබුණේ. එහෙමයි තිබුණේ. ඒ නිසා අද මේ විපක්ෂය නඟන චෝදනා සම්බන්ධයෙන් අපට තිබෙන්නේ බලවත් කනගාටුවක් කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

ඊළඟට, සුරාබදු ආඥාපනත යටතේ ගෙනෙන රීති සම්බන්ධවත් වචන කීපයක් කියලා මගේ කථාව අවසන් කරන්නම්. අපි දැක්කා, මේ වනකොට රුපියල් බිලියන 10.5ක් භාණ්ඩාගාරයට අය වෙන්න තිබෙනවා කියලා. පසුගිය කාලයේ ඔබතුමන්ලා ඒවා අය කරගත්තේ නැහැ. ඔබතුමන්ලාගේ ගජ යහළුවෝ මේවා කළේ; කලින් ගජ යහළුවෝ කළේ. පසුව ඔබතුමන්ලාම මේ බිස්නස් එක පටන් ගත්තා. මේ බිස්නස් එක සම්බන්ධයෙන් ගත්තොත්, අද ආණ්ඩුවේ ඉන්න, පැවැති ආණ්ඩුවේ හිටපු මැති ඇමතිවරුන්ගේ නම් ගණනාවක් කියන්න පුළුවන්. මේ බදු ගෙවලා නැත්තේ ඔබතුමන්ලා. ඒ නිසා තමයි අද ඒක ගැන කථා කරන්නේ නැත්තේ. මොකද, ඔවුන්ගේම නම් කියැවෙන නිසා අද ඒ ගැන වැඩියෙන් කිව්වේ නැහැ. එහෙම කියන්න බැහැ. මට ඔය නම් ටික කියන්න අවශ්‍යතාවක් නැහැ. දැන් විපක්ෂයේ ඉන්න, හිටපු ඇමතිලා තමයි අද ඒ බිස්නස් එක කරන්නේ. එතුමන්ලා තමයි මේ ආණ්ඩුවට පොලු තියලා තිබෙන්නේ. එම නිසා ඒ සම්බන්ධයෙන් කථා කරන්න බැහැ. ආණ්ඩුවට රුපියල් බිලියන 10.5ක හිඟ තිබෙනවා; පොලු තිබෙනවා, ඔවුන්ම මේ ව්‍යාපාරය කරන නිසා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
නම් කියන්න.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
නම් ටික ඉතින් ඔබතුමන්ලා දන්නවා නේ. හෝද හෝදා මඩේ දමන්න ඕනෑ නැහැ. ඔබතුමාත්, මමත් ඒ නම් දන්නවා; පොලු තිබ්බේ කවුද කියලා දන්නවා. ඕනෑ නම් ජොන්ස්ටන්ගේ ඉඳලා දිගටම නම් ටික කියන්නම්, ඔබතුමාට අහගන්න. ඒ ගැන ඔබතුමාත් දන්නවා, මමත් දන්නවා. ඒ නිසා නිකම් කාලය නාස්ති කරන්න මම සූදානම් නැහැ. රුපියල් බිලියන 10.5ක මුදලක් පොලු තියලා තිබෙන්නේ. වැඩිපුර පොලු තියලා තිබෙන්නේ හිටපු ඇමතිවරුන්ගේ, හිටපු මන්ත්‍රීවරුන්ගේ ඉස්කාගාරවලින් කියන එක ඔබතුමාත් මතක තියා ගන්න කියන කාරණාව මම ඔබතුමාට මතක් කරනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අද ඒක ගැන කථා කරන්නේ නැහැ. කනත්තක් ළඟින් යනකොට අහක බලාගෙන දුවනවා වාගේ ඒ ගැන කියන්නේ නැතුව මේක අල්ලාගෙන යනවා. ඒක ඇල්ලුවත් ඒකත් විනාඩි පහක් යනකොට කුඩුපට්ටම් කරලා තිබෙනවා, අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා ඇතුළු මේ කණ්ඩායම. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, මේ තත්ත්වය ඇතුළේ මේ බදු පැනවීම හොඳ එකක් හැටියට දකින්න කියලා. එහෙම නැතුව ඕනෑම දෙයකින් ආණ්ඩුවට ගහලා කුජීත වෙන්නේ නැතුව හොඳ දේ හොඳ විධියට දකින්න කියන ඉල්ලීමත් කරමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.53]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිනට නියමිත විෂය සම්බන්ධව කථා කරන්න ඉස්සෙල්ලා අද මේ රටේ සිදු වෙච්ච ඉතාම කනගාටුදායක සිද්ධියක් ගැන කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ අවස්ථාවේදී පොලීසිය භාර ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. වැලිගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිවරයා අද මහ දවල් අමු අමුවේ ඝාතනය කළා. අද මේ රටේ ආරක්ෂාව තිබෙනවාද කියන එක ගැන බරපතළ ගැටලුවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වෙච්ච පසුගිය කාල සීමාව තුළ වෙඩි තැබීම් 100ක් විතර සිද්ධ වුණු ආකාරය අපි දැක්කා. ඒ විතරක් නොවෙයි. මිනී මැරුම් 60කට ආසන්න සංඛ්‍යාවකුත් සිද්ධ වුණා. එහෙම තත්ත්වයක් තමයි තිබෙන්නේ. එම නිසා ඒ සභාපතිවරයාගේ ඝාතනය අපට සුළුකොට තකන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම අපි දැක්කා, එතුමා සභාවේ පාලන බලය ලබා ගන්නකොටත්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස පත් වනකොටත් නොයෙකුත් ආකාරයේ බලපෑම් තිබුණු බව. ඒ වාගේම ආණ්ඩුවේ මැදිහත්වීම් තිබුණා. මට මතකයි, ආණ්ඩුව විශාල පිරිසක් අරගෙන ගිහිල්ලා එතුමා සභාපතිවරයා වශයෙන් පත් වන එක වළක්වන්න ලොකු උත්සාහයක් දරපු බව. එහෙම බලපෑම් මැද්දේ වාගේම විශාල පීඩනයක් මැද්දේ තමයි එතුමා ඒ ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයට පත් වුණේ; සමගි ජන බලවේගයට ඒ සභාව ලබා ගන්න කටයුතු කළේ.

දැන් හුඟක් වෙලාවට මිනී මැරුමක් සිද්ධ වුණාම මොකක්ද සිද්ධ වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? කුඩුවලට සම්බන්ධයි එහෙම නැත්නම් පාතාලයට සම්බන්ධයි කියලා ලේබලයක් අලවන්න තමයි ආණ්ඩුව පැත්තෙන් හැම අවස්ථාවේදීම කටයුතු කරන්නේ. නමුත්, එහෙම කරලා අත පිහදාගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මම මේ රජයෙන් ඉල්ලා සිටින්න කැමැතියි, මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා. මොකද, එතුමාගේ අතීතය සම්බන්ධව අපට ප්‍රශ්නයක් නැහැ. මහජනතාව එතුමාට ඡන්දය දීපු නිසා තමයි එතුමා මහජන නියෝජිතයෙක් ලෙස තේරී පත්වෙලා, ප්‍රාදේශීය සභා සභාපතිවරයා ලෙස පත් වුණේ. එහෙම නම් රජයට වගකීමක් තිබෙනවා, ඒ සම්බන්ධව විවිධ අර්ථ කථන දෙන්නේ නැතුව ඒ සිදුවීම වුණේ කොහොමද කියන එක ගැන අපක්ෂපාතී පරීක්ෂණයක් කරන්න. එම නිසා ඒ ගැන අපක්ෂපාතී පරීක්ෂණයක් කරන්න කියලා තමයි මට මේ අවස්ථාවේදී අදාළ අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටින්න තිබෙන්නේ. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාවත් අයින් කරලා තිබෙනවා. ඒ නිසා අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සම්බන්ධවත් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. බලන්න, අද රටේ තිබෙන අනාරක්ෂිත තත්ත්වය. දවසින් දවස වෙඩි තැබීම් සිද්ධ වෙනවා. ඒ තත්ත්වයත් එක්ක අපේ ආරක්ෂාව සම්බන්ධවත් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම අපට කලින් තිබුණු ආකාරයටම පොලිස් ආරක්ෂාවත් ලබා දෙන්න කටයුතු කරන්න කියලා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටින්න කැමැතියි.

මේ අවස්ථාවේදී මම තවත් කාරණයක් ගැන කියන්න ඕනෑ. අපි දන්නවා, හැම අවස්ථාවේදීම ඔබතුමන්ලා "නීතිය සැමට එකයි" කියලා කියූ බව. ඒ වාගේම රටේ ආරක්ෂාව තහවුරු කරනවා, වංචා සහ දූෂණ නැති කරනවාය කියලා තමයි ඔබතුමන්ලා බලයට ආවේ.

මේ වනකොට මට ලියුමක් ඉදිරිපත් කරලා තිබෙනවා, තුම්මුල්ල ප්‍රදේශයේ පදිංචි පිරිසක්. ඒ අය කියන්නේ මොකක්ද? ඊයේ පෙරේදා නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය ලබා දීලා තිබෙනවා, තුම්මුල්ල ප්‍රදේශයේ විශේෂ මහල් නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කරන්න. ඒ මහල් නිවාස ව්‍යාපෘතියට අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් මම හිතන විධියට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පදිංචිකරුවන් -මා ළඟ තිබෙන මේ ලිපිය ඉදිරිපත් කරලා තිබෙන අය- ප්‍රකාශ කරන පරිදි මීට වසර ගණනාවකට ඉස්සෙල්ලාත් ඒ ව්‍යාපෘතිය ආරම්භ කරන්න එක්තරා සමාගමක් කටයුතු කර තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සමාගමට අනුමැතිය ලබා දීලා නැහැ. මොකද, නාගරික සංවර්ධන අධිකාරියේ නිර්ණායකවලට, නීති රීතිවලට අනුගත නැහැ කියලා තමයි ඒ වෙලාවේදී ඒ සඳහා අනුමැතිය ලබා දෙන්න කටයුතු කරලා නැත්තේ. දැන් තිබෙන බරපතළ ප්‍රශ්නය තමයි, වර්තමාන සමාගමට ඒ සඳහා අනුමැතිය ලබා දුන්නේ කොහොමද කියන එක. මොකද අපි දන්නවා, ඉඩම් කැබලි තුනක් ඒක රාශි කරලා තමයි ඒ ව්‍යාපෘතිය පටන් ගන්න කටයුතු කරලා තිබෙන්නේ කියලා. ඊට අමතරව තවත් එක නිර්ණායකයක් තමයි, මුහුණත සඳහා නියමිත මීටර ප්‍රමාණය තිබෙන්න ඕනෑ වීම. නමුත් මෙහිදී මුහුණත සඳහා නියමිත මීටර ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් තිබෙන්නේ. එවැනි හේතු නිසා ඒ ව්‍යාපෘතියට කිසිසේත්ම අනුමැතියක් ලබා දෙන්න බැහැ. එහෙම වුණත්, මම හිතන විධියට තට්ටු 40ක මහල් නිවාස ව්‍යාපෘතියකට තමයි මේ අනුමැතිය ලබා දීලා තිබෙන්නේ. ඒක නේවාසික කලාපයක්. නේවාසික කලාපයක් තුළ එවැනි ගොඩනැඟිල්ලක් ඉදිකරන්න අවස්ථාවක් නැහැ. නමුත්, අනුමැතිය දීලා දවස් දෙකකින් හිටපු අමාත්‍යවරයා ඒකට මුල්ගල් තියන්නත් කටයුතු කරලා තිබෙනවා. දැන් අමාත්‍යවරයාත් වෙනස් වෙලා තිබෙන්නේ. එහෙම හදිසියේ අනුමැතිය ලබා දීලා, දවස් දෙකකින් විතර මුල්ගල් තියපු එක සම්බන්ධවත් යම්කිසි ආකාරයක

බරපතළ සැකයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඒ ප්‍රදේශවාසීන් වාගේම ඒ පිළිබඳව උනන්දුව දක්වපු අනෙකුත් ආයතන කියන්නේ මොකක්ද? මේකේ අත යට ගනුදෙනුවක් සිද්ධ වුණා ලු. නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරින් විසින් යම්කිසි මුදලක් අරගෙන ඒ සඳහා අනුමැතිය ලබා දුන්නාය කියලා සාධාරණ සැකයක් තිබෙනවා. ඒ නිසාද දන්නේ නැහැ, අමාත්‍යවරයාත් වෙනස් කරන්න කටයුතු කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම ඉල්ලා සිටිනවා, අනිවාර්යයෙන්ම මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න කියලා. ජනාධිපතිතුමාගෙනුත් ඒ අය ඉල්ලීමක් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රදේශවාසීන් ඉදිරිපත් කළ ලිපිය සහ ඊට අදාළ ලේඛනයක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ කාරණය ගරු ජනාධිපතිතුමාගේ විශේෂ අවධානයට යොමු කරලා, අක්‍රමිකතාවක්, වංචාවක් සහ දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒ ගැනත් සොයා බලා කටයුතු කරන්න කියලා තමයි මේ අවස්ථාවේදී මම ඉල්ලා සිටින්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී ඇති ඉතිරි විනාඩි දෙක තුළ මම අද දින විවාදයට ගෙන තිබෙන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වන නියමය පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වෙනවා. බොම්බයි ලූනු ගොවීන් සම්බන්ධව වාගේම අල ගොවීන් සම්බන්ධව අද විශාල වශයෙන් කථා කළා. ඒ නිසා මම ඒ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නුවරඑළිය ප්‍රදේශයේ ගොවි ජනතාව මට කරලා කිව්වා, අද වනකොට එළවලු මිලත් ඉතා පහළ මට්ටමකට වැටී තිබෙන බව. ඒ නිසා එළවලු වගා කළ ගොවියෝ අද වනකොට අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ඒ වාගේම, අල ගොවියෝත් ඒ තත්ත්වයේම තමයි; බී ලූනු ගොවියෝත් ඒ තත්ත්වයේම තමයි.

ගරු අමාත්‍යවරයාගේ කථාවේදී කියලා ගියා, "මේවා සම්බන්ධයෙන් විසඳුම් ලබා දෙනවා. මේ බද්ද අපි කලින් පැනවුවේ නැති වුණාට මේ සම්බන්ධයෙන් අක්‍රමිකතාවක් වුණේ නැහැ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න තිබෙන්නේ මේකයි. මීට මාස දෙක තුනකට ඉස්සෙල්ලා මේ බද්ද පැනවුවා නම්, ඒ තුළින් අපේ ගොවියාට සාධාරණයක් ඉෂ්ට කරන්න තිබුණා. මේ වෙනකොට විදේශ රටවලින් ගෙනාපු මෙට්‍රික්ටොන් 50,000ක විතර අල සහ බී ලූනු අපේ වෙළෙඳ පොළේ තිබෙනවා. එහෙම තොගයක් තිබියදී අපි මිල පාලනය කරන්නේ කොහොමද? අපේ ගොවියාගේ නිෂ්පාදනවලට අපි සාධාරණ මිලක් ලබා ගන්නේ කොහොමද? පිට රටින් ගෙනාපු අල වෙළෙඳ පොළේ කිලෝ එකක් රුපියල් 180ට, 200ට, 210ට තිබෙනවා. ඒ නිසා මේ තුළින් අපේ දේශීය ගොවීන්ට සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ. මම හිතන විධියට දැන් මේ බද්ද පැනෙව්වා කියලා අපේ ගොවීන්ට ලොකු වාසියක් ලබා ගන්න පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් තවත් මැසිවිල්ලක් තිබෙනවා. එක කාලයක නුවරඑළිය දිස්ත්‍රික්කයට ආවේණික වෙච්ච එළවලු වගා කිරීමේ කටයුතුවල ඒ දිස්ත්‍රික්කයේ ගොවීන් නියැළිලා හිටියා. ඒ නිසා සාමාන්‍යයෙන් උඩරට එළවලුවල මිල තුලනයක් තිබුණා. මොකද, ඒ එළවලු අනෙකුත් ප්‍රදේශවල වවන්නේ නැති නිසා ඒ එළවලුවලට යම්කිසි මිලක්, යම් ඉල්ලුමක් තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න, මම අවසන් කරනවා.

මෙතැන ඇතිවෙලා තිබෙන ප්‍රශ්නයට කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත් වෙනවා නම් හොඳයි. මොකද, විශේෂයෙන්ම චීනය, වියට්නාමය වාගේ රටවල් කෘෂි කර්මාන්තයට අදාළ එළවලු ඇතුළු අනෙකුත් දේවල් වගා කරන නිශ්චිත දිස්ත්‍රික්ක තෝරලා තිබෙනවා. ඒ වාගේම, වගා කරන නිශ්චිත ප්‍රදේශ තිබෙනවා. "මේ ප්‍රදේශවල තමයි මේවා වගා කරන්න ඕනෑ" කියලා තෝරා බේරා ගත් ප්‍රදේශ තිබෙනවා. එවැනි වැඩ පිළිවෙළකට ගියොත් තමයි සාධාරණ මිලක් හැමෝටම ගන්න පුළුවන් වන්නේ. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? නුවරඑළිය දිස්ත්‍රික්කයේ වගා කරන එළවලු දැන් කල්පිටිය, පුත්තලම, මන්නාරමේත් වගා කරන්න කටයුතු කර තිබෙනවා. මේ තුළින් වෙළෙඳ පොළට අතිරික්තයක් එනවා. ඒ ආකාරයට අතිරික්තයක් එන අවස්ථාවේදී කාටවත් සාධාරණ මිලක් ලබා ගන්න බැරි වෙනවා. එහෙම වුණාම සාධාරණ මිලක් නුවරඑළියේ ගොවීන්ට ලබා ගන්නත් බැහැ; පුත්තලමේ ගොවීන්ට ලබා ගන්නත් බැහැ. එම නිසා මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම ඇමතිතුමාගේ මැදිහත්වීමත් සිදු කරලා යම් සාධාරණ වැඩ පිළිවෙළක් ඇති කෙරුවොත් මිල තුලනය කිරීමේ හැකියාවක් තිබෙනවා කියන එකත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.01]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම අද උදෑසන ගරු විපක්ෂ නායකතුමාත් මතු කළ කාරණයක් තමයි, අද මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙක් ඝාතනය කර තිබෙනවා කියන එක. මට පෙරාතුව කථා කරපු ගරු මන්ත්‍රීතුමාත් මේ කාරණය මතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සිද්ධිය හරහා හෝ පසුගිය කාලයේ සිදු වූ වෙඩි තැබීම් හරහා මහජන ආරක්ෂාවට කිසිදු තර්ජනයක් වෙලා නැහැ.

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආනන්ද විජේපාල මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නා විධියට, මේ රටේ සංවිධානාත්මක අපරාධකරුවන් ඉන්නවා. සංවිධානාත්මක අපරාධකරුවන් කල්ලි හැටියට බෙදිලා ඉන්නවා. ඔවුන් සතුව අවි ආයුධ තිබෙනවා. ඔවුන් අතර ගැටුමක් තිබෙනවා. ඒ පිළිබඳව කිසිදු විවාදයක් නැහැ. මට මතක හැටියට, මම පසුගිය මැයි මාසයේ 20වැනි දාත් මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කළා. සන්නද්ධ කල්ලි, නැත්නම් සංවිධානාත්මක පාතාල අපරාධකරුවන් ඉන්නවා. අපරාධකරුවන් ආයුධ ළඟ තබාගෙන ඉන්නවා; ආයුධ සන්නද්ධව ඉන්නවා. ඔවුන් අතර ගැටුම් සිද්ධ වෙනවා. අද දින සිදුවූ සිදුවීම සම්බන්ධවත් මම මේ සභාවට කියන්න කැමැතියි. අද දින වෙඩි තැබීමකින් මරණයට පත්වෙලා තිබෙන්නේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ලසන්ත වික්‍රමසේකර නොහොත් "වැලිගම ලසා" කියන තැනැත්තා. ඔහු මහජන නියෝජිතයෙක් බවට පත් වුණාට, පාතාල අපරාධකරුවෙක්. ඔහුට විරුද්ධව නඩු 6ක් තිබෙනවා. මාතර මහාධිකරණයේ නඩු දෙකක් තිබෙනවා; කුරුණෑගල මහාධිකරණයේ නඩු දෙකක් තිබෙනවා; ගාල්ල අධිකරණයේ නඩු තිබෙනවා. ඔහු සිර දඬුවම් ලබා තිබෙනවා. අත්හිටවූ සිරදඬුවම් මත හිටියේ. විශේෂයෙන්ම පාතාල ක්‍රියාකාරකම්වලට සම්බන්ධයි. දැනට ඉන්දුනීසියාවේ ඉඳලා රඟෙන ආපු සංවිධානාත්මක අපරාධකරුවන් කිහිප දෙනෙක් ඉන්නවා. ඔවුන් කරන ප්‍රකාශ හරහා ඔහු සතුව යම් යම් අවි ආයුධ තිබෙන බව අනාවරණ වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විමර්ශන දිගටම පැවැත්වෙමින් තිබෙනවා. පසුගිය ජුනි මස 27වැනි දිනත් ඔහු උසාවියට ගිහිල්ලා තිබෙනවා. විවිධ අපරාධ සම්බන්ධයෙන් facts වාර්තා කර තිබෙනවා. මත්ද්‍රව්‍ය ජාවාරමෙන් මුදල් උපයා ගැනීම සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් තිබෙනවා. මේ විධියට පාතාල අපරාධවලට සම්බන්ධ පුද්ගලයන් අතර ආරවුල් ඇතිවීම පසුගිය කාලයේ තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේකත් එවැනි ආරවුලක්. පාතාල අපරාධකරුවන් එකිනෙකා අතර තිබෙන ආරවුල් තමන් සතුව තිබෙන ආයුධ භාවිත කරමින් මේ විධියට මිනිස් ඝාතන බවට පරිවර්තනය කර ගන්නවා. පසුගිය කාලය පුරාවටම සිද්ධ වුණේ ඒ දේ තමයි. මේකත් ඒ හා සමාන සිද්ධියක්. සමගි ජන බලවේගය කියනවා, එතුමන්ලාගේ පක්ෂයේ එවැනි අය නැහැ කියලා. ඒ ගැන අපි දන්නේ නැහැ. මම පසුගිය මැයි 20වැනි දාත් මේ පිළිබඳව පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කළා. එහිදී සජබය සම්බන්ධයෙනුත් සමහර නම් ගම් කිව්වා.

මේ පුද්ගලයාත් එවැනි පුද්ගලයෙක්. පාතාල ක්‍රියාකාරකම්වලට සම්බන්ධ හෝ වෙනත් පුද්ගලයෙක් හෝ මිය යෑම අපි කිසිසේත්ම අනුමත කරන්නේ නැහැ. අපි සියලු මිනිස් ජීවිතවල වටිනාකම අගයන ආණ්ඩුවක්. මේ පිළිබඳව විධිමත් විමර්ශනයක් සිද්ධ කරනවා. ඒ ඝාතනය අපි කිසිසේත්ම අනුමත කරන්නේ නැහැ. කවුරු වුණත් ඔහු මහජන නියෝජිතයෙක් හැටියට පත් වෙලා තිබෙනවා. හැබැයි, අපි කියන්නේ, පාතාල ක්‍රියාකාරිකයෙක් යම් දේශපාලන පක්ෂයක කටයුතු කර, ඔහු ඒ පක්ෂය විසින් එම ස්ථානයට පත් කර තිබෙනවා. හැබැයි, ඔහු ඝාතනය වෙනකොට, ඔහු මහජන නියෝජිතයෙක් කියන category එකට නොවෙයි, පාතාල ක්‍රියාකාරිකයෙක් කියන category එකට තමයි වැටෙන්නේ. මොකද, මට තේරෙන විධියට මේ නඩු හරහා, ඔහු සම්බන්ධයෙන් තිබෙන විමර්ශන හරහා, ඔහු පාතාල ක්‍රියාකාරිකයෙකු බවට, එහෙම නැත්නම් සංවිධානාත්මක අපරාධ කල්ලිවල නායකයෙකු හැටියට කටයුතු කළ බවට, ඕනෑ තරම් තොරතුරු පොලීසිය සතුව තිබෙනවා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබෙනවා. ඒ වාගේම අධිකරණයට කරුණු වාර්තා කරලා තිබෙනවා. ඔහු සම්බන්ධයෙන් විභාග වන නඩු තිබෙනවා, අත්හිටවූ සිර දඬුවම් දීලා තිබෙනවා, ඒ සියල්ල කරලා තිබෙනවා. ඒ නිසා මම ගරු විපක්ෂ නායකතුමාට හා එම පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරනවා, මහජන නියෝජිතයෙක් හැටියට පත් කරන පුද්ගලයා සමාජයේ නීතිගරුක පුරවැසියෙක් වුණා නම්, මෙවැනි දේ සිද්ධ වෙන්නේ නැහැ කියන එක.

මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பි.ப. 4.05]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உள்நாட்டிலே உற்பத்தி செய்யப்படுகின்ற வெங்காயம் மற்றும் உருளைக்கிழங்கு போன்ற பருவகாலப் பயிர்களை அறுவடை செய்யும் காலங்களிலே அவற்றுக்கு உரிய விலையைப் பெற்றுத்தரும் நோக்கில், வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்யப்படுகின்ற வெங்காயம் மற்றும் உருளைக்கிழங்குக்கான வரியை அதிகரிக்குமுகமாகச் சமர்ப்பிக்கப்பட்டுள்ள விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டத்தின்கீழான கட்டளை பற்றிய இன்றைய பிரேரணையை நான் உண்மையிலே ஆதரிக்கின்றேன். கடந்த காலத்தில் தேசிய மக்கள் சக்தி அரசாங்கம் கூறியதற்கமைவாக நாங்கள் இந்த நாட்டின் விவசாயத் துறையை மேம்படுத்துவோம்.

உண்மையிலேயே இலங்கையானது ஒரு விவசாய நாடாகும்; விவசாயத் துறையில் புகழ்பெற்ற பல விடயங்களைச் சாதித்த நாடாகும். எமது நாட்டில் விவசாயப் பொருளாதாரமே ஆதிக்கம் செலுத்துகின்றது. குறிப்பாக, வடக்கு, கிழக்கு, வட மத்திய மற்றும் மத்திய மாகாணங்களில் உள்ள மக்கள்தான் கூடுதலாக விவசாய நடவடிக்கைகளில் ஈடுபட்டு வருகின்றார்கள். இந்த மக்களுடைய வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்காக, விவசாய நடவடிக்கைகளை அதிகரிப்பதற்காக அரசாங்கம் என்ற வகையில் நாங்கள் அவர்களுக்கு உதவி செய்ய வேண்டிய கடப்பாட்டிலே இருக்கின்றோம். ஆரம்ப காலங்களிலே எங்களுடைய நாடு விவசாயத்திலே தன்னிறைவு அடைந்த ஒரு நாடாகக் காணப்பட்டது. குறிப்பாக, பொருளாதார நெருக்கடி மற்றும் யுத்த காலங்களில்கூட வடக்கு மாகாணம் விவசாயத் துறையிலே, விவசாயப் பொருண்மியத்திலே தன்னிறைவு கண்ட ஒரு பிரதேசமாகும்.

1977ஆம் ஆண்டுக்கு முன்னர் இலங்கையானது விவசாயத்துக்குப் புகழ்பெற்ற நாடாக இருந்ததாகவும், இங்கே விவசாயிகள் செழுமையான ஒரு வாழ்க்கையை வாழந்ததாகவும் வரலாறுகள் குறிப்பிடுகின்றன. ஆனால், அதற்குப் பின்னர் நாட்டிலே கொண்டுவரப்பட்ட சட்ட திட்டங்கள் வெளிநாட்டுப் பண்டங்களின் இறக்குமதிக்கு வழிவகுத்தது. தேவைக்கு அதிகமாக அல்லது மக்களுடைய விவசாய உற்பத்திகளைக் கருத்திற் கொள்ளாமல் விவசாயப் பொருட்களை இறக்குமதி செய்ததன் காரணமாக இறக்குமதிக் கலாசாரம் இங்கே பரவியது.

1980ஆம் ஆண்டிலே வடக்கு மாகாணம் இலங்கையின் மொத்த சிவப்பு வெங்காய - சின்ன வெங்காய - உற்பத்தியில்

56 சதவீதப் பங்களிப்பை வழங்கியது. குறிப்பாக, யாழ்ப்பாண மாவட்டம் 45.4 சதவீதப் பங்களிப்பை வழங்கியிருந்தது. ஆனால், 2005ஆம் ஆண்டின் புள்ளிவிபரத்தைப் பார்க்கின்றபோது, அன்று 56 சதவீதமாகக் காணப்பட்ட வெங்காய உற்பத்தி 20.6 சதவீதமாகக் குறைந்து காணப்பட்டது. வடக்கு மாகாணத்தில், குறிப்பாக யாழ்ப்பாணத்தில் உற்பத்தி செய்யப்படுகின்ற சின்ன வெங்காயம் தொடர்பாக இந்த இடத்திலே கதைக்க வேண்டிய தேவை எனக்கு இருக்கின்றது. சின்ன வெங்காயமானது, உலகளாவிய ரீதியிலே புகழ்பெற்ற ஒரு விவசாயப் பொருளாகக் காணப்படுகின்றது. ஆனால், கடந்த காலத்தில் பின்பற்றப்பட்ட சீரற்ற பொருளாதாரக் கொள்கை காரணமாக இதன் பயிர்ச்செய்கை வீதம் குறைவடைந்து காணப்படுகின்றது. இன்னும் சொல்லப்போனால், தற்போது காணப்படுகின்ற காலநிலை மாற்றங்களினால் வடபகுதி விவசாயிகள் மிக மோசமான பொருளாதார நெருக்கடிக்குள்ளாகி வருகின்றார்கள்.

உதாரணமாக, சில விவசாய உற்பத்திப் பொருட்களுக்கு காப்புறுதித் திட்டங்கள் காணப்படுகின்றன. ஆனால், சின்ன வெங்காய உற்பத்திக்கு இலங்கையிலே காப்புறுதித் திட்டங்களோ வேறு எந்தத் திட்டங்களோ இல்லை. எனவே, சின்ன வெங்காய உற்பத்திக்கு பாதுகாப்பை வழங்க இந்த அரசாங்கம் நிச்சயமாக அதிக கரிசனை கொள்ளும். அந்த விவசாயிகளின் வாழ்வாதாரத்தை மீட்டெடுத்து, அவர்கள் தன்னிறைவாக வாழக்கூடிய சூழலை நாங்கள் உருவாக்குவோம். குறிப்பாக, சின்ன வெங்காயத்தைச் சந்தைப்படுத்தும் செயற்பாடு மிகவும் மோசமான நிலைமையில் காணப்படுகின்றது. அதாவது, இந்த விவசாயிகளின் உற்பத்திப் பொருட்களைப் பெற்றுக்கொள்ளும் இடைத்தரகர்கள் அதிகமான இலாபத்தை ஈட்டுவதுடன் அவ்விவசாயிகளின் வயிற்றில் அடிக்கின்ற செயற்பாடுகளையும் செய்து வருகின்றார்கள். எனவே, இடைத்தரகர்களிடம் இருந்து விவசாயிகளைக் காப்பாற்ற வேண்டிய தேவை எமக்கு இருக்கின்றது. தேசிய மக்கள் சக்தி அரசாங்கம் இந்த நாட்டில் விவசாயத் துறையை மேம்படுத்தி நாட்டை மீண்டும் பசுமையான, விவசாயப் புரட்சிமிக்க நாடாக நிச்சயமாக மாற்றும் என்று கூறி, இந்த வாய்ப்பை வழங்கிய உங்களுக்கு நன்றி தெரிவித்து, விடை பெற்றுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු උපාලි සමරසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.10]

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අනුමැතියට ඉදිරිපත් කරන ලද සුරාබදු ආඥාපනත යටතේ රීති හා විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය සම්බන්ධයෙන් අපි පැය කිහිපයක් මේ ගරු සභාව තුළ වාද විවාද කළා. මෙහිදී අපේ පැත්තෙන් අපට පෙනෙන දෙයක් තිබෙනවා. මේ වාද විවාද කරන්න ඕනෑ ඇයි? අපට මේ වාගේ පනත් යටතේ රීති, නියම ගෙන එන්න සිදු වෙලා තිබෙන්නේ මොකද? ඒ රීති හා නියම මේ රටේ ජනතාවටත්, රටේ ආර්ථිකයටත් බලපාන්නේ කොහොමද කියන කාරණා වෙනුවට අද බොහෝ වෙලාවට මේ ගරු සභාව තුළ විපක්ෂය පැත්තෙන් බොළඳ තර්ක තමයි මතු වුණේ. ඒ වාගේම, විවිධ ප්‍රකාශ කරමින් තමයි, විපක්ෂය මේ විවාදයට සම්බන්ධ වුණේ. අපේ රටේ ආර්ථිකය සඳහා බදු අය කිරීමේදී ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙන් තමයි අපට සැලකිය යුතු බදු ප්‍රමාණයක් ලැබෙන්නේ. අපි ඒ බව දන්නවා. ඒ වාගේම ඒ බදු මුදල්වලින් තමයි අපි මේ රටේ මහ ජනතාවගේ පොදු පහසුකම් සඳහා මුදල් වැය කරමින්, මේ රටේ අනෙකුත් වැඩ සඳහා මුදල් වෙන් කරන්නේ.

පසුගිය දශක ගණනාවක් තිස්සේ සුරාබදු දෙපාර්තමේන්තුවේ තිබුණු නීති මාලාවන් යල් පැන ගිය ඒවා වන නිසාත්, වංචාකාරයන්ට, දූෂිතයන්ට ඒවායෙන් රිංගන්න පුළුවන් විධියේ නීති මාලාවන් තිබුණු නිසාත් තමයි, අපේ රටේ මහා භාණ්ඩාගාරයට ලැබිය යුතු බොහෝ මුදල් වෙනත් පාරවලින් තමතමන්ගේ සාක්කුවලට ගියේ. ඒ නිසා නව නීති පනවන්නේ නැතුව තිබෙන නීති වෙනස් කරමින්, බදු වැඩි කරන්නේ නැතුව ඒවා නැවත සාධාරණ ලෙස අය කර ගන්න පුළුවන් විධියට නීති වෙනස් කර ගනිමින්, ඒ සඳහා වැරැදිකරුවන් වූ අයට, මහහරින්නන්ට නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් වන විධියේ සංශෝධන තමයි මේ පනත් යටතේ අප මේ සිදු කරනු ලබන්නේ.

මීට කලින් කථා කරපු අපේ ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා කිව්වා වාගේම, අපේ රටේ අහිංසක ජනතාව තමන්ගේ දහඩිය මහන්සියෙන් හම්බ කරන සල්ලි දීලා තමයි මත්පැන් පානය කරන්නේ. සල්ලි දීලා තමයි අපි බියර්, අරක්කු ගන්නේ. හැබැයි, ඒ ගෙවන බදු ව්‍යාපාරිකයෝ, කොම්පැනිකාරයෝ මේ රටේ බැංකුවලට, අපේ රටේ භාණ්ඩාගාරයට ගෙවන්නේ නැහැ. නමුත්, මින් ඉදිරියට නීතිය හරහා මේ රටේ මහ ජනතාවගේ බදු මුදල් භාණ්ඩාගාරයට එන්න පුළුවන් ක්‍රමයක් සකස් වෙයි කියා අපි විශ්වාස කරනවා. කෘෂි වෙළෙඳ භාණ්ඩ බද්ද සම්බන්ධයෙන් කථා කිරීමේදී අපේ ගරු නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, යම් යම් සිදුවීම් සම්බන්ධයෙන් නීතිය පැත්තෙන්, වක්‍රලේඛ පැත්තෙන් කොතෙක් ඇත්ත කිව්වත් බොහෝ වෙලාවට විපක්ෂය පැත්තෙන් ඒ සම්බන්ධයෙන් දිගින් දිගටම බොරු ප්‍රචාරය කරමින් පැයේ, විනාඩි පහේ, දහයේ බොරු කියනවා කියලා. අපේ රටේ බදු ප්‍රතිපත්තිය අවුරුදු ගණනක් තිබුණා. අපේ රටේ අල, ලූනු ආදියට අවුරුදු ගණනක් බදු ගැහුවා. නමුත්, අපේ රටට අවශ්‍ය ලූනු ටික, අල ටික වගා කර ගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපේ ආණ්ඩුව තුළ අපි උත්සාහ කරමින් ඉන්නවා, මේ රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳන්නත්, නිෂ්පාදන වියදම අඩු කරලා මේ රටේ කෘෂි කර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය වැඩ කටයුතු කරන්නත්.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.15]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ සුරාබදු ආඥාපනත යටතේ ගෙනෙන රීති පිළිබඳවත් අදහස් ප්‍රකාශ කරනු ලබනවා. ඒ

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

පිළිබඳව යෝජනා ගණනාවක්, අදහස් ගණනාවක්ම ඉදිරිපත් වුණා. අපේ රටට ආදායම් උත්පාදන කරන මාර්ගයක් විධියට, භාණ්ඩාගාරයට වැඩිම මුදලක් සපයන ආයතනයක් විධියට සුරාබදු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙනවා.

සුරාබදු අය කිරීම සම්බන්ධයෙන් අපි කථා කළා, එක්කාසු කරන සුරාබදු මුදල් සුරා නිෂ්පාදනය කරන සමහර ආයතනවලින් රජයට හරියාකාරව ගෙවන්නේ නැහැ කියන කාරණයත් කියැවුණා. එම ආයතන එසේ එක්කාසු කරගෙන තිබෙන මුදල් රජයට ගෙවන්නේ නැත්නම් නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි. මොකද, රජයේ බලපත්‍රයක් මත තමයි ඒ ආයතන ක්‍රියාත්මක වෙන්නේ. රජය එය හරියාකාරව කළමනාකරණය කරනවා නම්, guide කරනවා නම්, ඒ බදු මුදල් නොලැබී තිබෙන්නට හේතුවක් නැහැ කියලායි මා හිතන්නේ. ලයිසන් එක ඊළඟ වතාවේ අලුත් කරන්න කලින් එකී බදු නොගෙවීම පිළිබඳව සොයා බලා බල පත්‍රය අලුත් නොකර සිටියා නම් ඒ අය ඒ බදු මුදල් ගෙවන්න විශේෂයෙන් කටයුතු කරනවා.

බදු එකතු කිරීම වාගේම රටේ අද කථා කරන ප්‍රධාන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා, මත්ද්‍රව්‍ය උවදුර. අපේ රටේ පාවිච්චි නොකරපු අලුත් මත්ද්‍රව්‍ය පවා සමාජය අද ග්‍රහණය කර ගනිමින් තිබෙනවා; සමාජයේ පරිහරණය වෙමින් තිබෙනවා; අපේ පාසල් දරුවන් පවා ඒවාට ඇබ්බැහි වෙමින් සිටිනවා. පාසල් පද්ධතිය පවා මත්ද්‍රව්‍ය ක්‍රියාත්මක කරන, එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය ජාවාරමට හසු වෙච්ච ඉලක්කයක් බවට අද පත් වෙලා තිබෙනවා. මේක මෙතැනට යොමු වෙන්න ප්‍රධාන කාරණයක් බවට පත් වෙන්නේ, මේ රටේ සුරාබදු ලෙස පනවන බදු ප්‍රමාණය වැඩි කර තිබීමයි. බදු වැඩි වීම තුළ සාමාන්‍යයෙන් ජනතාව පාවිච්චි කරන සියලු අරක්කුවල මිල විශාල වශයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. එම නිසා අඩු මුදලකට ලබාගෙන වැඩි වෙරි ගතියක් ලබා ගන්න ජනතාව වෙනත් මත්ද්‍රව්‍යවලට යොමු වීමේ වැඩි ඉඩකඩක් නිර්මාණය කර තිබෙනවා. ඒවායෙන් බදු ලැබෙන්නේත් නැහැ; රජයට ආදායමකුත් නැහැ. ඒක ප්‍රවර්ධනය කරලා තිබෙන්නේ, ප්‍රචලිත කරලා තිබෙන්නේ අපේ රජය විසින්.

රජය අනවශ්‍ය විධියට බදු ගහලා තිබෙන නිසා සාමාන්‍ය ජනතාවට තමාට පාවිච්චි කරන්න තිබෙන ගල් බෝතලයේ ඉඳලා පාවිච්චි කරන මත්පැන් සියල්ලම විශාල මුදලකට ගන්න සිදු වෙලා තිබෙනවා. Duty-free එකෙන් විස්කි ලීටරයේ බෝතලයක් ගන්න ගණනට සාමාන්‍ය ගල් බෝතලය එළියේ අළෙවි කරන තැනට ආවාම රටේ ජනතාවට ඒවා මිල දී ගැනීමේ අපහසුතාවක් තිබෙනවා. ඒ නිසා වැඩිහිටි පරම්පරාව ගම්වල පෙරන කසිප්පුවලට ඇබ්බැහි වෙනවා. එසේ ඇබ්බැහි වීමට, ඒවා ප්‍රචලිත වීමට, ව්‍යාප්ත වීමට, ඒවාට ලොකු වෙළෙඳ පොළක් නිර්මාණය වීමට ඒ මිල වැඩිවීමත් හේතු වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, තරුණ පරම්පරාව කසිප්පු ගහන්න බැරි නිසා තමන්ට අවශ්‍ය මත් ගතිය ලබා ගැනීම වෙනුවෙන් තමන්ගේ අතේ තිබෙන මුදලට මත්ද්‍රව්‍යවලට යොමු වීමේ ලොකු ඉඩකඩක් තිබෙනවා. ඒක තමයි අද වෙලා තිබෙන්නේ. වෙනදාට වඩා විශාල වශයෙන් මත්ද්‍රව්‍ය ප්‍රචලිත වන, ව්‍යාප්ත වන, අපේ රටේ ව්‍යසනයක් බවට පත් වන තැනට ඇවිත් තිබෙන්නේ, ආදායම් උත්පාදනය කරන කෙටි මාර්ගයක් විධියට රජය මත්ද්‍රව්‍යවලට පනවා තිබෙන බද්දයි. එම නිසා මෙම බද්ද පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න. ඉදිරියේදී අය වැය ඉදිරිපත් වෙනවා. ඒ අය වැයේදී මේ පිළිබඳව අවධානය යොමු කරන්න. මේ මත්පැන් රජයේ අනුමැතියට යටත්ව නම් පෙරන්නේ, ඒවා රජයේ පරීක්ෂණාගාරවලින් පරීක්ෂණ කරලා නම් එන්නේ, පරීක්ෂා නොකරන මත්පැන්වලට වැඩිය මෙම මත්පැන්වලින් වුණත් ජනතාව ගලවා ගන්න බුදු හාමුදුරුවන්ටත් බැරි වුණු එකේ, රජයකට එය කරන්න පුළුවන් කියලා අපි හිතන්නේ නැහැ. ඒ නිසා අපි යෝජනා කරන්නේ, පුළුවන් තරම් ප්‍රමාණයකින් මත්පැන්වලට පනවා තිබෙන බද්ද අඩු කරලා පාරිභෝගික ජනතාවට දැරිය හැකි මුදලකට ලබා ගන්න අවස්ථාව දෙන්න කියලා. ගල් අරක්කු තමයි මේ රටේ ජනතාව වැඩි වශයෙන් භාවිත කරන මත්පැන් බවට පත් වෙලා තිබෙන්නේ. ඒකට සාධාරණ මිලක් ලබා දුන්නොත් අපට පුළුවන් වෙයි එක පැත්තකින් කසිප්පු ජාවාරම්කාරයින්ගෙන් මේ රටේ ජනතාව යම් ප්‍රමාණයකට ගලවා ගන්නට. අනෙක් පැත්තෙන් අපේ රටේ තරුණ පරම්පරාව, හෙට දවසේ මේ රට භාර ගන්න ඉන්න අපේ අහිංසක දරුවෝ ටික මත් උවදුරෙන් ගලවා ගන්න පුළුවන් වෙයි. මම ඒ ගැන පරීක්ෂණ කරලා, research එකකින් ගත්ත results නොවෙයි මේ කියන්නේ. අපි සමාජයේ ගැවසෙනකොට සමාජය තුළ ඇති වන කතිකාවලින් අපට අවබෝධ වන කාරණයක් තමයි මම කිව්වේ. ඉක්මනින් ලාභ උපයන්නට, ඉක්මනින් මුදල් උපයා ගන්නට මේ විධියට බදු වැඩි කිරීම තුළින් රටක් විධියට අපට විශාල ව්‍යසනයකට මුහුණ දෙන්න වනවා කියන එක තමයි අපට පෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලවකවානුවේ අපේ රටේ ගොවි ජනතාව ගොවිතැන් කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ. හැබැයි, අදත් එය අභියෝගයට ලක් වෙලා තිබෙන්නේ. අපි සහල් නිෂ්පාදනය කරනවා කියනවා. අපේ රට සහලින් ස්වයංපෝෂිතයි කියනවා. හැබැයි, රටට අවශ්‍ය සහල් ප්‍රමාණය තවම නිෂ්පාදනය කර ගන්න හැකියාවක් ලැබිලා නැහැ. අපට නාඩු සහල් කොච්චරක්ද අවශ්‍ය වෙන්නේ, සම්බා සහල් කොච්චරක්ද අවශ්‍ය වෙන්නේ, කීරි සම්බා කොච්චරක්ද අවශ්‍ය වෙන්නේ කියලා බලලා අපි සැලසුම්සහගතව ගොවීන්ට වගා කරන්න අවස්ථාව උදා කර දීලා නැහැ. එම නිසා අද එක පැත්තකින් නාඩු මිල බහිනවා. සාමාන්‍යයෙන් යල කන්නයේ බාල වී තමයි අපේ ගොවියෝ වගා කරන්න පුරුදු වෙලා ඉන්නේ. මොකද, වතුර පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා. වතුර පිළිබඳව අවදානමක් තිබෙන නිසා ගොවි ජනතාව ඉක්මනින් පැහෙන වීවලට යොමු වනවා. එතකොට යල කන්නයේ නාඩු වී වගා කරන්න යොමු වනවා. ඒ නිසා අපි යල කන්නයේ කීරි සම්බා වගාව ප්‍රචලිත කරන්න හැදුවාට, ගොවීන් උනන්දු කරන්න හැදුවාට, ගොවියෝ එතැනට ගෙනෙන්න බැහැ. හැබැයි, රටේ කීරි සම්බා අවශ්‍යතාව අනුව මේ මොහොතේ රජය විසින් වැඩ පිළිවෙළක් හදලා, කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ගොවි ජනතාවට අවශ්‍ය බීජ ටික ලබා දීලා, රටට අවශ්‍ය ප්‍රමාණයට කීරි සම්බා වගා කරන්නට ගොවි ජනතාව පෙලඹුවොත් අපට පුළුවන් වෙයි රටට අවශ්‍ය කරන කීරි සම්බා නිෂ්පාදනය කර ගන්න.

අදටත් මම විශ්වාස කරනවා, කීරි සම්බා හිඟයක් නැහැ කියලා. අපේ අවශ්‍යතාවට නිෂ්පාදනය කරලා තිබෙනවා. හැබැයි, ප්‍රධාන වී මෝල් හිමියෝ ඒ ටික අරගෙන ගබඩා කරගෙන ඉන්නවා. මොකද, කීරි සම්බා ගන්න විශේෂ පිරිසක් ඉන්නවා. ඒ පිරිස ඒකෙන් ගැලවෙන්නේ නැහැ. එම නිසා කීරි සම්බා සඟවාගෙන මිල පාලනය කිරීමට ප්‍රධාන වී මෝල් හිමියෝ කටයුතු කරනවා. එම නිසා රජය මැදිහත් විය යුතු වනවා, කීරි සම්බා නිෂ්පාදනය කරන්න ගොවියෝ පොලඹවන්න වාගේම, ඒ වී ටික සාධාරණ මිලකට ගන්න. මොකද, ගිය මහ කන්නයේ අස්වනු නෙළනකොට මේ රටේ නාඩු වී මිලට වඩා කීරි සම්බාවල මිල පහළ බැස්සා. ඒ වෙලාවේ අඩු මුදලට සහ කුණුකොල්ලෙට අරගෙන ගබඩා කර ගත් වී තමයි අද විශාල මුදලකට අළෙවි කරන තැනට පත් වෙලා තිබෙන්නේ. එම නිසා කීරි සම්බා වගා කරන්නට ගොවි ජනතාව පොලඹවනවා වාගේම, ගොවි ජනතාවට කීරි සම්බාවලට වැඩි මිලක් ලබා දෙන්න. කීරි සම්බා ගෙන්වන්න ගියාම අපේ විදේශ විනිමය අහිමි වනවා. එම නිසා වැඩි පිරිවැයක් දරලා හෝ ගොවීන්ගෙන් කීරි සම්බා මිලදී ගන්න.

වෙළෙඳ පොළේ ක්‍රියාත්මක වන, මුදලාලිලා දෙන මුදලට වඩා වැඩි මුදලකට රජය අරගෙන ගබඩා කර ගත්තොත්, අපට පුළුවන් ක්‍රමානුකූලව කීරි සම්බා වෙළෙඳ පොළට නිකුත් කර, ඒ හරහා කීරි සම්බා හිඟයට පිළියම් ලබා දෙන්න. එහෙම නැතුව පොන්නි සම්බා ගෙනාවාට එය කීරි සම්බාවලට විකල්පයක් බවට පත් වෙන්නේ නැහැ. හෝටල්වල ඒ හදන rice එකට කීරි සම්බා ම තමයි අවශ්‍ය වෙන්නේ. පොන්නි සම්බා ගෙන්වීම තුළින් කීරි සම්බාවල මිල පහළට ගෙනෙන්නට හැකියාව ලැබෙන්නේ නැහැ කියන එක අපි බොහොම පැහැදිලිව කියනවා.

අද වනකොට අපේ ගොවියෝ අස්වනු අළෙවි කර ගැනීමට නොහැකිව දැඩි අපහසුතාවකට පත් වෙලා ඉන්නවා. අපේ අර්තාපල් ගොවියෝ ගැන අපි දන්නවා. ඒ කට්ටියත් ප්‍රශ්නයක ඉන්නේ. ඊට වැඩිය අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව පෙළෙන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ, තමයි ඔවුන්ගේ බී ලූනු ටික අළෙවි කර ගන්න බැරි තත්ත්වයෙ. බී ලූනු ටික ගෙනැල්ලා stock කරලා, අවසානයේ ආනයන බද්දක් පනවා තිබුණාට, අපේ ගොවි මහත්වරුන්ට අද බී ලූනු ටික අළෙවි කර ගන්න හැකියාවක් නැහැ. එම නිසා බී ලූනු ගොවියෝ දැඩි අපහසුතාවකට පත්ව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට ඔබතුමා දන්නවා, අපේ බී ලූනු ඉන්දියාවේ සහ පාකිස්තානයේ බී ලූනු වාගේ වියළි තත්ත්වයෙන් නැති බව. එම නිසා ඒවා ගබඩා කර ගන්නට අපේ ගොවීන්ට හැකියාවක් නැහැ. මේ වර්ෂා කාලය. ඒ නිසා ඒ ඔක්කෝම කුණු වෙලා, විනාශ වෙලා යනවා. එම නිසා ඉක්මනින් ඒ ටික අළෙවි කර ගන්නට සුදුසු වැඩ පිළිවෙළක්, සැලැස්මක් සකස් කරලා එම ගොවීන්ට සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්න කියන කාරණය මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුති කරමින්, මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.22]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින පාර්ලිමේන්තුවේ යෝජනා දෙකක් විවාදයට ගැනෙනවා. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ගෙනෙන නියමය සහ සුරාබදු ආඥාපනතේ 52 වෙනි අධිකාරය යටතේ ඉදිරිපත් කරන ලද රීති අනුමත කර ගැනීමට අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා.

සුරාබදු ආඥාපනත යටතේ නව රීති පැනවීමේ ප්‍රධාන අරමුණ අලුතින් බදු පැනවීමක් නොවෙයි. අපේ ආණ්ඩුව පත් වුණාට පස්සේ සෑම ක්ෂේත්‍රයකම ක්‍රමවල තිබෙන ගැටලු ගණනාවක් හඳුනාගෙන තිබෙනවා. විශේෂයෙන් ඒ හැම තැනකම බදු අය කර ගැනීමේ පරිපාලනය විධිමත් කර ගත යුතුයි. අපේ අවධානයට යොමු වුණා සුරාබදු ආඥාපනත යටතේ පනවන ලද රීතිවල තිබෙන හිල්, අඩු පාඩු අවස්ථාවාදීව ව්‍යාපාරිකයන් විසින් භාවිත කිරීමේ තත්ත්වයක්. ඒක වළක්වා ගැනීමත්, හිඟ බදු ගොඩ නොගැසීමටත්, බදු පරිපාලනය වේගවත් කිරීමේ අරමුණිනුත් තමයි මේ නව රීති පැනවීම සිද්ධ කළේ.

එහිදී ප්‍රධාන වශයෙන්ම වෙන්නේ මෙන්න මේ කාරණය. දැනට තිබෙන රීතිවලට අනුව, ඒ කියන්නේ 2014 අංක 1846/8 දරන ගැසට් පත්‍රය යටතේ නිවේදන අංක 962 ඉදිරිපත් කරලා තිබෙනවා. අපි දැන් ඒ නිවේදනය අවලංගු කරනවා. ඒ නිවේදනය යටතේ, බදු, අරක්කු, බියර් සහ ස්ප්‍රීතු නිෂ්පාදනය මත ගෙවන්න ඕනෑ බදු හිඟ හිටියොත්, ඒවා ගෙවීමට ඒ අදාළ ආයතනයට සහන කාලයක් දීලා තිබුණා. ඒක මාස 6ක් වෙනකම් දීලා තිබුණා. ඒ මාස 6 ඇතුළතදී මාස්පතා සියයට 3ක පොලියක් එකතු කිරීමේ ඉඩකඩක් ඒ නිවේදනයේ තිබුණා. ඒ පොලිය අධිභාරයක් විධියට පනවලා තිබුණේ. ඒ අධිභාරය පැනවුණෙත් වැල් පොලී ක්‍රමයකට එක මත එක එකතුවෙමින්. මෙන්න මේ මාස 6ක කාල සීමාව අවසාන වුණාම සුරාබදු දෙපාර්තමේන්තුවට ඒ ආඥාපනතේ 17වෙනි වගන්තිය අනුව ඉඩකඩක් පැවරිලා තිබුණේ නැහැ, නඩු ක්‍රියාමාර්ග ගන්න. තවමත් එහෙම නැහැ. ඔවුන්ට පැවරිලා තිබුණේ ලබා දීලා තිබුණු බලපත්‍රය අහෝසි කරන්න පමණයි. නමුත්, ඒ බලපත්‍රය අහෝසි කරන්න ගියාම ඔවුන්ට ප්‍රායෝගික ගැටලු ගණනාවකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ මාස 6ක කාල සීමාව නිසා සමහර අය හිතා මතාම 6වෙනි මාසය ඉවර වෙනකොටම කලින් හිඟ තිබුණු එක මාසයක හිඟ බද්ද විතරක් ගෙවනවා. එතකොට තව මාස 5ක බදු හිඟයි. මේ විධියට එන්න එන්න දිගින් දිගටම මේ බදු ප්‍රමාණය වැඩි වෙලා ඇවිල්ලා තිබෙනවා. ඒ දත්ත ඉදිරිපත් කළොත්, මේ වෙනකොට රුපියල් මිලියන 10,555ක ප්‍රමාණයක් ආයතන 40ක් මඟින් හිඟ තියලා තිබෙනවා. අරක්කු නිෂ්පාදනය සම්බන්ධ හිඟ බදු අධිභාරය සහිතව ආයතන 14කුත්, අමුද්‍රව්‍ය මත හිඟ බදු පැනවුණු ආයතන 5කුත්, රා නිෂ්පාදනය මත ආයතන 17කුත්, අපතය මත ආයතනයකුත්, දුම්කොළ මත ආයතනයකුත් ඇතුළුව ආයතන 40ක් තිබෙනවා. මේ ආයතන 40ම විවිධ උපක්‍රම භාවිත කරමින් මේ බදු මුදල් ගෙවීම පැහැර හැර තිබෙනවා. ඒවා අය කර ගන්න සුරාබදු දෙපාර්තමේන්තුව උත්සාහ ගත්තාට ඒ උත්සාහය අසාර්ථක වුණා. මම එක උදාහරණයක් කියන්නම්. මෑතකදී එක්තරා සමාගමකට විරුද්ධව නඩු කටයුත්තකට ගිහින් තිබෙනවා. ඒ සමාගමේ නිෂ්පාදන බලපත්‍රය අහෝසි කළා. ඔවුන් අධිකරණය ඉදිරියේ පෙනී ඉඳලා, මේ තිබෙන මාස 6ක කාල සීමාවත්, අමාත්‍යවරයාට බදු පැනවීමට තිබෙන ඉඩකඩත් අර්ථ නිරූපණය කරමින් කියනවා, අපි ඔවුන්ගේ බලපත්‍රය අවලංගු කිරීම වැරදියි කියලා. ඒ අනුව ඔවුන් යම් අතුරු තහනම් නියෝගයක් ලබාගෙන තිබෙනවා. මේ තත්ත්වයෙන් පැන නඟින අහිතකර දේවල් සහ බදු පරිපාලනයේ ගැටලු විසඳීම තමයි අපි මේ කරන්නේ.

මොකක්ද මේකෙන් වෙන්නේ? අලුත් නිවේදනය මේ පාර්ලිමේන්තුව සම්මත කළාට පස්සේ හිඟ බදු හිටියොත් මොකද වෙන්නේ? සාමාන්‍යයෙන් නිෂ්පාදනය මත බදු ගෙවීම සිද්ධ වෙන්නේ, මාසයේ පළමුවෙනි දින 15ට අදාළ බද්ද ඒ මාසයේ 30වෙනි දාට පෙර ගෙවන්න ඕනෑ. ඒ වාගේම දෙවෙනි දින 15ට ගෙවිය යුතු බදු ඊළඟ මාසයේ 15වෙනි දාට කලින් ගෙවන්න ඕනෑ. දැන් අලුත් රීතිවලට අනුව මෙන්න මේ හිඟ ගෙවීම සඳහා ලබා දෙන්නේ දින 30ක කාලයක්. පළමුවෙනි දින 30 ඇතුළේ නොගෙව්වොත් අපි අලුතින් පනවන රීතිවලට අනුව සුරාබදු දෙපාර්තමේන්තුවට පුළුවන් ඒ සමාගමේ නිෂ්පාදන බෝතල් කිරීමේ බලපත්‍රය තාවකාලිකව අත්හිටුවන්න. ඒ ක්‍රියාමාර්ගයට යන්න පහසුකම තමයි මෙතැනදී සලසා දෙන්නේ. ඒ අනුව පළමුවෙන්ම සිද්ධ වෙන දේ තමයි, හිඟ ගොඩ ගැසීම නවත්වලා දාන එක. ඒ වාගේම ඔවුන් තවදුරටත් බදු නොගෙවා සිටියොත් මාස තුනක් ඇතුළතදී - දින 90ක් ඇතුළතදී - අනෙකුත් සියලු බලපත්‍ර අහෝසි කිරීමේ අවස්ථාව මෙමඟින් ලබා දෙනවා. ඒ අනුව මෙහි පරමාර්ථය බවට පත් වෙන්නේ හිඟ බදු අයින් කරලා බදු එකතු කිරීමේ කාර්යක්ෂමතාව ලබා ගැනීමයි.

[ගරු අනිල් ජයන්ත මහතා]

මේ වෙනකොට අපේ ආණ්ඩුව යටතේ බදු ඇතුළු ආණ්ඩුවට ආදායම් එකතු කිරීමේ කාර්යක්ෂමතාව ඉහළම මට්ටමට ගෙනැල්ලා තිබෙනවා ප්‍රධාන ආදායම් දෙපාර්තමේන්තු තුනම. ඒ කියන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ Sri Lanka Customs. ඒ ආයතන තුනේම අපේක්ෂිත ඉලක්ක ඉක්මවා යමින් තිබෙනවා. ඒ වාගේම මෑතකදී ක්‍රම සහ විධි කාරක සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවෙන් පැහැදිලිව පෙන්නුම් කරනවා අපි මොන ආකාරයටද ඉදිරියේදී ආදායම් ලබා ගෙන යන්නේ කියලා.

ඒ වාගේම විශේෂ වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් බදු පැනවීමේදී ඉතාම නිවැරදිව අදාළ ක්‍රමවේදය අනුගමනය කරමින් කටයුතු කර තිබෙනවා. ඒ අනුව ආහාර සුරක්ෂිතතා කමිටුවේ නිර්දේශ මත, අදාළ අමාත්‍යවරයාගේ මැදිහත් වීමෙන් එම තීන්දු අරගෙන කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තමයි ලූනුවලට අතිරේක රුපියල් 40කුත්, අලවලට අතිරේක රුපියල් 20කුත් වශයෙන් මේ බදු පැනවීම කළේ. විශේෂයෙන්ම දේශීය ගොවියා ආරක්ෂා කර ගැනීම වෙනුවෙනුයි එය සිදු කළේ. අපි දැන් එහි ප්‍රතිඵල දකිමින් තිබෙනවා. අගෝස්තු මාසයේ තමයි මේ බද්ද පැනෙව්වේ. සැප්තැම්බර් මාසයේදී අල සහ ලූනු ආනයනය අඩු වෙලා තිබෙනවා. ඒක ඉතාම හොඳ තත්ත්වයක්.

විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරු සඳහන් කළා, බලපත්‍ර ලබා දීමේදී ඒවායේ වැඩ කටයුතු හරියට කෙරිලා නැහැ, නීතිය ඇතුළේ ඒ වැඩ කටයුතු කරන්න පුළුවන් කියලා. ඒ කාරණය තමයි මම පැහැදිලි කළේ. ඒ තත්ත්වය යටතේ කලින් ආණ්ඩුවලදී බොහෝ දුරට නීතියේ සිදුරුවලින් රිංගලා ගියා. අපි ඉදිරියේදී ඒ විධියට නීතියේ සිදුරුවලින් රිංගලා යන්න දෙන්නේ නැහැ. මේ මොහොත වන විට ආදායම් එකතු කිරීමේ කාර්යය පමණක් නොවෙයි, රට ඇතුළට ආයෝජන ගෙන ඒමේ කාර්යයේදීත් රට තුළ ක්‍රමයෙන් විශ්වාසය ගොඩනැඟෙමින් පවතිනවා. විශේෂයෙන් අපේ ආණ්ඩුවේ තිබෙන වංචා, දූෂණ නැති බව විතරක් නොවෙයි, සැම කෙනාටම පොදුවේ සැලකීම, කෙනෙකුට විශේෂ කොට නොසැලකීම තුළ මේ ප්‍රජාතන්ත්‍රවාදී තත්ත්වය නිර්මාණය වෙලා තිබෙනවා. අන්න ඒ විශ්වාසවන්තභාවය ගොඩනැඟීමත්, ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදය සුරක්ෂිත කිරීමත් ඉතාම වැදගත් කියලා මම හිතනවා. ඒ අනුව අද අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන නියමය සහ රීති, ආදායම් එකතු කර ගැනීමේ කාර්යක්ෂමතාව වැඩි කර ගන්න මහත් සේ පිටුවහලක් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ කාරණයත් සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## සුරාබදු ආඥාපනත: රීති
## மதுவரிக் கட்டளைச் சட்டம்: விதிகள்
## EXCISE ORDINANCE: RULES

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය යටතේ මත්පැන් නිෂ්පාදනය මත බදු ගෙවීමේ කාලසීමාව සහ අධිභාරය අය කිරීම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2025 සැප්තැම්බර් 05 දින පනවන ලදුව, 2025.10.21 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

## පියයුරු පිළිකා කල්තියා හඳුනා ගැනීම ප්‍රවර්ධනය
## மார்பகப் புற்றுநோயை முன்கூட்டியே கண்டறிவதற்கான விழிப்புணர்வை ஊக்குவித்தல்
## PROMOTE EARLY DETECTION OF BREAST CANCER

[අ.භා. 4.31]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 ඔක්තෝබර් මාසය ලෝක පියයුරු පිළිකා දැනුවත් කිරීමේ මාසය ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නම් කර තිබේ. 2022 වසරේ මෙරට පියයුරු පිළිකා නව හඳුනා ගැනීම් 5,447ක් වාර්තා වී ඇති අතර, කාන්තාවන් අතර වාර්තා වන පිළිකා තත්ත්වයන් අතරින් සියයට 28ක්ම පියයුරු පිළිකා ලෙස හඳුනාගෙන තිබේ.

පූර්ව පිළිකා හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සහ ස්වයං පියයුරු පිළිකා පරීක්ෂා ක්‍රමවේදයක් පැවැතියද, ඒ සඳහා නිසි දැනුවත් බව නොමැති වීමෙන් පියයුරු පිළිකා මුල් අවධියේදී හඳුනා ගැනීමේ අවස්ථාව මඟහැරී යාම අවාසනාවන්ත තත්ත්වයකි.

මෙම තත්ත්වය නිවැරදි සහ ඵලදායී දැනුවත් කිරීම් හරහා ජයගත යුතුව තිබේ. එහි එක් කුඩා පියවරක් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය සභාව කල් තැබීමේ යෝජනාවක් ගෙන ඒමට කටයුතු කර තිබෙන අතර, ඒ සඳහා සහාය දක්වමින් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයද අද රෝස පැහැයෙන් යුත් ඇඳුමින් සැරසී පැමිණ සිටියි.

පියයුරු පිළිකා කල්තියා හඳුනා ගැනීමේ ක්‍රමවේදය තව දුරටත් ක්‍රමවත් කිරීමටත්, ඒ පිළිබඳව ප්‍රමාණාත්මක දැනුවත් කිරීමේ පියවර සමාජයේ සියලුම ස්තරයන් තුළ සිදු කළ යුතුව තිබෙනවා. ඒ සඳහා සියලු අංශයන්ගේ සහයෝගය ලබා ගනිමින් නිසි වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීමේ මාසය ලෙස ඔක්තෝබර් මාසය යොදාගෙන තිබෙනවා. ඒ වාගේම අද අපි පාර්ලිමේන්තුව තුළත් ඒ සඳහා වැඩසටහන් කිහිපයක් පැවැත්වූවා. මේ මාසය පුරාවටම ලංකාවේ විවිධ ආයතන මේ පිළිබඳව දැනුවත් කිරීම් රාශියක් කරනවා.

එහි විශේෂ අවස්ථාවක් ලෙස තමයි පාර්ලිමේන්තු කාන්තා සංසදය දැනුවත් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික පිළිකා මර්දන වැඩසටහනේ නිලධාරින් ඇවිල්ලා අපේ මන්ත්‍රීවරියන්ව මීට කලින් දැනුවත් කළේ. එහි ප්‍රතිඵලයක් විධියට තමයි අපි මේ වැඩසටහන අපේ රටේ සියලු ජනතාව අතරට ගෙන යන්න ඕනෑ එක් වැඩසටහනක් විධියට අද මේ සභාව කල් තබන අවස්ථාවේ විවාදයක් හැටියට ගන්නේ. ඒකේදී මූලික කරුණු කිහිපයක් කියන්න තිබෙනවා. මේ ගැන තොරතුරු හොයද්දී අපේ පාර්ලිමේන්තුවේ Research Division එකෙන් මට තොරතුරු කිහිපයක් ලබා දුන්නා. අද මම ඒක පාර්ලිමේන්තුවට **සභාගත*** කරනවා.

2015 ඉඳලා තිබෙන සංඛ්‍යාලේඛන අනුව පියයුරු පිළිකා විතරක් නොවෙයි, පිළිකා රෝගීන්ගේ වර්ධනයක් -වැඩි වීමක්- පෙන්වනවා. 2015දී පුරුෂයන් 13,921ක්, ස්ත්‍රීන් 15,046ක් ලෙස වැඩි වෙලා තිබෙනවා. 2021 වෙද්දී පිළිකා රෝගයට ගොදුරු වුණු පුරුෂයන් 16,398ක් රෝගීන් විධියට හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම ස්ත්‍රීන් 19,547ක් හඳුනාගෙන තිබෙනවා. පියයුරු පිළිකාව පළමුවැනි අවස්ථාවේ හඳුනා ගත්තොත් අනිවාර්යයෙන්ම රෝගයක් බවට පත් වෙන්න කලින් හඳුනාගෙන ප්‍රතිකාර කිරීමෙන් අනිවාර්යයෙන්ම සනීප කරන්න පුළුවන්කම ලැබෙනවා. හැබැයි, අවාසනාව තිබෙන්නේ දැනට වාර්ෂිකව 5,000කට වැඩිය හඳුනාගත් රෝගීන් වාර්තාගත වෙලා තිබෙනවා. ඒකෙන් අපි දවසකට 15දෙනෙක් හඳුනා ගන්නවා, කාන්තා රෝගීන් විධියට. ඒ වාගේම තුන් දෙනෙක් මිය යනවා. වර්ෂයකට අපේ රටේ කාන්තාවන් 800ක් විතර පියයුරු පිළිකාවලින් මිය යනවා.

අපි ඒ සම්බන්ධව තිබෙන සමාජ ආකල්පය පිළිබඳව කථා කරන්න ඕනෑ. පියයුරු පිළිකාවේ අවස්ථා කිහිපයක් තිබෙනවා. මුල් අවස්ථාවේ ස්වයං පරීක්ෂාවක් කර ගැනීම සම්බන්ධයෙන් අපේ රටේ ජනතාවගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ තිබෙන දැනුවත්භාවය අඩුයි. අපි මේ රටේ කාන්තාවන් දැනුවත් කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. මේ පාර්ලිමේන්තුව හරහා වැඩසටහන් හැදිය යුතුයි. කාන්තාවන් දැනුවත් කළ යුතුයි. ඒ සඳහා අපේ රටේ තිබෙන සෞඛ්‍ය සාක්ෂරතාව කියන එක වැදගත්. කාන්තාවක් තමන්ගේ සෞඛ්‍ය පිළිබඳව දක්වන ආකල්පය මීට වැඩිය සංවර්ධනය වෙන්න ඕනෑ, මීට වැඩිය විද්‍යාත්මකව තේරුම් ගන්න ඕනෑ. එතැනදී පවුල තුළ මවගේ භූමිකාව අතිවිශාලයි. බිරිඳ පිළිබඳව ගෙදර ඉන්න සැමියාට වගකීමක් තිබෙනවා. තමන්ගේ ගැහැනු දරුවන් පිළිබඳව පියාට වගකීමක් තිබෙනවා. ඒ වාගේම තමන්ගේ නැගණියන් පිළිබඳව සහෝදරයෙකුට වගකීමක් තිබෙනවා. මේක පවුලක් තුළ සාමූහික සමාජ වගකීමක්. මෙන්න මේ සාමූහික සමාජ වගකීම අද දවසේදී අපේ සමාජයෙන් අත්හැරිලා තිබෙන නිසා කාන්තාවන් විශාල ප්‍රමාණයක් දිනපතාම මිය යනවා. එහෙම වෙන්නේ අපට වළක්වා ගන්න පුළුවන් තත්ත්වයන් තිබේද්දී.

සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා මේ කාරණය මීට වැඩිය ජනගත කරන්න ඕනෑ. පියයුරු පිළිකාවලින් අපේ කාන්තාවන් ගලවා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් ඕනෑ. ඒ සඳහා වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. ඒ සඳහා කාන්තා සංගම් මෙන්ම, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලට මේ කාරණය සමාජගත කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. අපි දන්නවා, තමන්ගේ පවුලට මව අහිමි වුණොත් එහි වේදනාව තමන්ගේ දරුවන්ට, පවුලට දැනෙන බව. ඒ වාගේම පිළිකා රෝගයට ගොදුරු වුණු; පියයුරු පිළිකාවකට ලක්වුණු කාන්තාවක් පවුලේ සිටීම හේතුවෙන් එම පවුලට ආර්ථික වශයෙනුත් ලොකු ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියගේ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න.

යම් කෙනෙකුට පිළිකාවක් හැදුණාට පස්සේ තමන්ගේ පවුලේ ආර්ථික මට්ටම පහළ යනවා. ඒ වාගේම සමහර අය පියයුරු පිළිකාවක් තිබෙනවා කියලා කියන්න කැමැති නැහැ. ඒකත් ලොකු ලජ්ජාවක් විධියට හිතන නිසා ඒ ගැන කථා නොකර ඉන්නවා. ඒ නිසා ආකල්පමය වශයෙනුත් කාන්තාවන් දැනුවත් වෙන්න ඕනෑ. ඒ තුළින් මුල් කාලයේ දීම එය වළක්වා ගන්න පුළුවන්. ඒ සඳහා කාන්තාවන් වන ඔබ ස්වයං පරීක්ෂාවට ලක්වීම වාගේම ඒ අදාළ ආයතනවලට යොමු වෙන්න කියලා කියමින්, මම මේ තොරතුරු ටික සභාගත කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව, ස්ථිර කිරීම. ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.39]

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය විසින් අද දින සභාව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කළ පියයුරු පිළිකා වළක්වා ගැනීම සම්බන්ධයෙන් වූ යෝජනාව ස්ථිර කිරීමට මට අවස්ථාව ලබා දීම සම්බන්ධව පළමුව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය]

පියයුරු පිළිකාව කියන්නේ අපි හැමෝටම සංවේදී මාතෘකාවක් - topic එකක් - කිව්වොත් එය නිවැරදියි. විශේෂයෙන්ම අප සියලුදෙනාටම අපේ ජීවිත කාලය තුළ පියයුරු පිළිකාව නිසා පීඩා විඳින, ඒ වාගේම ඒ නිසා ජීවිතය අහිමි වුණු මවක්, සහෝදරියක්, දියණියක් හමු වෙලා තිබෙනවා කිව්වොත් නිවැරදියි. අපේ රටේ බහුතරයක් ඉන්නේ කාන්තාවන්. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජනගහනයෙන් සියයට 52ක් වන කාන්තාවන්ට තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි, පියයුරු පිළිකාව. අපේ සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමියත් කියපු ආකාරයට 2021 වර්ෂයේදී පියයුරු පිළිකාව වැළඳී සිටි කාන්තාවන් සංඛ්‍යාව 5,447ක් බවට වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම සෑම දිනකම 15කට ආසන්න සංඛ්‍යාවක් අලුතින් හඳුනා ගන්නවා, මේ රෝගය වැළඳී තිබෙන බවට. ඒ වාගේම පියයුරු පිළිකාව නිසා දිනකට තිදෙනෙක් ජීවිතක්ෂයට පත් වන බව තමයි වාර්තා වන්නේ. භූ ගෝලීය වශයෙන් ගත්තත්, රටක් වශයෙන් ගත්තත් අපේ රටේ මේ තත්ත්වය ඉතාම ඉහළ මට්ටමක තිබෙනවා කිව්වොත් නිවැරදියි. විශේෂයෙන්ම දියුණු රටවලවලට වඩා ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල මේ තත්ත්වය උග්‍ර බව තමයි වාර්තා වෙලා තිබෙන්නේ.

අපි දන්නවා, පියයුරු පිළිකාව වැලදෙන්න නොයෙකුත් හේතු බලපාන බව. විශේෂයෙන්ම ජානමය හෝමෝනවලට අමතරව තවත් නොයෙකුත් හේතු මේ සඳහා බලපානවා. මම මේ අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් දීර්ඝව කථා කරන්නේ නැහැ. අපේ මූලික පරමාර්ථයට අනුව අද දින අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය මඟින් විශේෂයෙන්ම පියයුරු පිළිකාව සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කළා. මොකද, පියයුරු පිළිකාවට ගොදුරු වන සෑම කෙනෙකුම ඒ පිළිබඳව කලින් හඳුනා ගත්තොත් සියයට 100ක සුවවීමේ තත්ත්වයක් ඇති කරගත හැකි බවට තමයි වාර්තා වන්නේ. එම නිසා අපි පාර්ලිමේන්තුවෙන් ආරම්භ කරපු මේ වැඩසටහන විශේෂයෙන්ම අනෙකුත් රාජ්‍ය ආයතන තුළත්, ඒ වාගේම පෞද්ගලික අංශය තුළත් දියත් කළොත්, පියයුරු පිළිකාව වැළඳී ඇති බවට මුල් අවස්ථාවේදීම හඳුනා ගන්නා කාන්තාවන් සුව කිරීමේ හැකියාව වැඩි කරගත හැකි බව මම මේ අවස්ථාවේදී සියලුදෙනාටම මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම අපි දන්නවා, මේ සම්බන්ධව අපේ රටේ Indira Cancer Trust, Roshan Mahanama Trust වාගේ පදනම් වාගේම, තව නොයෙකුත් පෞද්ගලික ආයතන තිබෙන බව. විශේෂයෙන්ම ඒවා හරහාත් මේ රෝගය වැළැක්වීම සම්බන්ධව නොයෙකුත් වැඩසටහන් දියත් කර තිබෙනවා. විශේෂයෙන්ම TLC - Touch, Look, Check - කියන වැඩසටහනත් දියත් කර තිබෙනවා. ඒ වාගේම ලංකාවේ ප්‍රථම වතාවට කොළඹ මියුසියස් විද්‍යාලයේ දැරියන් ඇතුළු ආචාර්ය මණ්ඩලය රෝස පාට කරපටියක් සෑම බදාදාවකම පැළඳ ගන්නට එකඟ වෙලා තිබෙනවා. එය ආදර්ශයට ගෙන ලංකාවේ තිබෙන සියලුම පෞද්ගලික සහ රජයේ පාසල් මේක අනුගමනය කළොත්, කුඩා දරුවාගේ ඉඳලා දෙමව්පියන් දක්වාම මේ දැනුවත් කිරීමේ වැඩසටහන අපට දියත් කරන්න පුළුවන් කියා මා විශ්වාස කරනවා.

ඒ වාගේම මම ස්තුතිවන්ත වනවා, විශේෂයෙන්ම Indira Cancer Trust එකටත්, අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරින්ටත්, අද දින පාර්ලිමේන්තුවට පැමිණ අපව දැනුවත් කිරීමේ මේ වැඩසටහන ඉතා සාර්ථකව කර ගැනීමට විශාල කාර්යභාරයක් සිද්ධ කිරීම පිළිබඳව. ඒ වාගේම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයට අදාළ නිලධාරිනියන් සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අග්‍රාමාත්‍ය (ආචාර්ය) හරිනි අමරසූරිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.44]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීමට සහාය පළ කිරීමේ වැඩසටහනක් පාර්ලිමේන්තුව තුළ පැවැත්වීම හරහාත්, ඊට අදාළව සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනැල්ලා විවාද කිරීම හරහාත් මේ රෝගය පිළිබඳව මුළු රටම දැනුවත් කිරීමට ලබා දුන් අවස්ථාව ගැන මම බෙහෙවින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප සියලුදෙනාම දන්නවා, අද කියවුණු දත්ත සියල්ලක් පිටුපසම, හැම මරණයක් පිටුපසම, හැම රෝගී තත්ත්වයක් පිටුපසම කතන්දරයක් තිබෙනවා කියලා. ඒ හැම සංඛ්‍යා දත්තයක් තුළම ඉන්නේ අපේ සහෝදරියක්, අපේ මවක්, අපේ දියණියක්, අපේ යෙහෙළියක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මවගේ නැඟණියන් දෙදෙනෙකුම පියයුරු පිළිකා රෝගී තත්ත්වයට මුහුණ දුන්නා. මගේ මවගේ බාලම සහෝදරිය පියයුරු පිළිකා රෝගයෙන් තමයි මිය ගියේ. මේ රටේ සිටින ගොඩක් අය වාගේම, පවුල් ගණනාවක් වාගේම මේ රෝගය පිටුපස තිබෙන ඛේදවාචකය, කතන්දරය ගැන මමත් හොඳින් දන්නවා. ඒ වාගේම මේ රටේ ඉන්න කාන්තාවන්ගෙන් බහුතරයක් මේ කථාව හොඳින්ම දන්නවා. අප සියලුදෙනාටම මේ පියයුරු පිළිකාව නිසා අපි ආදරය කරන කවුරු හරි කෙනෙක් නැතිවෙලා තිබෙනවා, අහිමි වෙලා තිබෙනවා. පියයුරු පිළිකාව කලින් හඳුනාගෙන ඒකට ප්‍රතිකාර ලබා ගෙන ජීවිත කාලය දික් කර ගන්න පුළුවන් වාගේම ඒක සුව කර ගන්න පුළුවන් තත්ත්වයකුත් අද ඇති වෙලා තිබෙනවා. අද වෛද්‍ය විද්‍යාව දියුණු තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. ඒ දියුණුවත් සමඟ සමහර පිළිකාවලට කරන්න පුළුවන් ප්‍රතිකාරත් එන්න එන්නම දියුණු වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම පියයුරු පිළිකා කියන්නේ, කලින් හඳුනා ගැනීම - early detection - තුළින් සුව කර ගත හැකි එහෙම නැත්නම් treat කරන්න පුළුවන් තත්ත්වයේ පිළිකාවක්. ඒ නිසා තමයි මේ දැනුවත් කිරීම අතිශයින්ම වැදගත් වන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශය වාගේම මේ පිළිබඳව මැදිහත් වන රාජ්‍ය නොවන සංවිධාන ගණනාවකුත් තිබෙනවා. මම ඒ සියලුදෙනාටම ස්තුතිවන්ත වනවා, මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව.

මේ කථා කරන අප සියලුදෙනාම early detection ගැන අවධානය යොමු කරන්න ඕනෑ. අපි මේ campaign එක තුළින්, මේ වැඩසටහන තුළින් බලාපොරොත්තු වනවා, අපේ සහෝදරියන්, අපේ මවුවරුන්, අපේ දියණියන් අවුරුද්දකට සැරයක්වත් එහෙම නැත්නම් අවුරුදු දෙකකට සැරයක්වත් මේ පරීක්ෂණය කර ගන්න යොමු වෙයි කියලා. තමන්ට මේ පරීක්ෂණය ගෙදර දී වුණත් කර ගන්න පුළුවන්. එහෙම නැත්නම්

ක්ලිනික් එකකට ගිහිල්ලා කර ගන්නත් පුළුවන්. සෞඛ්‍ය ඇමතිතුමා මට කිව්වා, අවුරුදු 20න් පස්සේ වුණත් මේක කරන්න පුළුවන් කියලා. අවුරුදු 20 කෙසේ වෙතත්, අඩුම තරමින් අවුරුදු 35 ඉඳලාවත් සියලුම කාන්තාවන් මේ සඳහා යොමු විය යුතුයි. මේකට ක්ලිනික් තිබෙනවා. ඒ වාගේම මේ සඳහා රජයේ ලොකු රෝහල්වලින් විශේෂ සේවා ඇති කරලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය නොවන ආයතනත් මැදිහත්වෙලා ඒ කටයුතු සිදු කරනවා. මේ පිළිබඳව දැනුවත් වෙන්න ඕනෑ තරම් අවස්ථා තිබෙනවා.

මෙතැන තිබෙන වැදගත්ම දේ වන්නේ, මේ රෝගය කලින් හඳුනා ගැනීමයි. මේ රෝගය කලින් හඳුනා ගන්න නම්, සියලුම කාන්තාවන් මේක තමන්ගේ වගකීමක් හැටියට සලකන්න ඕනෑ. තමන්ගේ ජීවිතය බේරා ගන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා. අපි සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, මේ පරීක්ෂණය කර ගන්න ඉදිරිපත් වෙන්න කියලා. මේ රෝගය කලින් හඳුනා ගත්තොත් ප්‍රතිකාර කරන්න පුළුවන්, ඒ සම්බන්ධව මැදිහත් වන්න පුළුවන්, ජීවිතයක් බේරා ගන්න පුළුවන්. මේ දත්ත පිටුපස තිබෙන ඒ ඛේදවාචක, ඛේදවාචකයක් නොවන්න අපට මැදිහත් වෙන්න පුළුවන්. ඒ නිසා මෙවැනි සාකච්ඡා සහ සංවාද තුළින් මේ ඛේදවාචක යම් තරමකින් හෝ වළක්වා ගන්න අපට පුළුවන් වෙනවා.

අපි සියලුදෙනා දන්නවා, අද වනකොට පිළිකාවලින් සිද්ධ වන මරණවලින් කාන්තාවන්ගේ ඉහළම මරණ ප්‍රමාණය වාර්තා වෙන්නේ පියයුරු පිළිකා නිසා කියලා. ඉතින්, අපට ඒ පියයුරු පිළිකා early detection තුළින් වළක්වා ගන්න පුළුවන් කියන්නේ අපේ කාන්තාවකගේ ජීවිතයක් අපට බේරා ගන්න පුළුවන් කියන එකයි. අන්න, ඒ නිසා මේක අතිශයින්ම වැදගත් දෙයක්. ඒ සඳහා ඔබ සියලුදෙනාගේම සහයෝගය සහ මැදිහත් වීමත් අපට අවශ්‍ය වෙනවා. අපි මේ අවස්ථාවේදී අපේ මන්ත්‍රීවරුන්ටත් ස්තුතිවන්ත වෙනවා. මොකද, අපේ මන්ත්‍රීවරු සියලුදෙනාත් අද දවසේ මේ විවාදයට සහභාගි වුණා. එතුමන්ලාත් රෝස පාට බැජ් එකක් පැලඳගෙන හිටියා. ඒ වාගේම මම දැක්කා, අපේ මන්ත්‍රීවරුන් බොහෝදෙනෙක් රෝස පාට ටයි එකක් දාගෙන ඉන්නවා. මේ විවාදය තුළින් අපි සියලුදෙනාම ඉල්ලා සිටින්නේ මේ පිළිබඳව දැනුවත් වෙලා අපි ජීවිතයක් බේරා ගනිමු කියන එකයි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.50]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ලෝක පියයුරු පිළිකා දැනුවත් කිරීමේ මාසය නිමිත්තෙන් මෙම වැදගත් මාතෘකාව පිළිබඳව අද දවසේ සාකච්ඡාවක් පැවැත්වීමට යෝජනා කිරීම පිළිබඳව මම ගරු මන්ත්‍රීවරියන් සියලුදෙනාටම ස්තුතිය පළ කරනවා.

පියයුරු පිළිකාව ශ්‍රී ලංකාවේ බහුලව දකින්නට ලැබෙන පිළිකාවක්. විශේෂයෙන්ම වාර්ෂිකව රෝගීන් 5,000කට වඩා හඳුනා ගෙන තිබෙනවා. මේ සංඛ්‍යාවේ වාර්ෂිකව සියයට 5ත්, 10ත් අතර වර්ධනයක් දකිනවා. බොහෝ සෙයින් රෝග හඳුනා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් මේ ආශ්‍රිතව වාර්ෂිකව මරණ දහසකට වැඩි ප්‍රමාණයක්, ඉහළ මරණ අනුපාතයක් පවතින බව තමයි අපට අවබෝධ වී තිබෙන්නේ. මේ සංඛ්‍යාත්මක වර්ධනය සිදු වීමට ඇත්තවශයෙන්ම ජීවන රටාවේ වෙනස්කම් බලපානවා. තරබාරුකම, ව්‍යායාම නොමැතිකම, ආහාර රටාව සහ තවත් හේතූන් ගණනාවක් නිසා මේ පියයුරු පිළිකා ගැටලුව ඉස්මතු වෙනවා. ඇත්තවශයෙන්ම දියුණු රටවලට සාපේක්ෂව අපේ රටේ ඉහළ මරණ අනුපාතයක් පවතින්නට බලපාන හේතු කීපයක් තිබෙනවා. රෝග හඳුනා ගැනීමේ ප්‍රමාදය, ප්‍රතිකාර ලබා ගැනීමේ ප්‍රමාදය, දියුණු පරීක්ෂණ හා ප්‍රතිකාර නොපැවැත්වීම හෝ සීමිත වීම එවැනි හේතු කීපයක්.

වර්තමාන තත්ත්වය තුළ අපි පරීක්ෂාකරණය - screening - දිහා බැලුවොත්, සායනික පියයුරු පරීක්ෂා කර ගැනීමට අවස්ථා කාන්තා සෞඛ්‍ය සායන හරහා සපයනවා. හැබැයි, ආවරණය දිහා බැලුවොත් සීමාසහිත ආවරණයක් තමයි තිබෙන්නේ. අපි රෝග නිශ්චය එහෙමත් නැත්නම් හඳුනා ගැනීම - diagnosis - කියන ක්ෂේත්‍රය දිහා බැලුවොත්, රට පුරා පවත්නා පිළිකා රෝග නිශ්චය සේවාවල තිබෙන ගැටලු ගණනාවක් මේ අවස්ථාවේදී මම ඉදිරිපත් කරන්න කැමැතියි. අපි විශ්වාස කරනවා, මේ ප්‍රශ්නවලට විසඳුම් ක්‍රමිකව ලැබෙයි කියලා. විශේෂයෙන්ම ග්‍රාමීය දිස්ත්‍රික්කවල mammography පහසුකම් සීමිත වෙලා තිබෙනවා. නවීන රෝග හඳුනා ගැනීමේ පරීක්ෂණ සීමිත වීම හෝ සමහර අවස්ථාවල නොමැති වීම තවත් ගැටලුවක්. උදාහරණයක් වශයෙන් ප්‍රතිශක්ති රසායනික පරීක්ෂණ - immunohistochemistry - ජාන පරීක්ෂණ - genetic testing - ගන්න පුළුවන්.

ඒ වාගේම ප්‍රතිකාරක ක්ෂේත්‍රය දිහා බැලුවොත් රට පුරා පවත්නා පිළිකා රෝග නිශ්චය සේවා අතරින් බහුතරයකට අදාළ ගැටලු කීපයක් තිබෙනවා. විකිරණ චිකිත්සාව ලබා ගැනීමේ හැකියාව සීමිත වෙලා තිබෙනවා. රට පුරාම රාජ්‍ය අංශයේ ක්‍රියාත්මක රේඛීය ත්වරණ විකිරණ චිකිත්සා යන්ත්‍ර පවතින්නේ 10ක් පමණයි. ඒකට Linear accelerator - LINAC - radiotherapy machines කියලා කියනවා. ඒ වාගේම නිතිපතා රසායනික චිකිත්සක ඖෂධ පහළ මට්ටමක තිබීම තවත් ගැටලුවක්. ඒ කියන්නේ, unavailability of chemotherapy. මෙන්න, මේ ප්‍රශ්නයත් උද්ගත වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගැටලුවලට විසඳුම් ලබා දීම ඉතාම වැදගත් වෙනවා.

එම නිසා මේ පිළිකාව වළක්වාලීම සඳහා කළ යුතු දේ, කල් තබා හඳුනා ගැනීමයි. පියයුරු සෞඛ්‍ය පිළිබඳ දැනුවත්භාවය සහ අවදානම් සාධක පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමෙන්, කාන්තාවන් දැනුවත් කිරීමෙන් ඒ අධ්‍යාපනය අපි ශක්තිමත් කරන්නට ඕනෑ. ඒ වාගේම ප්‍රජාව තුළින් සායනික පියයුරු පිළිකා පරීක්ෂණ සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා නිලධාරිනියන් හෝ නිලධාරීන් පුහුණු කිරීම වේගයෙන් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ වාගේම සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම වැදගත්. විශේෂයෙන්ම බර පාලනය, ව්‍යායාම, ආහාර රටාවන් සහ අනෙකුත් විශේෂිත වූ කරුණු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම අතිශයින්ම වැදගත් කියන එක මම මේ අවස්ථාවේදී පෙන්වා දෙන්න කැමැතියි.

රෝග හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කියන මාතෘකාව යටතේ විශේෂයෙන්ම ප්‍රාදේශීය රෝහල්වල රෝග හඳුනා ගැනීමේ ධාරිතාව අපි කෙසේ හෝ වැඩිදියුණු කර ගන්නට ඕනෑ. Mammography, ultrasound, biopsy and pathology services, ව්‍යාධි විද්‍යා සේවා ඇතුළු සේවාවන්වල වැඩිදියුණු කිරීමක් අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම කාලෝචිත යොමු කිරීමේ මාර්ග සහතික කිරීම සහ රෝග හඳුනා ගැනීමේ ප්‍රමාදයන් අඩු කර ගන්නට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ වාගේම පළාත් හරහා විකිරණ චිකිත්සා සහ පිළිකා වෛද්‍ය පහසුකම් පුළුල් කිරීමත් සිදු වෙන්නට ඕනෑ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඇත්තවශයෙන්ම මේ අඩුපාඩු අපි පෙන්වා දෙන්නේ ප්‍රගතිශීලීව. අපි විශ්වාස කරනවා, මේ අඩුපාඩු එක මොහොතකින් විසඳන්නට බැරි බව. නමුත් ක්‍රමිකව විශේෂයෙන්ම භෞතික සම්පත් සහ මානව සම්පත් මේ පියයුරු පිළිකා වැළැක්වීම උදෙසා ලබා දීම මම හිතන්නේ රජයේ ප්‍රමුඛතාව විය යුතුයි. විශේෂයෙන්ම මේ වැදගත් කාරණාව පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේදී විපක්ෂයක් හැටියට අපිත් සූදානම්, විශේෂයෙන්ම පියයුරු පිළිකා වළක්වාලීමේ ක්‍රියාදාමයන්ට අපේත් සහයෝගය සහ ශක්තිය සක්‍රියව ලබා දෙන්නට. ඇත්තවශයෙන්ම දිනෙන් දිනම වැඩි වන මේ පිළිකා රෝගී තත්ත්වයන් වළක්වා අපේ කාන්තා පාර්ශ්වයට සත්‍ය වශයෙන්ම මීට වැඩිය දීර්ඝායුෂ ලබා දෙන වැඩ පිළිවෙළකට යොමු කිරීම වෙනුවෙන් අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න අපි සූදානම්. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ක්‍රිෂ්ණන් කලෙයිචෙල්වි මන්ත්‍රීතුමිය - *[සභා ගර්භය තුළ නැත.]*

මීළඟට, ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් අමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.58]

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීමේ මාසය තමයි, ඔක්තෝබර් මාසය. මේ අවස්ථාවේදී අපි මේ පාර්ලිමේන්තුව තුළ පියයුරු පිළිකා වළක්වා ගැනීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා වූ සාකච්ඡාව කරමින් ඉන්නවා. ඒ සාකච්ඡාවේදී අපට කථා කර ගන්න බොහෝ කාරණා තිබෙනවා. විශේෂයෙන්ම ලංකාවේ වාර්තා වන පිළිකා රෝගීන් අතරින් සියයට 26ක් මේ පියයුරු පිළිකා රෝගීන් කියලා සංඛ්‍යා දත්තවලින් සොයාගෙන තිබෙනවා. ලංකාවේ දිනකට අලුතෙන් පියයුරු පිළිකා රෝගීන් 15ක් හඳුනා ගන්නවා. ඒ වාගේම ප්‍රතිකාර ලබමින් ඉන්න රෝගීන්ගෙන් 3දෙනෙක් දිනකට මිය යනවා. ඒ අනුව ලංකාවේ කාන්තාවන් අතර බහුලවම හඳුනා ගනු ලබන පිළිකා රෝගී තත්ත්වයක් හැටියට තමයි මේ පියයුරු පිළිකාව හඳුන්වන්නේ. පිළිකා රෝගීන්ගෙන් සියයට 26ක් පියයුරු පිළිකා රෝගීන් හැටියට වාර්තා වෙනවා. ඒ වාගේම දිනකට රෝගීන් 15 දෙනෙක් අලුතින් හඳුනා ගන්නා, දවසකට 3දෙනෙක් මිය යන රෝග තත්ත්වයක් හැටියට තමයි මෙන්න මේ පියයුරු පිළිකාව කියන එක අවදානම් තත්ත්වයේ තිබෙන්නේ. විශේෂයෙන්ම මේක වළක්වා ගන්න පුළුවන්, එහෙම නැත්නම් මුල්ම අවස්ථාවේදී හඳුනා ගැනීම තුළ සියයට 100ක්ම සම්පූර්ණයෙන්ම සුව කරගන්න පුළුවන් රෝගී තත්වයක්ව තිබියදීත් දිනකට තුන්දෙනෙකු මිය යන තත්වයක අවදානමකට පත් වීම ඉතාම ඛේදවාචකයක්. ඒ නිසා මේ ගැන ජනතාව අතර ලොකු අවබෝධයක් ඇති කරන්න, ජනතාවට වැඩි පැහැදිලි කිරීමක් කර මෙය වළක්වා ගැනීම සඳහා කටයුතු කළ යුතුයි කියලා අපි හිතනවා.

මෙහි වැඩිම රෝග අවදානමක් තිබෙන්නේ කාටද? විශේෂයෙන් පියයුරු පිළිකාව රෝගය වාර්තා වීමේදී, මෙයින් මිය යන අවදානම වැඩිම වයස් කාණ්ඩය බැලුවොත්, වයස අවුරුදු 40ත්, 69ත් අතර කාන්තාවන් තමයි වැඩි වශයෙන් මේ අවදානමට ලක් වන්නේ; මෙයින් මිය යන්නේ කියන එක සොයා ගෙන තිබෙනවා. ඒ නිසාම මෙන්න මේ අවදානම ඇති වන්නේ කාටද කියලා සොයා බලද්දී, විශේෂයෙන්ම 2020 වසරේ සංඛ්‍යාලේඛන අනුව හඳුනාගත් පියයුරු පිළිකා රෝගීන් 792ක් වාර්තා වෙලා තිබෙනවා. 2020 වසරේ හඳුනාගත් ඒ 792දෙනා අතරින් පිරිමින් 19දෙනෙකුත් වාර්තා වෙලා තිබෙනවා. ඒ නිසා මේ රෝගය පිරිමින් අතර හඳුනා ගන්නේ නැති, කාන්තාවන්ට පමණක්ම සීමා වුණු රෝගයක් හැටියට හඳුන්වන්න බැහැ. නමුත්, අවදානම ගත්තොත්, මේ රෝගයේ වඩාත්ම අවදානම් සහ වඩාත්ම මුහුණ දෙන කණ්ඩායම කාන්තාවන් වීම තමයි විශේෂත්වය. ඒ නිසාම 2020 වර්ෂයේදී හඳුනාගත් රෝගීන් 792න්, 773ක් කාන්තාවන් මේ රෝගයෙන් මිය ගිහින් තිබෙනවා. ඒ නිසා මෙන්න මේ වෙනස් කළ නොහැකි ප්‍රධාන අවදානම් සාධක හඳුනාගත යුතුයි. මේ රෝගයේ -පියයුරු පිළිකාවේ- වෙනස් කළ නොහැකි ප්‍රධානම අවදානම් සාධකය තමයි ස්ත්‍රියක වීම. ගැහැණියකට තමයි මෙන්න මේ පියයුරු පිළිකාවෙන් මරණයේ අවදානම වැඩියෙන් තිබෙන්නේ. ඒ නිසා තමයි අපි කාන්තාවන් සඳහාම මේ පිළිබඳ වැඩිම අවබෝධය ලබා දීමට කටයුතු කරන්නේ.

ඒ නිසාම මම මේ අවස්ථාවේ තෝරා ගත්තා මෙන්න මේ විශේෂ කාරණා කිහිපය සඳහන් කරන්නට. ලංකාව තුළ මේ පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසයේදී, විශේෂයෙන්ම කාන්තාවන්ගේ රෝග තත්ත්වයන් ගැන කථා කරද්දී, මෙන්න මේ පියයුරු පිළිකාවෙන් දිනකට මියයන රෝගීන්ට පුංචි සහනයක් සලසන්නට, මේ අඳුරු තත්ත්වය තුළත් ආලෝකය ලබා දෙන්නට, මේ අවස්ථාවේදී පිළිකා රෝගයට මුහුණ දුන් යම් කෙනෙකුට නැවත ජීවිතය ගැන සිතා බලන්නට කටයුතු කරන ඉන්දිරා පිළිකා භාරය, - Indira Cancer Trust - දිවංගත ඉන්දිරා ජයසූරිය මහත්මියගේ නාමය එක්ක අපි ඉතාම කෘතවේදීව සිහිපත් කරනවා. මේ ආයතනය විශේෂයෙන්ම පියයුරු පිළිකා රෝගීන්ට විශාල සේවාවක් සපයන ආයතනයක්. අසරණ රෝගීන්ට හිස කෙස් දන් දීම, මානසික උපදේශන සේවා, රෝගය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා රෝගීන්ට අවශ්‍ය මානසික ශක්තිය ඔවුන් ලබා දෙනවා. ඒ නිසාම පියයුරු පිළිකාව කලින් හඳුනා ගත්තොත් සම්පූර්ණයෙන්ම සුව කළ හැකි පිළිකාවක් බව ජනතාවට දැනුවත් කිරීම සඳහා අද දිනයේදීත් මේ ඉන්දිරා පිළිකා භාරය විසින් විශාල කාර්ය භාරයක් ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික පිළිකා මර්දන වැඩසටහනත් එක්ක ඒකාබද්ධව දියත් කරමින් තිබුණා. ඒ අනුව තමයි අද පාර්ලිමේන්තුව රෝස වර්ණයෙන් සැරසිලා මේ දැනුවත් කිරීමේ වැඩසටහනට දායක වුණේ. එම වැඩසටහන සංවිධානය කිරීමට ඔවුන්ගෙන් ලැබුණු දායකත්වය වැදගත්.

ඒ වාගේම, ජාත්‍යන්තර උදාහරණයක් හැටියට මම ඔබතුමන්ලාට කාරණයක් කියන්න කැමැතියි. පියයුරු පිළිකා අවදානමට නිර්භීතව මුහුණ දුන් අපි දන්නා ලෝක ප්‍රකට කාන්තාවක් ඉන්නවා. ඒ තමයි, සුපිරි හොලිවුඩ් නිළියක් වාගේම මානව හිතවාදිනියක් වන ඇන්ජලීනා ජොලී. ඇන්ජලීනා ජොලී ගැන අපි අසා තිබෙනවා. ඇයගේ මව පියයුරු පිළිකාවකින් මිය යනවා. ඇන්ජලීනා ජොලී තමාගේ ශරීරය පරීක්ෂා කරගන්නවා. එහිදී එතුමිය අනාවරණය කර ගන්නවා BRCA1 නමැති පිළිකා රෝගී තත්ත්වය, නැත්නම් පියයුරු පිළිකාව සඳහා වන විශේෂ ජානමය තත්ත්වයක් ඇයට තිබෙනවා, ඒ නිසා ඇයට පියයුරු පිළිකාවක් වැලඳීමේ අවදානම සියයට 87ක, 90ක තරමින් තිබෙනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට නියමිත කාලය අවසන්, ගරු ඇමතිතුමියනි.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
විනාඩියකින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා ඇය තීරණය කරනවා ශල්‍යකර්මයක් කරන්න. ඇයගේ පියයුරු දෙකම ශල්‍යකර්මයකින් ඉවත් කරලායි ඇය දැන් ජීවත් වෙන්නේ. ඒ නිසා ඇයගේ පිළිකා අවදානම ඉතාම පහළ අගයකට -සියයට 5කටත් වඩා අඩු අගයකට- පත් කරගෙන තිබෙනවා. ඇය ඒ තුළින් ලබාදෙන ප්‍රධානම පණිවුඩය තමයි රෝගය කල් තියා හඳුනා ගැනීම වැදගත් කියන එක. ඒ වාගේම අවදානම් සාධක ඇත්නම් ඊට මුහුණ දීමේ ශක්තිය ඇය ලෝකයට ලබා දුන්නා. ඇය වැනි ලෝකයේ ප්‍රසිද්ධම නිළියක්, රූපය ඉතාම වැදගත් යැයි සලකන නිළියක් ලෝකයට ලබා දෙන පණිවුඩය තමයි කාන්තාවන්ට රූපයට වඩා ජීවිතය වටිනවා කියන එක. ඒ නිසා දෙසැරයක් හිතන්න එපා, අනිවාර්යයෙන්ම වයස අවුරුදු 20ට වඩා වැඩි හැම කෙනෙක්ම TLC - Touch, Look, Check - කියන පියවර අනුගමනය කරන්න. ඒ තේමාව ඔස්සේ බැලුවාම අපි හැම කෙනෙකුටම ස්වයං පියයුරු පරීක්ෂාවක් කරගන්න පුළුවන්. ඒ වාගේම, කල් තියා එහි අවදානම හඳුනාගෙන ඒ සඳහා වන මැදිහත්වීම කරන්න කියලා අපි කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු අමාත්‍යතුමියනි.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
හොඳයි, මම අවසන් කරනවා, මූලසානරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම, ලංකාවේ සෞඛ්‍ය සේවාව තුළ සුවනාරී සායන තුළින් ඔබට මේ සේවාව ලබාගන්න පුළුවන් කියන මතක් කිරීම කරමින් නීරෝගී දිවියක් සඳහා කල් තියා රෝගය හඳුනා ගනිමු කියන පණිවුඩය ලබා දෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.04]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ඇත්තවශයෙන්ම මම කල්පනා කළා, මේ පියයුරු පිළිකාව සම්බන්ධ මේ යෝජනාව කාන්තා මහජන නියෝජිතයකු වෙනුවෙන් පිරිමි මහජන නියෝජිතයකු, මන්ත්‍රීවරයකු මාර්ගයෙන් ගෙනැල්ලා සම්මත කර ගත්තා නම් තවත් හොඳයි කියලා. එහෙම කියන්න විශේෂ හේතුවක් තිබෙනවා. විශේෂයෙන් දෙමළ කථා කරන කඳුරට දෙමළ ජනතාව, අපේ මව්වරුන්, අපේ බිරින්දෑවරුන්, අපේ සහෝදරියන්, දියණියන් අතර මේ පිළිබඳව තිබෙන දැනුම, මේ පිළිබඳව ඔවුන් දන්නා කාරණා - පරීක්ෂා කිරීම මඟින් ආරම්භයේදීම පියයුරු පිළිකාව හඳුනා ගැනීමට ඇති හැකියාව පිළිබඳව තිබෙන දැනුවත්භාවය - awareness - හරි අඩුයි. අපිට ලබා දුන්න මේ පොත මම සම්පූර්ණයෙන් කියෙව්වා. විශේෂයෙන්ම මම හිතන්නේ ඇමතිතුමිය කිව්වා වාගේ මේකේ අවසානයේදී තමන් විසින්ම මේක හඳුනා ගැනීම සඳහා ලබා දී තිබෙන උපදෙස් මාලාව -එතුමිය මේ සභාවේ නැහැ- දෙමළෙන් ලියලා තිබුණා නම් තවත් හොඳයි. ඒ නිසාම මම කල්පනා කළා, මේ කෙටි කාලය තුළ මගේ කථාව දෙමළෙන් කරන්න ඕනෑ කියලා.

ඊට ඉස්සෙල්ලා මම තව ප්‍රශ්නයක් අහන්න ඕනෑ, මේ වෙනුවෙන් පෙනී සිටින පිරිමි උදවියගෙන්, මන්ත්‍රීවරුන්ගෙන්. අපගේ මව, එහෙම නැත්නම් අපගේ බිරිඳ නැත්නම් අපගේ ගැහැණු දරුවා, සහෝදරිය සමඟ පියයුරු පිළිකාව සම්බන්ධව සාකච්ඡා කරලා, ඒ අය විසින් හෝ වෛද්‍යවරයෙකු හරහා ඒ පිළිබඳව පරීක්ෂාවට ලක් කිරීම සඳහා කථා කළේ කවදාද? මේ පිළිබඳව පරීක්ෂා කිරීම කළ යුතු වන්නේ අවුරුදු 20න් පස්සේ කියලා කියනවා. විශේෂයෙන් අවුරුදු 40න් පස්සේ මේ ගැන අවධානය යොමු කළ යුතුයි.

ප්‍රධාන වශයෙන් මව් කිරි ලබා දීමේ ක්‍රියාවලියේ තිබෙන්නා වූ ප්‍රශ්න නිසා ඇති වෙන මේ පියයුරු පිළිකාව සම්බන්ධව පවුල ඇතුළේ ටිකක් විවෘතව කථා කරන්න; අයියලා එක්ක, තාත්තා එක්ක, ස්වාමිපුරුෂයා එක්ක, තමන් ඒ දන්නා හඳුනන අය එක්ක කථා කරන්න **මැළිභාවයක්** දෙමළ ජනතාව තුළ තිබෙනවා. මම හිතන්නේ සිංහල ජනතාව තුළත් තිබෙනවා.

உண்மையிலேயே மார்பகப் புற்றுநோயை பெண்களுடைய விடயமாக மாத்திரம் நான் காணுவதில்லை. இந்தச் சபையில் இருக்கின்ற ஓர் ஆண் பாராளுமன்ற உறுப்பினராகிய நான், எப்பொழுதாவது என்னுடைய தாயிடம் மார்பகப் புற்றுநோய் சம்பந்தமாகப் பேசி இருக்கின்றேனா? அல்லது அவரை ஒரு வைத்தியரிடம் அழைத்துச் சென்று பரிசோதித்து இருக்கின்றேனா? எங்களுடைய தமிழ் பேசும் சமூகத்தில் இருக்கின்றவர்கள் தங்களுடைய மனைவி, சகோதரிகள், பெண் பிள்ளைகளுடன் இது பற்றி பேசுவதற்குக்கூட வெட்கப்படுகின்றார்கள். அது தமிழர்களாக இருக்கலாம், முஸ்லிம்களாக இருக்கலாம், மலைநாட்டுத் தமிழர்களாக இருக்கலாம்! மார்பகப் புற்றுநோய் கொஞ்சம் முற்றிய பிற்பாடு, அது இருப்பதாகக் கண்டுபிடிக்கப்பட்டால், அது பற்றி வெளியே சொல்ல மாட்டார்கள். ஏனெனில், மார்பகம் அகற்றப்பட்டால் அது தங்களுக்குப் பெரியதோர் அவமானமென நினைக்கிறார்கள். මේ පිළිකාව නිසා කෙනෙකුගේ පියයුරු ඉවත් කළොත්, ඒක මහා ලොකු අවමානයක් හැටියට හිතන එක හරි අසාධාරණයි.

I am so thankful that the Hon. Minister spoke about the famous Hollywood actress. She is also one of my favourite actresses. She did beautiful lovely films. I think she is also a pretty woman. මම කියන්නේ ඒ වාගේ ප්‍රසිද්ධ වුණු නිළියක් පවා පියයුරු පිළිකාව සම්බන්ධයෙන් අදාළ ශල්‍ය කර්මයට භාජන වීම පිළිබඳව පොදුවේ කථා කිරීම හරහා සමාජය තුළ ඒ පිළිබඳව දැනුවත්භාවයක් ඇති වෙනවා.

ஆகவேதான் நான் மிகவும் பணிவாக வேண்டிக் கொள்கின்றேன், நாங்கள் மார்பகப் புற்றுநோய் தொடர்பான விடயத்தில் முன்மாதிரியாக இருக்க வேண்டும் என்று. நாங்கள் எங்களுடைய குடும்பத்திலுள்ள, சமூகத்திலுள்ள பெண்களிடம் மார்பகப் புற்றுநோய் சம்பந்தமாகப் பேச வேண்டும்.

[ගරු එම්. නිසාම් කාරියප්පර් මහතා]

என்னுடைய கையிலுள்ள இந்தப் புத்தகத்தின் கடைசிப் பந்தியில் குறிப்பிடப்பட்டுள்ளவாறு, ஒவ்வொரு பெண்ணும் சுயமாகவே தனக்கு மார்பகப் புற்றுநோய் இருக்கின்றதா என்பதைக் கண்டறிந்துகொள்வதற்கு ஒரு simple test இருக்கின்றது. அது சம்பந்தமாக நாங்கள் பெண்கள் மத்தியில் பாரியதொரு awarenessஐ ஏற்படுத்த வேண்டும். இந்த விடயம் சம்பந்தமாக எனக்குப் பாராளுமன்றத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்ததை உண்மையிலேயே கௌரவமாக நினைக்கின்றேன். இது சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணையை முன்மொழிந்த கௌரவ உறுப்பினருக்கும், அதை வழிமொழிந்த கௌரவ உறுப்பினருக்கும் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். நாங்கள் தொடர்ந்தும் இது சம்பந்தமான விழிப்புணர்வை எங்களுடைய தாய்மார், மனைவி, பெண் பிள்ளைகள் மத்தியில் ஏற்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனச் சொல்லி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.10]

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உலகெங்கிலும் உள்ள பெண்களின் ஆரோக்கியத்துக்கு அச்சுறுத்தலாக இருந்தாலும், ஆரம்பத்திலேயே கண்டறிந்தால் எளிதில் குணப்படுத்தக்கூடிய ஒரு நோயைப் பற்றி பேசுவதற்காகவே நாம் இவ்வேளையில் இந்தச் சபையில் ஒன்றுகூடி இருக்கின்றோம். ஒக்ரோபர் மாதமானது, மார்பகப் புற்றுநோய் விழிப்புணர்வு மாதமாகப் பிரகடனப்படுத்தப்பட்டு உள்ளது. இலங்கையில் வாழும் பெண்களிடையே பொதுவாகப் பதிவாகும் புற்றுநோய் மார்பகப் புற்றுநோய் ஆகும். ஒரு நாளைக்கு சுமார் 15 நோயாளர்கள் புதிதாகக் கண்டறியப்படுகின்ற அதேவேளை, மூன்று பெண்கள் இந்நோயால் உயிரிழப்பதாக எமக்குக் கிடைக்கின்ற தகவல்கள் மூலம் நாம் அறிந்துகொள்ளக்கூடியதாக இருக்கின்றது. மார்பகப் புற்றுநோயை ஆரம்பத்திலேயே கண்டறிந்தால், அதை முழுமையாகக் குணப்படுத்திக்கொள்ள முடியும். இதனை அறுவைச் சிகிச்சை மூலமும் குணப்படுத்திக்கொள்ள முடியும். அறுவைச் சிகிச்சை மேற்கொண்டால் அழகை இழந்துவிடுவோமெனக் கருதுகின்றார்கள். அழகைவிட எமது வாழ்க்கை முக்கியம் என்றே நாம் கருத வேண்டும்.

இன்று காலை முதல் இந்தச் சபையில் பெண்களைத் தாக்கும் முக்கிய நோயான மார்பகப் புற்றுநோய் தொடர்பில் நாங்கள் பேசிக்கொண்டு இருக்கின்றோம். நான் நுவரெலியா மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினராக இருக்கின்றேன். அங்கு வாழுகின்ற பெண்கள் மத்தியில் குறிப்பாக, தோட்டப்புறங்களில் வாழும் பெண்கள் மத்தியில் மார்பகப் புற்றுநோய் தொடர்பில் போதியளவு விழிப்புணர்வு இல்லை. கௌரவ நிசாம் காரியப்பர் அவர்கள் கூறியதுபோல, இன்று காலையில் எங்களுக்கு வழங்கப்பட்ட மார்பகப் புற்றுநோய் தொடர்பான புத்தகம் தமிழ் மொழியில் இல்லை. மலையகத்தில் வாழும் பெண்கள் காலையில் வேலைக்குச் சென்றால் பின்னேரம்தான் வீடு திரும்புவார்கள். மார்பகப் புற்றுநோய் என்று ஒரு நோய் இருக்கின்றது. அந்த நோய்க்கு சிகிச்சை பெறுவதற்கு வைத்தியசாலைக்குச் செல்ல வேண்டும். அது சம்பந்தமாக உரிய வைத்திய அதிகாரிகளுடன் கலந்தாலோசிக்க வேண்டும். அந்த நோயைக் குணப்படுத்த முடியும் என்ற தெளிவுகூட அவர்களிடம் இல்லை. ஏனென்றால், இந்த நோய் சம்பந்தமான விழிப்புணர்வு அவர்களிடம் இல்லை. இந்த நோய் தொடர்பில் விழிப்புணர்வூட்ட பெண்கள் அமைப்புகள், சிவில் அமைப்புகள் எனப் பல அமைப்புகள் இருந்தாலும், மலையகத்திலுள்ள பெண்களை விழிப்புணர்வூட்ட ஒரு வேலைத்திட்டமும் இல்லை. இன்று மலையகப் பெண்களும் பாரியளவில் மார்பகப் புற்றுநோயால் பாதிக்கப்படுகின்றார்கள்.

எனவே, இந்த நோய் சம்பந்தமாக எமது மலையகப் பெண்களும் தெளிவுபெற வேண்டும். குணப்படுத்தக்கூடிய பல நோய்கள் இருக்கின்றன. மார்பகப் புற்றுநோய் என்றவுடன் ஒவ்வொரு பெண்ணின் மனதிலும் தோன்றுவது, அதனைக் குணப்படுத்த முடியாது என்ற அச்சமே! இந்தப் பாராளுமன்றத்திலுள்ள பெண் உறுப்பினர்கள்போல், ஏனைய பெண்களும் இந்நோய் தொடர்பில் தெளிவைப் பெறுவது முக்கியமானது. இது வெட்கப்படக்கூடிய, அழகைக் குலைக்கக்கூடிய விடயமல்ல. மார்பகப் புற்றுநோய் என்பது குணப்படுத்தக்கூடிய ஒரு நோயாகும். எனவே, இது தொடர்பான விழிப்புணர்வைக் கட்டாயம் மலையகத்தில் ஏற்படுத்த வேண்டும். மலையகத்தைப் பிரதிநிதித்துவம் செய்யும் பல உறுப்பினர்கள் இங்கு இருக்கிறார்கள். நாங்கள் சிவில் அமைப்புகள், பெண்கள் அமைப்புகள் ஊடாக மலையகப் பெண்கள் மத்தியில் மார்பகப் புற்றுநோய் தொடர்பில் விழிப்புணர்வூட்டும் வேலைத்திட்டங்களை முன்னெடுக்க வேண்டும். இந்த நோயின் அறிகுறிகள் மற்றும் ஆபத்து பற்றி தெரிந்துகொள்ள வேண்டும். இருபது வயதுக்கு மேற்பட்ட ஒவ்வொரு பெண்ணும் தன்னை சுய பரிசோதனைக்கு உட்படுத்தல் முக்கியமானது. இவ்வாறு செய்வதனூடாக இந்த மார்பகப் புற்றுநோய்க்கு முற்றுப்புள்ளி வைக்க முடியுமென நான் நினைக்கின்றேன். ஆகவே, நாம் இது தொடர்பிலான விழிப்புணர்வை பெண்கள் மத்தியில் ஏற்படுத்தவேண்டி உள்ளது. குறிப்பாக, வளங்கள் குறைந்த மலையகத்தில் வாழும் பெண்கள் மத்தியில் இது தொடர்பான விழிப்புணர்வை ஏற்படுத்த நாம் அனைவரும் ஒன்றிணைந்து வேலைத்திட்டங்களை முன்னெடுக்க வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.16]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மார்பகப் புற்றுநோய் தொடர்பாக இன்று கொண்டுவரப்பட்டிருக்கின்ற இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணை மிகவும் முக்கியத்துவம் வாய்ந்தது. இந்த நாட்டிலே, மிக முக்கியமாக பெண் பாராளுமன்ற உறுப்பினர்களின் ஒன்றிம் இந்தப் பிரேரணையை முன்வைத்திருப்பதானது ஒரு புதுப் பதிவாக, முதலாவது அடையாளமாக இருக்கின்றது.

இலங்கையில் மட்டுமல்ல, உலகத்திலேயே இந்தப் புற்றுநோயால் பாதிக்கப்படுகின்ற அநேகமானவர்களுக்கு அந்நோய் இருப்பது அவர்களது மரணத் தறுவாயில்தான் அறியப்படுகின்றது. அவ்வாறு மரணத்தின் வாசலுக்குப் போனதற்குப் பிற்பாடு இந்த நோய் அறியப்படுவதன் காரணத்தால்தான் பலர் பயந்து போகிறார்கள் அல்லது இந்த நோய் என்பது மரணத்திற்குரியது; இதிலிருந்து தப்ப முடியாது என்ற மனச் சிக்கலை அவர்கள் கொண்டிருக்கிறார்கள்.

அண்மையில்கூட, பிரித்தானிய நாட்டிலே எனது நண்பர் ஒருவருடைய மனைவிக்கு இந்த நோய் அடையாளம் காணப்பட்டு கிட்டத்தட்ட 2 மாதங்களுக்குள் அவர் மரணத்தைத் தழுவியிருந்தார். ஏனென்றால், பலர் இதற்கான முன்னெச்சரிக்கையாகப் பரிசோதனைகளைச் செய்வதில்லை; அதற்கான அறிகுறிகளை அறிந்திருப்பதில்லை. இதன் அறிகுறிகளை அறிந்திருக்காத காரணத்தால்தான் பெண்கள் கூடுதலாகப் பாதிக்கப்படுகிறார்கள். அதிலும், சமூகம் என்ன நினைக்குமோ, இந்த நோய் வந்தால் குடும்பத்துக்கு ஏதாவது கெட்ட பெயர் ஏற்படுமோ என்ற எண்ணங்கள் இப்பொழுதும் எங்களுடைய மக்களிடத்தில் காணப்படுகின்றது.

ஒரு வருடத்திலே நாட்டில் கிட்டத்தட்ட 15,000 பேர் வரை இந்த நோயால் பாதிக்கப்படுகிறார்கள் என்றால், அது மிக மிக மோசமான நிலைமை! ஒரு வருடத்திலே இவ்வளவு பேர் பாதிக்கப்படுகின்றார்கள், ஒரு நாளைக்குச் சராசரி 3 அல்லது 4 பேர் இந்தப் புற்றுநோயால் இறக்கிறார்கள் என்றால், அது எவ்வளவு மோசமானது! ஆனால், இதற்குக் காரணமாக வெறுமனே நாங்கள் நோயினுடைய அறிகுறிகளை மட்டும் சொல்ல முடியாது; நாங்கள் சாப்பிடுகின்ற உணவுகள் முக்கியத்துவம் வாய்ந்தவை. ஒரு காலகட்டத்திலே இருந்த எங்களுடைய உணவுப் பழக்க வழக்கங்கள் எல்லாம் இன்று எங்களிடம் இருந்து மாறியிருக்கிறது. தற்போது புதிய, நவீனமான, chemical சேர்ந்த உணவுகளைத்தான் அதிகமானவர்கள் உட்கொள்கின்றார்கள். பிள்ளைகளைப் பெற்றெடுக்கின்ற தாய்மார்கூட பால் சுரப்பதற்காக எத்தனையோ chemical சேர்ந்த உணவுகளைச் சாப்பிடுகின்றார்கள். பிள்ளைகளுக்கும் அந்தப் பால் மா வகைகள் வழங்கப்படுகின்றன. ஆகவே, இயற்கையான உணவை உண்ணுகின்ற வழியிலேயிருந்து எங்களுடைய மக்கள் தள்ளிச்செல்வதும் இந்தப் புற்றுநோய் ஏற்படுவதற்கு மிகவும் முக்கியமான காரணமாகும்.

ஆதிகாலப் பெண்கள் ஆரோக்கியமாக 80 - 90 வயது வரையும் வாழ்ந்தார்கள்; 100 வயதைத் தாண்டினார்கள் என்ற வரலாற்றை நாங்கள் படிக்கின்றோம். அதற்குக் காரணம் என்னவென்றால், அவர்களுடைய உணவுப் பழக்க வழக்கம்! அவர்கள் வாழ்ந்த வாழ்க்கை முறை! அவர்களிடம் இருந்த அந்த இயல்பான வாழ்க்கை முறை அவர்களை வாழ வைத்தது. ஆனால், இன்றிருக்கின்ற இயந்திர வாழ்க்கை மற்றும் வேலை உலகம், இந்த மக்களை உடனடியான உணவுகளை - சமைத்த உணவுகளை, உடனடியாகச் செய்த உணவுகளை - வாங்கிச் சாப்பிடுகின்ற பழக்கத்தை நோக்கி நகர்த்தியிருக்கின்றது. இதனால்தான் அதிகமான பெண்கள் மார்பகப் புற்றுநோயினால் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். ஆகவே, என்னுடைய தாய், என்னுடைய மனைவி, என்னுடைய மகள், என்னுடைய சகோதரிகள் என்று எங்கள் குடும்பத்திலே இருக்கின்ற ஒவ்வொருவருடைய வாழ்க்கை முறையையும் நாங்கள் திரும்பிப் பார்க்கவேண்டியிருக்கிறது. ஒவ்வொரு குடும்பத்திலும் இந்த இழப்பு வருகின்றபொழுதுதான் அதைத் துயரமான விடயமாகப் பார்க்கிறோம்.

இலங்கையிலே மஹரகம வைத்திசாலையானது, புற்றுநோய்ச் சிகிச்சைக்குப் பெயர்போன ஒரு வைத்தியசாலையாகும். அதேபோல, யாழ்பாணத்திலே தெல்லிப்பளையிலே இதற்கென ஒரு வைத்தியசாலை உண்டு. அதைவிட, நாட்டிலே பல இடங்களில் புற்றுநோய் வைத்தியசாலைகள் உள்ளன. இந்த வைத்தியசாலைகளுக்குச் சென்று பார்க்கின்றபொழுது வாழ்க்கையினுடைய ஓர் எல்லை ஒவ்வொரு மனிதனுக்கும் விளங்குகிறது. நான் அண்மையிலே மஹரகம வைத்தியசாலைக்குச் சென்றபோது நான்கு வயது குழந்தை புற்றுநோயால் பாதிக்கப்பட்டிருந்ததைப் பார்த்தேன். ஒரு தந்தையைப் பார்தேன், அவருடைய முகத்தில் ஒரு கன்னப் பகுதி இல்லாமல் இருந்தார். அதுபோல் தாய்மார்களும் கனபேர் இருந்தார்கள். இவ்வாறு புற்றுநோயினால் பாதிக்கப்பட்ட பெண்களைப் பார்க்கின்றபொழுது, வாழ்க்கையினுடைய எல்லை அங்கே தெரிந்தது. ஆகவேதான் கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே நான் குறிப்பிடுவது, நாங்கள் எல்லோரும் விழிப்பாக வேண்டும் என்று. நாங்கள் எல்லோரும் சிந்திக்க வேண்டும்.

தனியே பாராளுமன்றக் குழுவில் இருக்கும் பெண்கள் மட்டுமல்ல, அடையாளமாக இளஞ்சிவப்பு நிற ஆடையை அணிவது மட்டுமல்ல, படிப்படியாக இதனை ஒரு பிரசாரமாகப் பாடசாலைப் பிள்ளைகளிடம் கொண்டுசெல்ல வேண்டும். ஆரோக்கியமான நல்ல ஒரு சமுதாயத்தைக் கட்டி வளர்க்க பிள்ளைகளிடம் இந்த விழிப்புணர்வு இப்பொழுதே வரவேண்டும். அப்போதுதான் பிள்ளைகள் எதிர்காலம் பற்றிய நம்பிக்கையோடு தங்களை அடையாளப்படுத்துவதற்கும் இந்த நோயிலிருந்து வெற்றி பெறுவதற்கும் மிக முக்கியமான காரணியாக இது அமையும். ஆகவே, புற்றுநோய் அகற்றப்படக்கூடியது, அது ஒரு நோயல்ல, அதைத் தைரியமாக வெற்றி கொள்ளலாம் என்ற நம்பிக்கை ஒவ்வொரு பெண்களுக்கும் வழங்கப்பட வேண்டும். ஒவ்வொரு பெண்களுக்கும் நம்பிக்கை கொடுக்கப்படுகின்றபொழுது, ஒவ்வொரு ஆண்களுக்கும் நம்பிக்கை கொடுக்கப்படுகின்றபொழுது, தைரியம் ஊட்டப்படுகின்றபொழுது இந்தப் புற்றுநோயிலிருந்து அவர்கள் விடுவிக்கப்படுவார்கள். ஆகவே, இலங்கை வரலாற்றிலே எடுக்கப்படுகின்ற இந்த முன்னுதாரண முயற்சியை முதலில் எல்லோரும் சேர்ந்து முன்னெடுக்க வேண்டும். கொண்டுவரப்பட்ட பிரேரணை மிகவும் முக்கியத்துவம் வாய்ந்தது. அதனை வரவேற்று, நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මේ මැදිහත්වීම අතිශයින් වැදගත්. අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පමණක් නොවෙයි මේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

බොහෝ දෙනෙක් රෝස පාටින් ඇඳගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම මමත් මේ ලාංඡනය පැළඳ ගෙන ඉන්නවා. හැමදෙනාම පාහේ රෝස පාටින් වර්ණ ගල්වා තිබෙන මේ අත්පළඳනා පැළඳ ගෙන ඉන්නවා. මේ සියල්ල කරන්නේ මේ ඔක්තෝබර් මාසය පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසය හැටියට - Breast Cancer Awareness Month - ලෝකය පිළිඅරගෙන යන මොහොතක අපි සමස්තයක් හැටියට - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු සහ කාර්ය මණ්ඩලය - අපේ ජනතාවට පණිවුඩයක් ලබා දෙනවා, පියයුරු පිළිකාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමට අපි එකතු වුණාය කියන එක. ඒක චේතනාන්විතව කරන මැදිහත්වීමක් නිසාම අද පමණක් නොවෙයි, මේ ඔක්තෝබර් මාසයේ පමණක් නොවෙයි, නීති සම්පාදනය කිරීමේදී, ප්‍රතිපත්ති සකස් කිරීමේදී අපේ මේ මැදිහත්වීම අතිශය වටිනවා.

රටක් හැටියට අපි මුහුණ දෙන ඉතාම දැවැන්ත සහ බරපතළ අභියෝගයක් තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෝ නොවන රෝග. අපේ රටේ සිදුවෙන මරණවලින් සාමාන්‍යයෙන් සියයට 83ත්, සියයට 85ත් අතර ප්‍රමාණයක් සිදු වන්නේ පිළිකා ඇතුළත් බෝ නොවන රෝගවලින්. සාමාන්‍යයෙන් අපි දවසකට අලුත් පිළිකා රෝගීන් සියයක් පමණ හඳුනා ගන්නවා. ඒ අනුව වසරකට 33,000ක් පමණ අපි අලුත් පිළිකා රෝගීන් හඳුනා ගන්නවා. දැනට වාර්තා වෙන සංඛ්‍යාලේඛන හැටියට, දවසකට ඒ හඳුනා ගන්නා නව පිළිකා රෝගීන් සිය දෙනා අතරින් 10ත්, 15ත් අතර ප්‍රමාණයක් පියයුරු පිළිකා රෝගීන්. සමහර අවස්ථාවලදී අපට පියයුරු පිළිකා රෝගීන් හඳුනා ගන්න වෙන්නේ ඒ රෝගයේ අදියර ගණනාවක් පහු කරලා ව්‍යාකූල තත්ත්වයට පත් වුණාමයි.

අපි අපේ රටේ රෝහල් තුළ යම් පහසුකම් ප්‍රමාණයක් ඒ සඳහා ලබා දීලා තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමා කිව්වා වාගේ මේ සඳහා ප්‍රතිකාර කරන linear accelerator වාගේ machine එකකට අපි සාමාන්‍යයෙන් රුපියල් මිලියන 600ක්, 700ක්, 850ක් විතර වියදම් කරනවා. අලුත් machines 5ක් ලබා ගන්න අපි ගිවිසුම්ගත වෙලා තිබෙනවා. තව මාස හතරකින්, පහකින් ඒ machines ටික ලැබෙනවා. කෙසේ නමුත්, නව පිළිකා රෝගීන් හඳුනා ගැනීම සහ ඔවුන්ට ප්‍රතිකාර කිරීමට අපි යොදන මහන්සිය යනාදී මේ සියල්ල ගත්තාට පස්සේත්, ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය කියපු විධියට අවුරුදු 70ට වඩා අඩු මරණ - premature deaths - සැලකිය යුතු ප්‍රමාණයක් මේ රෝගයෙන් සිදු වෙනවා.

අපේ රටේ තිබෙන ප්‍රධාන පිළිකා වර්ග තුන තමයි පිරිමින්ට මුඛ පිළිකා, කාන්තාවන්ට පියයුරු පිළිකා සහ ගැබ්ගෙල පිළිකා. ඉතින් අපේ සෞඛ්‍යයට, ආර්ථිකයට, පවුලට, සමාජයට හැම පැත්තෙන්ම වෙන බලපෑම පිළිබඳව සලකා බැලුවාට පස්සේ සහ වර්ධනය වෙන තත්ත්වය සලකා බැලුවාට පස්සේ විශේෂයෙන් පියයුරු පිළිකා හඳුනා ගැනීම සඳහා මුල් අදියරේදී කටයුතු කිරීම තමයි වැදගත් වෙන්නේ. ඇත්තටම මේ අභියෝගය ජයග්‍රහණය කිරීම සඳහා තිබෙන ප්‍රධානතම මෙවලම බවට පත් වෙන්නේ කල් තියා පළවෙනි අවස්ථාවේ දී මේ රෝගය හඳුනා ගැනීමයි. ඒ සඳහා මෙවැනි දැනුවත් කිරීම් හරහා, මෙවැනි වැඩසටහන් හරහා තමයි ඒ ගැන ජනතාව දැනුවත් කර ගැනීමට පුළුවන්කම ලැබෙන්නේ. විශේෂයෙන් self-breast examination වාගේ දෙයකට හුරු කිරීම, යොමු කිරීම තුළින් සැලකිය යුතු ප්‍රමාණයක දැනුවත්භාවය ඇති කර ගන්න පුළුවන්. ඒ වාගේම අපට තිබෙන සුවනාරී සායන සහ සුව දිවි සායන තුළින් ඊට එහා මට්ටමේ පරීක්ෂණයක් කර ගන්නත් පුළුවන්කම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නව රජයේ වැඩ පිළිවෙළක් හැටියට අපි හඳුන්වා දෙමින් තිබෙනවා ජනගහනය 5000ත්, 10000ත් අතර ප්‍රමාණයකට ග්‍රාම නිලධාරි වසම් 4ක් හෝ උපරිම 5කට කිලෝමීටර් 3ක උපරිම දුර සීමාවක් යටතේ ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථානයක් - Arogya Health and Wellness Centre - එකක් ආරම්භ කරන්න. අපි නියමු ව්‍යාපෘතියක් වශයෙන් දැනට දිස්ත්‍රික්ක 5ක එය ආරම්භ කරලා තිබෙනවා. ඒකට අපි අනුයුක්ත කර තිබෙනවා, Public Health Nursing Officer කෙනෙක්. එයාගේ මූලික කාර්යභාරය තමයි 5,000ක, 10,000ක පිරිසක් ලියාපදිංචි කරගෙන ඒ අයගේ රෝග හඳුනා ගැනීම. දියවැඩියාව, අධික රුධිර පීඩනය පමණක් නොවෙයි විශේෂයෙන්ම cancer screening සඳහා මුල් පියවර තැබීම තමයි ඒ කාර්ය මණ්ඩලයේ කාර්යභාරය බවට පත් වෙන්නේ. එතකොට නිශ්චිත ජනගහනයක්, නිශ්චිත ලෙස screen කරලා කල් ඇතිව මේ රෝගය හඳුනා ගන්න පුළුවන්කමක් තිබෙනවා.

ඊළඟ අදියර තමයි, මේ රෝගීන් රෝග විනිශ්චය - diagnosis - සඳහා යොමු කිරීම. එතැනදී mammogram, ultrasound scan වාගේ පරීක්ෂණවලට ඔවුන් යොමු කිරීම අවශ්‍ය වෙනවා. තුන්වැනි පියවර තමයි ප්‍රතිකාර ලබා දීම. ශල්‍ය ප්‍රතිකාර, විකිරණ ප්‍රතිකාර, පිළිකා නාශක ඖෂධ ප්‍රතිකාර, හෝමෝන ප්‍රතිකාර ආදී මේ විවිධ ප්‍රතිකාරවලට යොමු කිරීම තමයි ඊළඟ පියවර. මේ සමස්තය ක්‍රියාත්මක කිරීමේදී එක එක අදියරේදී ද්විතීයික සෞඛ්‍ය ආයතනවලට, තෘතීයික සෞඛ්‍ය ආයතනවලට යොමු කිරීමට ප්‍රථම ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන හරහා මේ රෝගීන් කලින් හඳුනා ගැනීමේ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීම තමයි අපි මේ කරමින් ඉන්නේ.

මම හිතන හැටියට වසර කිහිපයක් යනකොට මෙන්න මේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම තුළින් අපට දවසකට වාර්තා වෙන නව පිළිකා රෝගීන් ප්‍රමාණය අඩු කරගෙන, රෝග ව්‍යාකූල වෙන තත්ත්වය වළක්වා ගෙන, ඒ සංකීර්ණ තත්ත්වය අදියරෙන් අදියර වළක්වා ගෙන, කලින් ප්‍රතිකාර කරලා ඔවුන් නිරෝගී පරපුරක් බවට පත් කරගන්න පුළුවන්කම ලැබෙන්නේ. 2026 - 2035 දක්වා සකස් කරන අපේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළ අපි ප්‍රධාන අවධානයක් යොමු කර තිබෙනවා, පියයුරු පිළිකා ඇතුළු පිළිකා රෝග මර්දනය කිරීම සඳහා. රෝග වැළඳීම අවම කර ගැනීම සහ ප්‍රතිකාර වලට යොමු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙනවා. ඒ ප්‍රතිපත්තියට සමගාමීව මේ වසර 10 සඳහා අපි හදන Strategic Master Plan එක ඇතුළේත් මම කලින් කියපු ආකාරයට ක්‍රමයක් සකස් කරනවා, සමහර විට ජනතාව තමන් ගැන හිතනවාටත් වඩා වේගයෙන් මේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල ජනතාව ගැන හිතලා ජනතාව වෙත ප්‍රවේශ වෙන ක්‍රමයක්.

මේ ආදී වශයෙන් ගත්තොත් පිළිකා ඇතුළු බෝ නොවන රෝගවලින් අපේ රටේ ජනතාව බේරාගන්න, ඔවුන් මරණවලින් වළක්වා ගන්න, ඔවුන් රෝගී තත්ත්වයට පත් වුණාට පසුව එහෙම නැත්නම් මරණයට පත් වුණාට පසුව ඒ පවුල්වලට ඇතිවන තත්ත්වය අවම කර ගැනීම සඳහා සුවිශේෂී මැදිහත් වීමක් කරමින් ඉන්න බව කියන්න කැමතියි. මේ පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ සහ රටේ අවධානය යොමු කිරීමට මුල් වුණු අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික පිළිකා මර්දන

වැඩසටහනටත්, මේ කටයුත්තට උදවු කළ - ඉන්දිරා පිළිකා භාරය වාගේ ආයතන ගණනාවක් තිබෙනවා - ඒ සියලුදෙනාටමත් සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට මේ වෙලාවේ මගේ ගෞරවය පිරිනමන්න කැමතියි. අපේ මේ සමස්ත ක්‍රියාකාරිත්වය ඇතුළේ, අපේ මේ අදහස් දැක්වීම් සියල්ල ඇතුළේ, අපේ රටේ ජනතාව ගිල ගන්නා, අපේ සම්පතමයන් ඩැහැ ගන්නා, අපට දිනපතා වාර්තා වෙන මේ අභියෝගය ජයග්‍රහණය කිරීම සඳහා මේ මන්ත්‍රීවරු ඇතුළු රටේ සියලුදෙනා දායක වෙන්න කියා ඉල්ලීමක් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 ඔක්තෝබර් 23වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2025 ஒக்ரோபர் 23, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Thursday, 23rd October, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.